# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

*WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2014** දෙසැම්බර් **04** වන බ්‍රහස්පතින්දා
2014 மார்கழி 04 வியாழக் கிழமை
Thursday 04th December 2014

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.24 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.24 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.24 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு தவிசாளர் .[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2015
# පූර්ණ කාරක සභාව

## ANNUAL FINANCIAL STATEMENT - 2013
## COMMITTEE OF THE WHOLE COUNCIL

***2015 වාර්ෂික මුදල් ප්‍රකාශයේ ප්‍රදානයන් සලකා බැලීම සඳහා පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය යුතු යැයි ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] විසින් යෝජනා කරන ලදුව, පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් විය.***

*Having stated by the Hon. Chairman, [Sunil Wejerathna] that the Provincial Council be converted into a Committee of the Whole Council in order to consider the grants of the Annual Financial Statement of 2015, the provincial council converted itself into a Committee of the Whole Council.*

***ශීර්ෂ අංක 106, 119, 120 හා 121 යන ශීර්ෂයන්ගෙන් රුපියල් 10/- ක සංකේත කපා හැරීමක් කළ යුතු යැයි හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනය පිළිබඳ ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී. (ප්‍රගතිය : 2014.12.03)***

*The question on the amendment that a token cut off of Rs. 10/- from each vote Nos. of 106, 119, 120 & 121 moved by Hon. Harshana Rajakaruna, Chief Opposition Whip, was proposed again. - (Continuation: 03.12.2014 )*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂ අංක 106, 119, 120 හා 121 වැය ශීර්ෂ විවාදය ආරම්භ කිරීමට මම අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 08 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[පූ.භා. 09.25]

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම, සුළු වාරිමාර්ග සහ පරිසර කටයුතු සම්බන්ධ වැය ශීර්ෂය පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න කලින් මගේ කාලය ආරක්ෂා කර ගැනීම සඳහා ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් මම මෙහෙම ප්‍රශ්න කරනවා. අද මේ විෂයය කථා කරද්දී කෘෂිකර්මයට අදාළ ගරු අමාත්‍යවරයෙක් මේ සභාව තුළ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉන්නවා. වැඩ බලන ඇමැතිතුමා ඉන්නවා. එතුමා දිවුරුම් දීලා තියෙන්නේ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

වැඩ බලන ඇමැතිතුමා විධියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක නිවේදනය කළා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

කවුද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒ වැය ශීර්ෂය සම්බන්ධ සම්පූර්ණ වගකීම සාමූහික කැබිනට් මණ්ඩලය භාර ගන්නා විධියට මම විශ්වාස කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා)

Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services, Trade Affairs and Information)

ඔව්.

**ගරු අසෝක සපුමල් රන්වල**

Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මේ කෘෂිකර්මාන්තය, සුළු වාරිමාර්ග සහ පරිසර විෂයය ගත්තාට පස්සේ අද රටක් විධියට ගත්තත් ඉතාමත් බරපතළ ඛේදවාචකයකට පත් වෙලා තිබෙනවා. ඒ ඛේදවාචකයේ ගොදුරක් බවට පත් වෙලා තිබෙනවා, බස්නාහිර පළාත් සභාව සම්බන්ධව මේ විෂයයන්. ඒ වාගේම ප්‍රායෝගික තලය තුළ කෘෂිකර්මාන්තය පත් වෙලා තිබෙන ඉරණම. ඒ වාගේම සුළු වාරිමාර්ග පත් වෙලා තිබෙන ඉරණම. ඒ වාගේම පරිසරය පත් වෙලා තිබෙන ශෝචනීය ඉරණම. (බාධා කිරීමක්) මෙවැනි තත්ත්වයක් තුළ කෘෂිකර්මාන්තය බිඳ වැටීමේ ප්‍රතිඵලයක් විධියට අද සහල් කිලෝ එකක මිල රුපියල් 85 ත් රුපියල් 100 ත් අතර මිලකට පත් වෙලා තිබෙනවා. මේ සහල් මිලට ගැනීමේ උවමනාව තිබෙන පාරිභෝගික ජනතාව කවුද? ඇත්ත උවමනාවෙන් තමන්ගේ එදිනෙදා ජීවිතය සරි කර ගන්න රුපියල් 800 ක් වැනි දෛනික ආදායම තිබෙන මනුස්සයෙකුට තමන්ගේ ඒ දෛනික ආදායමෙන් 10% කට වැඩි මුදල් ප්‍රමාණයකින් තමන්ගේ ප්‍රධාන ආහාරය සපුරා ගන්න සිද්ධ වෙලා තිබෙනවා.

මහන්සි වෙලා වැඩ කරන ගොවි ජනතාව, ඒ වාගේම ධීවර ජනතාව, ඒ වාගේම ශිෂ්‍යයින්, අනෙකුත් කම්කරුවන්ට තමන්ගේ එදිනෙදා වේලට 10% කට වැඩියෙන් තමන් සොයන මුදලින් වෙන් කර ගන්න සිද්ධ වුණාම ඇති වෙලා තිබෙන ශෝචනීය තත්ත්වය නිසාම මන්දපෝෂණය, නීරක්තිය, ඒ වාගේම රක්තහීනතාවය වැනි බරපතළ උවදුරුවලට තමන්ගේ පවුලේ සාමාජිකයින් ගොදුරු වෙමින් පවතිනවා. මෙන්න මේ තත්ත්වය වෙනස් කරන්න තමයි 2004 දී සන්ධාන ආණ්ඩුව පිහිටුවාගෙන ඉදිරියට යද්දී ඒ වාගේම 2005 දී මහින්ද චින්තනය හරහා ජනතාවට ලොකු බලාපොරොත්තුවක් දීලා තිබුණේ. මේ බලාපොරොත්තුව අනුව ජනතාවට පුරන් කුඹුරු අස්වද්දලා රටේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ නව ප්‍රබෝධයක් ඇති කරන්න ජනතාවට විශාල බලාපොරොත්තුවක් දීලා තිබුණා. මෙහි ඇත්ත තත්ත්වය තමයි අද වනකොට රටේ තිබෙන කුඹුරු ප්‍රමාණයෙන් තවදුරටත් කෘෂිකර්මාන්තයට අදාළව තිබෙන කුඹුරු ප්‍රමාණය ගත්තාට පස්සේ බස්නාහිර පළාත තුළ හෙක්ටයාර් 46,430 ක් තිබෙනවා. මෙයින්, මේ මොහොත වනවිටත් බස්නාහිර පළාත තුළ පුරන් වෙලා තිබෙනවා හෙක්ටයාර් 10,536 ක්.

මේ පුරන් කුඹුරු අස්වද්දනවා වෙනුවට අද සිද්ධ වෙලා තිබෙන්නේ, මගේ ප්‍රදේශය ආශ්‍රිතව ගත්තාට පස්සෙත් තිබෙන කුඹුරු විවිධ දේවල්වලට යොදවා ගන්න එක. ගොඩ කිරීම, ඒ වාගේ මංතීරු සැකසීම, ඒ වාගේම ජලාශ ඉදි කිරීම නිසා ඒ තිබෙන කුඹුරු ප්‍රමාණයත් අස්වද්දන්න බැරි ශෝචනීය තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. බියගම ප්‍රදේශයේ සශ්‍රීකම කුඹුරු යාය සියඹලාපේ හන්දිය, කලර් ලයිට්ස් හන්දියේ - ගම්පහ දිස්ත්‍රික්කය පසු කරගෙන මෙතැනට එන මන්ත්‍රීවරු දන්නවා ඇති. ඉතාමත් සශ්‍රීක භූමි ප්‍රදේශයක්. මීගහවත්ත ප්‍රදේශයේ ඉතාමත් සශ්‍රීක කුඹුරු භූමි ප්‍රදේශයක්. අද වනකොට මෙන්න මේ කුඹුරු ඉඩම් යට කරමින් මංතීරු සෑදීමේ ප්‍රතිඵලයක් විධියට ඒ සශ්‍රීක කුඹුරු යායේ ගොවිතැන් කරන්න බැරි ශෝචනීය තත්ත්වයකට පත් වෙලා තිබෙනවා ගරු සභාපතිතුමනි. මේකේ ප්‍රතිඵලයක් විධියට ප්‍රදේශයේ ජනතාවට තමන්ගේ සහල් අවශ්‍යතාවය සපුරා ගන්න පාරිභෝගික ජනතාව විධියට රුපියල් 85 යි, 100 යි එහෙම නැත්නම් පිටරටින් පොන්නි සම්බා ගෙන්වන ඉතාමත් ශෝචනීය තත්ත්වයකට අපේ රට ඇද වැටිලා තිබෙනවා.

ඒ වාගේම මේ පීඩාවට පත් වෙලා ඉන්න ජනතාවට එක පැත්තකින් මන්ද පෝෂණය. අනෙක් පැත්තෙන් නීරක්තිය. තව පැත්තකින් රක්තහීනතාවයේ ගොදුරු බවට පත් වෙමින් පවතිද්දී තව ඉතාමත් අතලොස්සක් වුණු සුළුතරයකට මේ මංතීරු පාවිච්චි කරලා තමන්ගේ අධිපෝෂණය එහෙම නැත්නම් මාංශපේෂිවල තිබෙන අධික තෙල් තැන්පත්වීම අයින් කර ගන්න හැකියාව ලැබිලා තිබෙනවා. හැබැයි, බියගම වැනි ප්‍රදේශයක මංතීරුවකට අද මොක්ද වෙලා තිබෙන්නේ? සවස 06.00 සිට රෑ එළිවෙනකල් සූර්ය තාපයෙන් වැඩ කරන ලයිට් පත්තු වෙලා කිසිම ප්‍රයෝජනයක් ගන්න බැරි ඉතාමත් පහළ අඩියකට වැටිලා තිබෙනවා. හැබැයි ඉතාමත් දුෂ්කර ප්‍රදේශවල ජනතාවට

කළුවරේ එළියට බහින්න බැහැ. සතා සිවුපාවාට ගොදුරු වෙනවා. ඒ වාගේම අලි උවදුරට ගොදුරු වෙනවා. අලි වැටක් ඉදි කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම තව පැත්තකින් සර්ප දෂ්ඨයට ගොදුරු වෙමින් පවතිද්දී තමයි එහෙම විදුලි ආලෝකය සම්බන්ධ ගැටළුවක් නැති අර බියගම ප්‍රදේශයේ ඉතාමත් වටිනා සූර්ය ආලෝකය පාවිච්චි කරමින් නිරපරාදේ ආලෝක ශක්තිය පරිසරයට මුදා හරිමින් පවතින්නේ. මෙන්න මෙවැනි තත්ත්වයක් තුළ තමයි අපි දකින්නේ - 2004 දී මේ සභාවට මම මුල්ම අවස්ථාවේදී පැමිණෙන කොට මේ සභාවේ ඉදිරිපස භූමිය ගොවිතැන් කටයුතු කරන ප්‍රධාන භූමියක් බවට පත් වෙලා තිබුණා. අද ඒක පුරන් භූමියක් බවට පත් වෙලා තිබෙනවා පමණක් නොවෙයි. නැවත ඒක වැඩකට ගන්න බැරි ශෝචනීය තත්ත්වයකට පත් වෙමින් පවතිනවා. එතැන හදන්නේ මොකක්ද කියලා අපි අද වනකල් දන්නේ නැහැ. මේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා තමන්ගේ කුඹුරු ඉඩම් බලහත්කාරයෙන් ඒ උවමනාවලට ඇදගෙන තිබෙනවා කියලා. ඒ වාගේම කොළඹ දිස්ත්‍රික්කයේ කුඹුරු ගොඩ කිරීම ගත්තාට පස්සේ මහරගම කුඹුරු අක්කර -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ජනාධිපති අපේක්ෂකතුමා කියනවා ඉඩම් ගොඩ කරනවා -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒක තමයි මම කියන්නේ. මම කියන්නේ මේ කාරණයේ තිබෙනවා, සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමනි මම මේ පැහැදිලි කරන්නේ, ඒ කාරණයට අදාළව. 2002 දී Regaining Sri Lanka වැඩ සටහන යටතේ බස්නාහිර පළාතේ කුඹුරු ඉඩම් ගොඩ කිරීමේ උවමනාව ඉස්සරහාට එනකොට, ඒ වාගේම බස්නාහිර පළාත තුළ තිබෙන වාරි කර්මාන්තය වෙනස් කරන්න ජල කළමනාකරණ පනත එනකොට ඒ උවමනාව යටපත් කරලා දැවැන්ත සමාජ උවමනාවක් ඇති වුණා. ඒ සන්ධාන උවමනාව හරහා මේ රටේ ඒ තත්ත්වයන් පරාජය කරන්න. හැබැයි, අපි ඉතාමත් පැහැදිලිව කියනවා, 2002 Regaining Sri Lanka වැඩ සටහන, එදා යෝජනා කරපු ඒ වැඩ සටහනටත් වඩා ඉස්සරහාට ගිහිල්ලා ජනතාව පීඩාවට පත් කරවමින් සාර්ථකව ඉදිරියට ගෙන යනවා. මේ පුරන් කුඹුරු පමණක් නොවෙයි. හොඳ කුඹුරු ගොඩ කරලා වෙනත් අවශ්‍යතාවයන් වෙනුවෙන් පාවිච්චි කිරීම නිසා ඉතාමත් ශෝචනීය තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. මම මේ කිව්වේ, මහරගම කුඹුරු අක්කර 1044 ක් වගා කළ හැකි ප්‍රමාණය අක්කර 744 ක්. එයින් අද වනකොට ආදර්ශ කුඹුරු යායක් විධියට අක්කර 67 ක භූමි ප්‍රදේශයක් වෙන් කරන්න තීරණය කරලා තිබෙනවා. එයින් ආදර්ශ කුඹුරක් විධියට කිඹුලඇළ ප්‍රදේශයේ තිබෙන අක්කර 25 ක් නඩත්තු කරලා. මේ අක්කර 25 නඩත්තු කරන්න ජල සැපයුම, ජල පෝෂක ප්‍රදේශය සාදන්න ගිහිල්ලා ඒ උවමනාව නිසා අද කුඹුරු අක්කර 744 ක ප්‍රමාණයක් පුරන් බවට පත් වෙමින් පවතිනවා. ඒ ප්‍රදේශයේ ජනතාවට ගොවීන්ට ඒ කුඹුරුවලින් ප්‍රයෝජන ගන්න බැරි ශෝචනීය තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Electricity and Power, Provincial Roads, Housing and Constructions, Water Supply and Drainage, Social Welfare, Urban and Estate Infractructure Facilities)

ඔබතුමා දන්නේ නැතුව නේ කථා කරන්නේ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

හරි ඔබතුමා ඉන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමැතිතුමා, එතුමාට බාධා කරන්න එපා. තව විනාඩියයි එතුමාට තියෙන්නේ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒ වාගේම කුඹුරු ඉඩම්වල ප්‍රධාන පිට ඇළ, නැත්නම් වක් ඇළ අද වැසිකිළි උතුරා යෑමේ ප්‍රශ්නයට ගොදුරු වීම නිසා පවුල් 500 කට වඩා ප්‍රමාණයකට ඒ ප්‍රදේශයේ ජීවත් වෙන්න බැරි ශෝචනීය තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මෙන්න මේ ආකාරයට මංතීරු සැකසීම, ඒ වාගේම පුරන් කුඹුරු අස්වැද්දීම සිදු නොකිරීම, Regaining Sri Lanka වැඩ පිළිවෙළ වඩාත් හොඳින් මේ ආණ්ඩුව තුළින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් විධියටත්, ඒ තුළ බස්නාහිර

[ගරු අසෝක සපුමල් රන්වල]

පළාත් සභාව ඒ පුරන් කුඹුරු අස්වද්දන්න හෝ එහෙම නැත්නම් Regaining Sri Lanka වැඩ පිළිවෙළ පරාජය කරන්න නිසි ක්‍රමවේදයක් ඉදිරිපත් නොවීම නිසාම මේ ශෝචනීය තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මම පුංචි උදාහරණයක් කියන්නම්. කැස්බෑව ප්‍රදේශයේ කැස්බෑව වැව. ඒ කැස්බෑව වැවේ බන්ට් එකේ ඇතුල් පැත්තේ මංතීරු සකසන්න ගම්පහ දිස්ත්‍රික් ඉංජිනේරුවරියට එන්න කියනවා. කොළඹ දිස්ත්‍රික්කයේ ඉංජිනේරුවරියට එන්න කියනවා. කළුතර දිස්ත්‍රික්කයේ ඉංජිනේරුවරයාට එන්න කියනවා. මේ කට්ටිය එකතු වෙලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මට පොඩි විනාඩියක් දෙන්න ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය දෙන්න අමාරුයි මන්ත්‍රීතුමා. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මෙන්න මේ සියලු දෙනා ඒකරාශී වෙලා කරන සම්මන්ත්‍රණයක ප්‍රතිඵලයක් විධියට කැස්බෑවේ වැවේ වේල්ලේ ඇතුල් පැත්තෙන් මංතීරු සකසන්න තමයි තීරණය ගන්නේ. මේකට විරුද්ධ වුණු, මේක අනුමත නොකරපු, තමාගේ විෂයය පථයට අදාළ නොවෙනවා කියලා වාරිමාර්ග ඉංජිනේරුවරිය සඳහන් කරද්දී, ඒ ඉංජිනේරුවරියගේ වැඩ තහනම් කරනවා. මොකක්ද මේ උවමනාව? මධ්‍යම රජයේ ප්‍රධාන උවමනාවක් බවට පත් වෙලා තිබෙන කුඹුරු ඉඩම් ගොඩ කරලා මංතීරු හදලා, එහෙම නැත්නම් වෙනත් අවශ්‍යතාවයන්වලට පත් කරලා බස්නාහිර පළාතේ කුඹුරු ඉඩම් විනාශ කිරීමේ උවමනාව මත පදනම්ව තමයි මේ ක්‍රියාවලිය සිද්ධ වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මට තව විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය දෙන්න අමාරුයි. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

එතකොට මෙන්න මේ තත්ත්වයත් එක්ක තමයි අපි දකින්නේ කෘෂිකර්මාන්තය ශෝචනීය තත්ත්වයකට පත් වෙලා තිබෙනවා කියලා. පරිසරය ගත්තත් එහෙමයි. විශේෂයෙන්ම මම සිටින දොම්පේ ප්‍රදේශයේ අද කඳු ගත්තාට පස්සේ ඉතාමත් බරපතළ පරිසර හානියකට පත් වෙලා තිබෙනවා. බොහෝ කඳු ඇත ඉදලා ගත්තාට පස්සේ එක පැත්තක විතරයි කන්දේ කොළ පාටට තියෙන්නේ. අනෙක් පැත්ත හරියට අංශක 90 කින් කපලා ඉවර වෙලා ඉතාමත් ශෝචනීය ඉරණමකට පත් කරලා තිබෙනවා. දොම්පේ ප්‍රදේශයේ දේශපාලන අධිකාරියේ බල උවමනාව පෙරදැරි කරගෙන. මෙන්න මේ සියලු තත්ත්වයන් එක්ක අද වන විට කෘෂිකර්මාන්තය බරපතළ ශෝචනීය තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් විධියට අද මේ කෘෂිකර්මාන්ත විෂයයට අදාළව 2014 කටයුතු කරපු කෘෂිකර්මාන්ත අමාත්‍යවරයාත් මේ සභාවේ නැහැ. ඒ වගකීම ගරු ප්‍රධාන ඇමැතිතුමා ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒ නිසා මම නැවත නැවතත් -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එතුමාට විනාඩි 02 ක කාලයක් ලබා දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඒ විනාඩි දෙකක් ගිහිල්ලා ඉවරයි. ඔබතුමා වැඩිපුරත් කාලය ගත්තා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

තව විනාඩි දෙකක් හම්බ වෙලා තිබෙනවා. මෙවැනි Regaining Sri Lanka වැඩ පිළිවෙළ දිගින් දිගටම ගෙනියන්න අද වනකොට බස්නාහිර පළාත් සභාවත් කටයුතු කරලා තිබෙන තත්ත්වයක් තමයි තිබෙන්නේ. මෙන්න මෙවැනි කුඹුරු ඉඩම් ගොඩ කරලා වෙනත් අවශ්‍යතාවයන්වලට යෙදවීමට විරුද්ධව ජනතාව ලොකු අරගලයක් කරද්දී, ඒ කුඹුරු ඉඩම් ගොඩ කිරීමේ උවමනාව තිබෙන පුද්ගලයින් අද ප්‍රකාශ කරන ප්‍රධාන කාරණයක් බවට පත් වෙලා තිබෙනවා, මට මේ කුඹුර ඕනෑත් නැහැ. මම මේක බැසිල් රාජපක්ෂ ඇමැතිතුමාට විකුණනවා කියලා. බැසිල් රාජපක්ෂ ඇමැතිතුමාගේ මේ හස්තය මඟින් ඒ අයගේ උවමනාවට මේක බලහත්කාරයෙන් යොදවලා සමාජ උවමනාව පැත්තකට දාලා ඒ පටු උවමනාවන් ඉෂ්ට කරගන්න නාගරික සංවර්ධන අධිකාරිය ආරක්ෂක අමාත්‍යාංශයට ගැට ගහලා තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරියේ විෂයය පථය ආරක්ෂක අමාත්‍යාංශයට සම්බන්ධ වෙන්නේ කොහොමද කියලා මේ සභාව තුළ ප්‍රශ්න කරනවා. අඩුම තරමින් ඒක මධ්‍යම ආණ්ඩුවේ මධ්‍යම පරිසර අධිකාරියට සම්බන්ධ කළා නම් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. සම්බන්ධ කරලා තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයට. මේ යකඩ සපත්තුවේ හස්තය තුළින් ජනතාව පීඩාවට පත් කරලා, ජනතාවගේ එදිනෙදා ප්‍රධාන අවශ්‍යතාවයක් වුණු සහල් අවශ්‍යතාවය පැත්තකට තියලා වෙනත් පෞද්ගලික අවශ්‍යතාවයන් ඉතාමත් සුළුතරයකගේ පිනවීම සඳහා කොළඹ ප්‍රදේශය ඇතුළු ගම්පහ, කළුතර ප්‍රදේශයේ ඉතාමත් සශ්‍රීක කුඹුරු යායවල් පුරන් වෙන්න අරින තත්ත්වයක් තමයි උද්ගත වෙලා තිබෙන්නේ. ඒ වාගේම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට එතුමා කිව්වා, මේ සභාව දැන් තුරුණු වියේ තියෙනවා කියලා. ඇත්තෙන්ම මේ ප්‍රකාශ වෙන්නේ, 1978 හඳුන්වා දුන් විවෘත ආර්ථිකය එදාටත් වඩා හොඳින් මේ ආණ්ඩුව ඉදිරියට ගෙන යෑමේ කොල්ලකාරී ආර්ථික තුළ පෞද්ගලික ආර්ථික උවමනාවන් පෙරදැරි කරගෙන, එකිනෙකා හඹාගෙන යන සමාජ ව්‍යුහය තුළදී මේ අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ ගොවි ජනතාවයි. ඒ වාගේම කෘෂිකර්මාන්ත විෂයය ගත්තාට පස්සේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මට විනාඩි දෙකක් ලැබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ කාලයත් දීලා තියෙන්නේ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මෙන්න මෙවැනි ශෝචනීය තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම මෙන්න මේ තත්ත්වයන් අපට කථා කරන්න 2014 වර්ෂයේ මේ සභාව තුළ කටයුතු කරපු කෘෂිකර්මාන්ත විෂයයට, පරිසර විෂයයට ඒ වාගේම වාරි කර්මාන්ත විෂයයට අදාළ ඇමැතිවරයා අද නැහැ. ඒ වගකීම ගරු ප්‍රධාන ඇමැතිතුමා අරගෙන තිබෙනවා. ඒ සම්බන්ධව අපි ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා දැන් -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේ Regaining Sri Lanka වැඩ පිළිවෙළ නවත්වලා මේ රටේ පුරන් කුඹුරු අස්වද්දලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පළාත් සභාවේ හිටපු ජ්‍යෝෂ්ඨ මන්ත්‍රීවරයෙක්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

කටයුතු කරගෙන යන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතිය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊයේත් ඒ වාගේම ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් කථා කළා. කියන එක අහන්නේ නැතුව. මම ඉතාමත් ගෞරවයෙන් සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, මේ වනවිට අපි සභාව ආරම්භ කරන්න විනාඩි 25 ක් ප්‍රමාද වුණා. මගේ වරදක් නොවෙයි. මම නියමිත වෙලාවට ආවා. නමුත් ගරු ප්‍රධාන ඇමැතිතුමා සහ තවත් මන්ත්‍රීවරු තුන්දෙනයි මේ පරිශ්‍රයේ හිටියේ. ඔක්කෝම හතර දෙනයි හිටියේ. ඒ නිසා නියමිත වේලාවට සභාව පවත්වා ගන්න නොහැකි වුණා. ඒ නිසා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඉදිරි කාලයේදී මූලාසනයට ගරු කරලා නියමිත වේලාවට කථාව අවසන් කරන්න. නැත්නම් අද පෙ.ව. 11.00 ට අපට ඡන්දයට යන්න අමාරු වෙනවා. එහෙම නැත්නම් අනෙක් කථීක මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වෙනවා. අදාළ කාලය ලබා දෙන්න බැරි වෙනවා. ඒ නිසා මම ආණ්ඩු පක්ෂයෙන් සහ විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, නියමිත කාලයට කථාව අවසන් කරන්න කියලා. ඉසුරු දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 07 ක කාලයක් වෙන් වී තිබෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ ඔබතුමා කලින්ම කිව්වා නම් ඉවර නේ? ආයිත් දෙපාරක්. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබියදී.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මට පොඩි වෙලාවක් දෙන්න වරප්‍රසාද ප්‍රශ්නය මතු කරන්න. මම මේ සභාවේ මන්ත්‍රීවරයෙක් විධියට කටයුතු කරද්දී මාධ්‍යවලට මම ප්‍රකාශයක් කළා කියලා ඒ සම්බන්ධව ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් මට ලිපියක් එවලා තිබෙනවා. ඒ ලිපිය මම සභාගත[1] කරනවා.

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

ප්‍රකාශයක් ලබා ගැනීමට කැඳවීම,

2014.11.03 වන දින රන් FM ගුවන් විදුලි සේවයට ප්‍රකාශයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔබගෙන් ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා 2014.12.09 වන දින විමර්ශන අංශයට කැඳවන මෙන් කළමනාකාර ආරක්ෂක විසින් මා වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. එම නිසා ඉහත ප්‍රකාශය ලබා දීමට 2014.12.09 වන දින පෙ.ව. 09.00 ට ප්‍රධාන කාර්යාලයේ විමර්ශන අංශය වෙත නොවරදවා වාර්තා කරන මෙන් මෙයින් දන්වා සිටිමි.

මේ සභාවේ මන්ත්‍රීවරයෙක් විධියට ගුවන් විදුලියට එහෙම නැත්නම් FM Channel වලට අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය මට තිබෙනවා. ඒ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය නැති කරන්න, ඒක මර්දනය කරන්න, යටපත් කරන්න ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ අදාළ බලධාරීන් කටයුතු කරලා තිබෙනවා නම් ඒ සම්බන්ධව මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සහ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ගැන අපි බලන්නම්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒ සම්බන්ධව ක්‍රියාත්මක කිරීම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ලිපිය සභාගත කරන්න. මම ඒ ගැන -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක විමර්ශනයක් නේ?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට මාව ගෙන්නන්න බැහැ. ඕනෑම නම් ශ්‍රී ලංකා පොලීසියට මාව ගෙන්නන්න පුළුවන්. ඒක නිසා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒ අවස්ථාවේ එහි සේවකයෙක්ද අපි දන්නේ නැහැ නේ?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

පූර්ණ කාලීනව නිදහස් වෙලා සිටින නිලධාරියෙක් විදියට මේ සභාවේ කටයුතු සම්බන්ධයෙන් හෝ මේ සභාවේ ඔබතුමා වෙනුවෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ලේකම්තුමාට උපදෙස් දෙනවා ඒ සම්බන්ධව වාර්තාවක් ලබා ගෙන -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේ සම්බන්ධව ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ මානව සම්පත් කළමනාකරණ මහතාගෙන් විමසා එහෙම කිරීමේ අයිතියක් නොමැති බවට පැහැදිලි කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ලිපිය සභාගත කරන්න. මම ඒ ගැන සොයා බලන්නම්. සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[පූ.භා. 09.41]

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතියි. පළමුවෙන්ම අද උදෑසනම අදහස් දැක් වූ අපේ අශෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශයකින් මේ විවාදයේ කටයුතු ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ආරම්භ කරන්න මා සූදානම්. එතුමා සඳහන් කළා, මහරගම ප්‍රදේශයේ ආදර්ශ කුඹුරු යායක් පිළිබඳව. ඒ වාගේම එතුමා සඳහන් කළා, එහි ජලපෝෂිත කලාපය සඳහා කුඹුරු යාය පාවිච්චි කරලා තමයි ජලපෝෂිත කලාපය ඉදි කරලා තිබෙන්නේ කියලා. ගරු සභාපතිතුමනි, මේ කියන ප්‍රදේශය ආශ්‍රිතව වසර ගණනාවක් ඉන්න කෙනෙක් මම. ඒක නිසා මම පෞද්ගලිකව මේ පිළිබඳව දන්නවා. මේ ආදර්ශ කුඹුරු යාය මේ ආකාරයට සකස් කරන්නට මත්තෙන් මේකෙන් 10% ක්වත් වගා කළේ නැහැ. පුරන් වෙලා තිබුණේ. ඉතාම අපිරිසිදු තත්ත්වයෙන් සහ පුරන් වූ තත්ත්වයෙන් තිබුණු මේ අක්කර ගණනාවක කුඹුරු යාය, කිඹුලාවල ආශ්‍රිතව තිබෙන්නා වූ කුඹුරු යාය අද වනවිට ඉතාමත් මනරම් ආකාරයෙන් සංවර්ධනය කරලා තිබෙනවා විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, මේ කුඹුරු යාය වසරකට කන්න තුනක් වගා කරන මට්ටමට ගෙනැල්ලා තිබෙනවා. මේ වසරේ තුන්වැනි කන්නයත් මේ වනවිට වගා කරලා තිබෙනවා. මම දන්නවා ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මේ පිළිබඳව මීට පෙර මේ සභාවේදී කථා කළා. Car Park එකක් මෙතැන ඉදි කරලා තිබීම සම්බන්ධයෙන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා වරද්දගෙන. Car Park -

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

මගේ කථාවට කරුණාකරලා සවන් දෙන්න. මම ඔබතුමන්ලාට බාධා කරන්නේ නැහැ. කරුණාකරලා මම ඉල්ලා සිටිනවා මට බාධා කරන්න එපා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

බොරු කියන්න එපා. ඒ කුඹුරු යාය ඉතාමත් සශ්‍රීක කුඹුරු යායක්.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

අද වනවිට මේ ප්‍රදේශයට ඇති වී තිබෙන්නා වූ ගංවතුර තත්ත්වය පාලනය කිරීමට පමණක් නොවෙයි. මේ කුඹුරු යාය -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒක පුරන් කුඹුරු යායක් නොවෙයි. ඒක 2006 ට කලින් ඉතාමත් සශ්‍රීක කුඹුරු යායක්.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

මම මේ අවස්ථාවේදී ඉතාමත් ගෞරවයෙන් සඳහන් කරන්න කැමැතියි.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

බොරු කියන්න එපා. ඒක පුරන් කුඹුරක් නොවෙයි. 2006 ට කලින් සශ්‍රීක කුඹුරු යායක්.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

මේ අමාත්‍යාංශය යටතේ තිබෙන්නා වූ අනෙකුත් -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

2006 දීත් වගා කළා.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

බලාපොරොත්තු වෙනවා. කරුණාකරලා මගේ කථාවට මට ඉඩ දෙන්න.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. R. Nimal Peiris

ඔබතුමා දන්නේ නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඔබතුමා දන්නේ නැතුව කථා කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

කරුණාකරලා කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මේ සභාව නොමඟ යවනවා. මේක පුරන් කුඹුරු යායක් නොවෙයි. 2006 දීත් ඉතාමත් සශ්‍රීකව වගා කරපු කුඹුරු යායක්.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

මම මේ වෙනුවෙන් කාලය ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා බාධා කිරීම් කරන්න එපා. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. කරුණාකරලා වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ජේ.ආර්. ජයවර්ධන ඒ කුඹුරු ගත්තේ.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

මෙම අමාත්‍යාංශය යටතේ තිබෙන්නා වූ අනෙකුත් විෂයය ක්ෂේත්‍රයන් පිළිබඳව මේ අවස්ථාවේදී අවධානය යොමු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර, සංස්කෘතික හා කලා කටයුතු කියන මේ අමාත්‍යාංශ විෂයය ක්ෂේත්‍රය යටතේ විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා කලා සහ සංස්කෘතික කියන විෂයය ක්ෂේත්‍රයන් පිළිබඳව. අපට පේනවා අද සමාජයේ විශේෂයෙන්ම, මහජන නියෝජිතයින් පවා අවිචාරවත් ලෙස හැසිරෙනවා. ඔවුන්ට සංස්කෘතික පදනමක් නැහැ. ඒ නිසා වාචාලයෝ වාගේ හැසිරෙන්නට පටන් අරගෙන තිබෙනවා. වෙන කෙනෙකුගේ මතයක් අහගෙන ඉන්න සූදානම් නැහැ. වෙන කෙනෙක් කියන දෙයක් අහගෙන ඉන්න සූදානම් නැහැ. මේ අය අවිචාරවත් විධියට, පිස්සෝ වාගේ, ගාල කඩා ගත්තු හරක් රැලක් වාගේ සමහර වෙලාවට හැසිරෙන්නේ. මේකට හේතුවක් තිබෙනවා. එදා 1978 මේ රටට විවෘත ආර්ථීක ප්‍රතිපත්තිය එක්සත් ජාතික පක්ෂය හඳුන්වා දීපු වෙලාවේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා

කිව්වේ මොකක්ද? Let the lord barons to come. කොල්ලකාරී සිටුවරුන්ට එන්නට ඉඩ හරින්න. මේ රටට විජාතික බලවේගයන් සියල්ලටම එන්න එදා දොරටු විවර කරලා දැම්මා. ඒකේ ප්‍රතිඵලයක් විධියට බටහිර සංස්කෘතිය මේ රටට ආවා. බටහිර කලා නිර්මාණ මේ රටට ආවා. ඒ වාගේම හොඳ දේවල් තිබෙනවා වාගේම වැරැදි දේවලුත් තිබෙනවා. ඒ වැරැදි දේවල්වල ප්‍රතිඵලයක් විධියට අපි දැක්කා ගෙවුණු අවුරුදු 30 ක 40 ක කාලය තුළ අපේ සමාජය ඇතුළේ සංස්කෘතිකමය වශයෙන් විශාල පරිහානියක් සිද්ධ වුණා. මේ සංස්කෘතිකමය පරිහානිය රැක ගැනීම සඳහා විශේෂයෙන්ම බස්නාහිර පළාතේ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය විශාල කාර්ය භාරයක් සිදු කරනවා.

විශේෂයෙන්ම එළැඹෙන වසර සඳහා ඔවුන් යෝජනා කර තිබෙන්නා වූ යම් යම් වැඩ පිළිවෙළ පිළිබඳව මම මෙම සභාවේ අවධානය යොමු කරන්න සූදානම්. මෙතැන විශේෂයෙන්ම සඳහන් කරලා තිබෙනවා, දහම් පාසල් අධ්‍යාපනයේ සංවර්ධනය පිළිබඳව. වැය කරන්නට බලාපොරොත්තු වන්නා වූ ප්‍රතිපාදන පිළිබඳව. මා විශ්වාස කරනවා, යම්කිසි සභාවක තවත් කෙනෙක් කථා කරනකොට ඒකට සවන් දෙන්නට තරම්, ඒවාට සවන් දීලා තර්කානුකූලව ඒකට අවශ්‍ය අවස්ථාවේදී කථා කරන්නට තරම් කිසියම් කෙනෙකුට අධ්‍යාපනයක් නැහැයි කියන්නේ ඒ මිනිස්සු දහම් පාසලකටවත් ගිහිල්ලා නැහැ. දහම් පාසල් අධ්‍යාපනය මේ අවිචාරවත් අයට ලබා දුන්නා නම්, සමහර විට මේ අය මේ වාගේ හැසිරෙන්නේ නැහැ. ඒක නිසා අපි ස්තුතිවන්ත වෙනවා, ලබන වසරේ මේ අමාත්‍යාංශය යටතේ දහම් පාසල් අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා දහම් පාසල් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා දහම් පාසල් ගුරුවරුන්ගේ සංවර්ධනය සඳහා විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. මම විශ්වාස කරනවා මේක ඉතාමත් හොඳ තත්ත්වයක්. අඩුම තරමින් මේ අයට බැරි වුණු එකේ මේ අයගේ දරුවෙක්වත් දහම් පාසලකට යවලා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දහම් පාසල් යවන්න.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ජීවත් වෙන්නට අවශ්‍ය පසුබිම සලසා දෙන්නට මේ අමාත්‍යාංශය කටයුතු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි. තවත් විෂයයක් ගැන මම සඳහන් කරන්න කැමැතියි. කලාව සහ සංස්කෘතිය. කලාව සහ සංස්කෘතිය පිළිබඳව මේ අමාත්‍යාංශය යටතේ (බාධා කිරීමක්) වැඩ පිළිවෙළක් යොදලා තිබෙනවා. ඒ යටතේ මම විශේෂයෙන්ම සඳහන් කරනවා, දේශීය කලාත්මක අංගයන් පිළිබඳව. මෙතැන සඳහන් කරලා තිබෙනවා, පාරම්පරික ප්‍රවීණ ගම්මඩු සහ දෙවොල්මඩු ශිල්පීන් තෝරාගෙන ගම්මඩු හෝ දෙවොල්මඩු ශාන්ති කර්ම පැවැත්වීම. කෙටි නාට්‍ය කලාව ප්‍රවර්ධනය සඳහා ආධුනික පුහුණු කිරීම් සහ සවිබල ගැන්වීම. මෙවැනි වැඩ පිළිවෙළවල් සමාජයක් ඉස්සරහාට යද්දී ඒ සමාජයේ මිනිස්සුන්ගේ මානසික තත්ත්වය සංවර්ධනය කිරීමට, ඒ සමාජයේ මිනිස්සුන්ගේ යහපත් ආකල්ප වර්ධනය කිරීම සඳහා කලාත්මක සංවර්ධනය වැදගත් වෙනවා. ඒ වාගේම අපේ වාගේ රටක අනාදිමත් කාලයක සිට පවත්වාගෙන එනු ලබන කලාත්මක අංගයන්, විශේෂයෙන්ම අපේ සමාජයට ගැළපෙන, අපේ ජන සමාජයේ සිතුම් පැතුම්වලට ගැළපෙන ඒ කලාත්මක අංගයන් ඉදිරි අනාගතයට ගෙන යෑම සඳහා මෙවැනි දේවල් සංවර්ධනය කිරීම ඉතාමත් වැදගත් වෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. මේ අමාත්‍යාංශය යටතේ තවත් සුවිශේෂී කාර්ය භාරයක් පිළිබඳව දක්වලා තිබෙනවා. ඒ තමයි බස්නාහිර පළාතේ ආගමික සිද්ධස්ථාන සංවර්ධනය කිරීම. අපි දන්නවා ආගමික සහජීවනය තුළ, ආගමික හැදියාව තුළ සමාජයක් ඉදිරියට යොමු කරනවා. ගාල කඩාගත්තු හරක් රැලක් වාගේ කැඟහන මිනිස්සුන්ව නියමාකාරයෙන් යහපත් සංවර්ධන මාර්ගයක් කරා යොමු කිරීමට ඔවුන්ව ආගමික මාර්ගයක් වෙත යොමු කිරීම පිළිබඳව ඉතාමත් වැදගත් කාර්ය භාරයක් ඉෂ්ට කරන්න පුළුවනි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශය යටතේ බොහෝ දෙනෙක් අවධානය යොමු නොකරන්නා වූ විෂයය ක්ෂේත්‍රයන් දෙකක් වන සංස්කෘතික හා කලා කියන විෂයය ක්ෂේත්‍රයන් දෙක යටතේ එළැඹෙන වසරේදී මේ අමාත්‍යාංශය යටතේ කරන්නට බලාපොරොත්තුවෙන් සිටින්නා වූ මෙම ව්‍යාපෘති, මම හිතන්නේ අපේ සමාජයට -

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. R. Nimal Peiris

බුද්ධ සරණං ගච්ඡාමි.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ඉතාමත්ම යහපත් ප්‍රතිඵල ගෙන දෙන්නක් බව විශ්වාස කරමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෙතුමා පළාත් සභාවට එන්න කලින් කිව්වා පළාත් සභාව ඌරු කොටුවක් කියලා. දැන් ඌරු කොටුවට දහම් පාසලක් දාන්න හදන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මගේ අසුන් ගැනීම පිළිබඳව මට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. දවස ගාණේ මගේ ස්ථානය මාරු වෙමින් තිබෙනවා. මම මේ සභාවට ආවේ 1999 අවුරුද්දේ. මම ඇමැතිකම කළේ 1999 අවුරුද්දේ. ඉතින් තවම ගම්මන්පිල මැතිතුමා ඇමැතිකම කරලා, පළාත් සභාවට ඇවිල්ලා අවුරුදු 06 යි. එතුමා ඇමැතිකම් කරලා තිබෙන්නේ අවුරුදු 05 යි. හැබැයි එතුමාගේ ආසනය මට කලින් පනවලා තිබෙනවා. ඒ වාගේම සුනිල් ජයමිණි ගරු මන්ත්‍රීතුමා, ලලිත් වනිගරත්න හිටපු ඇමැතිතුමා ඒ සියලු දෙනා ඊට කලින් සභාවට ආපු අය. ඉතින් අසුන් පැනවීමේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මේ බෝඩ් එක එහාට මෙහාට යනවා. මේක ස්ථිර තැනක තියන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කැපිලි. කැපිලි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

නිසි තැනින් තියන්න අපට වාඩි වෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා කොමියුනිස්ට් නේ? කැපිල්ල තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, මම ඒ ගැන සොයා බලන්නම්. අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා නම් එහෙම අපි ඒක නිවැරදි කරන්නම්. මම දන්නවා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම ඔබතුමාට හිටපු ඇමැතිවරයෙක්. රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.50]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

සුභ උදෑසනක් ගරු සභාපතිතුමනි. කරුණාකරලා මම පොඩි ඉල්ලීමක් කරනවා. අපි කාටවත් බාධා කරන්නේ නැති නිසා අපට අවස්ථාව ලබා දෙන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඒක මම විශේෂයෙන්ම -

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

දැන් පොඩ්ඩකට කලින් අපට නම් කෑගහනවා දැක්කා. අපිත් හැබැයි මෙච්චර කල් කෑගහලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කාටවත් බාධා කිරීම් කරන්නේ නැහැ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔබතුමාට කථා කළේ, ඔබතුමා ගම්පහ ඉඳගෙන කොහොමද මෙහේ ගැන කථා කරන්නේ කියලා.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

නැහැ, පළාත් සභාවක් වුණාම පොදුවේ බලනවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

කොඩිකාර ඇමැතිතුමා හරි, නිමල් පීරිස් මන්ත්‍රීතුමා හරි -

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

අපි පළාත් සභාව ගැන පොදුවේ බලනවා.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. R. Nimal Peiris

අපේ ඉඩම්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී නොවෙයි. බස්නාහිර පළාත් සභා මන්ත්‍රී.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

මම බස්නාහිර පළාත් සභා මන්ත්‍රී. ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී නොවෙයි නේ ගරු මන්ත්‍රීතුමා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මගේ වෙලාව. මට අවස්ථාව දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා. විපක්ෂයේ මන්ත්‍රීවරුත් එතුමාට බාධා කරනවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, ජනගහනයෙන් 74% ක් ඉන්නේ ගොවීන්. ඒ 74% නුත්, 54% ක් ඉන්නේ වී ගොවීන්. ඉන්දියාවේ මුළු අමාත්‍ය මණ්ඩලයම ඉන්නේ 24 යි. නමුත් ලංකාවේ කෘෂිකර්මාන්තයට පමණක් පළාත් සභා සහ මේ සියලුම දේවල් එකතු වුණාම 23 දෙනෙක් ඉන්නවා. එහෙත් මම හිතන්නේ, ගොවියාට නම් සහනයක් වෙලා තිබෙනවා කියලා හිතන්න බැහැ. විමධ්‍යගත කිරීම් මත ගොවීන්ට නිසියාකාර සේවාවක් ඉටු වෙලා තිබෙනවා කියලා අපට හිතන්න බැහැ. හැමදාමත් වවන්නෝ හිඟන්නෝ බවට පත් වෙලා, විකුණන්නෝ ප්‍රකෝටිපතියන් බවට පත් වෙලා තිබෙනවා ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම වී විකුණන්නා හිඟන්නා. හාල් විකුණන්නා ප්‍රකෝටිපතියා බවට පත් වෙලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි හැමදාමත් අපේ පරිසරය පිළිබඳව අවධානය යොමු කරනවා. (බාධා කිරීම්) මගේ අවස්ථාවේදී කථා කරනවා නම් ගරු මන්ත්‍රීතුමනි, මට ඒ සඳහා වෙලාව අවශ්‍යයි.

දැන් අපි වාහනයක් ගත්තොත් එහෙම මේ වාහන සඳහා අනිවාර්යයෙන්ම දුම් සහතිකයක් ලබා ගත යුතුයි. පරිසරයට සිදු වන්නා වූ හානිය පිළිබඳව. නමුත් මේ වී වගාවේදී සහ කෘෂිකර්මාන්තයේදී පාවිච්චි කරන්නා වූ රසායන ද්‍රව්‍ය පිළිබඳව, ඒකෙන් සිදු වන්නා වූ හානිය පිළිබඳව කිසිදු සොයා බැලීමක් කරන්නේ නැහැ. අඩුම තරමින් අපි වාහනයක් ගත්තොත් ඒ වාහනය හොඳ තත්ත්වයේ තිබෙනවාද කියලා පරිසර බලපත්‍රයක් ගන්න ගියොත් - මම එක සැරයක් කොට්ටාවෙන් මගේ වාහනයට ගන්න ගියාම එතැනදී කිව්වා, මේකේ ප්ලග්ස් වෙනස් කරලා එන්න ඕනෑ කියලා. මම ඊට පස්සේ ආපහු රවුමක් කාරිය ගහලා බැලුවා. හැම තැනම වහලා. මම ඒක වෙනස් කළා කියලා ආපහු ආවා. ආපහු ආවට පස්සේ කොට්ටාවේදී ඒක සමත් වුණා. මම ඇහුවා මම කිසි දෙයක් කළේ නැහැ නේ? මේකේ කිසිම වෙනසක් කළේ නැහැ නේ? මම කිව්වා, එහෙම නම් බෝඩ් එකක් ගහලා තියන්න ඕනෑ රවුමක් ගහලා එන්න කියලා. නැවත වතාවක් ඒ වාහනයෙන්ම ඊළඟ අවුරුද්දේ මම එතැනට ගියා. ගරු සභාපතිතුමනි, කොට්ටාවේදී ඒක අසමත්. මම හෝමාගමට ගිහිල්ලා ගත්තා. අර කොළ පාටට තියෙන්නේ Evergreen ද මොකක්ද කියන එකෙන්. ඒකෙන් සමත්. මම ප්‍රවිෂ්ටයක් ගත්තේ කෘෂිකර්මාන්තය සඳහා සිදු වන්නා වූ හානි පිළිබඳව සොයා බැලීමක් කරන්නේ නැහැ මේ රසායන ද්‍රව්‍ය යෙදවීමෙන්. නමුත් වාහනයකින් දුම් පිටවීමෙන් සිදු වන්නා වූ හානිය පිළිබඳව මහ සොයා බැලීමක් කරනවා.

මේක පරිසරය පිළිබඳව කථා කරන නිසා මම හිතනවා, විශාල වශයෙන් ඒ පිළිබඳව සැලකිල්ල යොමු කිරීමක් කරන්න ඕනෑය කියලා. මේ අංශ තිබීම අවශ්‍යද කියන එක පිළිබඳව. ගරු සභාපතිතුමනි, ඇත්තටම ගොවීන් රැකියා ඉල්ලන්නේ නැහැ. ඔවුන් හැම වෙලාවේම හැම්බෙකන් වාගේ දේවල් ඉල්ලන්නේ නැහැ. වතුර, එහෙම නැත්නම් ගංවතුර පාලනයයි, බීජ පිළිබඳවයි. ගරු සභාපතිතුමනි, අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා එතුමාගේ 2014 කථාවේදී ප්‍රකාශ කරලා තිබුණා ගොවීන් සඳහා අවශ්‍ය කරන වෙළඳ පොළක් හදලා දෙනවා කියලා. නමුත් මම හිතන්නේ ඒ වෙළඳ පොළ තවමත් නැහැ. ගම්පහ ප්‍රදේශයේ නම් ඇති.

[ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්]

මම දැනුවත්ව නම් මෙහේ අවශ්‍ය සුලභ ලෙස තමන්ට ඇවිල්ලා විකුණා ගන්න පුළුවන් තත්ත්වයේ පසුබිමක් හැදිලා නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

හදලා තියෙන්නේ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ නිසා ගරු සභාපතිතුමනි, අලෙවි කර ගැනීමේ අපහසුතාවයෙන් ඉන්නවා. එතකොට හෝමාගම, මීපේ, අවිස්සාවේල්ල වාගේ ඉන්න අය බත්තරමුල්ලට එන්න ඕනෑ මේ බඩු ටිකත් අරගෙන විකුණගන්න. එතකොට වෙළඳ ඒකාධිකාරිය යටතේ එතැන ඒ කටයුත්ත කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ ගරු සභාපතිතුමනි. ඒ නිසා දිවි නැගුම හරහා එවන්නා වූ - මගේ කාලය. මම වෙනත් දේවල් කථා කරන්න යන්නේ නැහැ. දිවි නැගුම මගින් අපේ ප්‍රදේශවල බෙදලා තිබෙන -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දිවි නැගුම සතිපොළ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

සතිපොළ. හරි සමාවෙන්න. ඒවත් එක්ක දීලා තිබෙන බීජ පිළිබඳව කථා කළොත් එහෙම දීලා තියෙන්නේ මැකරල්. එන්නේ සෝයා බෝංචි. මම දන්නේ නැහැ මොනවාද කියලා. ඒකේ ඉන්නේ වෙනත් ජාතියේ දේවල්. ගරු සභාපතිතුමනි, මේ අවධානය යොමු කරන්නේ ඒ පිළිබඳව. ඒ වාගේම තමයි රජය ඉදිරිපත් කරලා තිබෙනවා බීජ පනත. ගරු සභාපතිතුමනි, ඒ බීජ පනත ඉතාමත් භයානක එකක්. දැන් ලංකාවේ ගොවීන්ට තමන්ගේ බීජ, ඉස්සර තිබුණා -සාමාන්‍යයෙන් මා දිහා බැලුවාම හිතෙන්න පුළුවන් යුරෝපීය ගතියක් තිබෙනවා කියලා. නමුත් මගේ දෙමව්පියන්ගේ පාර්ශවයේ එහෙම එකක් නැහැ. මම හිටියේ කන්තලේ. එහේ අපේ ඉඩමක් තිබෙනවා. එහේ වගා කිරීම තමයි ගොඩක් දුරට අපේ දෙමව්පියන්ගේ පැත්තෙන් කළේ. ඉතින් දැන්

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මහරගමට ඇවිල්ලා තමයි -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

අනිවාර්යයෙන්ම. ඔබතුමන්ලා නිසා තමයි. ඉතින් මෙහේ ගත්තාම ගරු සභාපතිතුමනි, මේ බීජ පනත යටතේ ගොවීන්ට තමන්ගේ බීජ තමන්ට ඕනෑ විධියට හදා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ පාලනය කිරීම, ජානගත කිරීම නිසා අමුතු ආකාරයේ නිෂ්පාදන තමයි හැදෙන්නේ. එක්කෝ අපි ගත්තොත් එහෙම අලි පේර. ජීවිතේට දැකලා නැහැ පේර ගෙඩියක්. මෙන්න සයිස් පේර ගෙඩිය. මම හිතන්නේ, මේ විකෘති කළ ජාන ඇතුළත් බීජ ලංකාවට හඳුන්වා දීම නිසා ඉතාමත්ම අහිතකර තත්ත්වයක් තමයි ඇති වෙන්නේ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, දැන් ජල කළමනාකරණ පනත වයඹ සම්මත කරලා තිබෙන්නේ. වයඹ පළාත් සභාව මගින් ජල කළමනාකරණ පනත සම්මත කරලා තිබෙනවා. මේක වැඩි කාලයක් යන්න ඉස්සෙල්ලා ලංකාව පුරාම ගිහිල්ලා ගොවීන්ට වතුර ටිකක් ගන්න හම්බ වෙන්නේ නැහැ. අනිවාර්යයෙන්ම මීටර් දාලා ඉවර වෙලා ඒ අනුව ක්‍රියාත්මක වන තත්ත්වයක් ඇති වෙනවා. මම වැඩිපුර කථා කරන්න හදන්නේ, මට විනාඩියක් වාගේ කාලයක් තිබෙන නිසා.

මම යන්නම් මට අදාළ කාර්ය පිළිබඳව කථා කරන්න. කලාකරුවෙක් හැටියට සංස්කෘතිය හා කලාව පිළිබඳව කථා කරන්න. ගරු සභාපතිතුමනි, අපි එක අතකින් කර්මාන්ත පිළිබඳව සෑහීමකට පත් වෙනවා. අද උදය ගම්මන්පිල හිටපු ඇමැතිතුමා අද මෙතැන නැහැ. එතුමා ඊයේ ප්‍රවේශයක් - මම හිතන්නේ අපි බැහැර වෙලා යද්දී අපට දුන්නා බෑග් එකක්. ඒ බෑග් එක ඇරලා බැලුවාම ෂීට් එකක් තිබුණා. එතුමාගේ නිෂ්පාදනවල, මෙන්න මේවයි අපි කරලා තිබෙන්නේ කියලා කියා පාන්නට වාගේ මැටි වැඩ තිබුණා. මැටි භාණ්ඩ තිබුණා. ඔරලෝසුවකුත් තිබුණා. ඒක හදපු එකක්ද දන්නේ නැහැ. පිටින් ගෙනාපු එකක්ද දන්නේ නැහැ. නමුත් එතුමා යම්කිසි කාර්ය භාරයක් කරන බව ඒකෙන් ඒත්තු ගන්වලා තිබුණා. ඒක දීම තුළින් නොවෙයි. මම මෙවැනි දේවල් කරලා තිබෙනවා කියලා. අද එතුමා නොසිටියත් එතුමා මේක තුළ තවදුරටත් සිටියා නම් මම

හිතන්නේ, මේ කාර්මාන්ත ක්ෂේත්‍රයට ඉතාමත් හොඳින් ඉදිරියට යන්න පුළුවන්කමක් ලැබෙනවා.

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමා යටතේ තිබෙන නිසා පළාත් සභා පාසල් තුළ මේ සෞන්දර්ය විෂයය අධ්‍යයනය කොට සෞන්දර්ය විශ්ව විද්‍යාලයට ගිහිල්ලා, සෞන්දර්ය විශ්ව විද්‍යාලයෙන් පිටතට එන ළමුන් පිළිබඳව ඉතාමත් මහා ශෝචනීය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

පුංචි වෙලාවක් දෙන්න. ශෝචනීය තත්ත්වයක් තිබෙන්නේ. ඇත්තටම ජෝන් ද සිල්වා මාවත ගත්තොත් එහෙම අද චිත්‍ර ශිල්පීන් පාර දිගේ තමන්ගේ චිත්‍ර එල්ලාගෙන අලෙවි කර ගන්න නිසි වෙළඳ පොළක් නැතුව දුක් විඳින තත්ත්වයක් තිබෙන්නේ. අද සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ දරුවාට තමන්ගේ දෛනික ජීවිතය, දෛනික දේවල් එකතු කරගැනීම සඳහා අද එවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. ගරු ප්‍රධාන ඇමැතිතුමා සංස්කෘතිය පිළිබඳව කථා කරනවා. සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා සංස්කෘතිය පිළිබඳව කථා කළා. කලාව පිළිබඳව කථා කළා. කලාකරුවෝ විශාල ප්‍රමාණයක් අද මේ පළාත් සභාවට ඇවිල්ලා ඉන්නවා. ගරු සභාපතිතුමනි, අපට නාට්‍යයක් පුහුණු වෙන්න, නාට්‍ය පුහුණු වීමේ ස්ථානයක් නැහැ. අපට තිබුණු ලුම්බිණිය දැන් ඉවරයි. අපට තිබුණු ජෝන් ද සිල්වා එක ඉවරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

දැන් ඇවිල්ලා තිබෙන්නේ නෙළුම් පොකුණ වාගේ දේවල්. ගරු සභාපතිතුමනි, නෙළුම් පොකුණ වාගේ දේවල් ලොකු ලොකු කලාකරුවන්ට කරන්න පුළුවන් ඇති. නමුත් අපි වාගේ පුංචි කලාකරුවන්ට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ, එවැනි දේවල් කරන්න. ඒ නිසා අපට නාට්‍ය පුහුණු වෙන්න -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සෞන්දර්ය නිකේතනය තියෙන්නේ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

සෞන්දර්ය නිකේතනයේ 500 යි දාන්න පුළුවන්. මේ පොතේම තියෙනවා. සෞන්දර්ය නිකේතනයේ 500 යි දාන්න පුළුවන්. එතැනට ප්‍රේක්ෂකයන් ගෙන්වා ගන්න පුළුවන්කමක් නැහැ. ප්‍රේක්ෂකයෝ ගෙන්වා ගන්න අඩුම තරමේ වෙළඳ පොළ තිබෙන ස්ථානයක් වෙන්න ඕනෑ. ලයනල් වෙන්ට් එක අයිති පෞද්ගලික අයට. පුංචි තියටර් එක අයිති පෞද්ගලික අයට. ඒ නිසා පළාත් සභාවට අයිති වෙලා තිබුණු ලුම්බිණි විද්‍යාලයේ තිබුණු ලුම්බිණි රඟහල. නමුත් ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන්ම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා කලාකරුවන්ට නාට්‍ය පුහුණු වෙන්න - ඈත ගිහිල්ලා රූපගත කරන්න රන්මිණිතැන්න වාගේ දේවල් හදලා තිබෙනවා. ඒ ප්‍රදේශයට හරි යන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

සමාවෙන්න. ඒ නිසා මෙහෙත් ඒ සඳහා පසුබිමක් හදලා දෙනවා නම් හොඳයි කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. කලාකරුවන් සංරක්ෂණය කිරීමේ වැඩ කටයුත්තක් කරනවා නම් ඒකත් හොඳයි කියලා කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී යසපාල කෝරලගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.02]

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කාර්මාන්ත, පරිසර, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට සම්බන්ධ වීමට ලැබීම මම ඉතාමත්ම භාග්‍යයක් කොට සලකනවා. විශේෂයෙන්ම හයවන පළාත් සභාවේ අප නියෝජනය කරන්නේ, එම උපදේශක කාරක සභාව. විශේෂයෙන්ම ගෙවුණු වසර කිහිපයේදීත්, ගෙවුණු මාස කිහිපය තුළදීත් අපට බස්නාහිර පළාතේ ජනතාව අපේක්ෂා කරන සේවාවන් ඉෂ්ට සිද්ධ කර ගන්නට පුළුවන්කමක් ලැබුණා. අවාසනාවන්ත ලෙස, අනපේක්ෂිත ලෙස දේශපාලන හේතුන් නිසා අද විෂයය භාර අමාත්‍යවරයා මෙහි නොසිටියත්, මම හිතන්නේ පළාතේම වගකීම දරන අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා එහි වගකීම භාර අරගෙන කටයුතු කරනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, ඒ පළාතට දෙන නායකත්වය තුළින් ඉදිරි කාලය තුළදී මේ අමාත්‍යාංශය ශක්තිමත් කර ගන්නට අපට පුළුවන්කමක් ලැබෙයි කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට පෙර කථා කරපු මගේ උගත් ඥාති මිත්‍රයා අපේ රොඩ්නි ප්‍රේසර් ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් මට පැහැදිලි වුණේ, ඒ අයත් එක්ක වර්තමානයේ අපේ සන්ධානයෙන් ගිලිහිලා ගිහිල්ලා නව සන්ධානයත් එක්ක එකතු වෙලා තිබෙන - නව සන්ධානය අපේ සන්ධානය වාගේ කියලා කියන්න පුළුවන්කමක් නැහැ. ඒක නිකම් ආඩි හත්දෙනාගේ කැඳ හැලිය වාගේ එකක්. මට නිකම් එතුමාගේ කථාවෙන් පැහැදිලි වුණේ, එතුමා හෙළ උරුමයට පොඩි පහරදීමක් කළා වාගේ. මොකද, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දුම් පරීක්ෂණය කියලා Emanation Test කියලා තියෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට එතැනදී පැහැදිලි වුණේ, එතුමා ඒ අයත් එක්ක සන්ධානගත වුණත් හෙළ උරුමයත් එක්ක පොඩි අවුලක් තිබෙනවා වාගේ. මොකද, දුම් පරීක්ෂණ ආයතනය අපේ ආණ්ඩුවේ ඇමැතිවරයෙකුට සම්බන්ධ ඥාතියෙකුගේ එකක් නොවෙයි. ඒක චම්පික ඇමැතිතුමාගේ ඥාතියෙකුගේ එකක්. මම හිතන්නේ මම දන්න විධියට එක වාහනයක් දුම් පරීක්ෂා කළාම එතුමාටත් යම්කිසි ප්‍රතිලාභයක් ලැබෙනවා. මම හිතන්නේ, ඒක දැනගෙන එතුමා පහරක් එල්ල කළා කියලා -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ කියන්නේ ඔක්කෝම ඥාතියෝ ටික හොරු ටික තියාගෙන ඉඳලා තියෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මට හිතෙන්නේ එතුමා ඒ වාගේ අදහස් කළේ. මට ඒක හිතුනා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔක්කෝම ඥාතියෝ ටික. දැනගෙන තමයි මෙච්චර කල් ඉඳලා තියෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මගේ ළඟ තිබෙනවා ජාතික හෙළ උරුමය ඉදිරි ජනාධිපතිවරයේදී ඉදිරිපත් කරපු ඒ අයගේ යෝජනාවලිය. මේ යෝජනාවලිය තුළින් අපි දන්නවා ජාතික හෙළ උරුමය වෙන අයටත් අත්සන් -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

කෘෂිකර්මය, සංස්කෘතික කටයුතු පිළිබඳව කථා කරන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

සන්ධානයත් එක්ක නොවෙයි. අපි දැක්කා පසුගිය දවස්වල මෛත්‍රී පාලනයක් සඳහා කට්ටිය අත්සන් කරනවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෘෂිකර්මයට අදාළද?

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

එතැන දේශපාලන පක්ෂ තිබුණේ නැහැ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

කෘෂිකර්මයට අදාළද?

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මේ අදාළයි. ඒ නිසා අපට පැහැදිලි වෙනවා සන්ධානයත් එක්ක නොවෙයි ඒ අය අත්සන් කරලා තිබුණේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක. එතකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ පක්ෂයක්. මෛත්‍රීපාල සිරිසේන මහත්තයා එන්නේ අනුන්ගේ පක්ෂයක ලකුණෙන්. ගිය සැරේ පැරදුණු හංසයා උඩ නැඟලා තමයි පීනලා එන්න හදන්නේ. එතකොට දැන් එතැන සන්ධානයක් නැහැ. එහෙම සන්ධානයක් නැති නිකම් පුද්ගලයෙක් එක්ක -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

එක අපේක්ෂකයෙක් එක්ක එහෙම එකක් අත්සන් කරලා මේ රටට දෙන පණිවිඩය මොකක්ද?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අපි මේ සභාවට එන්නේ, අයවැයේදී අහන්න ලැහැස්ති වෙලා එන්නේ අයවැයට අදාළ කරුණු පිළිබඳව සවන් දෙන්න. නමුත් ඒ කරුණු පිළිබඳව නැතිව අපට ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරුන්ගෙන්, වසර ගණනාවක ඉඳලා එන මන්ත්‍රීවරුන්ගෙන් අහන්න වෙන්නේ ඕවා නම් ඇත්තටම අපේ සභාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වැඩිපුර කාලය ගන්න එපා. විෂයයට සම්බන්ධ වෙලා කථා කරනවා නම් වඩා හොඳයි.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ මේ රටේ දීර්ඝ කාලීන ඉතිහාසයක් තිබෙන, මේ රට අවස්ථා කිහිපයකදීම පාලනය කරලා වර්තමානයේ මේ රට වැඩිම කාලයක් පාලනය කරන්න නායකත්වය දුන්නු පක්ෂය. ඒ වාගේම පක්ෂයක් එක්ක අත්සන් කරන්න පුළුවන්. එකේ වගකීමක් තියෙනවා. පුද්ගලයෙක් එක්ක තමයි මෙවර හෙළ උරුමය එහෙම දෙයක් අත්සන් කරලා තිබෙන්නේ. ඉතින් ඉදිරි මැතිවරණයේදී ජාතියට දෙන්න පුළුවන් පණිවිඩය මොකක්ද? දැන් ඒ අයගේ ඉල්ලීම තමයි කොටි ත්‍රස්තවාදය පරාජය කළ හැකිය. එය පරාජය කළ යුතුය. ඒක කරලා තිබෙනවා. ඒක තමයි මේ රටට තිබුණු ලොකුම ප්‍රශ්නය. හෙළ උරුමයේ යෝජනාවේ තිබෙනවා. අපි ඒක ඉෂ්ට කරලා තිබෙනවා. එහෙම ඉෂ්ට කරලා තියෙද්දීත් හෙළ උරුමය අපෙන් ගිලිහිලා ගිහිල්ලා තිබෙනවා. මම අහන්නේ, මෛත්‍රී පාලනයකදී මොකක්ද මේ තුළින් ඒ අයට දෙන්න පුළුවන් පණිවිඩය. මොකක්ද මේ රටේ ජනතාවට පිළිගන්න පුළුවන් වෙන්නේ. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය. ඒ නිසා අපට ඉතාමත් පැහැදිලි වෙනවා, මේ ඉදිරි ජනාධිපතිවරණයේදී සන්ධාන දෙකක් තිබෙනවා. මෛත්‍රී පාලනයක් උදෙසා වූ සන්ධානය. අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුක්ත එක්සත් ජනතා නිදහස් සන්ධානය. එතකොට මේ සන්ධානය තුළ ඉන්න දේශපාලන පක්ෂ. අනු කාණ්ඩ නොවෙයි. මෛත්‍රීපාල ඉන්නේ අනු කාණ්ඩ. අපත් එක්ක ඉන්නේ පක්ෂ. මේ රටේ පිළිගත් දේශපාලන පක්ෂවලින් සැදුම්ලත් සන්ධානයක් ඉන්නේ. ඒ නිසා මේ අත්සන් කළේ කවුද? එම්.ඩී.එස්.කේ. ගුණවර්ධන පක්ෂ නායකයෙක්ද? සෝභිත හාමුදුරුවෝ පක්ෂ නායකයෙක්ද? සෝභිත හාමුදුරුවෝ ගැන මෛත්‍රීපාල අපේ ලේකම්තුමා අපෙන් ඇහුවා නම් අපි කියනවා. මොකද, අපි කෝට්ටේ නේ? අපට මතකයි පළාත් සභා ක්‍රමය පිහිටුවන වෙලාවේදී -

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. R. Nimal Peiris

ඔබතුමා පන්සලේමයි එදා හිටියේ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මම නාගවිහාරේ නොවෙයි. මම රජමහ විහාරේ. ගිවිසුම අත්සන් කරලා ඔයා හැංගිලා ඉන්න කොට ප්‍රේමදාස මහත්තයා අපිත් එක්ක රාජගිරියට ඇවිල්ලා පළාත් සභා ක්‍රමයට විරුද්ධව අත්වැල් බැඳගන්නකොට ඔයගොල්ලෝ හැංගිලා හිටියේ. එදා අපට මතකයි සෝභිත හාමුදුරුවෝ

[ගරු ඉසුර දේවප්‍රිය]

කරන්නේ හැම වෙලේම ජනතාව කුපිත කරන එක. ජනතාව කුලප්පු කරන එක. දැන් උන්වහන්සේ කුලප්පු කළා. මොකක්ද උන්වහන්සේගේ රිසාල්ට් එක. අද උන්වහන්සේට මේ සන්ධානයේ තැනක් තියෙනවාද? උන්වහන්සේට එදා මේක අත්සන් කරන්න වුණේ හිටගෙන. හත් දෙයියනේ අපි තවම ආදරය කරන අපේ ගමේ ඉන්න, අපි ඉතාමත්ම ගෞරව කරන පූජනීය, අතිපූජනීය ස්වාමීන් වහන්සේ කෙනෙක්. නායක හාමුදුරු කෙනෙක්. අපට දුකයි. නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා කියන කථාව ඇත්ත. මොකද, අපේ ගමේ පන්සලක් නේ? අපේ ගමේ පන්සලේ නායක හාමුදුරුවන්ව හිටගෙන තියලා ගිවිසුම් අත්සන් කරනවා. මේ සන්ධානය හදන්න, විකල්ප ජනාධිපති අපේක්ෂකයා බිහි කරන්න කැප වුණු එකම නායකයා. රනිල් වික්‍රමසිංහ මහත්මයා දෙවැනියා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. සෝභිත හාමුදුරුවෝ තමයි මේකේ නිර්මාපකයා. අද නිර්මාපකයාත් කොන් කරලා තිබෙනවා. එහෙම කොන් වෙලා තිබෙන කොට හෙළ උරුමයට පුළුවන්කමක් තිබෙනවාද කොන්ද කෙළින් තියාගෙන මේ රටේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සංස්කෘතික විෂයය. අහගන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

නායකත්වයෙන් බිහි වුණු පක්ෂයක් හැටියට කොන්ද කෙළින් තියාගෙන මේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාට ඇමැතිකම හම්බ වෙන්නේ නැහැ. සලෝචනට දෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මේ කියන යථාර්ථය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දිනේෂ් ගුණවර්ධන ඇමැතිතුමා අපට කිව්වා එයාට දෙන්නේ කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

පැහැදිලි වෙනවා. එක්සත් ජාතික පක්ෂය හෙළ උරුමයේ ආගමනය, හෙළ උරුමය මෛත්‍රීපාල මහත්මයාත් එක්ක අත්සන් කරපු ඒ MU එක ප්‍රතික්ෂේප කරන්න කියන පණිවිඩය තමයි අද රොඩ්නි ප්‍රේසර් ගරු මන්ත්‍රීතුමා මේ අයවැය විවාදයේදී -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා කොච්චර කෑගැහුවත් හම්බ වෙන්නේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

කියන එක මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[පූ.භා. 10.09]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ ජනතාවට වැදගත් වන, කළුතර දිස්ත්‍රික්කයට වැදගත් වන කරුණු කිහිපයක් ගැන මම කාලය අනුව කථා කරනවා. අද තමුන්නාන්සේලා මේ අමාත්‍යාංශය තුළ විශේෂයෙන් වැදගත්කමක් ගන්නා වී ගොවිතැන - බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කය, ගත්තොත් විශාල ප්‍රමාණයක් ජාතික අවශ්‍යතාවයක් හැටියට වී නිෂ්පාදනයට දායකත්වය ලබා දෙන දිස්ත්‍රික්කයක්. අද වී ගොවියාට නියම තැනක් ලබා දීමට කටයුතු කිරීමට අපොහොසත් වෙලා තිබෙනවා මේ රජය ගෙන යන ක්‍රියාමාර්ගය තුළ. විශේෂයෙන්ම පොහොර ලබා දීම ගැන මම කථා කරන්න කැමැතියි. අද ලබා දෙන පොහොර ප්‍රමාණය ගුණාත්මක බවින් ඉතාම පහළ මට්ටමක තිබෙනවා. අනෙක් පැත්තෙන් අද ලබා දෙන පොහොර ප්‍රමාණය අවුරුද්දෙන් අවුරුද්ද ටිකෙන් ටික අඩු කරනවා. ඒ තුළින් වගා කරන ගොවියාට තමන්ගේ ගොවිතැනෙන් නියම අස්වැන්නක් ලබා ගැනීමට නොහැකි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. පසුගිය කන්න දිහා

බැලුවාම මහ කන්නයේ වැඩ කළත් යල කන්නයේ ගොවීන් වැඩ කරන්නේ නැහැ. ඒකට හේතුව ගොවිතැනට යන වියදමෙන්, ශ්‍රමයෙන් තමන්ට ඵලදායීතාවක් නොමැති නිසා විශාල වශයෙන් අද ගොවිතැන අත්හරින තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම අද ගොවිතැනට නැඹුරු වෙන්නේ වැඩිහිටි අය විතරයි. තරුණ ජනතාවගේ කිසිම නැඹුරුවක් ගොවිතැනට නැහැ. මේ තත්ත්වය මේ විධියට ගියොත් අනාගතයේදී ගොවිතැන අපේ රටෙන් තුරන් වෙලා යන තත්ත්වයට පත් වෙනවා. ඒ නිසා අපි අවධානය යොමු කරනවා - විෂයය භාර ඇමැතිතුමා මෙතැන නැහැ. නමුත් අපි මේ සභාවට අවධානය යොමු කරවනවා, තරුණයින් ගොවිතැනට යොමු කර ගැනීම සඳහා යම්කිසි ක්‍රමවේදයක් ගත යුතුයි. ඒ සඳහා විකල්ප මාර්ගයක් වශයෙන් පාසල්වල ගොවි පොළවල් ඇති කිරීම පෙන්වලා තිබෙනවා. පාසල්වල ගොවි පොළවල් ඇති කිරීම තුළින් පමණක් මෙය සාර්ථක කර ගන්න බැහැ. එකක් තමයි ශ්‍රම අභිමානයක් ඇති කරන්න ඕනෑ. අද අපේ රටේ ගොවියාට අතීතයේදී අතිමහත් ගෞරවයක් තිබුණා. ගමේ පිළිගැනීමක් තිබුණා. නමුත් අද ගොවිතැන් කරන පුද්ගලයාව පිළිගැනීමක් නැහැ. ඒ නිසා මේ රටේ ජාතික අවශ්‍යතාවයක් වන බත සැපයීම සඳහා මහත් වෙහෙසක් මහන්සියක් දරන ගොවියාට ශ්‍රම අභිමානයක් ඇති වන ආකාරයටත්, තමුන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න පුළුවන් විධියේ නියමිත මිලකුත් ලබා දුන්නොත් ගොවිතැනට අලුත් පරපුරක් ඇති වෙලා මේ වැඩ පිළිවෙළ දිගට ගෙන යන්න පුළුවන්කමක් ලැබෙනවා කියන එක මම මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන් මේ පොහොර භාවිතය ගැන කථා කරන කොට අද කියනවා, කොම්පෝස්ට් පොහොර භාවිතය වැඩියෙන් කරන්න කියලා. නමුත් ගොවි නියාමක මහත්මයෙකුගෙන් ඇහුවොත් කියන්නේ, කුඹුරු අක්කරයකට කිලෝ 750 ක් දාන්න කියනවා. කිලෝ එකක් රුපියල් 10 ක්, 12 ක්, 15 ක් වෙනවා. එතකොට රුපියල් 7500/- ක විතර පොහොර එක කන්නයකට කුඹුරකට දැම්මොත් එහෙම, ඉතුරු වැඩ ටිකත් කළාම එහෙම විශාල වියදමක් යනවා. ඒ නිසා ගොවිතැනට කොම්පෝස්ට් පොහොර භාවිතය අඩු වෙලා තිබෙනවා.

මම අවධානය යොමු කරනවා. අද ප්‍රාදේශීය සභා මාර්ගයෙන් කොම්පෝස්ට් පොහොර විශාල ලෙස නිෂ්පාදනය කරනවා. ඒ සඳහා ජාත්‍යන්තර ආධාර දෙනවා. පළාත් සභාවෙන් ඒවාට ලක්ෂ ගණන් ආධාර දෙනවා. නියමිත ගොවියන් තෝරා ගෙන සහනදායී ලෙස පොහොර දෙනවා වාගේම මේ කොම්පෝස්ට් පොහොර ලබා දීමේදී අපේ ගොවිතැන් කරන ගොවියාට අඩු මිලකට ලබා දෙනවා නම්, කොම්පෝස්ට් පොහොර භාවිතය වැඩි කරන්න පුළුවන්. නැතුව කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරලා ඒක ව්‍යාපාරයක් වශයෙන් අධික මිලකට විකුණන්න ගියොත් කවදාවත් කොම්පෝස්ට් පොහොර භාවිතය ඇති වෙන්නේ නැහැ. අද දෙන පොහොරවල විශේෂයෙන් ආසනික් වැඩියි. අද පොහොරවල ප්‍රමිතියක් නැති නිසා අඩු මිලට දෙන්න ආසනික් වැඩි කරනවා. එතකොට කුඹුරු තැම්බිලා පොහොර ගතියක් ආවට මාස ගණනක් යනකොට වැලි විතරයි. නිසරු බවින් වැඩි වෙනවා. කුඹුරුවලට

පමණක් නොවෙයි. අද මේ අඩු ගණනට දෙන පොහොරවලින් තේ නිෂ්පාදකයින් ඉතාමත් අමාරුවේ වැටිලා ඉන්නවා. පොහොර ගැහුවාට පස්සේ එක සුමානයයි දළු කඩන්න පුළුවන්. ඊට පස්සේ දළු නැහැ. එන්න එන්න අඩු වෙනවා මිසක් වැඩි වීමක් නැහැ. ඒ නිසා අපි ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා පොහොර භාවිතා කිරීමේදී, පොහොර ලබා දීමේදී ප්‍රමිතියක් තිබෙන වැඩි අස්වැන්නක් ලබා ගන්න පුළුවන් නියමානුකූල පොහොර රුපියල් 350 ට නොවෙයි, රුපියල් 700 ට, 1000 ට වුණත් කමක් නැහැ එලෙස පොහොර ටිකක් ලබා දෙන්න. එහෙම නැත්නම් මේ ගොවිතැන කවදාවත් ගෙන යන්න බැහැයි කියන එක මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි. මම මෙතැනදී දකිනවා, බස්නාහිර පළාතේ පැෂන් ෆෲට් වගාව ව්‍යාප්ත කිරීම සඳහා දස ලක්ෂ 2.9 ක් වෙන් කරලා තිබෙනවා. බස්නාහිර පළාතේ ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනයට 5.10 ක් වෙන් කරලා තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කය ආශ්‍රිත කුඹුරු ඉඩම් පාරම්පරික වී වගාව සඳහා දස ලක්ෂ 0.60 ක් වෙන් කරලා තිබෙනවා. මේ පාරම්පරික වී වගාව අද රටේ ලෙඩ රෝග බෝ වී වැළැක්වීමටත් එක්තරා උපාය මාර්ගයක් හැටියට දකිනවා. අද දේශීය වී වල ලෙඩ රෝග බෝ වීමේ අඩුවක් තිබෙනවා. අලුත් වී වලට වැඩිය. එහෙම නම් දේශීය වී නිෂ්පාදනය සඳහා උනන්දු වෙනවා වාගේම දේශීය වී නිෂ්පාදකයාට නියම මිලක් ලැබෙන්නේ නැහැ. දේශීය වී නිෂ්පාදනයේ අස්වැන්නේ විශාල අඩු බවක් තිබෙනවා. නමුත් සමහර ගොවි මහත්වරු මහන්සි වෙලා මේවායේ වැඩ කරනවා. වැඩ කළාට වැඩි මිලට විකුණා ගන්න පුළුවන්කමක් නැහැ. සාමාන්‍ය මිලට තමයි

[ගරු පී.ඩී. අබේරත්න]

විකිණෙන්නේ. නමුත් දේශීය වී වලට, දේශීය සහල්වලට සුපර් මාර්කට් එකට ගියාම කිලෝ එකක් රුපියල් 160 යි, 200 යි. නමුත් ගමේ නිෂ්පාදකයාට ඒ මිලෙන් සොච්චමක්වත් ලැබෙන්නේ නැහැ. කවුරු හරි කෙනෙක් සාමාන්‍ය වී මිලදී ගන්න මිලටම අරගෙන ඒකෙන් ඒ අය අයුතු ප්‍රයෝජනයක් ගන්නවා. විශාල මුදලක් ලබා ගන්නවා. නමුත් දේශීය වී නිෂ්පාදකයාට පළාත් සභාවෙන් විධිමත් වැඩ පිළිවෙළක් ඇති කළොත් කුඹුරේ නිෂ්පාදනය කරන වී ටික ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා වැඩි මිලකට දේශීය වී ලබා ගන්න වැඩ පිළිවෙළක් සකස් කළොත් මීට වැඩිය දේශීය වී නිෂ්පාදනය වැඩි කර ගන්න පුළුවන් කියන එක මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළතුරු වගාව ගැන බලනකොට අපේ බස්නාහිර පළාතේ විශාල වශයෙන් රඹුටන් වගාව දියුණු වෙලා තිබෙනවා. විශාල නිෂ්පාදනයක් තිබෙනවා. නමුත් කියන්න කනගාටුයි මිලක් නැහැ. මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා පසුගිය වර්ෂවල රඹුටන් නිෂ්පාදනය රුපියල් 02 කට ගෙඩියක් විකුණා ගන්න බැරිව ගස් යට වැටිලා ගිය තත්ත්වයකට පත් වුණා. ඇයි මේ ලෝකයේම රඹුටන් ඉල්ලුමක් තිබෙනවා. පළතුරුවලට විශාල ඉල්ලුමක් තිබෙනවා. විදේශීය රටවල්වලට ඕනෑ තරම් සපයන්න පුළුවන්කම තිබෙනවා. නමුත් මේ සඳහා රජයේ දායකත්වය ශත පහක්වත් නැහැ. පුද්ගලික අංශයේ කිහිප දෙනෙක් මේක ගෙන යනවා. ඒක සීමාසහිත ප්‍රමාණයක් පමණයි. නමුත් මේ රඹුටන්වලින් අපේ රටේ විකුණා අතිරික්ත වන සියලුම රඹුටන් ප්‍රමාණය විදේශීය වෙළඳ පොළට යන්න පුළුවන්. විදේශීය වෙළඳ පොළේ හොඳ ඉල්ලුමක් තිබෙන දෙයක්. ඒ සඳහා කිසිම අවධානයක් නැහැ. එසේ අවධානය යොමු නොකළොත් මේ රඹුටන් වගාව අද විනාශ වෙලා යන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා දන්නවා. රඹුටන් වගාව අපේ ප්‍රදේශයේ විශාල ආදායම් මාර්ගයක් බවට පත් වුණා. රුපියල් 5 ට, 7 ට, 8 ට විකුණුවා. පසුගිය දවස්වල රුපියල් 02 ටවත් විකුණාගන්න බැරි වුණා. එතකොට ඒ අය මන්දෝත්සාහී වෙනවා. මේ වගාවට උනන්දු වෙන්නේ නැහැ. අපට විදේශ විනිමය හම්බ කරන්න පුළුවන් අවස්ථාවක්. රජයේ උවමනාවක් නැති නිසා විනාශ වීගෙන යනවා. මම ඒ සඳහා දැඩි අවධානය යොමු කරනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ අවධානය යොමු කරනවා එළවළු වගාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

එහෙම නම් මම එළවළු වගාව ගැන කථා කරන්නේ නැහැ. මම පරිසරය ගැන කථා කිරීම වැදගත්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද පරිසර නිලධාරී මහත්වරුන්ගේ අවධානය යොමු කරනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු මේ සභාවට අවධානය යොමු කරනවා. අද අපේ ප්‍රදේශයට ඇවිල්ලා තිබෙනවා, මුළු ලෝකයෙන්ම ඉවත් කරපු කර්මාන්ත ශාලා. එකක් තමයි මෝල්ඩ් කර්මාන්ත ශාලාව. මේ මෝල්ඩ් කර්මාන්ත ශාලාව තුළ දවසකට රබර් දර ලොරි 75 ක් 100 ක් පමණ, අනෙකුත් දර වර්ගත් ගෙනැල්ලා අඹරලා MDF බෝඩ් හදනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතැන විශාල විනාශයක් ඇති වෙමින් යනවා. මේ මෝල්ඩ් කර්මාන්ත ශාලාවට යොමු කරන රසායනික ද්‍රව්‍යයක් තිබෙනවා. ඒකේ නම යූරියා පෝමැල්ටි හයිඩ්. යූරියා පෝමැල්ටි හයිඩ් කියන රසායනික ද්‍රව්‍ය කිසිම බටහිර රටකට ගෙන එන්නේ නැහැයි කියන සම්මුතියකට ඇවිල්ලා තිබෙනවා. මේ යූරියා පෝමැල්ටි හයිඩ් කියන රසායනික ද්‍රව්‍ය හදලා ගහන MDF බෝඩ් බටහිර කිසිම රටකට ගන්නේ නැහැ. නමුත් අපේ රටේ අපේ අවාසනාවට මෝල්ඩ් කර්මාන්ත ශාලාවට විශාල වශයෙන් මෝගු හල්මයිට්, යූරියා පෝමැල්ටි හයිඩ් කියන මේ රසායනික ද්‍රව්‍ය ලී පදම් කිරීම සඳහා දානවා. මේ තුළින් අද මෝල්ඩ් කර්මාන්ත ශාලාව වටා කිලෝ මීටර් භාගයක් විතර වටරවුම ගත්තාම පිළිකා රෝගීන් 26 දෙනෙක් ඉන්නවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. තමුන්නාන්සේට මේක රහසක් නොවෙයි. එයින් පසුගිය මාස 2 ½ තුළ හය දෙනෙක් මිය ගියා. තව තවත් වැඩි වැඩියෙන් හැදෙනවා. මේ රසායනික ද්‍රව්‍ය පිළිකාකාරකයක්. මේක පිළිකාකාරකයක් බවට ලෝකය පිළි අරගෙන තිබෙනවා. මෙවැනි දේවල් භාවිතා කරලා මේ කර්මාන්ත ශාලාව ගෙන යන අතර, මේ කර්මාන්ත ශාලාවෙන් ඉවත් වන සියලුම වතුර කළු ගඟට මුදා හරිනවා. කළු ගඟට මුදා හරින අතර - තමුන්නාන්සේ දන්නවා. කිලෝ මීටර් දෙකක් විතර පහළින් අද කොළඹට වතුර දෙන්න විශාල ටැංකියක් ගහලා

තියෙනවා. කොළඹට වතුර ගන්නේ එතැනින්. එතකොට මේ ලංකාව පුරාම විෂ ද්‍රව්‍ය අඩංගු වතුර පානය කිරීම තුළින් පිළිකා රෝගීන් තව තවත් වැඩි වෙන්න පුළුවන් ලොකු අවධානමක් තිබෙනවා. මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේක වැදගත් දෙයක්. ගරු ඇමැතිතුමා නැහැ. මේ කර්මාන්ත ශාලාවට අපි විරුද්ධ නැහැ. නමුත් මේ රසායනික ද්‍රව්‍ය පාවිච්චි කිරීම අපේ ප්‍රදේශයට විශාල අනතුරක් වෙලා තිබෙනවා. රෝගීන් විශාල ප්‍රමාණයක් ඇති වෙනවා. අපේ වගකීමක් තිබෙනවා මේවා නවත්වන්න. ඒ නිසා තමුන්නාන්සේලාගේ විශේෂ අවධානය යොමු කරලා මේ විෂකාරක යොදලා අපේ ප්‍රදේශයේ රෝගීන් බහුල වශයෙන් වැඩි වෙන්න යන මේ අවධානම් තත්ත්වයෙන් ගොඩ ගන්න විධිමත් ක්‍රියා මාර්ගයක් යොදන්න ඉතා ඉක්මණින් කටයුතු කරන්න කියලා මම ඉල්ලනවා. තව කථා කරන්න දේවල් තිබුණත් වේලාව අවසන් නිසා මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.19]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම මම බොහොම සතුටු වෙනවා. මොකද, හයවැනි පළාත් සභාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රය ගැන කථා කරන්න ලැබීම පිළිබඳව. මොකද, ඇත්තටම ඒ පිළිබඳව ඉතාමත් සතුටින් කථා කරන්නේ. මමත් ගොවියෙකුගේ පුතෙක් හැටියට. අපි දැක්කා මේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විශේෂයෙන්ම මම දකින්නේ, මේ 2015 අයවැය කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ හැදීමේදී පැහැදිලිවම පක්ෂ විපක්ෂ සියලු දෙනාගේම අදහස්වලට කන් දීලා, ගරු ඇමැතිතුමාත් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයත් ඉතා කැපවීමකින් ඒ කටයුත්ත කරලා තිබෙනවා. ඒ වාගේම මේ වසරේත් ඒක කළා. 2015 ටත් ඉතාමත් හොඳින් ඒ කටයුත්ත කරලා තිබෙනවා. ඒකේ පැහැදිලිවම මම දකින දේ තමයි ඇත්තටම මේකේ ඉතාමත් හොඳ ව්‍යාපෘති ගණනාවක් තිබුණා. මම දැක්කා මේ පාසල් කෘෂි සමාජ පිහිටුවීම. පාසල් දරුවාගේ පටන්ම මේ කෘෂිකර්මාන්තය නගා සිටුවන්න බස්නාහිර පළාත තුළ විශාල කැපවීමක් කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාත් හොඳින් දන්නවා. මේ පාසල් කෘෂි සමාජ පිහිටුවලා අපි ගම් මට්ටමින් දැක්කා ගොඩක් වෙලාවට පාසල් කෘෂි සමාජවල දරුවන් පාසල්වල වගා කරන්න පටන් ගත්තා. ඒ පටන් ගැනීමත් එක්ක දරුවාගේ කෘෂිකර්මයට තිබෙන ලැදියාව, ආශාව වැඩි දියුණු වුණා. ඒකත් එක්කම අපි දැකපු දෙයක් තිබුණා. ජනතාව මේකට මුහු කරන්න, කෘෂිකර්ම ප්‍රදර්ශන පවත්වලා ජනතාව මේ පැත්තට යොමු කරන්න විශාල කැපවීමක් ගත්තා. ඒ වාගේම විශාල වැඩ කොටසක් කළා. ඒ වාගේම වාරිමාර්ග ක්ෂේත්‍රය තුළ මම ගණන් මිණුම් කියන්න යන්නේ නැහැ. කාල වේලාව අඩු නිසා. වාරිමාර්ග ක්ෂේත්‍රය තුළ විශාල වැඩ පිළිවෙළක් කළා.

මොකද, අපි දැක්කා කළුතර දිස්ත්‍රික්කය ගත්තාම විශේෂයෙන් බණ්ඩාරගම ආසනය ගත්තාම කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් වාරිමාර්ග ක්ෂේත්‍රයේ ඒ වාගේම කෘෂි මාර්ග හදන්න මහා විශාල මුදල් සම්භාරයක් වෙන් කළා. වෙන් කරලා මේ සඳහා කෘෂිකර්මාන්තය දියුණු කරන්න, විශේෂයෙන්ම පුරන් කුඹුරු අස්වද්දන්න විශාල මුදල් ප්‍රමාණයක් වැය වුණා. මම මේකේදී පොඩි දුර්වලකම් කිහිපයක් දකිනවා. ඇත්තටම මම දකිනවා, මේ අවස්ථාවේදී ඒක නොකිව්වොත් අඩුවක් වෙනවා. මොකද, මේක ජනතාව අතර ප්‍රචලිත දෙයක්.

2014 වසරේ අපට ගොඩක් දුරට, විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ අපේ පළාත් වාරිමාර්ග ක්ෂේත්‍රයේ ඉංජිනේරුතුමාගේ තිබුණු දුර්වලකම් නිසා අපට ගොඩක් වැඩ කර ගන්න බැරි වුණා. ඉතින් මම හිතනවා මෙන්න මේ වාගේ දේවල් අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරීන් අවධානයට ගත යුතු දේවල් කියලා. මොකද, අපි ගොඩක් වෙලාට අපේ සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලදී පවා ලොකු අපහසුතාවයන්වලට පත් වුණා. අපේ සමහර නිලධාරීන්, විශේෂයෙන්ම හැම කෙනෙක්ම නොවෙයි. කළුතර හිටපු ඉංජිනේරුතුමා පැහැදිලිවම හැම දෙයක්ම බැහැයි කියාගත්තු ගමන් ඉන්න කෙනෙක්. ඉතින් හැම දෙයකදීම. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී. සමහර අවස්ථාවල අපිත් ලැජ්ජාවට පත් වුණා. මේවා ගැන අමාත්‍යාංශයේ දැඩි අවධානය යොමු කරන්න වෙනවා. මොකද, අපි මොනතරම් මුදල් ප්‍රතිපාදන වෙන් කළත් වැඩක් නැහැ, ඒ මුදල් ප්‍රතිපාදනවලට කටයුතු කරන්න බැරි නම්. මට ගොවියෝ වගයක් ඇවිල්ලා කිව්වා, ඉංජිනේරුතුමාට ඇළක් බලන්න යන්න කිව්වාම පොඩි වක්කඩකින් පනින්නේ නැතුව ඒ ගොවියන්ට කිව්වාලු ගිහිල්ලා ලෑල්ලක් අරගෙන එන්න කියලා. ඒ වක්කඩෙන් පැනලා යන්න. අන්න

[ගරු ලලිත් එල්ලාවල]

ඒ වාගේ ඉංජිනේරුවෝ. මෙන්න මේ වාගේ අය කෘෂිකර්ම ක්ෂේත්‍රයේ තියාගන්න හොඳ නැහැ. එහෙම වුණොත් එහෙම පැහැදිලිවම කෘෂිකර්ම ක්ෂේත්‍රය වැටෙනවා. ඒ නිසා මොනතරම් මුදල් ප්‍රතිපාදන වෙන් කළත් වැඩක් නැහැ ඒ වාගේ නිලධාරීන්ට. ඉතින් මේ අතර ඉතාමත් හොඳ නිලධාරීන් ඉන්නවා. ලේකම්තුමා ඇතුළු මේ අමාත්‍යාංශයේ සැලසුම් අංශයේ ඉන්න නිලධාරීන් ඉතාමත් කඩිනමින් මේ වැඩේ කළත් ගමට යනකොට ගමේ කෙනා ඒ වාගේම එතැන හිටියේ නැත්නම් එහෙම ලොකු ගැටළුවකට පත් වෙනවා.

ඒත් එක්කම මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. අපි මේ අමුණු ක්ෂේත්‍රය ගැන කියන කොට මම අවුරුදු ගාණක ඉඳලා උපදේශක කාරක සභාවේත් කථා කරලා ඇස්තමේන්තු කරපු වැඩක් තිබුණා. මට ගිය මැතිවරණ කාලයේත් මේක තදින් බලපාපු වැඩක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමාටත් බලපාන වැඩක්. අපේ කනේවෙල අමුණ. කනේවෙල අමුණ හැමදාම ඇස්තමේන්තු කරනවා. හදනවා කියනවා. පොරොන්දු වෙනවා. මේක කෙරෙන්නේ නැහැ. ඉතින් ඒ නිසා මම ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශයේ සියලු නිලධාරීන්ට කියන්නේ ලබන වසරේ නම් මෙකේ අක්කර 200 ක් 300 ක් විතර වගා කරන්න පුළුවන් කුඹුරු යායක්. ලබන වසරේ මුදල් ප්‍රතිපාදනවලින් මේ වැඩේ අනිවාර්යයෙන් කරන්න. නැත්නම් අවුරුදු තුනක විතර ඉඳන් ඇදී යන එකක්. මේ වැඩේ නොකිරීම අපට ලොකු හානියක්. අනෙක් එක තමයි ගොවියන්ට ලොකු හානියක්.

ඒත් එක්කම මම පැහැදිලිවම දකින අනික් දේ තමයි බිඳුණු පුටුවට දැතේ සවිය වැඩ සටහන. ඒක බොහොම ජනප්‍රිය වැඩ සටහනක්. අධ්‍යාපන අමාත්‍යාංශයේ අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ පැසසුමට ලක් කරපු ව්‍යාපෘතියක්. මේකේ අපි දැකපු දෙයක් තිබුණා. රුපියල් 50,000 ක මුදලක් කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබා දුන්නාට පස්සේ විශාල ප්‍රතිපාදනයක වැඩ කරනවා. උදාහරණයක් හැටියට ගත්තාම මම දැක්කා 2011 මේක ආරම්භ කළේ. 2011 ගරු ඇමැතිතුමා ආරම්භ කළාට පස්සේ අපි දැක්කා, 2014 දී මිලියන 39 ක් වෙන් කළාට පස්සේ මේකේ වටිනාකම මිලියන 239 ක්. මිලියන 39 ක මුදල් වෙන් කරලා තියෙන්නේ, වටිනාකම තියෙනවා 239 ක. ඒක ඉතාමත් වැදගත් දෙයක්. මොකද, අපි හැම පාසලක්ම ගත්තාම කැඩිලා බිඳිලා පැත්තකට දාපු ඩෙස් බංකු විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ කර්මාන්ත අධිකාරියෙන් මේ කාර්යය කිරීම පිළිබඳව අපි සියලු නිලධාරීන්ට ස්තුතිවන්ත වෙනවා. මේ වාගේ ඉතාමත් ගෞරවාන්විත වැඩක්, මේ වගේ පැසසුමට ලක් වන වැඩක් කිරීම පිළිබඳව. ඒ වාගේම මම තව දෙයක් දකිනවා. මේක ඉතාමත් හොඳ දෙයක්. අපි පරිසරය ගැන හිතනකොට පරිසර හිතකාමී සැරසිලි වැඩ පිළිවෙළ යටතේ ඉටි කොළවලින් තොර අවමංගල්‍ය උත්සවයක් පවත්වන්න පොඩි ප්‍රමාණයක් දුන්නත්, ඒකේ පොඩි නැඹුරුවක් පෙන්වනවා. මොකද, අපි ඒක පුංචියට දැක්කාට එතැන ඉටි කොළවලින් තොර අවමංගල්‍ය උත්සවයක් විධියට බැනර් එකක් දෙකක් තියෙන කොට ඒ අයට වුණත් ඉටි කොළයක් දාන්න හිතෙන්නේ නැහැ. ඒ වාගේ පරිසර හිතකාමී විශාල වැඩ පිළිවෙළක් මේ තුළ තිබුණා. ඉතින් ඒ නිසා -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

දැන් එල්ලලා තියෙන කටවුට් කොහොමද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ කටවුට් ටික ඔබතුමන්ලාත් ගහනවා නේ?

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

පොලිතීන් දාන්නේ නැහැ. පරිසර හිතකාමී -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දැන් ගිය මැතිවරණයේදී ඔබතුමන්ලා ගැහුවේ නැද්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා එතුමාට බාධා කරන්න එපා. එතුමා විෂයයට අදාළව කථා කරගෙන ආවා. ඔබතුමාට තව විනාඩියයි තියෙන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගිය මැතිවරණයේදී ඔබතුමන්ලා ඕනෑ තරම් ගැහුවා. ඒ කටවුට් සියල්ල මැතිවරණයෙන් පස්සේ අපි අයින් කර

ගන්නවා. අපි 08 වැනිදා දිනපු ගමන්ම කටවුට් ටික අයින් කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හීනෙන්ද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

හීනෙන් නොවෙයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

මහජනතාවගේ සල්ලි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මහජනතාවගේ සල්ලි නොවෙයි. ඒවා පුද්ගලික සල්ලි.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

හීනෙන්ද? හීනෙන්ද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මහජනතාවගේ සල්ලි නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මහජන මුදලින් ප්‍රචාරය කරන ලදී කියලා බෝඩ් එකක් දාන්න ඕනෑ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

08 වැනිදායින් පස්සේ අපි සියල්ල ඉවර කරනවා. මහජනතාවගේ සල්ලි නොවෙයි. කෝටි ගාණක් වියදම් කළේ එක්සත් ජාතික පක්ෂය කාලේ. ප්‍රේමදාස මහත්තයාගේ ආණ්ඩු කාලේ මතක නැද්ද තමුන්නාන්සේලා කරපු විධිය කොහොමද කියලා. තමුන්නාන්සේලා මැරිලා ඉපදුණාද? එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලේ ප්‍රේමදාස මහත්තයා කරපු හැටි මතක නැද්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මූලාසනයට කථා කරලා, කථාව අවසන් කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මැරිලා ඉපදිලා වාගේ කථා කරන්නේ. මහජනතාවගේ -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගෙනාවේ උදය ගම්මන්පිල -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලා මරපු ප්‍රමාණය මතක නැද්ද? අපි කැලෑවල හැංගිලා ඒ කාලේ බේරුනේ. අපි වමේ දේශපාලනයක් කළාට තමුන්නාන්සේලා මරණය අපට දුන්නේ. තමුන්නාන්සේලා ඒක හිතේ තියා ගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය අවසන්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලා අද දූෂණය ගැන කථා කරනවා. තමුන්නාන්සේලා ලැජ්ජ නැතුව රෙදි ඇඳගෙන මොකක්ද කළේ? නායකයෙක් හදාගන්න බැරි පක්ෂ. නායකයෙක් හදා ගන්න බැරි පක්ෂ. 60,000 ක් 80,000 ක් මරලා දාලා මෙතැන ඇවිල්ලා කථා කරනවා. තමුන්නාන්සේලාට 08 වැනිදාට ජනතාව උත්තර දෙයි. තමුන්නාන්සේලා කරපුවාට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය අවසන්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ජේ.වී.පී. එකත් එක්ක - දෙගොල්ලෝ එක්ක එකතු වෙලා මැරුවේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඇයි 71 කොහොමද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කාලය අවසන්. කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම වාරිමාර්ග ක්ෂේත්‍රය තුළ කථා කරන්න කරුණු ගණනාවක් තිබෙනවා. එහෙත් වෙලාව මදී. එක්සත් ජාතික පක්ෂයට සහ ජේ.වී.පී. එකට උත්තර දෙන්නත් වෙලාව මදී, මේගොල්ලෝ කරපුවාට. බටලන්දේ ගෙවල් අරගෙන තරුණයෝ මරලා තමයි අද මේ කථා කරන්නේ. ඒ නිසා කොහොම වුණත් මම ප්‍රාර්ථනා කරනවා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ -

**ගරු නිමල් ලාන්සා** (ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Nimal Lansa (Minister of Transport, Sports and Youth Affairs, Women's Affairs, Food Supplies and Distribution Affairs, Cooperative Development, Domestic Economic Promotion, Fisheries, Rural Development, Tourism, Investment Promotion Coordination and Animal Production and Development)

දැන් බටලන්ද චිත්‍රපටිය කෝ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට නැවතත් 2015 දී මේ වාගේ විශාල සංවර්ධනයක් කරන්න ඒ ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරීන්ට ශක්තිය, ධෛර්ය, වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් නැවත අතිගරු ජනාධිපතිතුමාගේ පාලනය යටතේ අපි 08 වැනිදායින් පස්සේ විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරලා තව තවත් කෘෂිකර්ම ක්ෂේත්‍රය වැඩි දියුණු කරනවා කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.29]

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

සියලුම දෙනාටම සුභ උදෑසනක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. මගේ මංගල කථාව. 2015 අයවැය වෙනුවෙන් කථා කරන්නේ. මම පළමුව ස්තුතිවන්ත වෙන්න ඕනෑ ජෙනරාල් සරත් ෆොන්සේකා මහත්මයාගේ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට ඡන්දය දීපු ලංකාව පුරා සිටින සියලුම දෙනාටත්, ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයෙන් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට ඡන්දය දීලා මාව වැඩි මනාපයෙන් පළාත් සභාවට පත් කර එවපු ජනතාවටත්, මම ආපු දවසේ ඉඳලා මේ පළාත් සභාවේ මට සියලුම දෙනා උදව් උපකාර කළා. නිලධාරි මණ්ඩලය ඇතුළු සියලුම දෙනා. ඒ සියලු දෙනාටත් ස්තුති කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අයවැය ගැන තමයි මට මුලින්ම කථා කරන්න තිබෙන්නේ. කෘෂිකර්ම, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳව. මගේ හදවත වාගේ තිබෙන කලා කටයුතු පිළිබඳව කථා කරන්න ලැබීමත් මට ලොකු ගෞරවයක්. ඒ වාගේම මම ඉස්සෙල්ලාම හිතුවා කවියක් කියලා වැඩේ පටන් ගත්තොත් හොඳයි කියලා. විරිඳුවක්.

2015 ට ආවා අයවැයක්
මේකෙන් නැහැ කිසි කෙනෙකුට සහනයක්
කථා කරන්නත් මෙහි නැහැ ලොකු දෙයක්
නෙතට නැගෙයි කඳුලක් සහ හරි දුකක්

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහ ඇමැතිට කීකරුයි.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ඒ වාගේ එකක් තමයි. අහගෙන ඉන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අයවැයේදී කෘෂිකර්මය, සංස්කෘතිය ගැන කථා කරන්න දෙයක් නැහැ. මේකට වෙන් කරලා තිබෙන්නේ බොහොම සුළු මුදලක්. මේවා

ගැන ඇත්තටම කථා කරන්නත් ලැජ්ජයි. කථා කරන්න දෙයකුත් නැහැ. අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කථා කරන කොට කථා කරන්නේ, කෘෂිකර්මය ගැන අමුතු අමුතු දේවල්. ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා කථා කළා ලාංජන ගැන. ඡන්දේ ඉල්ලන ලාංජන ගැන. කෘෂිකර්මය තමයි මේවා. මේවායෙන් ඉල්ලන්නේ මොකද? මේවා පරක්කු වෙන්නේ මොකද? මෙන්න කෘෂිකර්මය. දැන් එක මන්ත්‍රීවරයෙක් ඊයේ කියනවා අපට ඇහුණා, වෙන් කරපු අයවැයෙන් ලක්ෂ 200 ගණනේ රටේ ආර්ථිකය නඟා සිටුවන්න පළාත් සභා මන්ත්‍රීවරුන්ට දුන්නා කියලා. කෝටි 2 ගාණේ. ලක්ෂ 200 ක්. ඉතින් මේවා දෙන්නේ කෘෂිකර්මය නඟා සිටුවන්නද නැත්නම් ලයිට් කණුවල ගහලා තිබෙන කටවුට්වලටද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. මේවා පාර්ලිමේන්තුවේදී ඒගොල්ලෝ ප්‍රශ්න කර ගන්න ඕනෑ. (බාධා කිරීමක්) මොකක්ද සංවර්ධනය? අපි දන්නේ නැහැ නේ ඒවා. අපට පෙන්වන්නේ නැහැ නේ මොනවාටද වියදම් කළේ කියලා. ඒවා දෙන්නේ කොමිස් ගහන්න. සංවර්ධනයට තමයි. ඒවායෙන් කොමිස් ගහනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

කොමිස් ගහනවා. මේ තියෙන්නේ. මේ තියෙන්නේ ඒ කියන කථා තමයි. පළාත් සභා මන්ත්‍රීවරයෙක් කියනවා වැවට වෙන් කරන්නේ ලක්ෂ 100 යි. ලක්ෂ 50 ක්ම යන්නේ සංදර්ශනවලට. අන්න ඒවාට තමයි 200 දෙන්නේ. ඔයගොල්ලන්ගේම කෙනෙක් කියලා තියෙන්නේ. අපි නොවෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කෘෂිකර්මය සහ කලා කටයුතු.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

කෘෂිකර්මය සම්බන්ධව කියලා තියෙන්නේ. ඔබතුමන්ලාගේම ඇමැති කෙනෙක් කියලා තියෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ මංගල කථාව. විෂයය එක්ක කථා කරනවා නම් වඩාත් හොඳයි.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

විෂයත් එක්ක තමයි කථා කරන්නේ. මේ වෙන් කරපුවා ගැන කියන්නේ. කියපුවා ගැන කියන්නේ. ඊට පස්සේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාගේ කථාවට බාධා කරන්න එපා.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

තව මන්ත්‍රීවරයෙක් කිව්වා පැළයක් ගෙදර වවාගෙන සාත්තු කරලා ඒක හදාගෙන, ඒක දිහා බලාගෙන වගා කර ගෙන කන්න කියලා. මේ කියන්නේ, ආයිත් මිනිස්සුන්ට අතීතයට යන්න කියලා නේ? අපි ඉස්සෙල්ලාම පටන් ගත්තු විධිය මේක.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි හොඳ නැද්ද?

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

එහෙම හොඳයි. එහෙම හොඳයි නම් මොකටද කෘෂිකර්ම අමාත්‍යාංශය පිහිටුවාගෙන. මේවාට පඩි නඩි දීගෙන, වාහන දීගෙන නඩත්තු කරගෙන, මේවා කරන්නේ මොකටද? ඒවා අයින් කරන්න. ඒවා අයින් කරලා ගෙදර ඇට වවාගෙන කන්න කියන්න. එතකොට ඒ වැඩේ ඉවරයි. අපේ ඇමැතිතුමා කිව්වා, වාරිමාර්ග ගැන කථා කරද්දී කොළඹ වළවල් හාරන ඒවා. ඒවා හාරන්නේ මේ කෘෂිකර්මයටද? නැහැ. තෙල තියෙන කට්ටියට තෙල බස්සවා ගන්න මේවා හදන්නේ. වටේ ඇවිදින්න. තව එකක් තියෙනවා, ඉල්ලුවේ වැව හදන්න. දුන්නේ ඇවිදින මංතීරුවක්. ඇවිදින මංතීරුවට ලක්ෂ 100 යි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අසව්. අසව්.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ටොප් නේද? ඉතින් අපි කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලැජ්ජයි. මේවා මොනවාටද? වළවල් හාරලා මේවා හදලා තියෙනවා. මේවායෙන් කිසි ප්‍රයෝජනයක් තියෙනවාද? තව ටික කාලයක් ගිහිල්ලා බලන්න මේවාට වැටෙනවා පොලිතීන් බෑග්. පරිසරයේ තිබෙන සියලුම කුණු මේවාට එකතු වෙනවා. තැන් තැන්වල බේරේ වැවවල් හැදෙනවා. ගන්ධකේ බැරි වෙනවා. මාළු මැරෙනවා. දැනටත් එහෙමයි. උදේට දෙන්නෙක් තුන් දෙනෙක් දාලා උඩ තියෙන ඒවා පිරිසිදු කරනවා. මේවායෙන් කිසි වැඩක් නැහැ. මේවා මේ සල්ලි කන ව්‍යාපෘති. තමන්ට සල්ලි ගහගන්න කරන ව්‍යාපෘති. මේවා මේ සල්ලි ගහගන්න කරන ව්‍යාපෘති. මේවායෙන් කිසි සෙතක් නැහැ. මේවා වැඩක් නැහැ. මොකක්ද? (බාධා කිරීමක්) සර්ව සෞඛ්‍ය තමයි. තව තියෙනවා මේ. ගොවියෝ වහ බොනවා. වතුරත් නැහැ. ණය ගෙවන්නත් බැහැ. ගොවියෝ වස බොති. මෙන්න ගොවියන්ට අත් වෙලා තිබෙන ඉරණම. ඒකම තමයි ඉතින් බස්නාහිර පළාතේ වෙන්නේ. සියයට සුළු ගණනේ වෙන් කරලා තියෙන්නේ. මේකෙන් පුළුවන්ද කෘෂිකර්මය නඟා සිටුවන්න? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ලියුමක් ගෙනාවා. මෙහේ වැව් හදනවා. ඇළවල් හදනවා. මේ 2013.11.23 වැනිදා බණ්ඩාරගම, දැල්කඩ, පරගස්කඩ ගොවියෝ එකතු වෙලා දාපු ලියුමක්. මේ කුඹුරේ වළක් තියෙනවා. මේ වළ දැන් පල් වෙලා. මේකේ මදුරුවෝ ඉන්නවා. ඒ මිනිස්සු ඉල්ලා සිටිනවා පොඩි ඇළක් හදලා මේකේ වතුර බැහැගෙන යන්න සලස්වා දෙන්න කියලා. මේ ලියුම ඉදිරිපත් කරලා දැන් අවුරුද්දකටත් වැඩියි. තාම මේක හදලා නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔබතුමාගේ සල්ලිවලින් හදන්න.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

අපේ සල්ලි. අපේ සල්ලි නොවෙයි. අපේ සල්ලිවලින් අපි හදන්නම්. කෘෂිකර්ම අමාත්‍යාංශය තියෙන්නේ මොකටද? කෘෂිකර්ම අමාත්‍යාංශයට සල්ලි වෙන් කරන්නේ මොකටද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මන්ත්‍රීවරුන්ගේ සල්ලිවලින්.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

මන්ත්‍රීවරුන්ගේ සල්ලිවලින් අපි හදන ටික අපි හදා ගන්නම්. ඒක වෙනම කතන්දරයක්. අපි කියන්නේ කරන්නේ නැති වැඩ ගැන. අමාත්‍යාංශ තියෙන්නේ මොනවාටද? කියලා අපි මේ ප්‍රශ්න කරන්නේ. අපේ සල්ලිවලින් අපි කරගන්න දේ කරනවා - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බලන්න මේවායෙන් කිසි සෙතක් වෙනවාද කියලා.

කෘෂිකර්මය පැත්තකින් තියමු කෝ? අපි දැන් සංස්කෘතිය, කලා කටයුතු ගැන කථා කරන්නම් කෝ? දැන් අපි කලාකරුවෝ විධියට මේ රජයෙන් අපට මොනවාද කරලා තියෙන්නේ? මේ කලාකරුවෝ ටික අල්ලගෙන, මේ කලාකරුවෝ කඩේ යවාගෙන, කරට මළු දීලා, ඒ අය ලව්වා එක එක දේවල් කියවා ගෙන තමන්ගේ පක්ෂයේ වැඩ ටික කරවා ගන්නවා. මේ කලාකරුවෝ නිසා ඉස්සර තිබුණු ටෙලි නාට්‍ය ටිකවත් දැන් දාගන්න බැහැ. ඒ කලාකරුවෝ කඩේ යාම නිසා ගත්තු මුදල පවා අඩු කරලා. අද කලාකරුවෙක් බොහොම අමාරුවෙන් නිර්මාණයක් කරන්නේ. ඒ නිර්මාණය කරන්නේ තමන්ගේ ගේ උකස් කරලා. තමන්ගේ වාහනය උකස් කරලා. මේවා උකස් කරලා තමයි ටෙලි නාට්‍යයක් නිර්මාණය කරන්නේ. ඒක නිර්මාණය කරලා දාන්න ඕනෑ රූපවාහිනී සංස්ථාවටයි, ITN එකටයි අනුමැතිය ගන්න ලකුණු මට්ටම් තියලා. ලකුණු මට්ටම් ගන්නවා. එහෙම ගත්තාට පස්සෙත් මේ ටෙලි නාට්‍ය දාගන්න බැහැ. කඩේ යන්න ඕනෑ, අරලිය ගහ මන්දිරයට -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

නාට්‍ය නිර්මාණය කරන්න මේ අයවැයෙන් ලක්ෂ 05 ක් දීලා තියෙනවා.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

මොකක්ද?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ලක්ෂ 05 ක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාගේ කථාවට බාධා කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව විනාඩියයි තියෙන්නේ.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

දන්නේ නැත්නම් අහගන්න. ලක්ෂ 30 ක් පගාව දෙන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ලක්ෂ 05 ක්. ඔබතුමාටත් ඕනෑ නම් කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා කථාවට බාධා කරන්න එපා.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ඒ ලක්ෂ 30 දීලත් නැවත ජරාව දෙන්න ඕනෑ දාගන්න. මේවා කලාකරුවෝ දන්නවා. ඒ වුණාට කලාකරුවෝ කඬේ ගිහිල්ලා බුදු හාමුරුවන්ටත් නෑදෑකම් කියනවා. රජවරුන්ටත් නෑදෑකම් කියනවා. මේවා හිරිකත වැඩ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද කලාකරුවෝ පුදුම වේදනාවකින් ඉන්නේ. අපි බලමු ඉස්සරහාට කලාකරුවෝ මොනවාද? කරන්නේ කියලා.

අද නාට්‍යයකට ගිහිල්ලා කලාකරුවෝ කොළඹට ආවාම, කොළඹට එන කලාකරුවෝ අතරමං වෙනවා. කොළඹට ගෙනැල්ලා දැම්මාට පස්සේ රෑ 01.00 ට, 02.00 ට කලාකරුවන්ට ගෙවල්වලට යන්න බැහැ. රෑට යන්න බස් නැහැ. මම අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාට යෝජනාවක් විධියට කරන්න කැමැතියි කොහොම හරි මොකක් හරි නේවාසිකාගාරයක් හරි හදලා මේ රෑට අනාථ වන කලාකරුවන්ගෙන් රුපියල් 100 ක් වාගේ අරගෙන කාමරයක් හරි කුළියට දෙන්න යම් වැඩක් කරන්න කියලා. මේ කඬේ යන කලාකරුවන්ට හරි කොහොම හරි සේවයක් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.40]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මෙම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට ඇත්තටම පසුගිය වසර 05 තුළ ඉතාමත්ම සාර්ථක, පැහැදිලි, විනිවිදව වැඩ කරලා මේ සමාජයට, මේ රටට ලොකු සේවාවක් වාගේම ලොකු ධනයක් එකතු කරපු අමාත්‍යාංශයක් හැටියට මම දකිනවා. මොකද, අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මතක් කළා වාගේ බිඳුණු පුටුවට දැතේ සවිය කියන වැඩ පිළිවෙළ ඉතාමත්ම සාර්ථක වැඩ පිළිවෙළක් හැටියට අපි දැක්කා. ඒ තුළින් සමාජයට ලොකු සේවාවක් වුණා වාගේම ජනතාවගේ මුදලක් ඉතුරු වුණාය කියලා අපි දකිනවා. ඒ වාගේම කෘෂි සමාජ පිහිටුවීම තුළ පාසලේ අධ්‍යාපනය වාගේම දරුවන්ගේ මානසිකත්වයත් එක්ක එහාට යන්න පුළුවන්, ඒ අධ්‍යාපනය ප්‍රායෝගිකව තවත් එහාට ගෙනියන්න පුළුවන් වටපිටාවක් ගොඩනැඟුණා. අලුත් අදහස්, අලුත් ආකල්ප තුළ අපේ හිටපු අමාත්‍යතුමා කටයුතු කළා. ඇත්තටම අපි දැක්කා, හයවැනි පළාත් සභාව තුළ එතුමා හිටපු කාලය තුළ උපදේශක කාරක සභාව කී වතාවක් තිබ්බාද කියලා. ඒ තුළදී මම හිතන්නේ, ලොකු සේවාවක්, අපට ප්‍රශ්න ගැටළු ගොඩක් විසඳාගන්න පුළුවන් වටපිටාවක් ගොඩ නැගුණා.

[ගරු ලලිත් වර්ණකුමාර]

ඒ නිසා ඉතාමත් ආදර්ශවත්ව කටයුතු කරපු අමාත්‍යවරයෙක්. නමුත් අද අපි කනගාටු වෙනවා, මේ මොහොතේ නැති වීම ගැන. නමුත් එතුමා ගෙන ගිය වැඩ පිළිවෙළ මේ සමාජයට ලොකු ශක්තියක් වුණා. ලොකු සේවයක් වුණා. ඒ වාගේම එම අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන් සහ අධිකාරී, දෙපාර්තමේන්තුවල සියලුම නිලධාරීන් ඇතුළු ඒ කාර්ය මණ්ඩලය ලොකු කැපවීමකින් කටයුතු කළා. මොකද, අපි දන්නවා යම්කිසි යෝජනාවක් කළාම, යම්කිසි දෙයක් ඉල්ලුවාම ඒකේ ප්‍රතිඵලය ඒ වෙලාවේම ක්ෂණිකව කඩිනමින් ලැබෙන අමාත්‍යාංශයක් හැටියට අපි දකිනවා. ඒ නිසා ඒ තත්ත්වයට ගොඩ නඟාගෙන එනකොට ඇත්තටම මේ අමාත්‍යාංශය, අර අපි කථාවට කියන්නේ දෙයියන්ගේ හාල් කැවිලා වාගේ ගරු අමාත්‍යතුමා ඇතුළු පක්ෂයේ නායකයන් පොඩි අපහසුතාවයට පත් වෙලා අද මේ අවස්ථාවේ නැති එක ගැන අපි කනගාටු වෙනවා. මොකද, හොඳට ගොඩ නඟපු අමාත්‍යාංශයක්. හොඳට වැඩ කරගෙන ගිය අමාත්‍යාංශයක්. අද එතුමා මෙතැන නොසිටියත්, අපේ ආසන සංවිධායකතුමා ආපු එක පිළිබඳව සන්තෝෂයි. ඊයේ එතුමාගේ කථාවේදී කියනවා, කොන්ද පණ තියෙන අය තමයි අපත් එක්ක ආවේ. කොන්ද පණ තියෙන අය ඉන්නවා නම් තවත් එන්න කියලා. හැබැයි, එතුමන්ලා තමයි මීට අවුරුදු කිහිපයකට ඉස්සෙල්ලා මේ සභාවේ විශ්වාසභංග යෝජනා ගෙනැල්ලා කොන්ද පණ නැති අය විධියට ලක් කළේ. ඒ වෙලාවේ අපි එතුමන්ලාව රැකගෙන හිටියා. නමුත් අද එතුමන්ලා කියනවා -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

අදත් අපි රකිනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

අදත් අපි එතුමාව රකිනවා. අද කොන්ද කෙලින් කියන එක එතුමන්ලාට අමතක -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එදා තිබුණේ නැහැ. අද තියෙන්නේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

නැහැ එදා මුකුත් තිබුණේ නැහැ. හයවැනි පළාත් සභාව තුළ 2000 හිටපු කෙනාට වැඩිය හොඳ කෙනෙක් තමයි අද අපි බිහි කරලා තිබුණේ. ඒ නිසා ඇත්තටම එතුමාගේ වැඩ පිළිවෙළ තුළ ඉතාමත්ම සාර්ථක වැඩ පිළිවෙළක් කළත් අපි එතුමාට දොස් කියන්නේ නැහැ. පක්ෂයක් හැටියට ගියා නම් අපි දන්නවා, එතුමා හිතින් ඉන්නේ අපත් එක්ක කියලා. මේ අයට බොරු අයිසිං එකක් විතරයි පේන්නේ. එතුමාට කවදාවත් එකඟ වෙන්න පුළුවන් කොටසක් එක්ක නොවෙයි ඉන්නේ. එතුමන්ලා හරි දෙයක් වෙනුවෙන් හරි වැඩ පිළිවෙළකට ගියා නම් අපිත් එතුමන්ලාට සහයෝගය දෙනවා. නමුත් අතිගරු ජනාධිපතිතුමාට එහා යන්න පුළුවන් නායකයෙක් තවම අපි දකින්නේ නැහැ. ඒ නිසා ඒ වැඩ පිළිවෙළට හානියක් වන වැඩ පිළිවෙළකට ගිහිල්ලා හිතට එකඟව එතුමාට එතැන රැඳෙන්න පුළුවන්කමක් නැහැ. එතුමන්ලා කා එක්කද ඉන්නේ? එතුමාට විශ්වාසභංග යෝජනාවක් ගෙනාපු අයත් එක්ක. ඒ වාගේම මේ රට දෙකට කඩන්න, මේ රට බෙදා වෙන් කරන්න පෙරුම් පුරන අයත් එක්ක ඉන්නේ. අද අපි දැක්කා, අපේ සමහර ජනාධිපති අපේක්ෂකයන්ගේ ලේකම්වරු කොයිතැන හිටපු අයද කියලා. අද ඒ අය ළං කර ගෙන තියෙනවා. එතකොට මේ රට යන්නේ කොතැනටද? මේ අයගේ අරමුණ මොකක්ද කියන එක අපට බලාගන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි 02 ක කාලයක් තිබෙනවා. ඒ කාලය තුළ ඔබතුමාට පොඩ්ඩක් විෂයයට අදාළව කථා කරන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මම උදය ගම්මන්පිල හිටපු ඇමැතිතුමා ගැන කියන්නේ. එතුමාගේ අමාත්‍යාංශය. එතුමා ගහපු පොත් ටික තමයි තියෙන්නේ. ගරු සභාපතිතුමනි, මේ කෘෂිකර්මය විෂයය. හැබැයි අපි බස්නාහිර පළාතේ කෘෂිකර්මය ලොකු තැනකට ගෙන එන්න හදනකොට කෘෂිකර්ම විෂයයට අපි කොතරම් වියදම් කළත්, පුරන් කුඹුරු කොපමණ අස්වැද්දුවත් වීවල මිල පල්ලෙහාට දාගන්න පුළුවන්කමක් අපට තිබුණේ නැහැ. ඒක පාලනය කළේ කවුද කියන එක දන්නවා. ඒක

පොළොන්නරුවෙන් පාලනය කරලා සමහර වෙලාවට අපේ ජනාධිපතිතුමාට සහෝදර පදනම කියලා කියනකොට, සහෝදර පදනම නිසා තමයි මම කියන්නේ ජනාධිපතිතුමා අද රැකුනේ. නැත්නම් මේ කථා කරන එක්සත් ජාතික පක්ෂයේ අයගේ නායකයෝ මිය ගියේ එහෙම පදනමක් නොතිබුණු නිසා. එහෙම පදනමක් නොතිබුණු නිසා තමයි මේ නායකයෝ මිය ගියේ. අද අපේ නායකයාට සහෝදර පදනමක් තිබුණු නිසා තමයි මෙහෙම ජීවත් වෙන්නේ. මේ රට සංවර්ධනය කරන්න පුළුවන් වුණේ. ඒ වාගේම තමයි වී මිල ගැන මම කිව්වේ. කෘෂිකර්මය ගැන. ඇත්තටම වී කියන කොට එහෙම ගියා.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. R. Nimal Peiris

ෆයිල් නැද්ද?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ෆයිල් ඇති තියෙන අය ළඟ. ගරු සභාපතිතුමනි, වී ගැන කිව්වාම ඒකාධිපති බලයට නොඑන තැනක ඉඳගෙන ඒ තියෙන බලය - මම හිතන්නේ, පොළොන්නරුවේ තිබෙන කුඩා පරිමාණ කර්මාන්ත වාගේ කුඩා පරිමාණයේ වී මෝල් හිමියන් සියල්ලම බිමට පාගලා දාලා කර්මාන්ත හතරක් පහක් විතර මේ තත්ත්වයට ගොඩ නැඟුවා. ඒ සහෝදර සමාගම් තමයි. මම හිතන්නේ නැහැ උදය ගම්මන්පිල මැතිතුමන්ලාට පුළුවන් වෙයි කියලා පැහිලා ඒ තැන කටයුතු කරන්න. ඒ නිසා අපි ඇත්තටම ආරාධනා කරනවා. එතුමා ගතින් එතැන හිටියත්, හිතින් එතැන නොවෙයි. එතුමාගේ හිතට එකඟව එතැන ඉන්න පුළුවන්කමක් නැහැ. එතුමා හොඳ බෞද්ධයෙක් වාගේම මේ රටේ මුලින්ම බෞද්ධ ආගමත් එක්ක බැඳිලා ආපු පක්ෂයක් හැටියට අපි දැක්කා 2000 දී එතුමන්ලා ගත්තු ජයග්‍රහණ. 2004 ජයග්‍රහණ වාගේම, එක්සත් ජනතා නිදහස් සන්ධානයත් එක්ක එකතු වෙලා අවසානයේ අපේ පළාත් සභාවට තුන් දෙනෙක් පත් කර ගන්න විතරයි ඒ අයට පුළුවන් වුණේ. ඒ සන්ධානයේ බුලත් කොළේ හැටියට තරඟ කරලා. ඉතින් ඒ අයගේ ශක්තිය ජේනවා එන්න එන්න. අපට හොඳ කෙනෙක් හැටියට උදය ගම්මන්පිල මැතිතුමා නැවතත් ඇවිල්ලා - අපි ආරාධනා කරනවා. අපේ මේ අමාත්‍යාංශය භාර අරගෙන මේ අමාත්‍යාංශය ගෙන ගිය වැඩ පිළිවෙළ එතැන ඉඳලා තව ඉස්සරහාට ගෙනිහිල්ලා මේ රටට සේවයක් කරන්න. එතුමා කරගෙන ආපු සේවය මේ රටට තව ඉස්සරහාට ලබා දෙන්න කියන එක මේ අවස්ථාවේදී අපි මතක් කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපි කරමු 08 වැනිදාට.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

හීන විතරයි. ඒවා හීන විතරයි. හැමදාම හීන විතරයි. හීන කියන්නේ එදා සරත් ෆොන්සේකා මැතිතුමා එනකොට අපි ටිකක් භය වෙලා හිටියේ. එදා එතුමාගේ කටවුට් මුළු ලංකාව පුරාම පෝස්ටර් හැටියට තිබුණා. යුද්ධය දිනපු නිසා ඉදිරිපත් වුණා. ආරක්ෂක ලේකම්තුමා ඇතුළු ත්‍රිවිධ හමුදාවේම එතැන දිස් වුණා. එතකොට මුළු රටේම මුහුණක් ගිය නායකයෙක් නිසා අපි භය වෙලා හිටියා. නමුත් අද අපට එහෙම දෙයක් තේරෙන්නේ නැහැ. අපට එහෙම හැඟීමක්වත් නැහැ. අපට ආශිර්වාදයක් විධියට තමයි තියෙන්නේ අපේ විපක්ෂයෙන් එන වැඩ පිළිවෙළ. ඒක ජනාධිපතිතුමාට ආශිර්වාදයක් වෙලා තියෙන්නේ. හැමදාම ජනාධිපතිතුමා ජාත්‍යන්තරයේ යම්කිසි තැනකට ඇවිල්ලා හිර වෙනවා නම් ඒවාට අදෘශ්‍යමාන බලවේග ඇවිල්ලා එතුමාට සහායක් හැටියට එනවා. අන්න ඒ නිසා පව් කියන තත්ත්වයට, ජනාධිපතිතුමා පව් නිසා මේ පැත්තට එනවා නොවෙයි. සිරිසේන පව් කියන තත්ත්වයට ජනතාව අද ගොඩ නැඟිලා තියෙනවා කියන එක මතක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන වැඩ බලන අමාත්‍ය සහ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාට විනාඩි 12 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[පූ.භා. 10.49]

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් සම්බන්ධව අවසන් කථාව කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව

[ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා]

අවුරුදු 21 ක් මම නියෝජනය කළා. මේ අවුරුදු 21 න් අවුරුදු 05 යි කිසිම ධූරයක් ලබන්නේ නැතුව මම කටයුතු කළේ. අනෙක් හැම අවස්ථාවකදීම මේ පළාත් සභාවේ තියෙන සෑම විෂයයකටම ඇමැතිකමක් දරන්න මට අවස්ථාවක් ලැබුණා. මම කවදාවත් කරපු නැති එකම විෂයය කෘෂිකර්මය. හදියේම මේ විෂයය භාර ගන්න වුණාම මේ විෂය වෙනුවෙන් අයවැයකදී කථා කරන්න අවස්ථාව ලැබුණා.

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී අපේ හිටපු අමාත්‍ය උදය ගම්මන්පිල මැතිතුමාව ඉතාමත්ම සහෝදරත්වයෙන් මතක් කරන්න ඕනෑ. මොකද, පසුගිය අවුරුදු 05 කාල සීමාවේදී එතුමා මේ අමාත්‍යාංශයේ කටයුතු කරද්දී පළාත් සභාවට විශාල ශක්තියක් වුණා. ඒ වාගේම මේ පළාත් සභාව තුළත් එතුමාගේ දායකත්වය ඉහළම මට්ටමින් ලැබුණා. අපි දන්නවා, පළාත් සභා ක්‍රමයට විරුද්ධයි කියන එක. නමුත් එතුමා පළාත් සභාව තුළ ඒ සහයෝගය මට ලබා දුන්නා. ඒ ගැන මගේ ස්තූතිය මේ අවස්ථාවේදී පුද කරනවා. අපි පුද්ගලයන් ගියාම මඩ ගහන්න හොඳ නැහැ. ඒ කරපු සේවාව ගැන මතක් කරනවා. මොකද, අපි අදටත් මේ පුටුව හිස් තියලා තියෙන්නේ එතුමාව බලාපොරොත්තුවෙන්.

ගරු සභාපතිතුමනි, කෘෂිකර්මාන්තය ගැන කථා කරනකොට අපේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් කිව්වා මේ රට විනාශ වුණේ, 1977 න් පස්සේ විවෘත ආර්ථික ක්‍රමයත් එක්ක කියලා. මම විවෘත ආර්ථික ක්‍රමය විවේචනය කරනවා නොවෙයි. ඒකේ හොඳ හා නරක පැති දෙකම තිබුණා. ඒකේ නරක පැත්ත තමයි මේ රටේ කෘෂිකර්මාන්තය විනාශ වීම. ඒ වාගේම අපේ මන්ත්‍රීවරුන් කිව්වා වාගේ කෘෂිකර්මාන්තය තුළ පොහොර සහ අනෙකුත් දේවල්වලට රසායන පොහොර වාගේ දේවල් ලැබීම තුළින් අඩු මුදලින් වැඩි අස්වැන්නක් කරන්න ගිහිල්ලා අද රටේ විශාල බරපතළ ප්‍රශ්නයක් ඇති වුණා. බස්නාහිර පළාත විශේෂයෙන්ම නාගරීකරණය වන පළාත් සභාවක් හැටියට මේ පළාතේ ජනතාව 77 න් පස්සේ කෘෂිකර්මාන්තයෙන් ඈත් වෙන්න ගත්තා. මට මතකයි එක අවස්ථාවක රනිල් වික්‍රමසිංහ මහත්තයා ආණ්ඩුව කරන කාලේදී එතුමා කිව්වා, කොළඹ තිබෙන ඉඩම් ගොඩ කරලා ඒවායේ කර්මාන්ත ඉදි කරන්න ඕනෑ කියලා. කුඹුරු ගොඩ කරලා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ, නැහැ. ඒක වැරදියි. නාගරික -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මගේ කථාව අහගෙන හිටියා නම් ඔබතුමා තේරුම් ගනී. මම කිව්වේ නාගරීකරණය වන බස්නාහිර පළාතේ - එතුමාගේ කථාවත් එක්ක ගිය කථාවක් මම මේ කිව්වේ. ඒ නිසා ඒක පටවලා ගන්න එපා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ තත්ත්වය තුළ කෘෂිකර්මාන්තයට තිබුණු තැන කොහොමද කියලා අපි දන්නවා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු කථා කරද්දී, ජේන හොඳ දේවල් කථා කළේ නැහැ. විරුද්ධ පක්ෂය මේකේ තියෙන අඩුපාඩුමයි - විරුද්ධ පක්ෂය වෙන්න ඕනෑ විවේචනය කරන්න. හොඳ දේවල් කියන්න නොවෙයි. ඒක මම පිළිගන්නවා. නමුත් අපි දන්නවා, ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මේ ආණ්ඩුවේ අවුරුදු 10 න් අවුරුදු 04 ක් අවධානය යොමු කළේ යුද්ධයට. යුද්ධය ජයග්‍රහණය කරලා ඊට පස්සේ තමයි මේ රටේ ඉදිරි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ. යුද්ධයේ අවසාන අවුරුද්ද වන කොට අපි දැනගෙන හිටියා, යුද්ධය අවසන් වෙනවා කියලා. ඒකට සරිලන විධියට අවශ්‍ය පසුබිම හැදුවා. කෘෂිකර්මාන්තය දියුණු කරන්න අවශ්‍ය පසුබිම ඒ වකවානුවේදී දියුණු කළා. පොහොර සහනාධාරය ලබා දීලා ගොවියාව උනන්දු කළා, රට සහලින් ස්වයංපෝෂිත කරන්න.

අපි දන්නවා පසුගිය අවුරුදු දෙක තුනේ විශේෂිත සහල් හැරෙන්න කිසිම හාලක් පිටරටින් ගෙන්නුවේ නැහැ. මේ අවුරුද්දේ විතරයි අයහපත් කාලගුණය, නියඟය සහ ගංවතුර නිසා අපට හාල් පිටරටින් ගෙන එන්න සිද්ධ වුණේ. හැබැයි, ඒකටත් ගොවියාට - අපි දන්නවා, පසුගිය කාලයේ නියඟය නිසා, ගංවතුර නිසා අලාභ හානියට පත් වුණු ගොවියන්ට ආපහු වගාව කරන්න අවශ්‍ය කරන පසුබිම හදන්න නොමිලේම රජය ඉදිරිපත් වෙලා කටයුතු කරලා තිබෙනවා. ගොවියාට යම් වටිනාකමක් ඇති කළේ, මේ රජයෙන් කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ. ඒකට බස්නාහිර පළාතේ දායකත්වය ලබා දුන්නා. බස්නාහිර පළාත කටයුතු කරද්දී බස්නාහිර පළාතෙන් ඒ රජය ගෙන යන වැඩ පිළිවෙළට දායකත්වය දුන්නා. අද බීජ ගැන කථා කරද්දී කිව්වා, බෝංචි දුන්නාම සෝයා

එනවා කියලා. අඩුපාඩු තියෙන්න පුළුවන්. හැබැයි කරන දේ ගැන කථා කළේ නැහැ. අද බීජ ටික දෙනවා නම්, පොහොර සහනාධාරය දෙනවා නම් - මීට අවුරුදු 06 කට ඉස්සෙල්ලා බස්නාහිර පළාතේ පුරන් වුණු කුඹුරු කොපමණ තිබුණාද කියලා අපි කවුරුත් කථා කළේ නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

පොහොර ටික ලැබෙන්නේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අපි කවුරුත් දන්නවා 2009 – 2010 වනකොට මේ රටේ විශාල කුඹුරු ප්‍රමාණයක් පුරන් වෙලා තිබුණා. ඒ වෙලාවේදී පුරන් කුඹුරු - මට මතකයි ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක මැතිතුමා කෘෂිකර්ම ඇමැතිවරයා හැටියට එදා කථා කරනකොට අපේ රටේ පුරන් කුඹුරු ගැන කථා කළා. ඔබතුමන්ලාට මතක ඇති. හැබැයි, ඒ වැඩ පිළිවෙළ තුළ - මම නැහැයි කියන්නේ නැහැ. එතුමන්ලා යම් දායකත්වයක් දුන්නා. ඒ වැඩ පිළිවෙළ තුළ අද වනකොට පුරන් වෙලා තිබුණු කුඹුරුවලින් සියයට 50 ක 60 ක ප්‍රමාණයට අද වැඩ කරන්න පටන් අරගෙන තිබෙනවා. මම හිතන්නේ ඔබතුමන්ලා ඒක පිළිගන්නවා ඇති.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒවා ආයිමත් -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා. මෙතුමා කාරණාව ඉදිරිපත් කරද්දී අද සමහර අඩුපාඩු තියෙන්න පුළුවන්. නමුත් අද බහුතරයක් වගා කරනවා. ඒවා ගැන කථා කරන්නේ නැහැ. හැබැයි ජනතා විමුක්ති පෙරමුණ -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

2006 දී වගා කරපු ඒවා දැන් -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, නැහැ. මේ වන කොටත් ඒවා වගා කෙරෙනවා ගරු සභාපතිතුමනි. ඊට වඩා වැඩියෙන් වැඩ කෙරෙනවා. අඩු වුණු තැන් තිබෙනවා. වැඩි වුණු තැනුත් තිබෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි, හැම දෙයක්ම කරද්දී අඩුපාඩු තිබෙනවා. අපි දැක්කා, අනුර කුමාර දිසානායක මැතිතුමා කෘෂිකර්ම ඇමැති හැටියට කටයුතු කරන කාලේදී, වාරිමාර්ග වැඩ සටහන් කියලා වැව් හදන්න ගත්තා. වැව් හදපු එක හොඳයි. අපි නැහැයි කියන්නේ නැහැ. හැබැයි, වැව් ටික කරන්න කාටද දුන්නේ? ගම් මට්ටමේ ඉන්න ජනතා විමුක්ති පෙරමුණේ නියෝජිතයින්ට. ඒක නැහැයි කියන්න බැහැ. හැබැයි ඒ අය මොකද කළේ? (බාධා කිරීමක්) මම මේ අනුර කුමාර දිසානායක මැතිතුමාට දොස් කියනවා නොවෙයි. ඔබතුමා අහගෙන ඉන්න. හැබැයි, ගමේ ඉන්න නියෝජිතයා මොකද කළේ? වැව හැරුවා වැලිත් එක්කම යන්න. අනුර කුමාර දිසානායක මැතිතුමා ඒක ව්‍යාපෘතියක් හැටියට සද්භාවයෙන් ක්‍රියාත්මක කරන්න -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒ කළේ වැව් කමිටුවෙන්.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා - ගරු සභාපතිතුමනි මම මේකට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා. බාධා කිරීම්වලට යන්න එපා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, වැව් කමිටුව කියලා ජනතා විමුක්ති පෙරමුණේ නියෝජිතයින්ට දීලා ඒක කෙරෙව්වා. මම වගකීමෙන් කියනවා ගරු සභාපතිතුමනි. මගේ ආසනයේ මාබොදල වැව කරන කොට ඒ කටයුතු කළේ කොහොමද කියන එක මම දන්නවා. මම කාටවත් දොස් කියන්නේ නැහැ. හැබැයි ව්‍යාපෘතියක් හැටියට - ප්‍රතිපත්තියක් හැටියට

[ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා]

හොඳ ව්‍යාපෘතියක්. හැබැයි, ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය තුළ ඒකේ අඩුපාඩු තිබුණා. ඒකයි අදත් විවේචනය කරන්නේ. ඒ වැඩ සටහන් කරද්දී අන්තිමට මොකද වුණේ? පසුගිය කාලේ වැව් ටිකත් නැතුව ගියා. වැව් හිඳිලා ගියා. වතුර නැති වුණා. අද වටේ තියෙන ජල සීමාව (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා බාධා කිරීම් කරන්න එපා. කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මේ කටයුතු කරද්දී ඒක අපි මුහුණ දීපු දෙයක්. ඒ නිසා රජය යම් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරනවා. ඒක නිලධාරීන් හා ගොවීයන් අතරට යනකොට ඒ සීමාව තුළ යම් යම් අඩුපාඩු වෙන්න පුළුවන්. නමුත් එය නිවැරැදි කරගෙන කටයුතු කරපු නිසා තමයි අද සහලින් රට පෝෂිත වුණේ කියන එක මේ අවස්ථාවේදී අපි මතක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඒ වාගේම කෘෂිකර්මාන්ත විෂයය පිළිබඳව එතුමාගේ විශාල වැඩ කොටසක් මේ පොතේ තිබෙනවා. කරපු කාර්ය භාරය පිළිබඳව. බස්නාහිර පළාතේ වාරිමාර්ග සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න අපට මුදල් ලැබෙන කොට වැස්ස එනවා. වහින්නේ නැති කාලේට මුදල් නැහැ. මේ ප්‍රශ්නය හැමදාම බස්නාහිර පළාතේ තිබුණු එකක්. ඒ නිසා තමයි එතුමා අධිකාරිය පිහිටුවලා, ඒ ලබා දෙන මුදල් අධිකාරියට යොමු කරලා අදාළ කාල සීමාවේදී ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් ඇති කළේ. ඒ වාගේම එතුමා පළාත් සභා ව්‍යුහය තුළ යම් දායකත්වයක් මේ පළාත් සභාවට කළා කියන එක මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම අපේ කලාකරු මන්ත්‍රීතුමා කථා කරලා කිව්වා, කලාකරුවන් අද කඩේ යනවා කියලා. මම කනගාටු වෙනවා කලාකරුවෙක් හැටියට තමන්ගේ සහෝදර කලාකරුවන් ඒවාගේ හැල්ලුවට ලක් කිරීම ගැන. අපි දන්නවා. ඉතිහාසයේ යුග තිබුණා, කලාකරුවන් දේශපාලන වේදිකාවලට ගෙනැල්ලා, වේදිකාවට පාවිච්චි කරලා මැතිවරණයෙන් පස්සේ ඒ අය අසරණ වුණාම අතහැරලා දාලා තිබුණු. මරණ ගෙයක් වුණාම ශත පහක් දුන්නේ නැහැ. කලාකරුවන්ට කිසිම සැලකිල්ලක් දැක්වුවේ නැහැ. හැබැයි වර්තමානයේ කලාකරුවන් සඳහා ලොකු දායකත්වයක් ලබා දෙන්න මේ රජය කටයුතු කරලා තිබෙනවා. මම දැක්කා එතුමාගේ කථාවේදී කිව්වා, ඇවිදින මංතීරු හදලා තිබෙනවා කියලා. මම එතුමන්ලාට ආරාධනා කරනවා. විදේශ රටවලට ගිහිල්ලා බලන්න. හැමදාම රට එක තැන තියෙන්න බැහැ. රට ලස්සන වෙන්න ඕනෑ. ලස්සන කරනකොට යම් යම් දේවල් කරනවා. අද වැව් ටික හැදෙනකොට - පාවිච්චි කරන්න බැරි වැව් තිබුණේ. නමුත් ඒවා පාවිච්චි කරන මට්ටමට හැදුවා. මම දන්නවා උඩුගම්පල වැව. අපේ ආසනයේ කරපු දේ. ඒ නිසා ඒකෙන් විශාල කුඹුරු ප්‍රමාණයක් කරන්න පුළුවන්. එක ගලෙන් කුරුල්ලෝ දෙන්නෙක් ගහගන්න කටයුතු කළා. ඔබතුමා කලාකරුවෙක් හැටියට කලාකරුවන් කඩේ යනවා කියලා ඒ අය ගැන කරපු ප්‍රකාශය මම ප්‍රතික්ෂේප කරනවා. මොකද, කලාකරුවෝ මේ රටට විශාල දායකත්වයක් දෙනවා. සහෝදර කලාකරුවන් කඩේ ඇරියා කියන කොට ඒ කලාකරුවන්ට තමුන්නාන්සේත් අයිතියි. තමුන්නාන්සේත් කලාකරුවෙක්. තමුන්නාන්සේ මේ මන්ත්‍රී ධූරයට ආවේ කඩේ ගිහිල්ලා.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

මම කඩේ ගියේ නැහැ නේ? ඒ අය කඩේ යන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, ඔබතුමාත් කඩේ ගිය නිසා නේ ඔතැනට ආවේ. ඒ නිසා -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කඩේ ගිය හැටි කියන්නද?

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

කඩේ ගියාට කමක් නැහැ සේවයක් කරනවා නම්.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කඩේ ගිය හැටි කියන්නද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රවීන්ද්‍ර යසස් ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම එතුමාට දොස් කියන්නේ නැහැ. මොකද, අද ජයන්ත කැටගොඩ මහත්මයා අපත් එක්ක එකතු වුණා වාගේ හෙට එතුමා අපිත් එක්ක එනවා. ඒ නිසා අපි මුකුත් කියන්නේ නැහැ. කීකරු දරුවෙක් එයා. කීකරුව කටයුතු කරන කෙනෙක්. කලාකරුවෝ මැරුවේ කවුද භීෂණ කාලේ. පාරක් පාරක් ගාණේ කලාකරුවන්ව මැරුවා. තමුන්නාන්සේලාත් ඕවාට සම්බන්ධයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම මීට වැඩිය කථා කරන්නේ නැහැ. බොහොම ස්තුතියි.

***පූ.භා. 10.58 ට, අංක 106, 119, 120 හා 121 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***
*Discussion on the Expenditure Head Nos 106, 119, 120 and 121 concluded at 10.58 a.m..*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා දෙපක්ෂයේම ගරු මන්ත්‍රීවරු නිශ්ශබ්ද වෙන්න. කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂ අංක 106, 119, 120 හා 121 පිළිබඳ විවාදය අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ බෙදීමක් තිබෙන නිසා කරුණාකර සීනුව නාද කරන්න.

***ශීර්ෂ අංක 106 හි සඳහන් මුදල් අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 49 යි, විරුද්ධව 22 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No. 106 Should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61 (3) as 49 for, 22 against and 00 decliners.*

***ශීර්ෂ අංක 119 හි සඳහන් මුදල් අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 49 යි, විරුද්ධව 22 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No. 119 Should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61 (3) as 49 for, 22 against and 00 decliners.*

***ශීර්ෂ අංක 120 හි සඳහන් මුදල් අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 49 යි, විරුද්ධව 22 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No. 120 Should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61 (3) as 49 for, 22 against and 00 decliners.*

***ශීර්ෂ අංක 121 හි සඳහන් මුදල් අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 49 යි, විරුද්ධව 22 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No. 121 Should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61 (3) as 49 for, 22 against and 00 decliners.*

**ශීර්ෂ අංක 105 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය**

**ශීර්ෂ අංක 116 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

**ශීර්ෂ අංක 117 - ආයුර්වේද දෙපාර්තමේන්තුව**

**ශීර්ෂ අංක 118 - පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව**

Head No 105 - Ministry of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs

Head No 116 - Department of Health Services

Head No 117 - Department of Ayurveda

Head No 118 - Department of Probation and Child Care Services

***[සංකේත කපා හැරීම]***
*[Symbolic write-off]*

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, *"සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂ අංක 105, 116, 117 සහ 118 ශීර්ෂයන්ගෙන් රුපියල් 10/- බැගින් අඩු කළ යුතු යැයි"* යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 09 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 11.09]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. අපේ අවුරුදු 2500 ක පමණ වන මේ ශිෂ්ටාචාරය ගොඩ නඟන්න දායක වුණු ප්‍රධාන සාධක තුනක් තිබුණා. ඒ තමයි බෞද්ධ සංස්කෘතිය, වාරිකර්මාන්තය සහ ගොවිතැන. මේ තුන පදනම් වෙලා තමයි ලෝකයේ අනෙකුත් දියුණු රටවලට සාපේක්ෂව අපි ශිෂ්ට සම්පන්න ජාතියක් බවට පත් වුණේ. ඊළඟට 1930 න් පස්සේ ශිෂ්ටාචාරය තවත් ඔපවත් වෙන්න, සර්වජන ඡන්ද බලයත්, නිදහස් අධ්‍යාපනයත්, නිදහස් සෞඛ්‍යයත් බලපාලා තිබෙනවා. එතකොට මේ සියලු කාරණා මත ගොඩ නැඟුණු ශිෂ්ටාචාරයත්, විශේෂයෙන් 1977 විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නාට පසුව මේ සියලු පවුරු, පදනම්, පාදම්, කුළුණු සියල්ල බිඳ වැටිලා අද වනකොට නිදහස් සෞඛ්‍ය සේවාවත්, නිදහස් අධ්‍යාපනයත් බිඳ වැටිලා තිබෙනවා. 1977 න් පස්සේ බලයට පත් වුණු හැම ආණ්ඩුවක්ම එය පෞද්ගලිකරණය කරන්න කටයුතු කළා. මීට කලින් මෙවැනි මහජන නියෝජිත ආයතනවලට උගත්, බුද්ධිමත් සමාජ සේවකයන් යැවීමේ සිට අද වනකොට කුඩු ජාවාරම්කාරයන්ගෙන්, එතනෝල් ජාවාරම්කාරයන්ගෙන් පිරුණු ආයතන බවට පත් වෙලා තිබෙනවා. මේ සියලු පද්ධති විනාශ වෙලා තිබෙන කොට තමයි ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය පිළිබඳව අපට කථා කරන්න වෙන්නේ.

සෞඛ්‍ය සේවාවේ අර්බුද ගණනාවක් තිබෙනවා. එය මධ්‍යම රජයටත් පොදුයි. පළාත් සභාවටත් පොදුයි. රෝහල්වල බෙහෙත් හිඟයේ ඉඳලා, කල් ඉකුත් වුණු ඖෂධවල ඉඳලා, ඒ වාගේම රෝහල්වල අත්‍යවශ්‍ය ලේ පරීක්ෂා කරන්න, මුත්‍රා පරීක්ෂා කරන්න එහෙම නැත්නම් ECG එක ගන්න අවශ්‍ය උපකරණ නැතිකමේ ඉඳලා, වෛද්‍යවරුන්ගේ හිඟයේ ඉඳලා, කාර්ය මණ්ඩලයේ හිඟයේ ඉඳලා, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමේ ඉඳලා, විශේෂයෙන් සමහර පත්වීම් දේශපාලනීකරණය කිරීම විසින් මේ සියලු අර්බුද ගණනාවක් සමස්ත සෞඛ්‍ය පද්ධතියේ නිර්මාණය වී තිබෙනවා. අපි කල්පනා කරනවා ගරු සභාපතිතුමනි, මේ සියලු තත්ත්වයන් යටතේ අපට තිබෙන අභියෝග සුළුපටු නැහැයි කියලා. විශේෂයෙන් බස්නාහිර පළාතේ අවුරුද්දකට නේවාසික රෝගීන් ලක්ෂ 10 ක් වාර්තා වෙනවා. ඒ වාගේම සායන සඳහා ලක්ෂ 20 ක රෝගීන් ප්‍රමාණයක් ඇතුළත් වෙනවා. සාමාන්‍යයෙන් අපේ බාහිර රෝගී අංශය සඳහා ලක්ෂ 65 ක රෝගීන් ප්‍රමාණයක් වාර්තා වෙනවා. මේ තත්ත්වය තුළ මෙවැනි අභියෝගයක් ජයග්‍රහණය කරන්න බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සූදානම්ද කියන ප්‍රශ්නය තියෙනවා.

ඒ විතරක් නොවෙයි. අපේ රටේ වෙළඳ නගරය හිමි පළාත වීම නිසාත්, පරිපාලන කේන්ද්‍රය වීම නිසාත් බොහෝ ජනප්‍රිය ප්‍රධාන පාසල් පිහිටා තිබීම නිසාත් මේ පළාතෙන් පිට ජනතාවත් සෞඛ්‍ය පහසුකම් ගන්න බස්නාහිර පළාතේ රෝහල්වලට එනවා. ඒ නිසාම අපට තිබෙන අභියෝගය බරපතළයි. ඒ අභියෝගය ජයග්‍රහණය කරන්න තරම් ප්‍රමාණවත් මැදිහත්වීමක් කරනවාද කියන එකයි බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට අපි කල්පනා කරලා

බලන්න ඕනෑ. ඒකට තමුන්නාන්සේට උත්තරයක් තියෙයි. අපේ රටේ ප්‍රධාන ජාතික රෝහල්, ශික්ෂණ රෝහල්, මධ්‍යම ආණ්ඩුවෙන් පරිපාලනය වන සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන ගණනාවක් බස්නාහිර පළාතේ පිහිටා තිබීම නිසා පළාත් සභාවෙන් ඒ සඳහා යොදන මේ අවධානය හෝ මේ ප්‍රතිපාදන ප්‍රමාණවත්ද කියන තර්කයක් හදන්න පුළුවන්. නමුත් අපි හිතන්නේ, මේ අභියෝගයට සාපේක්ෂව ලක්ෂ 10 ක් නේවාසික රෝගීන් ඉන්නවා නම්, ලක්ෂ 20 ක් අපේ Clinic වලට එනවා නම්, ලක්ෂ 65 ක් OPD එකට එනවා නම්, පිට පළාත්වල ජනතාවත් සේවාව ලබා ගන්න මේ බස්නාහිර පළාතට එනවා නම් අපි මීට වඩා සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, දැන් අපි කල්පනා කළොත් ආණ්ඩුව කියන විධියට මහින්ද රාජපක්ෂ මැතිතුමා පසුගිය දවසක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු අයවැයේ ආකාරයට අපේ රටේ ඉදිරි අවුරුද්දේ ආර්ථික වර්ධන වේගයත් ආදී සියල්ල සලකා බැලුවාට පස්සේ, දළ දේශීය නිෂ්පාදිතය සාමාන්‍යයෙන් ඩොලර් බිලියන 75 ක් දක්වා පුරෝකථනය කරන්න පුළුවන්. ඒ අනුව මධ්‍යම ආණ්ඩුව සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා වෙන් කරලා තිබෙන්නේ ඉදිරිපත් කරන ලද අයවැයෙන් 1.6% යි. බස්නාහිර පළාත් සභාව රටේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව මේ අයවැයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් වෙන් කරලා තිබෙන්නේ 0.09% යි. මම කියන්නේ ගරු සභාපතිතුමනි, දළ දේශීය නිෂ්පාදිතයට 45% ක් දායක වන පළාතක්. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ ලොකු ජනගහනයකට සේවය සපයන්න ඕනෑ පළාතක්. බස්නාහිර පළාත් සභාවේ අයවැයෙන් අපි දළ දේශීය නිෂ්පාදිතයට වෙන් කරන්නේ 0.09% යි.

අපට තමයි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වැඩිපුර සේවකයෝ ඉන්නේ. බස්නාහිර පළාතට. හැබැයි රටේ සමස්ත පුනරාවර්ථන වියදම්වලින් අපි වියදම් කරන්නේ 7% යි. මෙහි ශෝකජනක කටයුත්ත තමයි සෞඛ්‍ය සඳහා රටේ සමස්ත ප්‍රාග්ධන වියදම්වලින් අපි වියදම් කරලා තියෙන්නේ 0.05% යි. ඒ විතරක් නොවෙයි, මේ කෝටි 1000 ට ආසන්න ප්‍රමාණයක් මේ අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙනවා. එහිදී අපි මොකක්ද කරන්නේ? එහිදී විශේෂයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ජනතාවට සෞඛ්‍ය පහසුකම් සපයන්න ඕනෑ. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අයවැයෙන් වෙන් කරලා තියෙන්නේ කෝටි 897 යි. ඒ කෝටි 897 න් පඩි නඩිවලට විතරක් 85% ක් වෙන් කරලා තිබෙනවා. ප්‍රාග්ධන වියදම් විධියට තියෙන්නේ 0.3% යි. දැන් අපි කල්පනා කළොත් ගරු සභාපතිතුමනි, 1987 දී අපේ රටේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ හිටපු පිරිසක් පළාත් සභාවට අරගෙන අපි ඒ අයට බස්නාහිර පළාත් සභාවේ වියදමින් පඩි ගෙව ගෙවා ඉන්නවා. 85% ක්. ඉතින් අපි කොහොමද ඉදි කිරීම් කරන්නේ? ගමට ගියාට පස්සේ තමුන්නාන්සේට තේරෙනවා ඇති, ඒ රෝහල්වලට පහසුකම් නැති වනකොට, වෛද්‍යවරු, කාර්ය මණ්ඩලය අර ඉදි කිරීම් ඕනෑ, මේ ඉදි කිරීම් ඕනෑ කියලා කියනකොට. නමුත් ඒවා ඉදි කරන්න තරම් ප්‍රාග්ධන වියදමක් අපි වෙන් කරලා නැහැ. බස්නාහිර පළාත් සභාවේ මම ඉස්සෙල්ලා කිව්වා වාගේම ලක්ෂ 65 ක් OPD එකට එනකොට, ලක්ෂ 10 ක් නේවාසික රෝගීන් එනකොට අපට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට වෙන් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ කෝටි 897 යි. ඇයි අපට මෙහෙම වෙලා තියෙන්නේ? අපි හිතන්නේ නැහැ රටේ සල්ලි නැතිකම නිසාය කියලා. රටේ මුදල් හිඟකම නිසා නොවෙයි මෙහෙම වෙලා තියෙන්නේ. අපේ රටේ සල්ලි නැතුව නොවෙයි. එහෙම නේද? ආණ්ඩුවට පුළුවන් පසුගිය දෙසැම්බර් මාසේ කොළඹ Night Race තියන්න. ලැම්බෝගිනිවලට කෝටි 20 ක බදු සහන දෙන්න පුළුවන්. කෝටි 20 ක්. ආණ්ඩුවට පුළුවන් IIFA එකට කෝටි 150 ක් වියදම් කරන්න. ආණ්ඩුවට පුළුවන් පොදු රාජ්‍ය මණ්ඩලයේ ක්‍රීඩා උළෙල තියන්න. ඒක ගන්න විතරක් කෝටි 25 ක් වියදම් කළා. හදිස්සියේ ඒක තිබුණා නම් 2018 දෙසැම්බර් මාසේ වනකොට කෝටි 18,500 ක ඇස්තමේන්තුව වියදම් කරන්න වෙනවා. ආණ්ඩුවට පුළුවන් එයාර් ලංකා එක පවත්වාගෙන ගිහිල්ලා හැම අවුරුද්දේම කෝටි 2000 ක් ඒ වෙනුවෙන් වියදම් කරන්න. අපට බැහැ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මේ වැය ශීර්ෂයන්ට අනුව කථා කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඒක තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂය.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඒක හරි. අපි කියන්නේ ගරු සභාපතිතුමනි, ඔබතුමාට තේරෙන්නේ නැද්ද? කෝටි 897 යි වියදම් කරන්නේ. මම කියන්නේ, මෙතුමාට උදව්වක් කරන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයට. සල්ලි ලැබෙන්නේ නැහැ. සල්ලි දෙන්නේ නැහැ. ආණ්ඩුවට බැරිකමක් නැහැ. බැරි නම් ප්‍රශ්නයක් නැහැ. බැරි නම් ඔබතුමාට කියන්න පුළුවන්. මගේ කථාවට බාධා කරන්න පුළුවන්. සල්ලි තියෙනවා නේ? සල්ලි නැත්නම් කොහොමද එක විධායක ජනාධිපති කෙනෙකුට අවුරුද්දට කෝටි 959 ක් වියදම් කරන්නේ. කෝටි 959 ක්. ලේසි නැහැ. එක විධායක ජනාධිපති ධුරයක්, එක පුද්ගලයෙකුට කෝටි 959 යි. මුළු බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට කෝටි 897 යි. ඒකයි තියෙන ප්‍රශ්නය. මෙතුමා මුහුණ දීලා තිබෙන ප්‍රශ්නය තමයි මම මේ කථා කරන්නේ.

ගරු සභාපතිතුමනි, අපට තිබෙන මූලික ගැටළුවක් තමයි, මම හිතන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයත් අවධානය යොමු කරලා තිබෙනවා. අපට බෝ නොවන රෝග පිළිබඳ ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙනවා. මේ වනකොට මම දැක්කා, පසුගිය දවසක කරාපිටිය රෝහලේ විශේෂඥ වෛද්‍ය සුමනතිලක මැතිතුමා ඉදිරිපත් කරලා තිබෙනවා, අපේ රටේ දියවැඩියා රෝගීන් සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ යනවා කියලා. 1990 අවුරුදු 18 ට වැඩි අයගෙන් 2.2% යි දියවැඩියා රෝගයට ගොදුරු වෙලා තිබුණේ. ජාතික දියවැඩියා සංගමය 2008 සමීක්ෂණයක් කළා. 10.3% යි දියවැඩියා රෝගීන් ගණන. මේ වනකොට පුරෝකථනය කරලා තිබෙනවා, අඩු තරමින් අපේ රටේ ජනගහනයෙන් අවුරුදු 18 ට වඩා වැඩි අයගෙන් 15% ක් දියවැඩියා රෝගයට ගොදුරු වෙලා ඇතියි කියලා. ඒකෙන් බස්නාහිර පළාත ප්‍රමුඛයි. 2008 වනකොටත් බස්නාහිර පළාතේ ජනතාවගෙන් 19% ක් දියවැඩියා රෝගයට ගොදුරු වෙලා තිබුණා. ඒ කියන්නේ, අපේ මේ බස්නාහිර පළාතේ ජීවත් වන හැම පස් දෙනාගෙන් එක් කෙනෙක්ම අවුරුදු 18 ට වැඩි අය දියවැඩියා රෝගියෙක් බවට පත් වෙලා තියෙනවා. දැන් සමීක්ෂණයකට අනුව වාර්තා කරනවා, කොළඹ නගරයේ විතරක් 29% කට දියවැඩියාව කියලා. කොළඹ නාගරික ප්‍රදේශවල ළමයින් 23,296 ක් ගෙනැල්ලා සමීක්ෂණයක් කළා. ඒකෙන් වාර්තා වෙනවා, අවුරුදු 5 ත් 14 ත් අතර ළමයින්ගෙන් 7.5% ක් දියවැඩියාව කියලා. අවුරුදු 5 ත් 19 ත් අතර ළමයින්ගෙන් 8.9% කට දියවැඩියාව. දැන් දියවැඩියා රෝගය ව්‍යාප්ත වෙලා යනකොට සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට මේ බස්නාහිර පළාතේ අපි මොකක්ද අරගෙන තිබෙන වැඩ පිළිවෙළ? බරපතළ තත්ත්වයක්. පළාතේ ජනතාවගෙන් 1/5 ක් දියවැඩියා රෝගයට ගොදුරු වනකොට. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, පිළිකා රෝගයත් එහෙමයි. 1986 වනකොට අපේ රටේ පිළිකා රෝගීන් වාර්තා වුණේ 3000 යි. දැන් ඒක 25,000, 30,000 දක්වා වැඩි වෙලා. නිකම් හිතුවොත් එහෙම 2020 වනකොට ලෝක ජනගහනයෙන් 20% ක් පිළිකා රෝගයට ගොදුරු වෙනවා කියනවා. ඒ කියන්නේ 1/5 ක්. ඉතින් මේ බෝ නොවන රෝග මෙහෙම එන්න එන්න වැඩි වෙමින් තියෙද්දී මට පේන්නේ නැහැ, අපි ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කරලා තියෙනවා කියලා. ඒ වාගේම තමයි අපට තිබෙන ගැටළුව මොකක්ද? මම දකිනවා පළාත් සභාව විධියට අපි මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ මේ කර ගෙන යන වැඩ අතරේදී මම දකින ප්‍රධාන ගැටළු කිහිපයක් තිබෙනවා. එකක් තමයි අපට සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා වුණු මධ්‍යකාලීන සහ දිගුකාලීන වැඩ පිළිවෙළක් නැහැ. ඔබතුමාත් මුහුණ දෙනවා ඇති. ප්‍රදේශයේ දේශපාලන අධිකාරියේ උවමනාව අනුව තමයි රෝහලක් මහ රෝහලක් කරනවාද, මූලික රෝහලක් කරනවාද කියලා බොහෝ විට තීන්දු වෙන්නේ. ඒ වාගේම එම රෝහලට අවශ්‍ය කරන ගොඩනැගිලි ටික, උපකරණ ටික තීන්දු වෙන්නේ ඒ මත. ඒක නොවෙයි. බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශයට දිගුකාලීන සහ මධ්‍යකාලීන වැඩ පිළිවෙළක් තිබෙනවා නම් අපි දැනගන්න ඕනෑ, ඒ ප්‍රදේශයේ ඉන්න මහ ආණ්ඩුවේ වුණත්, පළාත් ආණ්ඩුවේ වුණත් දේශපාලඥයින්ගෙන් මුදල් අරගෙන වැඩ ටික කර ගන්න. එහෙම නැත්නම් වෙන්නේ මොකක්ද? සම්පූර්ණයෙන් මේ ව්‍යුහයම කඩාකප්පල් කරලා, ඒකට බාධා කරලා තැන තැන ගොඩනැගිලි ඉදි කරනවා. දැන් ඔබතුමා දන්නවා, පිඹුර රෝහලේ ඔසු සැලක් විවෘත කරන්න ගිහිල්ලා සිදු වුණු තත්ත්වය.

ඒ වාගේ තමයි. වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ. අනෙක් පැත්තෙන් මධ්‍යම ආණ්ඩුවෙන් ලැබෙන ප්‍රතිපාදන වැඩි කර ගන්න. මම ඒකයි මෙපමණ වෙලා ඔබතුමාට කථා කළේ.

මධ්‍යම ආණ්ඩුවෙන් ලැබෙන ප්‍රතිපාදන වැඩි කර ගැනීම සඳහා - පළාත් සභාවට මේ රෝහල් ටික අයිති නම්, අපි සෞඛ්‍ය අමාත්‍යාංශය පවත්වාගෙන යනවා නම් ඒකට මැදිහත්වීමක් කරන්න ඕනෑ. ඒ වාගේම තමයි දැන් ප්‍රතිපාදනත් නැහැ. කරගන්න පුළුවන් වැඩකුත් නැහැ. ඒ නිසාම බලයට පත් වන සෞඛ්‍ය ඇමැතිවරයාට මොකක්ද කරන්න වෙලා තියෙන්නේ? මම අහලා තියෙනවා, එක්තරා කාලයක අපේ රටේ පළාත් පාලන ඇමැතිවරයා වෙලා හිටපු රණසිංහ ප්‍රේමදාස මැතිතුමාටත් මේ වාගේ තත්ත්වයකට මුහුණ දෙන්න සිද්ධ වුණාට පස්සේ, එතුමා කරලා තිබෙන වැඩක් තමයි, පළාත් පාලන අමාත්‍යාංශය මඟින් රට පුරා තිබුණු පාලම්වල තැඹිලි පාට තීන්ත ගෑම. හානියකුත් නැහැ. වාසියකුත් නැහැ. අවාසියකුත් නැහැ. හැබැයි ඇමැතිවරයා විධියට මොකක් හරි කළාය කියලා කියන්න පුළුවන්. එවැනි වැඩ කරන තත්ත්වයකට තමයි සෞඛ්‍ය ඇමැතිවරයාට පත් වෙන්න වෙලා තියෙන්නේ. මේ යන ක්‍රමයේ, යන විධියේ මොකක් හරි සංදර්ශනයක්, ව්‍යාපෘතියක් තමන්ගේ කාලේ කරනවා කියනවා මිසක් දිගු කාලීනව ගත්තොත් එහෙම සෞඛ්‍ය අමාත්‍යාංශයට කරන්න පුළුවන් දෙයක් එතුමාට නැහැ. ඒක එතුමාගේ වැරැද්දක් නොවෙයි. ඔය පුටුවේ මම වාඩි වුණත් ඕකම තමයි තියෙන්නේ.

දැන් වෙලා තියෙන්නේ, සැලසුමක් සහ ප්‍රතිපාදන නැතිකම නිසා තිබෙන ප්‍රශ්නයයි. ඒ විතරක් නොවෙයි. දැන් බොහෝ වෙලාවට විටින් විට සුළු සේවකයන් බඳවා ගන්නවා. දේශපාලන පත්වීම් ලබා දෙනවා. ඒකේ තිබෙන ගැටලුව තමයි ඒ අය දේශපාලන හයිය අරගෙන ගියාට පස්සේ රෝහල්වල වැඩ කරන්න අමාරුයි. ඔබතුමා දන්නවා ඇති. වෛද්‍යවරුන්ට, වෛද්‍ය අධිකාරීවරුන්ට, DMO ලාට වැඩ කරන්න බැහැ. ගණන් ගන්නේ නැහැ. ඇයි? එන්නේ අහවල් ඇමැතිවරයාගේ හයිය අරගෙන. ඒ ඇමැතිගේ හයිය අරගෙන තමයි වැඩ කරන්නේ. කිසිදු නියෝගයක් පිළිගන්නේ නැහැ. මේක අද වෛද්‍යවරු මුහුණ දීලා තිබෙන ප්‍රශ්නයක්. ඒ විතරක් නොවෙයි. ඔබතුමා හොයලා බලන්න. විශේෂයෙන් මධ්‍යම ආණ්ඩුවේ රෝහල්වල වෛද්‍යවරුන්ට ලැබෙන පහසුකම් ටික බොහෝ විට පළාත් රෝහල්වලට ලැබෙන්නේ නැහැ. ඒ නිසා බොහොම කලකිරීමක් තිබෙනවා. සමහර විට Resting Room එක වෙන්න පුළුවන්. එහෙම නැත්නම් OT ප්‍රශ්න වෙන්න පුළුවන්. පළාත් රෝහල්වල යම් බාධා කිරීමක් තිබෙනවා. සීමා කිරීමක් තිබෙනවා. අපට දෙන ප්‍රතිපාදන නිසා. ඒක සමස්තයක් හැටියට වෛද්‍ය ක්ෂේත්‍රයට බලපාන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මෙවැනි ගැටලු ගණනාවක් තිබෙනවා.

ඒ වාගේම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මේ වේගයෙන් ඉහළ යන සංවර්ධන තාක්ෂණය සෞඛ්‍ය සේවාවට බද්ධ කර ගන්න තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශය කටයුතු කරලා තිබෙනවා. මම හිතන්නේ අපේ සෞඛ්‍ය ලේකම්තුමා, පරිපාලන නිලධාරියෙකුට අමතරව එතුමා විශේෂයෙන් IT ගැන උනන්දුවක් දක්වන නිසාම e-channeling වාගේ e-hospital වාගේ සේවාවන් මේ සෞඛ්‍ය සේවාවට බද්ධ කරන්න ගත්තු පියවර ගැන අපි අගය කරන්න ඕනෑ. ඒක අපි තව ඉස්සරහාට ගෙනියන්න ඕනෑ. බස්නාහිර පළාතෙන් ආදර්ශයක් දෙන්න ඕනෑ. අපට පුළුවන් නම් ඒ රෝහල් තදබදය නවීන තාක්ෂණය යොදාගෙන අවම කරන්න, ඒකට අපි පහසුකම් දෙන්න ඕනෑ. ඒ නිසා මේ කරගෙන යන වැඩේට උදව්වක් තමයි දෙන්නේ. අපි දන්නවා, අමාරුවෙන් වැඩ කරගෙන යන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශය තව ඉස්සරහාට ගන්න එකතු වෙලා කටයුතු කරමුයි කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.24]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු මෙම වැය ශීර්ෂය සම්බන්ධයෙන් වචනයක් ප්‍රකාශ කරන්න අවස්ථාව සලසා දීම පිළිබඳව මම අතිශයින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ අමාත්‍යාංශය සඳහා 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය තුළින් වෙන් වී ඇති මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 9743 ක්. මම හිතන විධියට ප්‍රාග්ධන ආයෝජන සඳහා මෙයින් හම්බ වෙන්නේ 20% කට අඩු ප්‍රමාණයක්. ඒ නිසා කරන්න තිබෙන රාජකාරී ප්‍රමාණය අතිශයින්ම දැවැන්තයි. මමත් එකඟ වෙනවා, මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නැහැයි කියන කාරණාවට. මා දන්නේ නැහැ, ඒ සඳහා තිබෙන ගැටලු, බාධක අතරේ මේ කටයුත්ත - මම හිතනවා, ගරු ප්‍රධාන ඇමැතිතුමා ගිය වර්ෂවල මුදල්

[ගරු ජගත් අංගගේ]

ප්‍රතිපාදන වෙන් කරලා තිබුණාට වැඩිය 24.54% ක් වැඩියෙන් දීලා තිබෙනවා. එතකොට ගිය වර්ෂවල ඊට වැඩිය ගොඩක් අඩුවෙන් දීලා තියෙන්නේ. මේ ඉලක්කම් තිබෙනවා. ඒ ඉලක්කම් ප්‍රකාශ කරන්න මම මෙය අවස්ථාවක් කරගන්නේ නැහැ. කෙසේ වෙතත් සෞඛ්‍ය කියන විෂයය ශ්‍රී ලංකාවේ අති දැවැන්ත සංකල්පයක් මත බිහි වුණු විෂයයක්.

ශ්‍රී ලංකාවේ බහුතරයක් ජීවත් වෙන්නේ සිංහල බෞද්ධයින්. බුදුන් වහන්සේගේ ධර්මය අනුව ලෝකයේ ජීවත් වන මනුස්සයෙකුට ලබන්න පුළුවන් ඉහළම ලාභය තමයි නිරෝගීභාවය. ආරෝග්‍යා පරමා ලාභා - සන්තුෂ්ඨී පරමං ධනං. ඉතින් ඒ බුද්ධ වචනයට අනුව රටක රාජ්‍ය තමන්ගේ පුරවැසියන්ට නිරෝගී බව අත්පත් කර දීම සඳහා යම්කිසි ආයෝජනයක් කරනවා නම් ඒක මහ ධර්මානුකූල ක්‍රියාවක්. ඒ වුණත් අපට වඩා දියුණු බොහෝ රටවල් - අද චීනය තමයි අපට වැඩියෙන්ම උදව් කරන්නේ. චීන ව්‍යාපෘති තමයි ලංකාවේ හතර වටේ තිබෙන්නේ. මම පසුගිය කාලයේ චීන රටේ ෂැංහයි සහ බීජිං නගරවල රෝහල් හතරකට ගියා. ඒ එක රෝහලකවත් නිදහස් වෛද්‍ය සේවාවක් නැහැ. යම් රෝහලක් ඉදිරිපිට හදිසි අනතුරකට භාජනය වුණත් රෝහල ඇතුළට ඇවිල්ලා ප්‍රතිකාර ලබන්න නම්, සෞඛ්‍ය රක්ෂණය තියෙන්න ඕනෑ. එහෙම නැත්නම් මුදල් තියෙන්න ඕනෑ. ශ්‍රී ලංකාවේ යම් පුද්ගලයෙක් රාත්‍රී කාලයේ බස් නැවතුම් පොළක හිටියොත් එහෙම වැස්ස වහිනවා, බස් එකක් ගන්න නැත්නම් ළඟම තිබෙන රෝහලට ගිහිල්ලා පපුව රිදෙනවා කිව්වොත් රාත්‍රිය ගත කරන්න පුළුවන්. එහෙම තමයි ලංකාව. මේ නිදහස් සෞඛ්‍ය සේවයේ වටිනාකමක් අපට නොදැනුනාට මෙය අතිශයින් වැදගත් කාරණාවක් බව අපි මෙනෙහි කරගත යුතුව තිබෙනවා.

ඒ වාගේම අද සෞඛ්‍ය සේවාවේ පෙරට වැඩිය මහ දැවැන්ත වර්ධනයක් දකින්න තිබෙනවා. අපි කියනවා වාගේ බෝ නොවන රෝගවලින් ඉතා දැඩි ප්‍රතිශතයක් රෝගාබාධවලට ලක් වෙලා ඉන්නවා. ඒ තත්ත්වය පිළිබඳව බස්නාහිර පළාත් සභාව නායකත්වය ගෙන තිබෙනවා. බස්නාහිර පළාත් සභාව තමයි 2011 වර්ෂයේදී බෝ නොවන රෝග සම්බන්ධව ශ්‍රී ලංකාවේ පළමුවැනි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේ. උත්තම ශ්‍රම පූජා ව්‍යාපෘතිය ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ආරම්භ කළේ. එවකට හිටපු සෞඛ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන්. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්. අද එතුමා නැති වුණාට එදා ඒ කටයුත්තට අපට දායකත්වය දුන්නා. කොහොම වුණත් අපි රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල ලක්ෂයක කණ්ඩායමක් මේ රෝග තත්ත්වයන් පිළිබඳව නිරීක්ෂණය කරලා, ඒ අයව නැවත මේ රෝගාබාධවලින් නිදහස් කර ගැනීමට අවශ්‍ය මූලික අවබෝධය ඇති කරන්න පුළුවන්කම ලැබුණා. අපට මේ ව්‍යාපෘතියෙන් කෝටි ගණනක් ලාභයි.

ඇයි මම කෝටි ගණනක් ලාභයි කියන්නේ? දැන් රජයක් හැටියට නිදහස් සෞඛ්‍ය සේවාව පවත්වාගෙන යන්නේ. අපට කලින් යම් කෙනෙකුගේ රෝග තත්ත්වයන් පිළිබඳව පැහැදිලි කිරීමක්, වාර්තාවක් සපයා දෙන්න පුළුවන් නම් ඔහු බොහෝ විට තමන්ගේ පෞද්ගලික වෛද්‍යවරයා සමග තමයි සම්බන්ධ වෙන්නේ. එතකොට මේ තත්ත්වය හඳුනාගන්න බැරි වෙලා අපි හිතමු දියවැඩියාව නම්, දියවැඩියාවේ කෝමා තත්ත්වයට ආවොත්, ඉතාම උත්සන්න තත්ත්වයකට ආවොත් අඛණ්ඩව රජයේ රෝහලේ සායනයට එන්න සිද්ධ වෙනවා. නමුත් එය මූලික අවස්ථාවේ හඳුනා ගත්තොත් ඔහු තමන්ගේ පෞද්ගලික වෛද්‍යවරයාත් එක්ක සම්බන්ධ වෙනවා. මේ නිදහස් සෞඛ්‍ය සේවා තත්ත්වය තුළ රජයට විශාල වාසිදායක තත්ත්වයක් ඇති වෙනවා. නමුත් මේවා කරනකොට සමහර අයට දැනුනේ නැහැ. ඒ අය කිව්වා මොකටද මිනිස්සුන්ව බල බලා යන්නේ කියලා. නිකම් බල බලා යනවා. රජය එලෙස කරන විධියක් හැටියට තමයි ඒ අය දැක්කේ. මෙය කනගාටුදායක සිද්ධියක්. ගරු සභාපතිතුමා මගින් ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. බෝ නොවන රෝග තත්ත්වයන් පිළිබඳව දැඩි වර්ධනයක් සිද්ධ වෙනවා කියලා මේ ප්‍රකාශයේ තිබෙනවා. නමුත් ඒ ව්‍යාපෘති පිළිබඳව වචනයක්වත් සඳහන් කරලා නැහැ. උත්තම ශ්‍රම පූජා වෙන්න පුළුවන්. ඒකේ නම හොඳ නැත්නම් මුලින්ම ප්‍රේමදාස මහත්මයා ජනසවිය පටන් ගත්තා. ඊට පස්සේ සමෘද්ධි තිබුණා. සමෘද්ධියට තවත් නමක්. දිවි නැඟුම වුණා. ඒක ප්‍රශ්නයක් නැහැ. නම් වෙනස් කර ගත්තාට කමක් නැහැ. නමුත් මූලික හරයට හානියක් නොවන විධියට යහපත් දේ ක්‍රියාත්මක කිරීමේ වගකීම අපට තිබෙනවා.

ගරු ප්‍රධාන ඇමැතිතුමා පිළිබඳව සිහිපත් කරනවා. එතුමාගේ ආදර්ශය අපට වැදගත් වෙනවා. මම, 1999 අපේ පාසල - අපේ දැතින් සුරකිමු ව්‍යාපෘතිය පානදුර අධ්‍යාපන කොට්ඨාශයේ, මොල්ලිගොඩ කණිෂ්ට විද්‍යාලයේ තමයි සමාරම්භක උත්සවය තිබුණේ. අදත් ඒ මතක සැමරුම් සටහන තිබෙනවා. නමුත් එතුමා ඒ ව්‍යාපෘතිය ප්‍රධාන ඇමැති ධූරයට පත් වුණු දවසේ ඉඳලා හැම දවසකම ඒකට මුදල් වෙන් කළා. ප්‍රධාන ඇමැති ධූරය භාර ගත්තු හැම වර්ෂයකදීම ඒ සඳහා මුදල් වෙන් කරලා දීලා තිබෙනවා. යහපත් දේ ඉදිරියට අරගෙන යෑම සඳහා අපේ ක්‍රියාත්මක වැඩ සටහන් තිබෙන්න ඕනෑ. අනෙක් එක ගරු සභාපතිතුමනි, මේවා හැම එකක් පිළිබඳව ප්‍රාථමික අවස්ථාවේදීම සලකා බලන්න ඕනෑ. කළුතර දිස්ත්‍රික්කයේ සොඳුරු ළමා විය සුරකිමු කියලා නියාමක ව්‍යාපෘතියක් ආරම්භ කළා. මොකක්ද මේ කළේ? අපේ දරුවන්ට අපේ දේශීය ආහාර රටාව දිවට හුරු කරන වැඩ සටහනක්. මේ තුළින් කළුතර දිස්ත්‍රික්කය මුළු ලංකාවෙන්ම ළමා මන්දපෝෂණය අවම දිස්ත්‍රික්කය බවට පත් වුණා. වර්ෂ 1 ½ ක් ඇතුළත. මේ පිළිබඳ තොරතුරු තිබෙනවා. මේක අපි කරන්න ඕනෑ. සමහර වෙලාවට අපි චීන රටට ගියොත් අපේ ළමයින් කන්නේ නැහැ. මොකද, චීන රටේ මිනිස්සු හුරු වෙලා තිබෙන ආහාර රටාවට අපේ දරුවන්ගේ දිව හුරු වෙලා නැහැ. අපේ රටේ දරුවන්ගේ දිවට දේශීය ආහාර වර්ගවල රුචිය දැනෙන විධියට වැඩ සටහනක් සම්පාදනය කරන්න ඕනෑ කියන මතය තුළ අපි සොඳුරු ළමා විය සුරකිමු කියන දරුවන්ගේ මූලික අයිතිවාසිකම් සහ දරුවන්ට අපේ රටේ ආහාර රටාවට දිව හුරු කරන ක්‍රමවේදය පවුල් සෞඛ්‍ය නිලධාරීන්, පෙර පාසල් ගුරුවරුන් සමග ඒකාබද්ධ වෙලා විශාල ව්‍යාපෘතියක් කළා. මේ ව්‍යාපෘතිය තුළින් අපි විශ්වාස කළා, දරුවන්ට යම්කිසි විධියකින් විවෘත වෙළඳ පොළේ තිබෙන රූපවාහිනිය ප්‍රදර්ශනය කරන වෙළඳ දැන්වීම් දිහා නෙත් යොමු කරලා ආහාර රටාව තීන්දු කරනවාට වැඩිය, පුංචි කාලේ ඉඳලා මේ දරුවන්ට සෞඛ්‍ය අමාත්‍යාංශයත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් ඒකාබද්ධ වෙලා පෙර පාසල්වලට විශේෂ අවස්ථාවක් ලබා දිය යුතුයි කියලා. අපි එහෙම දීලා තිබෙනවා. පෙර පාසල් ගුරුවරුන්ට දීමනාවක් එහෙම ගෙවලා. මේ කණ්ඩායම ඒකරාශී වෙලා පුංචි කාලේ ඉඳලාම දරුවන් මේ රටේ ආහාර රටාවට දිව හුර කරගන්න ක්‍රමවේදය සකස් කර ගන්න. එතකොට මේ බෝ නොවන රෝග විශාල ප්‍රමාණයකින් මතු පුරපුර ආරක්ෂ කර ගන්න පුළුවන්. දැන් වඳ වුණු පැළයට කරන්න දෙයක් නැහැ. පුළුවන් තරම් සාත්තු කරලා බෙහෙත් හේත් ටිකක් පොවලා තියාගන්නවා හැරෙන්න. නමුත් පුංචි දරුවන්ගේ අනාගතය අතිගරු ජනාධිපතිතුමා පැහැදිලිව කියන කථාවක් තමයි හොඳම දේ දරුවන්ට කියලා. හොඳම දේ දරුවන්ට නම් අනාගතයේ දරුවන්ට බෙහෙත් බොන්න පාර කපන එක නොවෙයි වැඩේ. බෙහෙත් හේත්වලට යොමු නොවෙන්න, මේ රෝගාබාධවලින් දරු පරපුර ආරක්ෂා කර ගන්න මූලික පියවර ක්‍රියාත්මක කිරීමයි අවශ්‍යයි. ඒ නිසා මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාට සිහිපත් කරනවා, මේක සාර්ථක වුණු ව්‍යාපෘතියක්. මෙහි ප්‍රතිඵල අත්පත් කරගෙන තිබෙනවා. ඒ නිසා මගේ නම නොගැළපෙනවා නම්, වෙන නමක් දාලා හරි මේ කටයුතු ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ තුළ රටේ අනාගත දරු පරපුර ආරක්ෂා කර ගන්න බෝ නොවන රෝගවලින් සුවිශේෂී මෙහෙවරක් කරන්න පුළුවන් වේවි. ඒ සඳහා ගරු ඇමැතිතුමා - තව කථා කරන්න බොහෝ දේ තිබෙනවා. අනෙක් එක මට තව එක කථාවක් කරන්න තියෙනවා.

ගරු සභාපතිතුමනි, මට පුංචි වෙලාවක් දෙන්න. මේ පොත සකස් කරන වෙලාව වනකොට මේකේ තිබෙනවා සමාජ සේවා ප්‍රඥප්තිය සංශෝධනය කරනවා කියලා. මේ පොතේ 15 වැනි පිටුවේ සඳහන් වෙලා තිබෙනවා. සමාජ සේවා ප්‍රඥප්තිය සංශෝධනය - සමාජ සේවා විෂයය ගරු ඇමැතිතුමාගෙන් බැහැර වෙලා තියෙන්නේ. මේ පොත සකස් කිරීමේදී එය අවධානයට ලක් නොවීම පිළිබඳව මම කනගාටු වෙනවා. ඒක නිවැරදි කරනවා නම් හොඳයි. මොකද, හේතුව ඒක දැන් වෙනත් අමාත්‍යාංශයකට යොමු වෙලා තිබෙන නිසා.

ඒ වාගේම ප්‍රඥප්ති සංශෝධනය කිරීම. ප්‍රඥප්ති සංශෝධනය කිරීම යටතේ පෙන්වා දෙනවා 2012 අංක 03 දරන මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තියත් සංශෝධනය කරනවා කියලා. ඒ ප්‍රඥප්තිය මුළු ලංකාවෙන්ම අපි විතරයි සම්මත කර ගත්තේ. මුළු ලංකාවේම අනෙක් පළාත් සභා මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරන්න උත්සාහ ගත්තා. නමුත් කරන්න හම්බ වුණේ නැහැ. බාධා වුණා. දුන්නේ නැහැ. විවිධ බලවේග විරුද්ධ වුණා. වාසනාවට 2012 දී බස්නාහිර පළාතේ පමණක් අපි මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කළා. ඒ නිසා තමයි මේ ප්‍රමාණයට ඩෙංගු මර්දනය කරලා පාලනය කරගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. නිලධාරීන්ට අවශ්‍ය කරන

[ගරු ජගත් අංගගේ]

නෛතික බලය ලංකාවේ කිසිම පළාත් සභාවක් සම්පාදනය කරලා නැහැ. මම දන්නේ නැහැ මේකේ සංශෝධන හැටියට දැන් අවශ්‍යතාවයක් වෙලා තියෙන්නේ මොනවාද කියන්න. ඒ කාරණා පිළිබඳව එහෙම පැහැදිලි කිරීමක් නැහැ. සංශෝධන ප්‍රඥප්ති ගොනුවට මේ ප්‍රඥප්තියත් ඇතුළත් කරලා තිබෙනවා. මේවා සංශෝධනය කරන්න පුළුවන්. නමුත් මේ වගන්ති Cancel කරලා අලුතින් වගන්ති දාගන්න ගියාම ලොකු ප්‍රශ්න ඇති වෙනවා. ඒක මම පැහැදිලි කරනවා. මොකද හේතුව, මට අත්දැකීමක් තිබෙනවා. අනෙක් පළාත් සභාවල අමාත්‍යවරු ඒ දවස්වල මට පැහැදිලිව කථා කරලා කිව්වා, ඔබතුමාගේ ප්‍රඥප්තිය අපි මෙහෙට අරගෙන යන්න උත්සාහ කළා, අපට මෙන්න මේ වාගේ ගැටළු බාධක ආවා කියලා. නමුත් මේ සංශෝධනය ඉදිරිපත් කරන මොහොතේ ඔය ගැටළු බාධක එන්න පුළුවන්. මේකේ තියෙන කැලි ගලවන්න. අනුමත කරගත්තා වාගේ නොවෙයි. ආපහු මේකට එහෙන් මෙහෙන් අඩුපාඩු සිද්ධ වුණොත් එහෙම මහ විශාල වශයෙන් මේ ප්‍රදේශයට ඒ කාරණාව බලපානවා. ඒ නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. මේවා කොහෙන් එන යෝජනාද දන්නේ නැහැ. මේ යෝජනා ක්‍රියාත්මක කිරීමේදී ඔබතුමාගේ විශේෂ අවධානයට ඒ කාරණා ලක් කර ගන්න කියලා මම කියනවා.

අනෙක් එක මේ උද්‍යාන රෝහල් සංකල්පය. ගරු සභාපතිතුමනි, අපි දිස්ත්‍රික්ක තුනට දෙක ගාණේ රෝහල් හයක් නම් කළා. දැන් සටහන් වෙලා තිබෙනවා ගලපාත රෝහල. මේ පොතේ සඳහන් වෙනවා ගලපාත රෝහල උද්‍යාන රෝහලක් බවට පත් කරනවා කියලා. ගලපාත රෝහල උද්‍යාන රෝහලක් බවට පත් කරන්න අවශ්‍ය කරන පරිසරය නැහැ. උද්‍යාන රෝහලකට විශාල භූමි භාගයක් අවශ්‍ය වෙනවා. ඒ නිසා තමයි අපි කළුතර දිස්ත්‍රික්කයේ නම් කරලා තිබුණේ, හල්තොට රෝහල සහ ගෝනදූව රෝහල. මොකද, මේ රෝහල් දෙකේම භූමියේ විශාල ඉඩ ප්‍රමාණයක් තිබෙනවා. පළමුවැනි අදියරේ මුදල් ආයෝජනය කරලා ඒවායේ කොටස් අවසන් කරලා තිබෙනවා. Jogging Track එකක් පවා මේ උද්‍යාන රෝහලකට එන්න ඕනෑ. Track එකක් හදන්න පුළුන් භූමිය තියෙන්න ඕනෑ. උද්‍යානයක් සකස් කිරීමේ පරිසරය තියෙන්න ඕනෑ. මේ සියලු අවශ්‍යතා සම්පූර්ණ වුණාට පස්සේ තමයි ඒ කටයුතු සිද්ධ වෙන්නේ. අනෙක් එක මූලික රෝහලකට බද්ධ වෙන්න ඕනෑ. අපි ගෝනදූව රෝහල පානදුරේ මූලික රෝහලටත්, හල්තොට රෝහල හොරණ රෝහලටත් හිතාගෙන තමයි - අනෙක් දිස්ත්‍රික්ක දෙකේත් රෝහල් හතරක් නම් කරලා තිබෙනවා. ඒ සියල්ල පිළිබඳව ඔබතුමාගේ අවධානයට ලක් කරනවා. මම හිතනවා, මේක ඉතාමත් හොඳ ව්‍යාපෘතියක්. මම හිතනවා, අපේ ගරු ඇමැතිතුමාට ඒක සාර්ථකව අවසන් කරන්න පුළුවන් වෙයි කියලා. මොකද හේතුව, ප්‍රධාන රෝහල්වල තිබෙන දැවැන්ත තදබදය. සමහර වෙලාවකට කකුලක අස්ථි බිඳීමක් සිද්ධ වෙලා මාස දෙක තුනක් රෝහලේ ඉන්න ඕනෑ. නමුත් ඒකට ජීවිත අවධානමක් නැහැ. අපට ගිලන් රථ සේවාවක් තිබෙනවා. ගිලන් රථයක් මගින් ඒ රෝහලකට ඇතුළත් කරලා නිදහසේ ඔවුන්ට අවශ්‍ය කරන ව්‍යායාම කරන්න, ඒ පසුතලය තුළ නිදහසේ ඉන්න පුළුවන් තත්ත්වයට මේ රෝහල් සම්බන්ධ කරගත්තාට පස්සේ අපි අර පාසල් ප්‍රතිව්‍යුහගත කළා වාගේ මේ රෝහල්වලින් නිකන් නිකරුණේ තිබෙන වාට්ටු සහ ඇඳන්වලින් ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. ඒ වාගේම පරිසරය අලංකරණය තුළ රෝගියාට ඉතා යහපත් මානසික සුවයක් ලබන්න පුළුවන් විධියට පරිසරය සකස් කිරීම මේ සංකල්පය තුළ අතිශයින් වැදගත් වෙනවා. මේ කටයුත්ත ක්‍රියාත්මක කිරීමේදීත් ඔබතුමාගේ විශේෂ අවධානයට ලක් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මම දීර්ඝ වශයෙන් කථා කරන්න මට වෙලාවක් නැහැ. නැත්නම් මේ පොතේ සටහන් කරගත්තු කාරණා ගොඩක් තිබෙනවා. විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමාට මේ වර්ෂය තුළ ලැබිලා තිබෙන මුදල් ප්‍රතිපාදන ආයෝජනය කරලා ඉතාමත් යහපත් සේවාවක් බස්නාහිර පළාතේ සෞඛ්‍ය සේවාවට කරන්න ශක්තිය, ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තූතියි. ඇත්ත වශයෙන්ම එතුමා හිටපු සෞඛ්‍ය ඇමැතිතුමා හැටියට පසුගිය පළාත් සභාව තුළ විශාල සේවයක් කළා. එතුමා මේ අමාත්‍යාංශය තුළ විශාල සේවාවක් කළා. ඒ නිසා මම එතුමාට විනාඩි 05 ක කාලයක් වැඩිපුර ලබා දුන්නා. එතුමාට ගරු කිරීමක් වශයෙන් ඒ කාලය ලබා දුන්නේ.

එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 09 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.35]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මේ අවස්ථාවේදී බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. මුලින්ම කියන්න ඕනෑ හරිම කනගාටුයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය කථා කරන වෙලාවේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා මේ අයවැය විවාදය නරඹන්න ඇවිල්ලා නැහැ. මම හිතන්නේ ගරු ඇමැතිතුමා, ඔබතුමාගේ අඩුපාඩුවක් එතුමා මෙතැනට නොපැමිණීම. මොකද, අවුරුද්දට එක පාරයි මෙතැනට එන්න තියෙන්නේ. ඉතින් ඒත් එක්කම අපි මතක් කරන්න ඕනෑ, පළාත් සභා විෂයය පථය තුළ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා දැන් පළාත් සභාවලට ඇමැතිවරු පස් දෙනෙකුගේ පාලනයක් තිබුණාට, මේකට විශාල වපසරියක් තිබෙනවා. විශේෂයෙන් කිව්වොත් එහෙම අධ්‍යාපනය සම්බන්ධයෙන් බැලුවොත්, සෞඛ්‍ය සම්බන්ධයෙන් බැලුවොත් මේ පළාත් පාලන ආයතන විශාල ගණනාවක් මේ රටේ තිබෙනවා. ඒ නිසා මේ ආයතනවල සම්බන්ධීකරණය මනාව තිබෙනවා නම්, විශේෂයෙන්ම අගනගරය අයිති වන බස්නාහිර පළාත තුළ විශාල සේවයක් මීට වඩා කරන්න පුළුවන් වෙයි කියන එක මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම පළාත් පාලන ආයතන බිම් මට්ටමේ මෙහෙයවීම හරහා විශාල සේවයක් කරන්න පුළුවන්. විශේෂයෙන්ම පළාත් පාලන ආයතන මහ ඇමැතිතුමා යටතේ ආවට සෞඛ්‍ය ඇමැතිවරයා යටතේ ඉන්න මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වැඩ කරන්නේ පළාත් පාලන ආයතනවලට අනුබද්ධව. අන්න ඒ නිසා මේ සම්බන්ධීකරණයේ අඩුපාඩු නිසා කෙරෙන්න පුළුවන් විශාල වැඩ කොටසක් කෙරෙන්නේ නැහැ කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ.

විශේෂයෙන්ම අපි උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම මා ඉන්න කොලොන්නාව ආසනය, නැත්නම් මැද කොළඹ ආසනය අරගෙන බැලුවාම බිම් මට්ටමේ පළාත් පාලන ආයතන හරහා පුරවැසියන්ගේ සෞඛ්‍ය නඟා සිටුවන්න විශාල සේවයක් කරන්න පුළුවන්කම තියෙද්දිත් එහෙම කරන්නේ නැහැ. අද විශේෂයෙන්ම අපේ සෞඛ්‍ය ඇමැතිතුමා, දැන් කොලොන්නාවේ කුණු කන්ද ගැන මම නැවත කියන්න ඕනෑ. කිසිදු මැදිහත්වීමක් කරන්නේ නැහැ. වචනයක්වත් කථා කරන්නේ නැහැ. ඒ නිසා ඒ පළාතේ සෞඛ්‍ය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. වතු නිවාසවල සෞඛ්‍ය විනාශ වෙලා තිබෙනවා. ගංවතුරෙන් යට වුණාම ආධාර බෙදනවා විතරයි. ඒ ජනතාවගේ සෞඛ්‍ය සඳහා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් යොදන්න සෞඛ්‍ය අමාත්‍යාංශයටත්, පළාත් පාලන අමාත්‍යාංශයටත් එකට එකතු වෙන්න හැකියාවක් ලැබිලා නැහැ කියන එකත් කියන්න ඕනෑ. විශේෂයෙන් මම ඒ සම්බන්ධයෙන් පුදුම වෙන්නේ නැහැ. මොකද, හේතුව මධ්‍යම රජයේ සෞඛ්‍ය ඇමැතිවරයා කියනකොට එතුමාට වැඩ කරන්න අවස්ථාවක් දෙන්නේ නැහැ කියලා, පළාත් සෞඛ්‍ය ඇමැතිවරයාට වැඩ කරන්න හම්බ වෙන්නේ නැති එක ගැන අපි අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. මොකද, මේ රටේ නිදහස් සෞඛ්‍ය සේවය, නිදහස් අධ්‍යාපනය වාගේම වැදගත් වුණාට, මේකෙන් වැඩි හරියක් ප්‍රතිලාභ ලබන්නේ සාමාන්‍ය අහිංසක, අසරණ, දුප්පත් ජනතාවට. සල්ලි තිබෙන කට්ටිය පෞද්ගලික ආරෝග්‍ය ශාලාවලට ගිහිල්ලා තමන්ගේ දේවල් ටික කර ගන්නවා. නමුත් මේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සෙත සැලසෙන්නේ, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් සෙත සැලසෙන්නේ දුප්පත්, අහිංසක, අසරණ ජනතාවට. හැබැයි අද වනකොට නිදහස් සෞඛ්‍ය සේවය වචනයට පමණක් සීමා වුණු සෞඛ්‍ය සේවයක් කියලා අපට දැනෙනවා. මොකද, හේතුව බෙහෙත් අධික මිල ගණන්. තමන්ට අවශ්‍ය අධික මිල බෙහෙත් ටිකවත් රජයේ ඉස්පිරිතාලයකින් නොමිලේ ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. සාමාන්‍ය අඩු මිල බෙහෙත් ටික නිකම් හම්බ වෙනවා. අධික මිල බෙහෙත් ටික ගන්න බැරි නිසා අද ජනතාව ඒ තුළින් විශාල පීඩාවකට ලක් වෙනවා.

විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ පසුගිය දවසක අපි විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම මීගමුව මහ රෝහලට ගියාම, ඒ මහ රෝහලේ වාර්තා අරගෙන බැලුවාම ප්‍රධාන වෛද්‍යවරයා, වෛද්‍යවරිය පෙන්නපු වාර්තා අනුව දවසින් දවස, අවුරුද්දෙන් අවුරුද්ද මීගමුව මහ රෝහලේ එකෝ යන්ත්‍රයෙන් ලබා ගන්නා සේවාව වැඩි වෙමින් පවතිනවා. වාර්ෂිකව දහස් ගණනක් වැඩි වෙනවා. හැබැයි, ඒ එකෝ යන්ත්‍රය කැඩිලා ඒක Repair කරන්නවත් එහෙම නැත්නම් අලුතින් එකෝ යන්ත්‍රයක් ගන්නවත් මේ පළාත් සභාවෙන් කිසියම් වූ පියවරක් අරගෙන නැහැ. ඒකට නොයෙකුත් නීති රාමුන් පෙන්වනවා. හැබැයි, මිලියන දෙසිය ගණන් වියදම් කරලා කිසිම සැලැස්මක් නැතුව, එහෙම නැත්නම් තත්ත්ව වාර්තාවක් නැතුව ගොඩනැගිලි හදලා,

[ගරු එස්.එම්. මරික්කාර්]

ඒ ගොඩනැගිලි අවුරුදු 10 ක් යන කොට භාවිතා කරන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මම හිතන්නේ, බස්නාහිර පළාතේ සෞඛ්‍ය ඇමැතිවරයා වශයෙන් මෙතුමාත් අපේ හිටපු ඇමැතිවරුත් මේකට වග කියන්න ඕනෑ. මොකද, හේතුව මේ මහජනතාවගේ මුදල්, මිලියන 200 ක්. අවුරුදු 10 කින් බිල්ඩින් එකක් විනාශ වෙනවා කියන්නේ -

**ගරු රංජිත් සෝමවංශ** (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

ඒක බිහි කළේ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒ කාලේ ඔබතුමාගේ ජනාධිපතිනි. අපේද? එතුමිය තවමත් අපේ නායිකාව නොවෙයි. පැහැදිලිවම අපේ නායකයා රනිල් වික්‍රමසිංහ මැතිතුමා. ඔබතුමන්ලා තමයි ඒ කාලේ අතිගරු උත්තමාවිය කියා ගෙන ලෙව කාගෙන ගියේ. අපි ගියේ නැහැ. අපි අද යන්නෙත් නැහැ, ලෙව කාගෙන. විහාරමහා දේවිය කියා ගෙන ලෙව කාගෙන පස්සෙන් ගියේ ඔබතුමන්ලා. අපි ගියේ නැහැ. අපි අද යන්නෙත් නැහැ. අපි හෙට යන්නෙත් නැහැ. ඒක හොඳට මතක තියාගන්න. අපට ඉන්නේ එක නායකයයි. ඒ රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියන එක අපි පැහැදිලිව කියනවා. වැඩිය කථා කරන්න එපා. අද මාධ්‍ය සාකච්ඡාවක් තියලා ආවා. ඇමැතිතුමා මාධ්‍ය සාකච්ඡාවක් තියලා අද ආවේ. වැඩිය කථා කරන්න එපා. අද රැට බලාගන්න පුළුවන්. අන්න ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ, තමුන්නාන්සේලා මොන පක්ෂයේ හිටියත්, එක්සත් ජාතික පක්ෂයෙන් ඒ වැඩේ කළා නම් ඒත් වැරැදියි. එකෝ යන්ත්‍රයක් ලබා ගන්න බැරි සෞඛ්‍ය අමාත්‍යාංශය මිලියන දෙසිය ගණන් වියදම් කරලා බිල්ඩින් හදනවා. දැන් හාර්ට් ඇටෑක් එකක් හැදෙන කෙනෙකුට ඒවා Check කර ගන්න එකෝ යන්ත්‍රයක් නැතුව බිල්ඩින් හැදුවා කියලා වැඩක් නැහැ. තමුන්නාන්සේ වග කියන්න ඕනෑ. මේ ජනතාවගේ ජීවිතත් එක්ක සෙල්ලම් කරන්නේ.

අපි පැහැදිලිව කියන්න ඕනෑ. එක අතකින් අපට ඔබතුමා ගැන කනගාටුයි. මොකද, හේතුව මධ්‍යම රජයේ සෞඛ්‍ය ඇමැතිවරයා, පක්ෂයේ මහ ලේකම්වරයාට වැඩ කරන්න හම්බ වෙන්නේ නැත්නම්. සිගරට් පැකට් එකට රූපමය අවවාද ගේන එක - එතුමා අලුත්කඩේ උසාවියට ගිහිල්ලා බංකුව උඩ වාඩි වෙලා දවස් ගණන්, වරු ගණන් ඉඳලත් කරන්න දුන්නේ නැත්නම්. ඔබතුමාට කරන්න දෙයිද? අපි කියන ඒවා නොවෙයි. තමුන්නාන්සේලාගේම රජයම. ඊයේ පෙරේදා වනකල් සර් කියාගෙන අනේ මහ ලේකම්තුමා කියාගෙන පස්සෙන් ගියේ ඔයගොල්ලෝ. අපි නොවෙයි. ඒකත් පැහැදිලිව කියන්න ඕනෑ. එතුමාට අවුරුදු 47 ක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලනය කරලා, අවුරුදු 13 ක් මහ ලේකම් වෙලා ඉඳලා, අවුරුදු 04 ක් සෞඛ්‍ය ඇමැති වෙලා ඉඳලා සිගරට් පැකට් එකට රූපමය අවවාද ගේන්න ඉඩ දුන්නේ නැත්නම් අපි ප්‍රශ්න කරනවා, මේ කාගේ හස්තයද ක්‍රියාත්මක වෙන්නේ? කාගේ හස්තයද මේ ක්‍රියාත්මක වෙන්නේ? එතුමා මේක කිව්වේ නිකන්ද? අඩ අඩා කිව්වේ. ඒ නිසා මහත්තයෝ ඕනෑවට වැඩිය කඩේ යන්න එපා. හෙට දවසේ ඔබතුමාට අඩන්න වෙයි. 09 වැනිදායින් පස්සේ.

අන්න ඒ නිසා ඒක කියන ගමන් අපි විශේෂයෙන් කියන්න ඕනෑ, ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා හොඳ යෝජනාවක් ගෙනාවා. දරුවන්ගේ මුල් ළමා වියේදීම දේශීය ආහාරවලට හුරු කරන්න ඕනෑ කියලා. මම හිතන්නේ ඉතාම කාලෝචිත යෝජනාවක්. ඉතාමත් හොඳ යෝජනාවක්. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ යෝජනාවට මනාප පොරයෙන් එහාට ගිහිල්ලා ඇහුම්කන් දීලා ප්‍රායෝගික තලයේ ක්‍රියාවට නගන්න ගන්න කියලා. මොකද, හේතුව අද තාක්ෂණයේ දියුණුවත් එක්ක මිනිස්සුන්ගේ ජීවිත සැහෙන විධියට වෙනස් වෙලා තිබෙනවා. මේ ජීවිතයේ වෙනස්වීමත් එක්ක වැරැදි පාරවල්වලට, වැරැදි හුරුපුරුදුවලට ජනතාව යොමු වෙලා තිබෙනවා. විශේෂයෙන් කියන්න ඕනෑ, ඔබතුමා බස්නාහිර පළාතේ සෞඛ්‍ය ඇමැතිවරයා හැටියට ඉදිරි කාලයේ විශාල වැඩ කොටසක් කරන්න වගකීමක් තිබෙනවා.

අපි දැක්කා, ඊයේ පෙරේදා ජනමාධ්‍යවල පළ වුණා, බස්නාහිර පළාත මූලික කරගෙන ඒඩ්ස් වසංගතය ව්‍යාප්ත වන ප්‍රමාණය වැඩියි කියලා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආධාර උපකාර මේ සඳහා ලබාගෙන මේ කාර්යය, ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන්

සම්මන්ත්‍රණ ශාලාවට හෝ නිලධාරීන්ගේ උවමනාවට සීමා කරන්නේ නැතුව බිම් මට්ටමට, ගම් මට්ටමට ගෙනිහිල්ලා ජනතාව දැනුවත් කරමින් ඒ සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද හේතුව, බස්නාහිර පළාතෙන් තමයි මේ සඳහා ආවරණය ලබා දිය යුත්තේ. බස්නාහිර පළාතෙන් ආවරණය ලබා දීම හරහා අපට අනෙකුත් පළාත්වලට මේක ව්‍යාප්ත වීම සහ අපේ රට මේ අගාධයට වැටෙන්න යන එකෙන් වළක්වා ගැනීම සඳහා විශාල කාර්ය භාරයක් ඔබතුමාට කරන්න පුළුවන්. ඒක ජනතා සේවයෙන් එහාට ගිය පිංකමක් කියලා මම කියන්න කැමැතියි.

ඒ නිසා මේ රටේ මතු පරපුර වෙනුවෙන්, ඒ කාර්යය වෙනුවෙන් ප්‍රායෝගිකව බිම් මට්ටමේ මේ තරුණයන්ගේ ඔළුවලට යන, මනසට යන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපි පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව ඒ සඳහා සහයෝගය ලබා දෙනවා කියන එකත් පැහැදිලිව කියන්න ඕනෑ. මොකද හේතුව, බස්නාහිර පළාතේ මේ විනාශය ව්‍යාප්ත වෙලා ගියොත් මේක රට පුරාම පිළිකාවක් වාගේ ව්‍යාප්ත වෙනවා. ඊට පස්සේ අවුරුදු 05 ක් 10 ක් ගිහිල්ලා අපි දුක් වෙලා වැඩක් නැහැ. අන්න ඒ නිසා එවැනි හොඳ යෝජනාවලට ඉඩ දීලා ඔබතුමන්ලාගේ පක්ෂයෙන් සහයෝගය නොදුන්නත් අපි සහයෝගය දෙන්න සූදානම් කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. ඔබතුමාට මෛත්‍රීපාල සිරිසේන ඇමැතිතුමාට අත් වුණු ඉරණම අත් නොවේවා කියලා ප්‍රාර්ථනා කරමින්, ඔබතුමාට එවැනි මානසික පීඩන අත් නොවේවා කියලා ප්‍රාර්ථනා කරමින්, එහෙම තියෙනවා නම් කලින්ම කියන්න. අපි ඒවාට සහයෝගය දෙනවා කියලා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[පූ.භා. 11.45]

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ හිතවත් සෞඛ්‍ය අමාත්‍යතුමා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට සම්බන්ධ වෙන්න ලැබීම සතුටක්. දීර්ඝ කාලීන දේශපාලන පරිචයක්, මුළු ජීවිත කාලයම තමුන්ගේ විශ්ව විද්‍යාල ජීවිතයේ පටන් අද දක්වාම මේ රටේ පොදු ජනතාව වෙනුවෙන්, මේ රටේ මුදල් හම්බ කරන දේශපාලනය වෙනුවට මහජන සේවය සඳහාම කැප වුණු දේශපාලන චරිතයක් විධියට රංජිත් සෝමවංශ සෞඛ්‍ය අමාත්‍යතුමා, මේ පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය භාරගත් දවසේ සිට, එතුමා අපේ පළාත් සෞඛ්‍ය සේවය, දේශීය වෛද්‍ය ක්‍රමය සහ පරිවාස කටයුතු අමාත්‍යාංශය නඟා සිටුවීමට, ඉදිරියට ගෙන යන්න දරන උත්සාහය පිළිබඳව අපේ සතුට, අපේ ප්‍රශංසාව, අපේ ගෞරවය මුලින්ම පළ කරනවා. විශේෂයෙන්ම අපි අද නිදහස් සෞඛ්‍ය සේවය තවමත් භුක්ති විඳින රටක්. සමහරු මොන අවලාද කළත් අපි දන්නවා බංගලිදේශය, දකුණු ආසියාවේ පාකිස්තානය, ඇෆ්ගනිස්ථානය, මේ සියලු රටවල් එක්ක සාපේක්ෂව ගත්තාම අපේ රට තුළ ක්‍රියාත්මක වන නිදහස් සෞඛ්‍ය සේවයේ ඵලය අපි ජාතික වශයෙන් භුක්ති විඳිනවා. සංවර්ධනය මනින මිනුම් ඒකකවල ඒක පුද්ගල ආදායම් දර්ශක පැත්තකට දාලා බැලුවොත් ළදරු මරණ අනුපාතිකය දකුණු ආසියාවේ අඩුම රට අපි. උපතේදී දරුවන්ගේ මියයෑම් සංඛ්‍යාව අඩු කරලා, ඒ වාගේම විශේෂයෙන්ම දරු ප්‍රසූතියේදී මව්වරුන්ගේ මිය යෑම් ප්‍රමාණය අඩු කරගන්න, ඒ වාගේම ආයු කාලය දීර්ඝ කරගත හැකි වයස් ප්‍රමාණයක් ඉන්න, ජනගහනයක් ඉන්න රටක් බවට අපි පරිවර්තනය වෙලා තිබෙනවා.

ඉස්සර අපි දන්නවා, අපේ රෝහල් පිළිබඳ තත්ත්වය. ඉස්පිරිතාලයක් ළඟින් යනකොට බෙහෙත් දුර්ගන්ධය නිසා නාහය වසාගෙන, අපවිත්‍ර වුණු රෝහල් කරා යන මිනිස්සු කොට්ඨාශයක් ජීවත් වුණු අපි, අද රජයේ පළාත් සෞඛ්‍ය රෝහලකට යනකොට ප්‍රසාදයෙන් යන්නේ. මේවා ගැන අමතක කරන්න උත්සාහ කරන්න එපා. එක පිළිකා රෝගියෙකුට, එක හෘද රෝගියෙකුට සමහර ඇතැම් රෝගවලට රුපියල් ලක්ෂ හතර පහේ එන්නත් අපි නිදහස් සෞඛ්‍ය සේවය ඔස්සේ ලබා දෙනවා. ඇයි මේ බොරු කථාව කියන්නේ? රෝහල් නඩත්තු කරන්න, රෝහල් පිරිසිදුව තියාගන්න අවශ්‍ය රසායනික උපකරණ ගෙන්වන්න, වෛද්‍යවරුන්ට පඩිනඩි ගෙවන්න, කාර්ය මණ්ඩලවලට පඩිනඩි ගෙවන්න මේ රටේ රජයක් විධියට නිදහස් සෞඛ්‍ය සේවය පවත්වා ගන්න අපේ රජය කටයුතු කරලා තිබෙනවා. එහෙම නම් බොරු අවලාද එපා. නිදහස් සෞඛ්‍ය රැක ගැනීම සඳහා සටන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, මේ රටේ වාමාංශික ව්‍යාපාරයත් - අධිරාජ්‍යවාදී ධනපති දේශපාලන පක්ෂ තමයි නිදහස් සෞඛ්‍ය සේවය විනාශ කළේ. ඒවාට ජැක් ගහන ඇතැම් වාමාංශිකයින් ඉන්නවා. හැබැයි, මේ රටේ ප්‍රගතිශීලී දේශපාලන ව්‍යාපාරයම අපේ රටට තිළිණ කරපු දේවල් තමයි ඒ. අද ඒ නිසා පිරිසිදු රෝහල් පද්ධතියක්, හොඳ රෝහල්

[ගරු සිසිර ජයකොඩි - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]

පද්ධතියක් අපට ගොඩ නඟලා අපේ දරුවෝ සෞඛ්‍ය සම්පන්න මට්ටමකට යම් තරමකින් ගෙන එන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. අද ඇතැම් රෝග අපේ රටෙන් තුරන් වෙලා තිබෙනවා. කොලරා රෝගය, අපේ රටේ නැහැ. අද වසූරිය අපේ රටේ නැහැ. ලාදුරු අපේ රටේ නැහැ. එවැනි රෝග ගණනාවක් කියන්න පුළුවන් ගරු සභාපතිතුමනි. ඒ නිසා සෞඛ්‍ය සේවයේ අපි ජයග්‍රහණ ලබලා තිබෙනවා. නිදහස් සෞඛ්‍ය සේවය නිසා තමයි ඒ ජයග්‍රහණය ලබලා තිබෙන්නේ. ආවට ගියාට හැදිණු පෞද්ගලික රෝහල් කිහිපයක් දිහා බලාගෙන අපේ සෞඛ්‍ය සේවය අවතක්සේරු කරන්න එපා. ග්‍රාමීය රෝහල්වල පුළුවන් මට්ටමින්, කැපවීමෙන් යුතුව වෛද්‍යවරු සහ ඒ කාර්ය මණ්ඩල සේවය කරන බව අපි ඉතාමත් ඕනෑකමින් මතක් කරනවා.

අද අපි එක පැත්තකින් ජයග්‍රහණය ලබද්දී තවත් පැත්තකින් අපට සිදු වෙලා තිබෙන ගැටළු රාශියක් තිබෙන බව ගරු ඇමැතිතුමාත්, මේ සභාවේ ගරු මන්ත්‍රීවරුත් ප්‍රකාශ කළ බව අපි පිළිගන්නවා. ඒ තමයි බෝ නොවන රෝගවල වර්ධනයක් අපේ රට පුරාම ක්‍රියාත්මක වෙනවා. වකුගඩු රෝග, හෘද රෝග, දියවැඩියාව, අධික රුධිර පීඩනය අපේ ආහාර ක්‍රමය සහ පරිභෝජන ක්‍රමය තුළ මම දන්නවා, මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට තිබෙන බරපතළම මානසික ආතතියක්. ඒ වාගේම යෙදෙන්නේ වැරැදි පරිභෝජන රටාවක. ඒ නිසා අපි සියලු දෙනාම විතරක් නොවෙයි. මේ රටේ සමස්ත ජනයා, මේ තරගයත් එක්ක දුවන සියලු දෙනා හිත සන්සුන් නැති, සසල වුණු හිත් ඇති, සසල වුණු මනස්වලින් යුතු මහා තරගයකින් දුවන සියලු මිනිස්සු අද මේ මහ අධික පීඩනයට ගොදුරු වෙලා තිබෙන්නේ, වැරැදි පරිභෝජන රටාවත් එක්ක. වස විෂ කවන ආහාර ක්‍රමත් එක්ක වැරැදි මාවතකට තල්ලු කරගෙන යනවා.

ඒ නිසා සෞඛ්‍ය ඇමැතිතුමා යෝජනා කරලා තිබෙන පරිදි විශේෂයෙන්ම අපේ දේශීය වෛද්‍ය ක්‍රමයත් සම්බන්ධ කරගෙන අපේ ආහාර රටාව, අපේ පරිභෝජන රටාව - ගිය සතියේ වෛද්‍ය සංගමයේ සභාපති පාලිත මහීපාල මැතිතුමා ප්‍රකාශ කරනවා, අපේ රටේ 60% ක් අද මේ බෝ නොවන රෝග තත්ත්වයන්ගෙන් මිය යන සංඛ්‍යාව වැඩි වෙලා බරපතළ තත්ත්වයකට පරිවර්තනය වෙලා තිබෙන්නේ කියලා. ඒ නිසා අද කෘෂි රසායන භාවිතය ගැන කිව්වා. ආහාරවලට වස විෂ කලවම් වීම ගැන කිව්වා. නමුත් මේවා පාලනය කිරීමේ වැඩ සටහනක් වහ වහා ක්‍රියාත්මක වන පරිදි අපේ අමාත්‍යාංශය මැදිහත් වෙලා, ඒවාට අදාළ නිලධාරීන් පත් කරලා එවැනි ක්‍රියාකාරී මැදිහත්වීමක් කරන්න අවශ්‍ය කරන සහාය දැක්විය යුතුයි කියන යෝජනාව කරනවා.

ගරු සභාපතිතුමනි, අපි හරි සතුටින් හිටියා මඤ්ඤොක්කාවලට වස කලවම් කරන්නේ නැහැයි කියලා. අපි දන්නවා මඤ්ඤොක්කා කියන්නේ පිළිකා රෝග වළක්වන ආහාරයක්. එහෙත් මඤ්ඤොක්කා ගසේ අල ටික ගලවන්න පස බුරුල් වෙන්නත් අද රසායනික ද්‍රව්‍ය ගහනවා. සියලු පළතුරු වර්ගවලට. ඉස්සර ඇකිලුණු පතෝල, වැටකොළු කරල් දැක්කාම අපි කන්නේ නැහැ. සවුත්තු වෙලා කියලා කියන්නේ. අද වැටකොළු කරල, පතෝල කරල දික් වෙලා, කෙලින් වෙලා හිටින්න අලුත් ස්ප්‍රේ ජාති හඳුන්වලා දීලා තිබෙනවා. පුදුම රටක් බවට මේ රට පරිවර්තනය වෙලා තිබෙන්නේ. බොහොම කනගාටුදායක තත්ත්වයක්. ඔබතුමන්ලාට ඒවා දැන ගන්න ඕනෑ වෙයි. එවැනි අවශ්‍ය දේවලුත් වෙළඳ පොළේ තිබෙනවා. අද වැටකොළු කරලටත් ඒ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. ඉස්සර අපි දන්නවා මැස්සෝ වැහුවොත් කුණු මාළු කියලා අපි කන්නේ නැහැ. අද මැස්සෝ වහපු මාළු කන්න කියලා කියන්නේ. ඇයි? අද ෆෝමලින් ගහනවා මාළුවලට. අද පරිභෝජන ක්‍රමය, මේ විවෘත ආර්ථිකය රුපියල් ශත මත දුවන සමාජ, ආර්ථික ව්‍යුහයක් තුළ මෙහෙයවීමට අවශ්‍ය රාජ්‍ය යන්ත්‍රණයක්, ප්‍රතිලාභ ආර්ථික සංකල්පත් අතර ගැටුමක් ඇති වෙනවා. මේ ගැටුමේ ඵල තමයි වෙලා තිබෙන්නේ. මේක න්‍යායාත්මක ප්‍රශ්නයක්. ඒ නිසා රාජ්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කිරීම තුළ තමයි, රාජ්‍ය මැදිහත්වීම ශක්තිමත් කිරීම තමයි ඒවාට ප්‍රයෝජනවත් වෙන්නේ.

ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂය පෞද්ගලික අංශයට ශක්තිය දීලා මේ ප්‍රශ්නවලට විග්‍රහ කරන්න බැහැ. ඔබතුමන්ලාගේ න්‍යායාත්මක තර්කය යම්තාක් දුරකට හෝ ක්‍රියාත්මක වෙන්න පුළුවන් වෙන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ප්‍රගතිශීලී පිලත් එක්ක එකට එකු වෙලා මිසක් UNP යත් එක්ක ගිහිල්ලා මේ ප්‍රශ්නවලට විසඳුම් හම්බ වෙන්නේ නැහැ. ඒක මතක තියා ගන්න කියන ඉල්ලීම කරනවා.

අවසාන වශයෙන් කියන්න ඕනෑ ගරු සභාපතිතුමනි, පරිවාස කටයුතු කොටස අපි බොහෝ අය අමතක කරනවා. අපේ දරුවෝ විවිධ ප්‍රශ්න බාධක මැද්දේ - ගරු ඇමැතිතුමාගේ මූලිකත්වයෙන් අපි විවිධ ළමා නිවාසවලට ගියා. අලුත් කොමසාරිස්තුමියගේ නායකත්වය යටතේ අපි ගරු ඇමැතිතුමාගේ උපදෙස් මත අද සාර්ථක වැඩ සටහන් රාශියක් සිදු කෙරෙනවා. එහෙත් මම කනගාටු වෙනවා. සමාජ සේවා කොටස අපේ ගරු ඇමැතිතුමාගෙන් අයින් කරලා තිබීම පිළිබඳව. සමාජ සේවා, පරිවාස එකට ඒකාබද්ධ වෙන්න ඕනෑ අවස්ථාවකයි පසු වෙන්නේ. අවසාන වශයෙන් හිටපු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා ගැන එතුමා වෙනුවෙන්, එතුමාගේ ගුණ වෙනුවෙන් එක වාක්‍යයක් කියලා මම නිහඬ වෙනවා. මට මතක් වෙනවා, මොකද අපේ වර්තමාන පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමාටත් අනෙක් නිලධාරීන්ටත් ආදර්ශයක් වෙන්න මම මේ කියන්නේ. කාටවත් හෙළා දකින්න නොවෙයි. පසුගිය කාලයේ ඩෙංගු උවදුරෙන් අපේ දරුවෙක් බොහොම අසරණ වෙලා පෞද්ගලික රෝහලේ තියගන්න බැහැ යන්න කියලා කියද්දී, කියන්න කෙනෙක් හිටියේ නැහැ. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමාට කිව්වා. අනේ, අධ්‍යක්ෂතුමනි මෙවැනි ගැටළුවක් තියෙන්නේ කියලා. දුරකථන ඇමැතිතුමක් ඒ අධ්‍යක්ෂතුමාට ගන්න අපට පුළුවන්කම තිබුණා. එතුමා ඒ වෙලාවේ ඉඳලා ක්‍රියාත්මක වුණා. හැම විනාඩියෙන් විනාඩියටම. එහෙත් මම දන්නේ නැහැ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමිය මේ සභාවේ ඉන්නවාද කියලා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, මේ හිතුවක්කාර නිලධාරීන්ගෙන් - අපේ ගරු ඇමැතිතුමා ඉතා අවංක අමාත්‍යවරයෙක්. එතුමාට මේ කටයුත්ත ඉදිරියට ගෙන යන්න සහාය දෙන්න. අපි මේ නම්බු නාම, තානාන්තර, තනතුරු බලාගෙන නොවෙයි දේශපාලනය කරන්නේ. මේ කටයුත්ත හරියට කරන්න එතුමාට සහාය දෙන්න කියන ඉල්ලීම කරමින් ඔබතුමාට අවනත වෙමින් මාගේ කෙටි කථාව අවසන් කරනවා. ස්තුතියි.

[පූ.භා. 11.56]

**ගරු කවින්ද හේෂාන් ජයවර්ධන**
Hon. Kavinda Heshan Jayawardhana

ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි. ඇත්ත වශයෙන්ම සෞඛ්‍ය ඇමැතිතුමා හොඳ කාලෝචිත සංකල්ප කිහිපයක් මේ 2015 පොතට ඇතුළත් කරලා තිබෙනවා. මේ e-channeling කියන සංකල්පය ඉතාම වැදගත් කියන එක මම විශ්වාස කරනවා. මොකද, අපි තාක්ෂණයත් එක්ක ඉදිරියට යන්න ඕනෑ ජාතියක් සහ රටක්. ඒ වාගේම මේ සංකල්පය ඉතාමත් වැදගත්. ඒ වාගේම මාතෘ අභිමානී කියන සංකල්පයත් මම විශ්වාස කරනවා, ඉතාම වැදගත් සහ කාලෝචිත සංකල්පයක් සහ යෝජනාවක් හැටියට. ඒකට මම තව දෙයක් යෝජනා කරන්න කැමැතියි. ගැබිණි මව්වරුන්ව දැනුවත් කරන්න ඕනෑ. ඔවුන්ගේ ශරීර සෞඛ්‍ය ගැනත්, ඔවුන්ගේ පෝෂණය ගැනත්. එතැනින් අපි නවත්වන්න හොඳ නැහැ. මම විශ්වාස කරනවා. පුළුවන් නම් අන්තිම මාස තුනේ හරි පෝෂණ මල්ලක් ඔවුන්ට ලබා දෙන්න, ඒක ඉතාමත් වැදගත් කියලා. මොකද, මේක අහිංසක, දුප්පත් ගැබිණි මව්වරු සමහර වෙලාවට අද කන්න නැතුව - පත්තරවල අපි දැක්කා. කිරි දෙන්න බැරිව කරවිල කාලා තිබෙනවා. ඉතින් ඒ වාගේ අවස්ථාවක අපට පෝෂණ මල්ලක් දෙන්න පුළුවන් නම් ඒක වැදගත් කියන එක සහ කාලෝචිතයි කියන එක මම විශ්වාස කරනවා.

ඒ වාගේම මේ Health Profile කියන තාක්ෂණයත් එක්ක යන්න ඕනෑ ඉතාමත් හොඳ සංකල්පයක් ගරු ඇමැතිතුමා ගෙනැල්ලා තිබෙන්නේ. මොකද, ලෝකයේ ඇමැරිකාවේ, ජපානයේ ඒ වාගේ ප්‍රධාන රටවල්වල Health Profile කියන එක අනුගමනය කරනවා. මේකෙන් පවුල්වල තිබෙන Family History එක අපට වෛද්‍යවරයෙක් හැටියට Study කරන්න පුළුවන්. මේ දරුවාගේ එහෙම නැත්නම් මේ රෝගියාගේ තාත්තාට, අම්මාට මොන වාගේ රෝගයක්ද තිබිලා තියෙන්නේ කියන එක අපට දැන ගන්න පුළුවන්. මේක Computerize කරන්න. එහෙම නැත්නම් e-health එකට එකතු කරන්න පුළුවන් නම් ඉතාමත් කාලෝචිතයි කියන එක මම විශ්වාස කරනවා.

ඒ වාගේම අපේ මරික්කාර් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි මන්ත්‍රීවරු කණ්ඩායමක් මීගමුව රෝහලේ නිරීක්ෂණ චාරිකාවක යෙදුණා. ඒකේදී එකෝ යන්ත්‍රය ක්‍රියා විරහිත වෙලා තිබෙනවා. දැවැන්ත ලෙස ජනතාව අද පීඩාවට ලක් වෙනවා. ඒ වාගේම රෝහලේ තිබෙන ප්‍රධාන බිල්ඩින් එක, එහෙම නැත්නම් රෝහල ඇතුළේ තිබෙන බිල්ඩින් එකේ අද වතුර Leak වෙනවා. ඒවාට බිල්ඩිම ඇතුළේ පීලි දාලා තිබෙනවා. මේක ඉතාමත් දුක්බරයි. මොකද, මේකෙන් දුක් විඳින්නේ, අහිංසක දුප්පත් ළමයින්ගේ එහෙම නැත්නම් අම්මා තාත්තාගේ දරුවෝ. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මීගමුව ප්‍රධාන රෝහලේ බෙහෙත් ගබඩා ශාලාවක් නැහැ. කාමර දෙකක් එකතු

[ගරු කවින්ද හේෂාන් ජයවර්ධන]

කරලයි බෙහෙත් එක්රැස් කරලා තිබෙන්නේ. ගබඩා කරලා තිබෙන්නේ. මොකද, මේක දැවැන්ත ප්‍රශ්නයක්. අද CDD එක නිර්දේශ කරලා තිබෙනවා බෙහෙත් ගබඩා ශාලා මෙන්න මේ හේතූන් එක්ක තියෙන්න ඕනෑ. නමුත් අද රජයේ බෙහෙත් ගබඩා ශාලා එලෙස නැති එක ඉතාමත් දුක්බරයි. ඒ වාගේම අද මීගමුව රෝහලේ මෝචරිය අබලන් තත්ත්වයට පත් වෙලා. මේක ප්‍රධාන රෝහලක්. ඒ වාගේම අපේ ජාතික රෝහල්වල ඇඳවල් නැහැ. හුඟක් රෝහල්වල ලෙඩ්ඩු ඉන්නේ ඇඳවල් යට. එහෙම නැත්නම් පුටුවක් උඩ. ඉතින් මේක ඉතාමත් දුක්බරයි. මොකද, මේ අහිංසක, දුප්පත් මිනිස්සු මේ රෝහල්වලට යන්නේ. ගරු ඇමැතිතුමා කිව්වා වාගේ සල්ලි තියෙන වියදම් කරන්න පුළුවන් රෝගීන් යනවා පෞද්ගලික රෝහල්වලට. නමුත් ගරු සභාපතිතුමනි, අහිංසක, දුප්පත් රෝගීන් අද යන්නේ ජාතික රෝහල්වලට. ඔවුන්ට අද ඇඳක් නැති අවස්ථාවක අපි කොහොම හරි ඒ සේවය ලබා දෙන්නට ඕනෑ.

ඒ වාගේම අද රෝහල්වලට ගියාම ආරක්ෂක නිලධාරීන් ඒ වාගේම අනෙකුත් සමහර නිලධාරීන් ලෙඩ්ඩුන්ට එහෙම නැත්නම් ඒ අයගේ අහිංසක අම්මලාට, තාත්තලාට කථා කරන්න දන්නේ නැහැ. 12.00 ට කෑම ටික අරගෙන ගියාම අයිසේ බයිසේ කියලා කථා කරන්නේ. ඒ අයගේ Staff Discipline එක ඉතාමත් වැදගත් කියන එක මම මේ අවස්ථාවේදී කියනවා. ඒකට ඔවුන් පුහුණු කරන්න පුළුවන් නම් ඒකත් හොඳයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම මම දන්නේ නැහැ දැන් පාර්ලිමේන්තුවේ සෞඛ්‍ය ඇමැතිවරයෙක් ඉන්නවාද කියන එක. නමුත් අපේ හිටපු ඇමැතිතුමා බොහොම කලකිරීමෙන් අමාත්‍යාංශය දාලා ගියේ. එතුමා ඖෂධ පනතක් ගෙන ආවා. මම හිතන්නේ ඖෂධ පනත කියන එක ඉතාම වැදගත්. මොකද, දැන් අපි මාධ්‍ය හරහා දැක්කා, සමහර පෞද්ගලික ආයතන ප්‍රමිතියෙන් තොර බෙහෙත් ගෙනැල්ලා තිබෙනවා. ඉතින් එහෙම නම් එක එක මිලට එක එක බෙහෙත් විකුණනවා. ඖෂධ පනත කියන එක ඉතාමත් වැදගත් කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ වාගේම මරික්කාර් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ සිගරට් පැකැට්ටුවේ එන පින්තූරය 80% ක් එතුමා යෝජනා කළා. ඒ වාගේම අධිකරණය 60% ක් කළා. නමුත් මේක දැන් පේන තෙක් මානයක නැහැ. ඉතින් අපි මතට තිත කියලා උපාරුවෙන් කියන ආණ්ඩුවට යෝජනාවක් හැටියට සහ ඒ වාගේම අපි කියා සිටිනවා මේක ස්ථාපිත කරන්න. මේකෙන් හානියට ලක් වෙන්නේ අපේ රටේ අනාගත පරපුර හා අපේ රටේ දූවා දරුවන්. ඒ වාගේම අපට සැකයක් ඇති වෙනවා. මේ මිනිස්සු දුම්කොළ සමාගම්වලින් ඩොලර් අරගෙන නිශ්ශබ්දව ඉන්න එක අපට සැකයක්. ඒ වාගේම Non-communicable diseases, බෝ නොවන රෝග ගැන අපි සියලු දෙනාම කථා කළා. අද මම හිතන්නේ, බස්නාහිර පළාතේ තමයි වැඩිපුර බෝ නොවන රෝගවලින් ලෙඩ්ඩු මැරෙන්නේ. එහෙම නම් මේ ගැන කථා කරලා හරි යන්නේ නැහැ. ආරෝග්‍යා පරමා ලාභා කියලා අපි නිකන් ඉඳලා හරි යන්නේ නැහැ. මේකට වැඩ පිළිවෙළක් කරන්න ඕනෑ.

ගරු ඇමැතිතුමා කිව්වා UNP එකද, JVP එකද? UNP එකද, JVP එකද මෙතැන අදාළ වන ප්‍රශ්නය? මෙතැන අදාළ වන ප්‍රශ්නය මම විශ්වාස කරන විධියට සෞඛ්‍ය පනතක් ගේන්නට ඕනෑ. සියලුම පක්ෂ එකතු වෙලා සෞඛ්‍ය පනතක් ගේන්නට ඕනෑ. මොකද, එහෙම නැත්නම් අපේ රටේ මිනිස්සුන්ටයි මේ හානිය සිද්ධ වෙන්නේ? අද Diabetes, Heart Diseases ඉතාමත් දැවැන්ත ලෙස සීඝ්‍රයෙන් වර්ධනය වෙනවා. මේකෙන් නැති වෙන්නේ, අපේ ජීවිතයි ගරු සභාපතිතුමනි. ඒ වාගේම බලන්න අද ජාතික රෝහලට ගියාම කීදෙනෙක් අද පෝළිමේ ඉන්නවාද? Heart Patient කෙනෙක් එහෙම නැත්නම් හෘදයාබාධ Operation එකක් කරගන්න, CABG කර ගන්න විධියක් නැතුව කීදෙනෙක් අද පෝළිමේ ඉන්නවාද ගරු සභාපතිතුමනි. අද ඒ අය Waiting List එකේ ඉඳලා කැලැන්ඩරේ දිහා බලාගෙන ඉන්නවා මැරෙන දවස. ඉතින් මේක ඉතාමත් දුක්බරයි.

ඒ වාගේම අපි සියලු දෙනාම දන්න දෙයක් තමයි රෝහල්වල බෙහෙත් නැහැ. සතියකට හමාරකට කලින් මගේ ළඟට අම්මා කෙනෙක් ආවා. එතුමිය කිව්වා මන්ත්‍රීතුමා මගේ දරුවාගේ වකුගඩුවේ අමාරුවක් තිබිලා මගේ වකුගඩුව මගේ දරුවාට පරිත්‍යාග කළා. දෙකම නරක් වෙලා තිබුණේ. නමුත් දැන් මට බෙහෙත් දෙන්න විධියක් නැහැ. සතියකට දරුවාට විතරක් රුපියල් 5000 ක් යනවා. මටත් එක්ක රුපියල් 10000 ක් යනවා කිව්වා. මගේ මහත්තයා රජයේ සේවකයෙක්. මට මේක දරා ගන්න බැහැ. ඇත්ත වශයෙන්ම අපි තරුණ දේශපාලඥයෝ හැටියට දුක් වෙනවා. මේ වාගේ අපේ රටේ මිනිස්සුන්ට

බෙහෙත් ටික ගන්න බැරුව දුක් විඳින අවස්ථාවක ඒ අම්මා කියනවා මට බෙහෙත් නැති වුණාට කමක් නැහැ. මගේ දරුවාට බෙහෙත් ටික ගන්න මොකක් හරි ක්‍රමයක් හදලා දෙන්න මන්ත්‍රීතුමා කියලා. අපත් අසරණ වෙනවා ගරු සභාපතිතුමනි. ඒ වාගේම අද එක්ස්-රේ මැෂින් නැහැ. කියන්න කනගාටුයි. ගම්පහ දිස්ත්‍රික්කයේ එක රෝහලක විතරයි CT මැෂින් එකක් තියෙන්නේ. මුළු බස්නාහිර පළාතටම දැවැන්ත රෝහලක් වෙලා තිබෙන කොළඹ මහ රෝහලේ විතරයි MRI මැෂින් එකක් තියෙන්නේ. ඉතාමත් කාලෝචිත දෙයක් නොවෙයිද මේක. මේ අපට අවශ්‍ය වන දේවල්. මීගමුව රෝහලේ නැහැ. ගම්පහ රෝහලේ නැහැ.

ඒ වාගේම අපි අද උජාරුවට කථා කරනවා සංවර්ධනය ගැන. සංවර්ධනය ගැන කථා කරනවා. අධිවේගී මාර්ග ගැන කථා කරනවා. ගරු සභාපතිතුමනි, අද Highway එකේ එහෙම නැත්නම් අධිවේගී මාර්ගයේ මුදල් අය නොකර Ambulance එකකට යන්න අවස්ථාව දීලා නැහැ. ඉතින් මේකෙන් මම යෝජනාවක් කරනවා. පුළුවන් නම් පළාත් සභාවෙන් හරි මුදල් වෙන් කරලා අධිවේගී මාර්ගයේ Ambulance වලට යන්න දෙන්න කියලා.

ඒ වාගේම මම වෛද්‍යවරු ගැන කථා කරන්නට ඕනෑ, වෛද්‍යවරයෙක් හැටියට. අවුරුදු 10 ක් විතර යනවා විශේෂඥ වෛද්‍යවරයෙකුට රටට සේවයක් කරන්න. ඉතින් අපි බුද්ධිගලනය ගැන කථා කරනවා. අවුරුදු 10 ක් වැනි දීර්ඝ කාලයක් මේ රටේ ඉගෙන ගෙන, අහිංසක මහජනතාවගේ බදු මුදල්වලින් ඉගෙන ගෙන ඔවුන් මෙහෙට ආවාට පස්සේ ඔවුන්ට ලැබෙන සොච්චම් මුදලින් ඔවුන්ට ජීවත් වෙන්න බැරි නිසා ඔවුන් පිටරට යනවා ගරු සභාපතිතුමනි. ඉතින් ඒ නිසා මම ඔබතුමාට කියනවා අපේ ඇමැතිතුමා වැරැදි දෙයක් කිව්වා. ඉන්දියාවේ චෙන්නායිවල නිදහස් සෞඛ්‍ය නැහැයි කියලා. මම මතක් කරනවා MMC එකේ Madras Medical Mission Council එකේ බෙහෙත් දෙන්නේ නිකම්. SRMC එකේ බෙහෙත් දෙන්නේ නිකම්. ඒක වැරැදි කථාවක්. එතුමා කිව්වා, මේ ලංකාවේ පුළුවන්නු වැස්ස වෙලාවට මිනිහෙකුට බස් එකක් නැත්නම් ඉස්පිරිතාලෙකට ගිහිල්ලා ඉන්න කියලා. මේ ඉස්පිරිතාල බාල්දු කරන්න එපා කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා මූලාසනයේ අසුන් ගන්නවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Sumith Lal Mendis M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගාමිණී තිලකසිරි ගරු සභානායකතුමාට විනාඩි 10 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 12.06]

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ සෑම රජයක්ම විශේෂ අවධානයක් යොමු කරන්න බලාපොරොත්තු වෙන්නේ, සෞඛ්‍ය විෂයයටයි. නිරෝගීමත් මිනිසෙකු බිහි කිරීම තමයි රජයක ප්‍රධාන වගකීම. ඒ වගකීම කරට අරගෙන බස්නාහිර පළාත් සභාවේ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා මේ තනතුරට පැමිණිලා බොහොම කෙටි කාලයක් වුණත්, ඒ තනතුරේ තිබෙන වගකීම ඉතාමත් මැනවින්, බොහොම කාරුණිකව ඉෂ්ට කරන අමාත්‍යවරයෙක් කියන එක මම ප්‍රථමයෙන් සඳහන් කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ පොත පොඩ්ඩක් කියවාගෙන ගියා. මේකේ පිටුවල එක තැනක මෙහෙම තිබෙනවා.

*ප්‍රධාන බෝවන රෝගවලින් තොර රටක් බිහි කර ගැනීම.*

*"බස්නාහිර පළාතේ ප්‍රධාන බෝවන රෝග ලෙස ඩෙංගු, ජලභීතිකා රෝගය හා මී උණ දැක්විය හැක."*

දැන් මේ වාගේ ඇළපිල්ලක්, පාපිල්ලක් වෙනස් වෙන්න පුළුවන්. නමුත් මේක තවත් කෙනෙක් අතට ගියොත් ලොකු වැරැද්දක්. බෝවන රෝග ලෙස නම් කරලා තිබෙන කිසිම රෝගයක් බෝ වෙන්නේ නැහැ. බෝ වන රෝග මේ රටේ තිබෙනවා. ක්ෂය රෝගය, සරම්ප, පැපොල් විවිධාකාරයේ රෝග. නමුත් මම අමාත්‍යතුමාට

නොවෙයි, කථා කරන්නේ. මේවා සකස් කරන නිලධාරීන්ට. මෙවැනි වැරැදි විධියට සකස් කිරීමෙන් නොදන්න කෙනෙකුට ගියොත් බොහොම අඩුපාඩුවක් වෙනවා. ඒක මම පළමුවෙන්ම හඳුන්වා දෙන්න ඕනෑ. පසුගිය කාලසීමාව තුළ තිබුණු ප්‍රධාන මාතෘකාවක් තමයි ඩෙංගු. අද ක්‍රමක්‍රමයෙන් මධ්‍යම රජයේ සහ පළාත් සභාවේ කැපවීම තුළ මේ ඩෙංගු මරණ සංඛ්‍යාව මේ මොහොත වනකොට ඉතාමත් විශාල ලෙස අඩු කර ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා.

පසුගිය කාල සීමාව තුළ ඩෙංගු මර්දනයෙන් අර උතුරු - නැගෙනහිර යුද්ධය හා සමාන තත්ත්වයකට පත් වුණා. මේ වෙලාවේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා විශාල වැඩ සටහන් ක්‍රියාත්මක කළා. මම ඒවා එකින් එක කියන්න යන්නේ නැහැ. කාලසීමාව නැති නිසා. ජනාධිපතිතුමා මේකට හොඳ නායකත්වයක් දුන්නා. අද වර්තමානය වනකොට එතුමා ගත්තු තීන්දු ක්‍රියාත්මක කරන්න පළාත් සභාවල ඉන්න අමාත්‍යවරු කටයුතු කළාය කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම අපේ වර්තමාන සෞඛ්‍ය ඇමැතිතුමා ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරයි කියන එකත් මම නැවත වතාවක් මතක් කරන්න ඕනෑ.

ඩෙංගු රෝගය නිසා මියගිය පුද්ගලයින්ගේ වයස් සීමාවක් තිබුණේ නැහැ. විශාල වශයෙන් අපේ අහිංසක දූ දරුවෝ මේකට ගොදුරු වුණා. නමුත් අද මේ මොහොත වනකොට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය කථා කරනකොට අද ඒක ඉතාමත් පහළ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අද බොහොම කලාතුරකින් තමයි ඩෙංගු රෝගයෙන් යම්කිසි පුද්ගලයෙක් මිය ගියා කියන පුවත ඇහෙන්නේ. දැන් පසුගිය කාලසීමාව තුළ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරු කිහිප පොළක් විශේෂයෙන් සඳහන් කළා. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන කථා කරන කොට මේක නොකියාම බැහැ. දීර්ඝ කාලයක් තිස්සේ මේ රටේ දුම්පානය කියන එකට තැනක් නොතැනක් තිබුණේ නැහැ. ඕනෑම තැනක වෙන්න පුළුවන්. වාහනයේ වෙන්න පුළුවන්. මහ තොටේ වෙන්න පුළුවන්. පාරේ වෙන්න පුළුවන්. ප්‍රසිද්ධ ස්ථානයක් කියලා බැලුවේ නැහැ. රෝහලේ වෙන්න පුළුවන්. සිගරට් එකක් ගහන්න ඕනෑ එකා සිගරට් එක ගැහුවා. නමුත් අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ මැදිහත්වීම තුළ මේ රටේ ප්‍රසිද්ධ ස්ථානවල සිගරට් බීම කෙරෙන්නේ නැහැ. අද අපට ප්‍රසිද්ධ ස්ථානයක සිගරට් බොන මිනිහෙක් හොයා ගන්නවත් නැහැ. වයස 18 ට අඩු අයට සිගරට් විකිණීමත් තහනම් කළා. මේක අද ඊයේ කරපු දෙයක් නෙවෙයි. ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය අනුව -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මාර චින්තනයක් නේ? හිතනකොටත් ටක් ගාලා -

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

නැහැ, එතුමා කළා කියන එක අවිවාදයෙන් පිළිගන්න ඕනෑ. මම කිව්වා නේ මම කථා කරනකොට බොහොම Balance එකේ කථා කරන්නේ. මම එක එක්කෙනාගෙන් වාසි ගන්න කථා කරන්න පුද්ගලයෙකුත් නොවෙයි. අවාසි වෙන්න කථා කරන පුද්ගලයෙකුත් නොවෙයි. කියන්න ඕනෑ නම් මම කාට වුණත් කියනවා. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා කරපු දේ ගැන අපි සතුටු වෙන්න ඕනෑ. ඉස්සර හන්දියක් හන්දියක් ගානේ, පාසල් ඉස්සරහා, තේ කඩේ. අදත් සාමාන්‍යයෙන් මම දන්න මත්කුඩ ද්‍රව්‍ය පාසල් අසල තිබෙනවා. අපි නැහැයි කියන්නේ නැහැ. අපි ඒවා වළක්වන්න කටයුතු කරනවා. නමුත් ඒවා වළක්වන්න කටයුතු කරනවාටත් වඩා ඉදිරියෙන් ඒවාට වැඩ කරන්න මිනිස්සු ඉන්නවා. ඒ නිසා මම කියන්නේ දුම්පානයෙන් තමයි විශාල රෝග හැදෙන්නේ. මගේ රියදුරා පසුගිය දවස්වල හාඩ් ඇටැක් හැදිලා ගෙන ගියා. ගෙන ගිය ගමන් වෛද්‍යවරයා අහන්නේ සිගරට් බිව්වාද කියලා. ඒ නිසා මේක ඉතාමත් වැදගත් වැඩක්. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා එය කළාය කියන එක මම මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ.

අද හෝමාගම මැතිවරණ කොට්ඨාශය ගැන කථා කළොත් - මට විනාඩි 10 යි තියෙන්නේ. හෝමාගම රෝහල කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන පළාත් සභාවට අයිති රෝහල්වලින් විශාලම රෝහල. මේ හෝමාගම රෝහලේ මළ ප්‍රවාහන මධ්‍යස්ථානය ලක්ෂ 770 යි. අවුරුදු ගණනක් තිස්සේ ඇමැතිවරු ගණනාවක්, මම මහ ඇමැතිවරුන්ට දොස් කියනවා නොවෙයි. දැන් මේ වර්ෂයේත් ඒකේ වැඩ කටයුතු අවසන් කරන්න ලක්ෂ 520 ක් වැය කරලා තිබෙනවා. තව ඉදිරියට වෙන් කරන්න බලාපොරොත්තු

වෙනවා. මොකද, මෙතුමාගේ අමාත්‍යාංශය තුළ අපට යම් යම් පෞද්ගලික ප්‍රයෝජන ගන්න පුළුවන් තැනක් නොවෙයි. එතුමාගේ අමාත්‍යාංශය තුළ ලැබෙන ප්‍රතිපාදනවලට වැඩ කරන්න තිබෙනවා, ඒ වාගේ සිය ගුණයක්. දැන් හෝමාගම රෝහලට යන වියදමෙන් මම හිතන්නේ නැහැ, කොළඹ දිස්ත්‍රික්කයේ තවත් වැඩක් කරන්න පුළුවන් කියලා. ඒ නිසා මම විශ්වාස කරනවා සෞඛ්‍ය අමාත්‍යාංශයට මීට වඩා ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දිය යුතුයි. අඩුපාඩු සියල්ලම එකවර සකස් කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයට මීට වඩා ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන්න කටයුතු කරනවා නම්, වඩාත් හොඳයි කියලා මම දැනුම් දෙනවා.

ඒ වාගේම මීගොඩ ආයුර්වේද මධ්‍යස්ථානය. අපේ බස්නාහිර පළාත් සභාවට අයිති මීගොඩ ආයුරේවේද මධ්‍යස්ථානය කියන්නේ විශාල ආයුර්වේද මධ්‍යස්ථානයක්. ඒ මීගොඩ ආයුර්වේද මධ්‍යස්ථානයට අවශ්‍ය කරන සියලුම සම්පත් ලබා දීලා තිබෙනවා. දහස් ගණනක් රෝගීන් විවිධාකාරයේ රෝගී තත්ත්වයන්ට පත් වුණු වෙලාවේදී නේවාසිකව ප්‍රතිකාර ලබනවා. ඒ නිසා මීගොඩ රෝහල වැඩි දියුණු කරන්නත් අපි තව තවත් අවධානය යොමු කරන්න ඕනෑ. අපේ විපක්ෂ නායකතුමාගේ ගේ ඉස්සරහාම තිබෙන රෝහල. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාල සීමාව තුළ ප්‍රචලිත වුණු තවත් දෙයක් තමයි මී උණ. මී උණ කියන්නේ හදිසියේ තුවාලයක් හරි, සීරීමක් යම්කිසි ගොවියෙකුට තිබිලා වෙලට බැස්සා නම් හවස් වනකොට උණ ගන්නවා. උණ ගත්තාම රෝහලට ගිහිල්ලා නැවැත්තුවාම දවස් දෙක තුනකින් ඒ මනුස්සයා මැරෙනවා. අන්තිමට හොයලා බලනකොට මේ රෝගියාට හැදිලා තියෙන්නේ මී උණ කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගේ මාර්ගයෙන් මම ගරු සෞඛ්‍ය ඇමැතිතුමාට කියනවා. විශේෂයෙන්ම ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරලා, මොකද ඒ ප්‍රදේශ තිබෙනවා. හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ ඒ එකක්. මිනිස් ජීවිත ගණනාවක් බිලි වුණා. මී උණ නිසා. අහිංසක ගොවියෙකුට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මීයෝ මර්දනය කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

මීයෝ මර්දනය කරලා හරි, මොන ක්‍රමයකින් හරි කෘෂිකර්ම අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා කරන වැඩ ගොඩක් මෙතුමා ළඟ තිබෙනවා. මම දැක්කා, මේ පොතේ තව තැනක තිබෙනවා, මෙතුමා 2015 ට කරන්න හදන හොඳ වැඩ කටයුත්තක්. ඒ ගැන විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. බස් නැවතුම් පොළවල්වල කාන්තාවන් වෙනුවෙන් විවේකාගාර ඉදි කිරීම. ඒක මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත් වැදගත් යෝජනාවක් හැටියට මම දකිනවා. අපි දන්නවා සමහර අම්මලා තාත්තලාට දරුවෙකුට කිරි ටිකක් දීගන්න පුළුවන් විධියක් නැහැ. මොකද, බස් නැවතුම්වල පැය ගණන් ඉන්නවා. වෙලාවට බස් ලැබෙන්නේ නැහැ නේ? ඉතාමත් වැදගත් යෝජනාවක්. වෙන දේවල්වලට මුදල් වෙන් කරනවා වාගේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් මම ගරු ඇමැතිතුමාට කියනවා, ඒ පිළිබඳවත් දැඩි අවධානයක් යොමු කරලා බස් නැවතුම් පොළවල්වල කාන්තාවන් වෙනුවෙන් විවේකාගාරයක් ඇති කිරීම ඉතාමත් සුදුසුයි කියන යෝජනාව මම දන්වා සිටිනවා. මම මීට වඩා දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. මම ගරු ඇමැතිතුමාට සුභ පතනවා ඉදිරි වර්ෂය තුළ ඉතාමත් හොඳින් වැඩ කටයුතු කරගෙන යන්න පුළුවන්කම ලැබෙන්නය කියලා. ස්තුතියි.

[අ.භා. 12.15]

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා, සභා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධව කථා කරන්නට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ ගෞරවනීය ප්‍රණාමය මේ සභාවටත්, ඔබතුමාටත් මුලින්ම පුද කර සිටිනවා. ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ මගේ මතකයේ හැටියට 26 වැනි අයවැය මේ පවත්වන මොහොතේ මම නවක මන්ත්‍රීවරයෙක් හැටියට මගේ මුල්ම අයවැයට කථා කරන්නේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණු කාරණා ගණනාවක් මට කථා කරන්නට තිබුණත් කාලයේ ප්‍රශ්නයත් එක්ක කථාව පටන් ගන්නේ බස්නාහිර පළාත් සභාව තුළ පමණක් නොවෙයි. සමස්ත පළාත් සභා නවයකම ප්‍රතිපත්ති වෙනස් කරන්න පළාතේ සෞඛ්‍ය අමාත්‍යවරුන්ට අද මධ්‍යම රජයත් එක්ක කථා කර විසඳා ගැනීමේ ප්‍රශ්න කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. ඒ නිසා මේවා කෙටියෙන් හරි

[ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්]

මතක් කරන්න මම මේ සභාවේ අවධානය යොමු කරන්නේ. 1988 පළාත් සභා පනතත් එක්ක සෞඛ්‍ය අමාත්‍යාංශයේ සියලුම පළාත් සභාවලට වෙන් වනකොට එදා ඉඳලා මේ කථා කරන මේ විනාඩිය දක්වාම කිසිම පළාත් සභාවකට බලයක් නැහැ, ආරෝග්‍යශාලාවලට බෙහෙත් ටික බෙදා දෙන්නට. බෙහෙත් ගබඩාවක් එහෙම නැත්නම් බෙහෙත් ලබා ගැනීමේ පනතක් මධ්‍යම රජයෙන් පළාත් සභාවට වෙන් කරලා දීලා නැහැ.

කනගාටුවෙන් හරි මේවා කියන්නට වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පළාත් සභාවට අවුරුදු 26 ක් වුවත් මේ විනාඩිය වනකල් ලබා ගන්න බැරි වීම ගැන ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. කරුණාකරලා මධ්‍යම රජයත් එක්ක කථා කරලා බස්නාහිර පළාතේවත් ඒ ඖෂධ බෙදා හැරීමේ අවශ්‍යතාවය අද අවශ්‍යතාවයක් හැටියට දකිනවා. බස්නාහිර පළාත් සභාවේ ආරෝග්‍යශාලා කොපමණ තිබුණත්, රෝහල් කොපමණ තිබුණත් කිසිම ඖෂධයක් ලබා ගන්නට බැහැයි කියන එක මේ සභාවට මතක් කරනවා. ඒ වාගේම ළදරු මරණ අඩුවීම ගැන ඇත්තටම අපි කථා කරනවා. ළදරු මරණ අඩුවීම සතුටුදායක කාරණාවක්. නමුත් මේ රටේ මැරෙන 75% ක් මැරෙන්නේ අපේ ඇමැතිතුමා කිව්වා වාගේ බෝ නොවන රෝග නිසා තමයි.

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

එළුවොද?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

එළුවොත් වෙන්න පුළුවන්. මනුස්සයොත් වෙන්න පුළුවන්. සියලුම ජීවිත රැක ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශයට බලය තිබෙනවා. ඒ නිසා අමාත්‍යාංශයකුත් වෙන් කරලා තිබෙනවා. සර්පයින් රැක ගන්නත්. මේ බෞද්ධ රටේ අපි ආදර්ශවත් විය යුතුයි. ඒ නිසා එළුවන් මැරෙන එක ගැනත් ඔබතුමාත් එක්ක අපි පස්සේ කථා කරමු. මගේ කාලය නාස්ති කරන්න එපා ගරු මන්ත්‍රීතුමා.

ජනගහනය ගත්තාම බස්නාහිර පළාතේ කොලොම්පුරේ ගැන කියනවා. ඡන්ද සංඛ්‍යාව වැඩිම අගනුවර අපේ කොළඹ දිස්ත්‍රික්කයේ. දෙවන අගනුවර ගම්පහ දිස්ත්‍රික්කය. පස්වෙනි දිස්ත්‍රික්කය හැටියට ඡන්දදායකයන් ඇතුළු වැඩිම ප්‍රමාණයක් ජීවත් වෙන්නේ කළුතර දිස්ත්‍රික්කයේ. බස්නාහිර පළාත මුළු රටේම 28% ක ඡන්ද ප්‍රතිශතයක් තිබෙනවා. 33% ක් මුළු රටේම ජනගහන ප්‍රතිශතය. අද කනගාටුවෙන් හරි කියන්න වෙනවා, බස්නාහිර පළාතේ මූලික රෝහල් 11 ක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අඩුම තරමේ මේ බෝ නොවන රෝග නිසා මිය යන ජන සංඛ්‍යාව අපට රැක ගන්න පුළුවන් මට්ටමක් ඇති කර ගන්න බස්නාහිර පළාත් සභාවත්, සියලුම පළාත් සභාත් අපොහොසත් වෙලා තිබෙනවා. අද මේ පළාත් සභාවට අපට විශේෂඥ වෛද්‍යවරයෙක් Cardiologist කෙනෙක් ලබා ගන්නට බැහැ. පළාත් සභාවේ අමාත්‍යතුමාට පත්වීමක් දෙන්නට බැහැ. අපි කළුතර දිස්ත්‍රික්කයේ පානදුර රෝහලට පඩි ගෙවලා තමයි Cardiologist කෙනෙක් ගන්නේ. මම හිතන්නේ, මීගමුවටත් එහෙම වෙන්න පුළුවන්. ඒ නිසා මේවා පළාත් සභාවේ 88 පරණ ප්‍රඥප්ති තියාගෙන ගමන ඉදිරියට යන්න බැහැ. වර්ධනය වෙනවා නම් දියුණු වෙලා කියනවා නම් මේවා අපි පළාත් සභාවේ බලයක් හැටියට පවත්වාගෙන අඩුම තරමේ දිස්ත්‍රික්ක 11 ටවත් මූලික රෝහල්, MRI Scan යන්ත්‍රය, එකෝ යන්ත්‍රය, X-ray යන්ත්‍ර මේවා ලබා දීලා අඩුම තරමේ ඇඳන් තුනක් හතරක් තිබෙන Cardiology Unit එකක් හා වෛද්‍යවරයෙක් අපි ලබා ගැනීමට කටයුතු කළ යුතු වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ සභාවේ අවධානය මම ඒ සඳහා යොමු කරනවා. සමස්ත රටේමත් මේ ආකාරයටයි. පළාත් සභා පනතේ, ප්‍රඥප්තියේ. ඒ නිසා සියලුම පළාත් ඇමැතිවරු මේවා වෙනස් කරන්න ඕනෑ කියලා මම ගරු අමාත්‍යතුමාට මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

ඒ වාගේම අපට බැරි වෙලා තිබෙන දේවල් ගැන කථා කරනකොට ඖෂධ සැපයීම් අංශය ගැන මම කථා කළා වාගේ අපේ අඩුපාඩු ගැනත් දිස්ත්‍රික්කය වෙනුවෙන් කථා කරන්න වෙනවා. ඇත්තටම බේරුවල මැතිවරණ කොට්ඨාශය, කළුතර මැතිවරණ කොට්ඨාශය අපේ අමාත්‍යතුමා නියෝජනය වන දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ දෙකක්. මේ මැතිවරණ කොට්ඨාශ දෙක තුළ ජීවත් වන ජනයාට බස්නාහිර පළාත් සභාව තුළ මහජන නියෝජිතයෝ හැටියට අපටවත් සෞඛ්‍ය අමාත්‍යාංශයට කරන්න පුළුවන් කිසිම දෙයක් නැහැ. බේරුවල රෝහල් තුනක්. බේරුවල මූලික රෝහල, අලුත්ගම මූලික රෝහල, දර්ගා නගරයේ මූලික රෝහල නාගොඩට බද්ධ කරලා

ශික්ෂණ රෝහල් හැටියට මේවා භාවිතා කරනවා. කියන්න කනගාටුයි. බෙහෙතක් ගන්නා ගියාම Ambulance එකේ නග්ගලා ලෙඩාව කළුතරට යවන එක තමයි මේ රෝහල්වල කරන්නේ. එක අතකින් අපි පිළිගන්නවා, මේ රෝහල් කාර්ය මණ්ඩලයට කම්කරුවන්ට, හෙදියන්ට, දොස්තර මහත්වරුන්ට පුහුණු වීමේ මහ රෝහල් තුනක් හැටියට තමයි මේ රෝහල් ටික අදත් පවත්වාගෙන යන්නේ. කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් 1/3 ක්, තුන් ලක්ෂ පන්ස් දාහක් ජීවත් වෙන්නේ බේරුවල සහ කළුතර මැතිවරණ කොට්ඨාශයේ. ඡන්දදායකයින්ගෙන් දෙලක්ෂ තිස් පන් දාහක් ජීවත් වෙන්නේ බේරුවලත්, කළුතර මැතිවරණ කොට්ඨාශයේත්. නමුත් මේ පළාත් සභාවේ ඡන්දදායකයෝ හැටියට මේ පළාත් සභාවට කිසිම බලයක් නැහැ. පළාතේ මන්ත්‍රීවරයෙකුට පළාතේ වැඩක් කරන්නට සෞඛ්‍ය සායනයක් දාගන්නවත් අවස්ථාවක් ලබා දෙන්නේ නැහැ.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවධානය යොමු කරන්නේ, අපි තමුන්නාන්සේලාගේ ඉලක්කය විය යුත්තේ මේවා ලබා ගන්නට කටයුතු කිරීමයි. ඒ නිසා මේවාත් ලබා ගත යුතු වෙනවා ගරු සභාපතිතුමනි. ඇත්තෙන්ම හේෂාන් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමා, එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ කනගාටුවෙන් කියන්නේ. අපව ගොනාට අන්දපු කොරියානු රජය - මොන ඇමැති පාලනය කළත්, මොන ජනාධිපති පාලනය කළත් ප්‍රශ්නයක් නොවෙයි. කියන් නැම් කියන ආයතනය මීගමුව රෝහල, ගම්පහ මූලික රෝහල මම හිතන්නේ, අර ස්ලැබ් දාන්නට ඒ අය පරීක්ෂණයක් කළා. අපෙන් සල්ලි අරගෙන, අපෙන් පොලිය අරගෙන ඒ ගොඩනැගිලි ටික හැදුවේ. ඒකයි ඒවා ලීක් වෙන්නේ. ස්ලැබ් එක අතරේ දැම්මේ ස්පොන්ච් සිස්ටම් කියන ඒ ක්‍රමය. ටොයිලට්වල වතුර කාන්දු වන ක්‍රමයක් හැටියට පරීක්ෂණයක් කරන්න තමයි අභිසංක, දුප්පත් අපේ බෞද්ධ රටේ සල්ලි ටික අරගෙන මේ දේවල් කළේ. අද කියන් නැම් ආයතනය කියනවා කෝටි 2 ½ ක් එක ගොඩනැගිල්ලකට දෙන්නම්. මේවා නිරාකරණය කරන්න කියලා. මිලියන දහස් ගණන් වියදම් කරලාවත් අද හදන්න බැරි ආයතන. එදා මීගමු රෝහලට යනකොට මහින්ද චින්තනය තුළ අපි දැක්කා. මම විශාල බෝඩ් එකකුත් දැක්කා. ඒ වාගේම ආරෝග්‍යශාලාවේ කොන්ක්‍රීට් ස්ලැබ් එක යට තහඩු පීලි දාලා වතුර වැක්කෙරෙන්නේ නැතුව ඒ වතුර ටික එළියට අරගෙන ඇවිල්ලා පයිප්ප කට යටින් තමයි ඒ වතුර ටික එළියට ගේන්නේ. කනගාටුයි කියන්න. අපි තමුන්නාන්සේලාට දොස් කියනවා නොවෙයි. අපි මේ රැවටීමට මූලාවට අහුවීම ගැන කනගාටුව ප්‍රකාශ කරන්නේ. මම කලින් කිව්වා වාගේ අර බෝඩ් එක, මීගමුව මහින්ද චින්තනයේ කලපුවට සංවර්ධනය වෙලා තිබ්බේ. කාණුව දාන්නේ, ජල මුත්‍රා බැහැර වෙන කාණුව මම හිතන්නේ, කලපුවට දාලා තියෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා වෙනස් කළ යුතු වෙනවා. මේක හදන්නට සල්ලි වෙන් කරලා ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තූතියි. කාලය අවසන්.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මට විනාඩියක් දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

විනාඩියක් දෙන්න බැහැ. කාලය බොහොම සීමිතයි. තව කථිකයෝ ඉන්නවා.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

අවසාන වශයෙන් මට කියන්න වෙන්නේ අද සංඛ්‍යාන අත්පොත කියලා සෞඛ්‍ය අමාත්‍යතුමාගේ. මම හිතන්නේ, මෙතුමා අමාත්‍යතුමා වෙන්න කලින් ඉදිරිපත් කරලා වෙන්නත් පුළුවන්. දොස් කියනවා නොවෙයි. මුල් පිටුවේ ශ්‍රී ලාංකික දරුවෙකුගේ ඡායාරූපයක් දාගන්න බැරි තරමට අද ලංකාවේ ඉන්නේ මන්ද පෝෂිත දරුවෝද කියලා මම අහනවා. ඒකයි මේ සුදු දරුවෙකුගේ ඡායාරූපයක් දාලා තියෙන්නේ. දෙවැනි පිටුව බලන්න. පුංචි පවුල රත්තරන් කියලා කථා කරනවා. සුදු නෝනලාගේ සුදු බේබිලා තමයි ඡායාරූපයේ සඳහන් කරලා තිබෙන්නේ. මේවා වෙනස් කරන්න ගරු ඇමැතිතුමනි. ශ්‍රී ලාංකික පවුලක් මේවට ඇතුළු කරන්න. ඒ වාගේම -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට බොහොම ස්තූතියි. කාලය අවසන්.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

11 වැනි පිටුවේ සඳහන් කරනවා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඕක සභාගත කරන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

අපට බැරිද ශ්‍රී ලාංකික ඔසරිය ඇඳපු, සාරිය ඇඳපු, ජාතික ඇඳුම ඇඳපු පවුලකගේ පින්තූරයෙක් දාන්නට. බිකිනිය ඇඳපු ඇඳුම් දාන්නේ නැතුව. මේවා වෙනස් කරන්න. තමුන්නාන්සේලා චින්තනය ගැන කථා කරනවා විතරක් නොවෙයි. මේවා ගැනත් බලලා සංවර්ධනයක් කරන්නට මේ සභාවේ අවධානය යොමු කරනවා. අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිය පුද කරනවා.

[අ.භා. 12.26]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, ළමා රක්ෂක, පරිවාස කටයුතු අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු ලෙස මෙම අයවැය ලේඛනයට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. සුව සම්පන්න හෙට දිනක් උදෙසා සැමට නිදහස් සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම යන්න මහින්ද චින්තන ඉදිරි දැක්මේ ප්‍රධාන අරමුණයි. ඒ අනුව, ඒ මත පදනම්ව ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියක් අතිගරු ජනාධිපතිතුමා අපේ ශ්‍රී ලංකාද්වීපයට බිහි කරලා දීලා තිබෙනවා. ඒ ප්‍රතිපත්තිය පදනම් කරගෙන එයට සමගාමීව අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය ජාතික ප්‍රතිපත්තියට අනුගත වෙමින් මෙම අයවැය ලේඛනය සකස් කර තිබීම පිළිබඳව මම ඉතාමත් සතුටු වෙනවා. ඒ වාගේම අපේ රටේ සෞඛ්‍ය සේවාවන් ලබා දීමේදී අපේ පළාත් සභාව ප්‍රමුඛස්ථානයක් ගන්නවා. එයට ප්‍රධානතම හේතුවක් තමයි ඉහළම සෞඛ්‍ය සේවා සපයන රජයේ සහ පෞද්ගලික ආයතන සියල්ලක්ම කේන්ද්‍රගත වෙලා තිබෙන්නේ අපේ පළාත තුළයි. ඒ නිසා ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය මත එහි ඉලක්කගත කරුණුවලට සෞඛ්‍ය අමාත්‍යාංශය වශයෙන් අපේ අයවැය තුළින් වඩාත් කාර්යක්ෂමව හා ගුණාත්මකව ඵලදායී සෞඛ්‍ය සේවාවක් බස්නාහිර පළාත් සභාව තුළ ලබා දීමට අපේ අමාත්‍යාංශය කටයුතු කරමින් පවතින අවස්ථාවක් මේ. විශේෂයෙන්ම පළාත් සභාව වෙත පැවරී ඇති සෞඛ්‍ය සේවාවන් අතරින් දෙවැනි විශාලතම සේවය සෞඛ්‍ය සේවයයි. ඒ අනුව රෝහල් 41 ක්, මධ්‍යම බෙහෙත් ශාලා සහ මාතෘ සායන 78 ක් පමණ අප සභාව යටතේ පාලනය වෙනවා. මේ ආයතනවල සියලු කාර්යයන් සඳහා 2014 වර්ෂයට වඩා 2015 වර්ෂයේ විශාල මුදලක් වෙන් කිරීම පිළිබඳව, රුපියල් මිලියන 9743 ක විශාල මුදලක් මේ කාර්යයන් වෙනුවෙන් වෙන් කිරීම පිළිබඳව මගේ අවංක ආදර ස්තුතිය ගරු ඇමැතිතුමාට මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම ඩෙංගු උවදුර පිළිබඳව කථා කළොත් අද මරණ සංඛ්‍යාව යම් ප්‍රමාණයකට අඩු වී තිබුණද, මේක අපේ ප්‍රමුඛතම කාර්යයක්. ගත වූ පසුගිය කාලය තුළ ඩෙංගු රෝගීන් 39,848 ක් වාර්තා වෙලා තිබෙනවා. දැනට මරණ සංඛ්‍යාව යම් ප්‍රමාණයකට අඩු වී තිබුණත්, මේ මෝසම් වර්ෂාවෙන් පසුව නැවත මේ තත්ත්වය ඇති වීමට අපට බොහෝ ඉඩකඩ තිබෙනවා. ඒ සඳහා අපි සැලසුම් සහගතව සූදානම් විය යුතු අවස්ථාවක් වශයෙන් සලකන්න පුළුවන්. විශේෂයෙන්ම අපේ පළාත් පාලන ආයතන ඒ වාගේම නගර සභා, ප්‍රාදේශීය සභා අතර සුසංයෝගයකින් යම් වැඩ පිළිවෙළක් සකස් කිරීම සහ අපේ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ක්‍රියාත්මක කිරීම මේ වසර තුළ කළ යුතුයි කියලා මම යෝජනාවක් වශයෙන් කරනවා. ඒ වාගේම විශේෂයෙන්ම ඩෙංගු උවදුර මර්දනය කිරීමේදී කසළ අපහරණය සහ නාගරික ප්‍රදේශ තුළ ජනතාව මුහුණ දෙන ගැටළු, පරිසර දූෂණය, ඒ වාගේ මූලික පහසුකම් නොමැතිව ජීවත් වන ජනතාවගේ ගැටළු කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ආකල්පමය වෙනසක් ජනතාව තුළ ඇති කිරීමට හැකියාවක් ලැබේ නම්, එය අපේ ජයග්‍රහණයක්. ඒ වාගේම විශේෂයෙන්ම දියවැඩියාව, අධික රුධිර පීඩනය සහ කොලෙස්ටරෝල් වැනි බෝ නොවන රෝගවලට ගොදුරුවන මිනිස්සුන්ගේ සංඛ්‍යාව දිනෙන් දින සීඝ්‍රයෙන් ඉහළ යෑම කනගාටුවට කරුණක්.

ඒ වාගේම මෙයට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ වෙළඳ පොලේ පවතින විෂකාරක සහිත ආහාර සහ කෘෂි රසායන භාවිතයයි. ඒ වාගේම සුවිශේෂී අවධානයක් යොමු කළේ, ඒ රෝග සුව කිරීමටත් වඩා රෝග වැළැක්වීම සහ ජනතාව දැනුවත් කිරීමට යම් වැඩ පිළිවෙළක් යොදා තිබීම පිළිබඳව

මම මගේ අවංක ආදර ස්තූතිය පුද කරනවා. ඒ වාගේම අද වකුගඩු රෝගීන් සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යනවා. අපේ පළාත තුළත් විශාල වශයෙන් වකුගඩු රෝගීන් සංඛ්‍යාවක් ඉන්නවා. ඒ අය විශේෂයෙන්ම අඩු ආදායම්ලාභීන්. ආර්ථික වශයෙන් අඩු ආදායම්ලාභීන්. මාසිකව විශාල මුදලක් ඔහුගේ ප්‍රතිකාර වෙනුවෙන් වැය වෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම රුධිරයේ dialysis කටයුතු සඳහා මුදල් විශාල වශයෙන් වැය වෙනවා. ඔවුන්ට ඒ මුදල් දරා ගැනීමේ ශක්තියක් නැහැ. ඒ සඳහා අපේ අමාත්‍යාංශය තුළින් යම් වැඩ පිළිවෙළක් ඉතා ඉක්මණින් ක්‍රියාත්මක කරනවා නම් වඩාත් වටිනා කාරණාවක් වශයෙන් මම මේ අවස්ථාවේදී පැහැදිලිව කියන්න කැමැතියි. ඒ වාගේම 2015 වර්ෂය තුළ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට සමාගාමීව පළාතේ ගුණාත්මක සෞඛ්‍ය සේවායක් ලබා දීම සඳහා රෝග සුව කිරීම, රෝග වැළැක්වීම, සේවා ශක්තිමත් කිරීම සහ පවුල් සෞඛ්‍ය සේවාව ශක්තිමත් කිරීම ආදී වැඩ කටයුතුවලට අපි අවධානය යොමු කළ යුතුයි. ග්‍රාමීය මට්ටමේ රෝහල්වල පවතින අඩුපාඩු පිළිබඳව අපි තවදුරටත් සොයා බැලිය යුතු අවස්ථාවක්. ඒ අඩුපාඩුකම් තවදුරටත් සොයා බලා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා දිස්ත්‍රික්ක සහ පර්යන්ත රෝහල්වල මූලික පහසුකම් සහ සායන පහසුකම් වැඩිදියුණු කිරීම සහ රෝහල් අලුත්වැඩියා කටයුතු, ළමා සහ මාතෘ සායන කටයුතු වැඩි දියුණු කිරීම, රෝහල්වල සූතිකාගාර වැඩි දියුණු කිරීම ආදී කටයුතුවලට අවධානය යොමු කර ඒ සඳහා කටයුතු කිරීම වඩා වටිනා කාර්යයක් වශයෙන් හඳුන්වන්න පුළුවන්. ඒ වාගේම දැනට අප පළාත් සභාව තුළ දිස්ත්‍රික් මූලික රෝහල් සියල්ලම යම් දියුණු මට්ටමක පවතිනවා. ඒ තුළින් මාතෘ සහ මරණ අනුපාතිකය සජීවී උපත් දහසකට ප්‍රමාණයක් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම ළදරු මරණ අනුපාතිකය සහ අවුරුදු 05 ට අඩු දරුවන්ගේ මරණ අනුපාතිකය ඉලක්කගත ලෙස යම් අඩු කිරීමකට අපි යොමු විය යුතුයි.

ඒ වාගේම මම විශේෂයෙන් ස්තූතිවන්ත වෙනවා අපේ ගරු ඇමැතිතුමාටත්. සෞඛ්‍ය ලේකම්තුමාටත්. E රෝහල් ව්‍යාපෘතිය පානදුර මූලික රෝහල තුළ ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. මේ පිළිබඳව අපි පෞද්ගලිකවම සොයා බැලුවා. දැනට පානදුර රෝහලේ බාහිර රෝගී අංශය, බෙහෙත් නිකුත් කිරීමේ අංශය සහ රසායනාගාර ජාලගත කිරීම මූලික අදියර වශයෙන් දැනට ඉතාමත් සාර්ථකව මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා. දෙවැනි අදියරත්, ඒ වාගේම තෙවැනි අදියරත් ඉතා කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා. ඒ වාගේම මෙයින් විශාල ප්‍රතිඵලයක් අපට අත්කර ගන්න පුළුවන්. රෝහල තුළ ගත කරන කාලය අඩු කර ගන්න, රෝහල තුළ තදබදය අඩු වීමක් සහ ඒ කටයුතු කර ගැනීමට ඉවහල් වෙලා තිබෙනවා.

ඒ වාගේම දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳව කථා කළොත් වත්මන් ජනතාව වැඩියෙන්ම අවධානය යොමු කරන ක්ෂේත්‍රයක්. දේශීය වෛද්‍ය ප්‍රතිකාර ගැන විශ්වාසයක් තිබෙනවා. බාහිර රෝගී අංශවල දිනපතා රෝගී සංඛ්‍යාව වැඩි වන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම ස්තූතිවන්ත වෙනවා පානදුර ආසනයේ මොල්ලිගොඩ ආයුර්වේද රෝහල ඉතාමත් සාර්ථකව ක්‍රියාත්මක වීම පිළිබඳව. ඒ වාගේම දිස්ත්‍රික්කය තුළ තිබෙන මූලික රෝහල්, ආයුර්වේද කටයුතු පිළිබඳව දැනට මෙහි අඩුපාඩු සියල්ල සම්පූර්ණ කරන්න මේ වර්ෂයේ ගරු අමාත්‍යතුමා මුදල් ප්‍රතිපාදන ලබා දුන්නා. ලබන වර්ෂයේත් තවත් අඩුපාඩු කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම පංචකර්ම මධ්‍යස්ථානයේ තව කටයුතු රාශියක් ඉටු කරන්න මේ වසරේ මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබීම පිළිබඳව මම ඉතාමත් සතුටු වෙනවා. ඒ වාගේම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විශාල ප්‍රමාණයක් මේ ආයුර්වේද වෛද්‍ය කටයුතු පිළිබඳ විශ්වාසයක්, ඒ සේවාව පුළුල් කළොත් ඒ අයටත් විශාල සහනයක් ලබා ගන්න පුළුවන්. පළාතේ විශේෂයෙන්ම ලූනාව රෝහල. ඒ වාගේම මම යෝජනාවක් වශයෙන් කරනවා. අපට හැකි නම් දැනට මම පානදුර ආසනය තුළ එක සායනයක් පමණක් සතිපතා කරනවා. ආයුර්වේද වෛද්‍ය සායනයක්. අනෙක් ප්‍රදේශවලත් ඒ ඒ ප්‍රාදේශීය මට්ටමෙන් සතිපතා හෝ ඒ වෛද්‍යවරුන් ගෙන්වා ගමට මේ වෛද්‍ය සේවාව පුළුල් කළහොත් එය වඩා ප්‍රතිඵලදායක වෙන්න පුළුවන්.

ඒ වාගේම පරිවාස හා ළමා රක්ෂක සේවා කටයුතු. අපේ රටේ ජීවනාලිය බඳු මේ දරු සම්පත. ඒ වාගේම රටේ අනාගතය භාර ගැනීමට ඉන්නේ මේ දරු සම්පත. ඒ නිසා අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා හොඳම දේ දරුවන්ට කියන සංකල්පය මත නිදහස් නිවහල් ශ්‍රී ලංකාවක් අපට බිහි කරලා දීලා තිබෙනවා. ඒ ශ්‍රී ලංකාවේ ජීවත් වන මේ දරුවන් වෙනුවෙන් විශේෂයෙන්ම අනාථ, ඒ වාගේම අසරණ, අපයෝජනයට ලක් වූ අතහැර දමන ලද සියලු දරුවන් වෙනුවෙන් පිහිටක් වීමට අප අමාත්‍යාංශය විශාල වගකීමක් දරනවා. ඒ වගකීම

[ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු]

නිසියාකාරයෙන් ඉටු කරගෙන යන මේ අවස්ථාවේ ඔවුන් නිසි පරිදි සමාජගත කිරීමටත් ඒ වාගේම විශාල මුදලක් වැය වෙනවා. අප පළාතේ දරුවන් පමණක් නොව අනෙකුත් පළාත්වල දරුවන් අපේ ළමා නිවාසවලට ඇතුළත් වෙනවා. ඒ අයත් සුරක්ෂිත කරන්න අපට අවස්ථාවක් ලැබිලා තිබෙනවා. එහිදී විශේෂයෙන්ම දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය, පුනරුත්ථාපනය සහ අඩු ආදායම්ලාභී දරුවන් පාසල්ගත කිරීම සහ ඔවුන්ගේ අභිවෘද්ධිය, ළමා නිවාස වැඩිදියුණු කිරීම සහ ඒවායේ යටිතල පහසුකම් දියුණු කිරීම ඒ වාගේම වෘත්තීය පුහුණුව ලබා දීම සහ ඔවුන්ට සුදුසු රැකියා අවස්ථාවක් ලබා දීම මම හිතන්නේ අපේ කාර්යයක්. අපේ වගකීමක්. විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යතුමාට මගේ අවංක, ආදර ස්තූතිය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. එතුමා කළුතර දිස්ත්‍රික්කයේ ඉතාමත් දුක් විඳලා දේශපාලනය කරලා අද අපට අපේ දිස්ත්‍රික්කයෙන්ම සෞඛ්‍ය අමාත්‍යවරයෙක් බිහි කරගන්න ලැබිලා තිබෙනවා. ඒ වාගේම එතුමා විශාල වැඩ පිළිවෙළක් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සංවිධායකකම නැති වෙලා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

සංවිධායකකම නැති වෙලා. අති දුෂ්කරතාවයෙන් එතුමා ඉදිරියට ආවේ. ඉතින් අපි ඔබතුමාට සම්පූර්ණ සහයෝගය දෙනවා. ඒ වාගේම අපි ඔබතුමාගේ මේ පොතේ දැක්කා, ලබන වර්ෂය සඳහා පැහැදිලි වැඩ පිළිවෙළක්. තවම මාස 06 ක් වාගේ කාලයක් වුණේ. ඒ කාලය තුළ ක්‍රියාත්මක කරන්න බැරි වුණා. අපි ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මට තව විනාඩියක් දෙන්න. ඒ වාගේම මම එක කරුණක් කියනවා. පානදුර මූලික රෝහල පිළිබඳව. එම රෝහලේ දැනට මිලියන 19 ක් වියදම් කරලා අක්ෂි ශල්‍යාගාරයක් ලබා දීමට ඔබතුමා පොරොන්දු වෙලා තිබෙනවා. ඒ පොරොන්දුවත්, ඊ රෝහල් සේවයත්, ඒ වාගේම සිවි මහල් ගොඩනැගිල්ලත්, පස්වැනි වාට්ටුව - ළමා වාට්ටුව ප්‍රතිසංස්කරණය කිරීමටත් මුදල් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වාගේම ශ්‍රී ලංකාද්වීපයේ මෙතෙක් පහළ වූ සෞඛ්‍ය අමාත්‍යවරුන්ගෙන් අකාර්යක්ෂම සහ නිර්ධාශිලී සෞඛ්‍ය අමාත්‍යවරයා තමයි මෛත්‍රීපාල සිරිසේන කියන්නේ. රජයේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය වෙනුවට මෙතුමාට මේක කරගන්න බැරුව අපේ අතිගරු ජනාධිපතිතුමාට දොස් කියනවා. ඔහුට වැළඳුණු මන්ද මානසික රෝගයට පිළියම් දෙන්න ජනවාරි 08 වැනිදා අපේ රටේ නැවතත් මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා වශයෙන් පත් වන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 12.39]

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මගේ නම පුංචි වෙනසක් වෙලා තිබෙනවා. මගේ නම වෙනස් වෙලා නොවෙයි. උච්චාරණයේ වැරැද්දක්. ෆ්‍රේසර්. ෆ්‍රේෂර් කියනවා. එක එක ඒවා කියනවා. මම ගණන් ගන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ෆ්‍රේසර්. හරි.

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මගේ ස්තූතිය පුද කරනවා. අමාත්‍යවරුන් අතර ඉතාමත් හිතවත් අමාත්‍යවරයෙක් තමයි රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමා. මම එතුමාව ඉහළ නැංවීමක් කරනවා නොවෙයි. එතුමාගේ පරිවාස කොමසාරිස්තුමිය මට වැඩ සටහනකට ආරාධනා කළා. සාමාන්‍යයෙන් විපක්ෂයේ අය ගියාම පිළිගැනීම අඩුයි. වෙනත් උත්සවලට එහෙම ගියාම සමහර ඉන්න ඇමැතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ මුහුණුවල් එහෙම ටිකක් අප්සට් කරගන්නවා. නමුත් මම එතැනට ගිය වෙලාවේ අමාත්‍යතුමා හිටියා. අමාත්‍යතුමා ඒ වෙලාවේ එතැනින් ඉවත් වෙලා යන අවස්ථාව. එතුමා ගියාට පස්සෙත් - මට කොමසාරිස්තුමිය කිව්වා, දුරකථනයෙන් කථා කරලා කිව්වා

කියලා, එතුමාට තෑගි බෙදා දෙන්න අවස්ථාව දෙන්න කියලා. මාව ඇත්තටම හොඳින් පිළිගත්තා. අමාත්‍යාංශය පිළිබඳව කථා කරද්දී පසුව විග්‍රහ කරන්නම්. ඇත්තටම ඕනෑම අවස්ථාවකදී ඔබතුමා එක්ක කථා කරන්න පුළුවන්. ඔබතුමාත් එක්ක අදහස් ප්‍රකාශ කරන්න පුළුවන් අමාත්‍යවරයෙක්. ඔබතුමා ඉතාමත්ම වැදගත් අමාත්‍යවරයෙක් හැටියට මගේ ජීවිතයේ මම සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ හිතවත් මිත්‍රයා අපේ සංවිධායකතුමා සිසිර ජයකොඩි මැතිතුමා නිදහස් සෞඛ්‍ය සේවාව පිළිබඳව කිව්වා. මම හිතන්නේ ඔබතුමාටත්, මටත් එපමණ ඉතිහාසය පිළිබඳව මතකයක් නැහැ. නමුත් අපේ මතකය ඉතාමත් ඈතට ගියොත් එහෙම ටිකක් වැඩිහිටි අය දන්නවා ඇති 1970 - 1977 අතර කාලය තුළදී නිදහස් සෞඛ්‍ය සේවාව කප්පාදු වීම සඳහා කටයුතු කළේත් ඔබතුමන්ලාගේ - ඔබතුමා නියෝජනය කරනවාද කියලා මම දන්නේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යතුමියගේ පාලන කාලයේ තමයි. මම හිතන්නේ, ශත 50 ක මුද්දරයක් ගෙනැල්ලා - සෞඛ්‍ය ඇමැතිතුමාට මතකද දන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ශත 25 යි.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

නිදහස් සෞඛ්‍ය කප්පාදු කිරීමේ මූලික ආරම්භය ඇති කළේ එහෙන්. ඔබතුමා කිව්වා, එක්සත් ජාතික පක්ෂයෙන් නිදහස් සෞඛ්‍ය නැති කරන්න කටයුතු කළා කියලා. මම හිතන්නේ ඒකේ අනෙක් පැත්තයි වෙන්න ගියේ. නමුත් 77 දී නව පෙරළියක් වෙලා ආවට පස්සේ නිදහස් සෞඛ්‍ය නැවතත්, තවදුරටත් පවත්වාගෙන යන්න පුළුවන්කම ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ කවදාවත් හොඳක් අහන්න බැරි අමාත්‍යාංශයක් තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය. අධ්‍යාපන අමාත්‍යාංශය වාගේ. කොපමණ වැඩ කළත්. රත්තරන් නොවෙයි, මොනවා කළත් හොඳක් අහන්න පුළුවන් අමාත්‍යාංශයක් නොවෙයි. වෛද්‍යවරුන් සතුටට පත් වනකොට හෙදියෝ ටික, Midwife ලා ටික හරි සාමාන්‍ය සේවකයෝ හරි කවුරු හරි ගැටළුවක් ඇති කරගන්නා වූ අමාත්‍යාංශයක්. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සභාව කියලා කිව්වාම ප්‍රධාන පෙළේ පළාත් සභාවක් හැටියට, එහි සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට ඔබතුමාට පුළුවන් - අර පළාත් සභා මන්ත්‍රීවරයා ප්‍රකාශ කළා, ඔබතුමන්ලාගෙන් සමුගෙන ලබන 08 වැනිදා ජනාධිපතිවරණයට එකතු වන මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පිළිබඳව. එතුමා ගෙනාපු සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරගන්න බැරි වුණාය කියලා. එතුමාට බැරි වුණාය කියලා. ඔබතුමා දන්නවා ඇති සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට මේ සේනක බිබිලේ ප්‍රතිපත්තිය ක්‍රියාවට ගෙන එන්න ගිහිල්ලා, එතුමා මිය ගියේත් මේ ප්‍රතිපත්තිය ගේන්න ගිහිල්ලා. ඒ නිසා මේක ජාතික ප්‍රතිපත්තියක් හැටියට අද ඖෂධ වෙළඳ පොළ ගත්තාම එක එක ෆාමසියෙන් - ඔබතුමාට අයිතිය තියෙනවාද මම දන්නේ නැහැ. මේ ෆාමසි පිළිබඳව දැඩි සැලකිල්ලක් යොමු කරන්න. එක්කෝ එය අපේ බලයට ගන්න.

අපි ගත්තොත් එහෙම හන්දියේ තිබෙන එක ෆාමසියක්. එක ෆාමසියක එකම ඖෂධ වර්ගය විවිධ නම්වලින් තිබෙනවා. ඒ කියන ඖෂධ වර්ගය එතැන එක ගණනක්. තවත් තැනක තවත් ගණනක්. ඒ නිසා මිල ගණන්වල දැඩි විෂමතාවයක් දකින්න ලැබෙනවා. ඒ නිසා අද ඖෂධ වෙළඳ පොළ ගත්තාම එක්තරා පිරිසක් පමණක් ඖෂධ වෙළඳ පොළ තුළ දැඩි ඒකාධිකාරී ස්වභාවයක් ඇති කරගෙන ඉන්නවා. ශ්‍රී ලංකාවට ඖෂධ ගෙන්වන එක්තරා මාෆියාවක් තිබෙනවා. ඒ නිසා මේ මාෆියාව කඩන්න සෞඛ්‍ය ඇමැතිවරු හැටියට - මධ්‍යම රජය සහ පළාත් සභා ගත්තොත් එහෙම විශාල සෞඛ්‍ය ඇමැතිවරු පිරිසක් ඉන්නවා. ඒ නිසා ඔවුන්ගේ මුදල්වලට නතු වෙන්නේ නැතුව, වරදාන සහ දෙන්නා වූ යම් යම් දේවල්වලට යට වෙන්නේ නැතුව පළාත් සභාවක් හැටියට අඩුම තරමෙන් බස්නාහිර පළාත තුළ යම් ආකාරයකින් කටයුත්තක් කරන්න පුළුවන්කම ලැබෙනවා නම්, මම හිතන්නේ ඉතාමත් වැදගත් වෙනවා. ඒ නිසා හදිසියේ කඩා පතින හමුදා වාගේ ඉන්නවා නම්, කඩා පැනලා ඉවර වෙලා නිසි ප්‍රමිතියෙන් යුත් ඖෂධ නිකුත් කරනවාද කියලා සොයා බැලීමක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බොහෝ වෙලාවට රෝහලකට ගියාට පස්සේ රෝහලෙන් අපට දෙන්නේ තුණ්ඩුවක්. මේ තුණ්ඩුව ගෙනැල්ලා අපි වෙනත්

[ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්]

භාණ්ඩයක් ගන්න ගියොත් අපි අහනවා මේකේ මිල කීයද? කියලා. නමුත් අපි ඇත්තටම ගත්තොත් එහෙම පෞද්ගලික රෝහලකට ගිහිල්ලා හරි එහෙම නැත්නම් රජයේ රෝහලකට ගිහිල්ලා අපට බෙහෙත් ගන්න තුණ්ඩුවක් දුන්නොත් මේ තුණ්ඩුව ෆාමසියට දුන්නාම කියන මිල ගණන් අපි ගෙවන්න ඕනෑ. අපි දන්නේ නැහැ ඇත්තටම මේකේ මිල කීයද කියලා. කියන්නේ රුපියල් 10,000 ද, ඒක දීලා හරි ගන්නවා. ඒ නිසා මේ පිළිබඳව පළාත් සභාව තුළ ඇඩි කථිකාවක් ඇති කරගෙන මේ ඖෂධ මාෆියාව නැති කරන්න ඕනෑ.

මම දන්න තැනැත්තියක් එක්තරා ස්ථානයක - තැන කියන්න කැමැති නැහැ. සාමාන්‍ය ප්‍රමාණයෙන් ෆාමසියක් පවත්වාගෙන ගියා. මේ ආසන්නයේ. කිලෝ මීටර් දෙක තුනක් එහා. අද ඒ ස්ථානයත් අරගෙන - එතැන කිසිම අවස්ථාවක බිලක් දෙන්නේ නැහැ. ඒ ස්ථානයත් අරගෙන, ඊට පස්සේ තුන්වැනි තට්ටුවත් ගහලා, විශාල ප්‍රමාණයේ ෆාමසියක් බවට පත් කරගෙන තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ, මේක මුදල් ගරන ඉතාමත්ම ඉහළ ආදායම් ගෙන්වන මාර්ගයක්. ඒ නිසා ඔබතුමාගේ අවධානය ඒ වෙනුවෙන් යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම තමයි අපි කිහිප දෙනාම කථා කරපු ආකාරයට මෛත්‍රීපාල සිරිසේන, ඔබතුමන්ලාගේ හිටපු සෞඛ්‍ය ඇමැතිතුමා ඇත්තටම ගෙනාවේ දවටනයේ 80% ක රූපමය ලාංඡන. ජනතාවට දුම් බීම තුළින් - ඇත්තටම ඕනෑම වෛද්‍යවරයෙක් ළඟට ගියාට පස්සේ මොකක් හරි ලෙඩක් ගැන කිව්වාම හිටපු අමාත්‍යතුමා කියපු ආකාරයට, අහන්නේ සිගරට් බොනවාද කියලා. එතුමා වැරැදි වැඩක් ගෙනාවේ නැහැ. එතුමා අපව පුද්ගලිකව ගෙනැල්ලා අපේ මන්ත්‍රීවරුත් එක්ක කථා කරපු අවස්ථාවේදීත් එතුමා ඇත්තටම කිව්වේ, මම අයින් වෙන්න එක හේතුවක්, මා තුළ තිබුණු එක දෙයක් තමයි මම ගෙනාපු එකම ප්‍රතිපත්තියක්වත් ක්‍රියාත්මක කරන්න ඉඩ දුන්නේ නැහැයි කියලා. මට අඩුම තරමින් 80% ක් කියන රූප රාමුව, එහෙම නැත්නම් ඒ කොටස -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

අධිකරණය දුන්නු තීන්දුවක්. මහින්ද රාජපක්ෂ ගෙනාපු තීන්දුවක් නොවෙයි.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒක තමයි.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

අධිකරණය දුන්නු තීන්දුවක්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු මන්ත්‍රීතුමිය -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අධිකරණයට තීන්දු දෙන කෙනෙකුත් ඉන්නවා නේ?

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

අධිකරණයෙන් දුන්නු තීන්දුව. නියෝගයක් ගහලා අනාගත්තා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ නිසා ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන්න ඕනෑ. අපි නම් දුම් බොන්නේ නැහැ. අපි දුම් බොන්නේ නැති පාර්ශවයක්. ඉතින් ඒ නිසා මේ පිළිබඳව සැලකිල්ලක් යොමු කරන්නය කියලා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අනෙක් එක -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නඩුකාරයන්ගේ ගෙවල්වලට ගල් ගැහුවේ කවුද දන්නේ නැහැ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මගේ කාලය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මගේ කාලය අවශ්‍යයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩෙංගු පිළිබඳව කථා කළා. මම ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ ඩෙංගු පිළිබඳව සොයා බැලීම සඳහා පළාත් පාලන ආයතනයක විපක්ෂ නායකයෙක් වශයෙන් අවුරුදු 12 ක් විතර මම ක්‍රියාකාරීව හිටියා. පළාත් පාලන ආයතනවල මේ පිළිබඳව සොයා බැලීමට ඉන්නා වූ, විශේෂයෙන්ම සභාපතිවරු කිහිප දෙනෙක්ම ඉන්නවා. PHI මහත්වරු ගත්තොත් එහෙම, PHI මහත්වරු වැඩිපුරම ඉන්නේ නගර සභාවට වෙලා. සාමාන්‍යයෙන් ගමේ මිනිස්සු කියන්නේ, සැන්ටිපෝට් මහත්තයා කියලා. Sanitary Inspector කියන්නේ නැහැ. නිකම් කියන්නේ, සැන්ටිපෝට් මහත්තයා කියලා. මම නගර සභාවේ ඉන්න සමහර PHI මහත්වරුන්ට කියනවා, ඒක දාගන්නවා කෝ? අර ඇඳුම ඇඳගෙන යනවා කෝ? ගිහිල්ලා පොඩ්ඩක් බලනවා කෝ? මිනිස්සු ටිකක් බයයි නේ? එහෙම යන්නේ නැහැ. එතැනට වෙලා ඉඳගෙන ඉන්නවා. ප්ලෑන් අඳින්නේ ඒ මනුස්සයා. ප්ලෑන්වලට අවශ්‍ය කරන සියලු දේවල් කරනවා. සෞඛ්‍ය පිළිබඳව කිසිම සොයා බැලීමක් කරන්නේ නැහැ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

කොහේද?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

කොහේද කියලා කියන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

පොදුවේ මම මේ කියන්නේ. මොකද මට ස්ථානයක් -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

නිලධාරීන්ට ඔහොම කථා කරන්න එපා. ඕක වැරැදියි. අපේ පැතිවල නම් PHI මහත්වරු හොඳට වැඩ කරනවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ ඔබතුමිය වැඩ කරන තැන්වල වෙන්න ඇති.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඒකයි කිව්වේ කොහේද කියලා අපට කියන්න. නිලධාරීන් අපහසුතාවයට පත් කරන්නේ නැතුව ගරු මන්ත්‍රීතුමා, කොහේද කියලා කියන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔබතුමිය සමහර විට ඔය විධියට -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

හොඳට වැඩ කරන නිලධාරීන් ඕකෙන් අපහසුතාවයට පත් වෙනවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

හොර කාන්තාවෝ මෙහෙයවන ආයතනවල -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නිලධාරීන්ව කඩේ යවන්නේ ඔයගොල්ලෝ

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

හොර සභාපතිවරියෝ

[සභාවේ ඝෝෂා]

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

සමහර තැන්වල කියලා කිව්වේ. ඔබතුමිය බොරුවට කෑගහන්න එපා. ඔබතුමියගේ තැන හරි ඇති.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔබතුමිය ගණන් ගන්න එපා. සමහර තැන්වල, හොර නායිකාවෝ මෙහෙයවන පළාත් පාලන ආයතන තුළ මොවුන් වැඩ කරන්නේත් ඒ හොර නායිකාවට අවශ්‍ය කරන ආකාරයටම තමයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කිරීමක් කරන්න ඕනෑ. පරිවාස හා ළමා රක්ෂක කටයුතු පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳව කථා කරනවා. මම කනගාටුවට පත් වෙනවා අපි පළාත් සභාව නියෝජනය කළාට පළාත් පාලන ආයතනවල බහුතරයක් අද ළමා අපචාරවලට සම්බන්ධ වුණු අය - මහරගම නගර සභාවේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා. ඉස්සර එක්සත් ජාතික පක්ෂයේ හිටියේ. ඊට පස්සේ මෙහාට ආවා. ළමා අපචාර සිද්ධියකට සම්බන්ධ වුණා. නමුත් අදත් කිසිම දෙයක්, ඒ පිළිබඳව සොයා බැලීමක්වත් වෙලා නැහැ. නුවර එළිය මහ නගර සභාවේ හිටපු නියෝජ්‍ය නගරාධිපතිවරයා මේවාට සම්බන්ධයි. අකුරැස්සේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ළමා අපචාර පිළිබඳව අපි කථා කරන්නේ කොහොමද? ජාතික රූපවාහිනිය ගත්තොත් ඒකේ වැඩි වශයෙන් යන්නේ මොනවාද? කොරියන් චිත්‍රපටි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

අද ළමයින්ගෙන් ඇහුවොත් එහෙම Boys over Flowers. මම උගන්වන ගුරුවරයෙක් හැටියට මේවා කෙළින්ම -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

Kissing Scene එහෙම දාලා තියෙනවා. ඒ නිසා ඒවා ජාතික රූපවාහිනිය සහ අනෙකුත් චැනල්වලට කියන්න කොරියන් චිත්‍රපටි, ටෙලි නාට්‍යය පෙන්වන එක නවත්වන්න කියලා.

[අ.භා. 12.54]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මුලින්ම ස්තූතිවන්ත වෙනවා සෞඛ්‍ය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න අපට අවස්ථාව ලබා දීම පිළිබඳව. ඒ වාගේම මම ඉතාමත්ම සතුටු වෙනවා, මම නියෝජනය කරන පස්දුන් කෝරළයේම නියෝජනය කරන අපේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් හැටියට රංජිත් සෝමවංශ මැතිතුමා, සෞඛ්‍ය ඇමැතිතුමා හැටියට කටයුතු කිරීම, අපේ දිස්ත්‍රික්කයට අපේ ප්‍රදේශයට ලැබුණු සම්පතක් හැටියට සලකන්න, මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම අපි ඉතාමත් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන උදවිය හැටියට ඒ ප්‍රදේශවල මිනිස්සුන්ගේ සෞඛ්‍ය අපහසුකම් ගැන අත්දැකීම් තිබෙන එතුමා, අපි විශ්වාස කරනවා, එතුමාගේ සෞඛ්‍ය අමාත්‍ය කාල පරිච්ඡේදය තුළ විශාල වැඩ කොටසක් කරාවිය කියන විශාල බලාපොරොත්තුවක් අපි තුළ තිබෙනවා.

අපි අද ඩොලර් 3000 ක ප්‍රමාණයක ඒක පුද්ගල ආදායමක් ලබන රටක් හැටියටයි සලකන්නේ. අම්මයි, තාත්තයි දරුවෝ දෙන්නයි ලෙස පවුලක අඩුම ගාණේ හතර දෙනෙක් ඉන්නවා නම්, ඒ පවුලේ ඒක පුද්ගල ආදායම අවුරුද්දකට ඩොලර් 12,000 ක් වෙන්න ඕනෑ. එතකොට මාසයකට මේක රුපියල්වලින් කළොත් එහෙම රුපියල් 130 ක් වෙනවා. හැම පවුලකම අඩුම ආදායම රුපියල් 130,000 ක්වත් වෙන්න ඕනෑ කියන එක තමයි රජයේ ගණන් මිනුම් බෙදීම වෙන්නේ. නමුත් ගමේ ජීවත්වන උදවිය හැටියට අපට පේන්නේ නැහැ, ගමේ මිනිස්සුන්ට 130,000 ක ආදායමක් අපේ රටේ ලැබෙනවා කියලා. අපට කිසිම විධියකින් පිළිගන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒක නිසා ඒ ප්‍රදේශවල ජීවත්වන ජනතාවගෙන් තවමත් විශාල ප්‍රමාණයක් ඉන්නවා, සමෘද්ධිලාභීන් හැටියට ජීවත් වන අය. අඩු ආදායම්ලාභීන්. ඉතින් ඒ අයගේ සෞඛ්‍ය වෙනුවෙන්, ඒ අයට අවශ්‍ය කරන සෞඛ්‍ය පහසුකම් සලසා දීම වෙනුවෙන් රජය විශාල වගකීමක් දරනවා වාගේම මම විශ්වාස කරනවා, පළාත් සභාවත් ඒ වගකීම ඉෂ්ට කරන්න කටයුතු කරාවිය කියන එක.

මම උපන්නේ පිඹුර ඉස්පිරිතාලේ. මීට අවුරුදු 60 කට උඩදී. නමුත් අද ගොඩනැගිලි හැදිලා තිබෙනවා. අලුත්

අලුත් දේවල් ලැබිලා තිබෙනවා. නමුත් මම උපන්න ඉස්පිරිතාලෙට තවම බැහැ දරුවෙක් ඉපදෙන්න පහසුකම් සලසා දෙන්න. අවුරුදු 60 ක් ගිහිල්ලාත්. ඉතින් සෞඛ්‍යයේ දියුණුව වෙන්නේ මොකක්ද කියන එක ගැන අපට විශාල ගැටළුවක් තිබෙනවා කියන එක විශේෂයෙන්ම සඳහන් කරනවා. අද අපි බෙහෙත් ටිකක් ගන්න ගියාම, වැඩි බෙහෙත් ටික ගන්න වෙන්නේ ෆාමසියකට ගිහිල්ලා. මේ නිසා මිනිස්සු ඉතාම අමාරු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම ශල්‍යකර්මයකට යන්න සිද්ධ වුණොත් එහෙම මම දන්නවා, අපේ ගම්වල මිනිස්සුන්ට තමන්ට තිබෙන ඉඩම් කෑල්ල විකුණලා තමයි ඒකට මුහුණ දෙන්න අද ඔවුන්ට සිද්ධ වෙලා තිබෙන්නේ. ඉතින් ඒක නිසා මේක බරපතළ සමාජ ගැටළුවක් බවට පත් වෙලා තිබෙනවා. ගණන් මිනුම්වලින් ආදායම ඉහළට තිබුණත් ඇත්ත තත්ත්වය ඒක නොවෙන නිසා මම හිතනවා, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මේ වගකීම තේරුම් අරගෙන ඔබතුමා කටයුතු කරන්න ඉදිරිපත් වේවිය කියලා. ඒ දේ අපි විශේෂයෙන් බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම බෙහෙත් මිල මිනිස්සුන්ට ඔරොත්තු දෙන්නේ නැහැ. මම සතුටු වෙනවා මහචාර්ය සේනක බිබිලේ මැතිතුමාගේ ප්‍රතිපත්තිය අපේ රටට හඳුන්වා දෙන්න පුළුවන් වුණා නම් ඒක විශාල දෙයක් වෙනවා. එතුමා ඒ කාලේ මා නියෝජනය කරන ලංකා සම සමාජ පක්ෂයේ නායකයෙක්. එතුමා මිය යන්න ප්‍රථම. ඒ නිසා එවැනි කෙනෙකුගේ ප්‍රතිපත්තිය අපට හඳුන්වා දීලා, අපි දන්නවා, ලෝකයේ වෙනත් රටවල එතුමාගේ ප්‍රතිපත්තිය අද ක්‍රියාත්මක වෙනවා. නමුත් අපේ රට තුළ තවමත් පුළුවන්කමක් වුණේ නැහැ, ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවන්න. අපේ හිටපු සෞඛ්‍ය ඇමැති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ පිළිබඳව කෙටුම්පතක් හැදුවා. ඒක නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට භාර දුන්නා. ඊට පස්සේ නැහැයි කිව්වා. ඒත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව තිබෙන්නේ කාගේ යටතේද? නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව අද අධිකරණ අමාත්‍යාංශයෙන් අයින් කරලා ජනාධිපතිතුමාගේ විෂයයක් හැටියටයි පත් වෙලා තිබෙන්නේ. ජනාධිපතිතුමාගේ විෂයයක් හැටියට පත් වුණාම මම හිතන්නේ නැහැ, ඒ ඇමැතිවරයාට ඊට එහා ගිහිල්ලා ඒ පිළිබඳව කථා කරන්න පුළුවන්කමක් තියෙයි කියලා. ඒක තමයි මේ විධායක බලය තුළ ගොඩනැගිලා තිබෙන අවාසනාවන්ත තත්ත්වය. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය කියන එක විශේෂයෙන්ම අපි සඳහන් කරන්න ඕනෑ. පළාත් සභාව මහජන නියෝජිතයින් නියෝජනය කරන තැනක්. දැන් අර සිගරට් පැකට්ටුව පිළිබඳව ප්‍රශ්නය ආවා. පාර්ලිමේන්තුව තීන්දු කළා, 80% ක් මේකේ වෙළඳ දැන්වීමට ඇතුළු වෙන්න ඕනෑ කියලා. උසාවිය තීන්දු කළා, මේක 60% කට සීමා කරන්න ඕනෑ කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පනතක් හැටියට නේ ගෙනැල්ලා තියෙන්නේ.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

60% කට සීමා කරන්න ඕනෑ කියනකොට පාර්ලිමේන්තුවේ තිබෙන උත්තරීතරභාවය එතැන හැල්ලුවට ලක් වෙලා තිබෙනවා. ශිරානි බණ්ඩාරනායක මහත්මිය නිකුත් කර පාර්ලිමේන්තුව ගත්තු තීන්දුව උසාවිය වෙනස් කරනකොට එක සමානව කටයුතු කරන්න මේ බලය තුළ පුළුවන්කමක් ඇති වෙලා නැහැ. ඒක නිසා තමයි අපි මේ අසාධාරණය නැති කරන්න, බලය එකතැන් වෙලා තිබෙන එක නැති කරන්න, මේ විධායක ක්‍රමය අහෝසි කරන්න ඕනෑ කියන මතවාදයේ ඉන්නේ. ඒක සෞඛ්‍යයටත් අදාළයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාට බුදු සරණයි. අන්තිමට දකින්න ලැබෙන්නේ මේ පළාත් සභාවේ තමයි.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මේ රටේ සියලු ක්ෂේත්‍රයන්ටත් මේක අදාළ වෙනවයි කියන කාරණාව විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා මම හිතනවා ඉස්පිරිතාලෙක ගොඩනැගිල්ලක් හදන එක දිහා නොවෙයි, (බාධා කිරීමක්) මේ මූලික ගැටළු පිළිබඳව සැලකිල්ලක් දක්වන්න ඕනෑ. ඔබතුමා සෞඛ්‍ය ඇමැතිවරයා හැටියට මේක ආණ්ඩුවට ඉදිරිපත් කරලා. මම හිතන්නේ නැහැ ආණ්ඩුව තුළ ඔබතුමාට මුකුත් කරන්න පුළුවන් කියලා. නමුත් ඒ දේ කරන්න පළාත් සභාව හැටියට යම් මැදිහත්වීමක් වෙන්න කියන ඉල්ලීම කරමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී දිවා ආහාර විවේකය සඳහා සභාව පස්වරු 02.00 දක්වා කල් තැබෙනවා.

*ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. **02.06** ට ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ [යසපාල කෝරලගේ මහතා ] ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.*

*Accordingly the Committee of the Whole Council Suspended and. it resumed at 02.06 p.m. with Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 08 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 02.07]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තුතියි. මම ඉතාමත්ම කෙටියෙන් කාරණා දෙකක් සම්බන්ධයෙන් පමණක් මගේ කථාව සීමා කරලා කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා, ඔබතුමා හරහා අපේ විෂයය භාර ගරු ඇමැතිවරයා වෙත. මම මේකේ පළමුවැනි කාරණාව හැටියට සඳහන් කරන්නේ කොළඹ, කළුතර සහ ගම්පහ ග්‍රාමීය රෝහල් ගණනාවක් ප්‍රශ්න දෙකකට අපි මුහුණ දෙනවා. ඒක පරීක්ෂණාගාර සේවාවට අදාළ ප්‍රශ්න දෙකක්. මේ ග්‍රාමීය රෝහල්වල පරීක්ෂණාගාර සේවාව Lab Facility කියන එක බොහොමයක් රෝහල්වල නැහැ. Lab Facility තිබෙන රෝහල්වල පවා බොහෝ විට අපි දන්න කාරණයක් තමයි MLTS ලා නැහැ. කාරණා දෙකයි. එතකොට අපි දන්නවා, අද විවිධ රෝග ඇතුව රෝහලට යන අයට පරීක්ෂණ පවත්වා ගැනීමේ අවශ්‍යතාවයක් තිබෙනවා. රෝග නිශ්චය සහ වෛද්‍ය පහසුකම් සැපයීමට ප්‍රථමව. නිදර්ශනයකින් කියනවා නම්, අද ඉතාමත්ම විශාල සංඛ්‍යාවක් දියවැඩියා රෝගීන් ඉන්නවා. ඒ දියවැඩියා රෝගීන්ට තමන්ගේ ලේ නැත්නම් මුත්‍රා Test කර ගන්න Lab Facility's නැත්නම් මම කියපු පරීක්ෂණාගාර සේවාවන් නැත්නම් ඒ රෝහලෙන් ඔහුට ලබාගන්න පුළුවන් ප්‍රතිලාභය සම්පූර්ණයෙන්ම සීමා වෙනවා. මේ සම්බන්ධයෙන් මම ඔබතුමා හරහා ගරු ඇමැතිතුමාට කියන්නේ ඔබතුමාට කලින් හිටපු ගරු ඇමැතිතුමාට මම මැදිහත් වෙලා - ඔබතුමන්ලා දන්නවා ඇති මගේ භාර්යාව ශ්‍රී ජයවර්ධනපුර වෛද්‍ය විද්‍යාලයේ මහචාර්යවරියක්. ඇය හරහා ගරු ඇමැතිතුමා මාර්ගයෙන් MLTS සේවාවට එක්තරා ප්‍රමාණයක් Technicians ලා සම්බන්ධ කරන්නට ක්‍රමවේදයක් ඇති කළා. ඒ කළේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ MLTS විභාගයෙන් උපාධිය ලබන්නට ඉන්න උපාධිලාභීන් ඉන්නවා. හතරවන වර්ෂයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් එකතු කරලා. මම හිතන්නේ, මේ වාගේ පරීක්ෂණාගාර සේවාවන්, MLTS නොතිබුණු රෝහල් දෙකක - මට මතක හැටියට ගෝනපොළ සහ ගෝනමඩිත්ත වෙන්න ඕනෑ. නිවැරැදි කිරීමකට යටත්ව. සතියකට එක දවසක් මේ අය යවන්නට අපි සැලසුම් සකස් කරලා තිබුණා. ඒ වාගේම මම අපේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමියට මේ පිළිබඳව සඳහන් කරලා දැනුවත් කළා. ඇයව මම දන්නවා. මගේ භාර්යාවත් සමග සම්බන්ධ වෙලා බොහොම උනන්දුවෙන් ඒ ක්‍රියාවලිය තවදුරටත් දියුණු කරමින් MLTS සේවා නැති ග්‍රාමීය රෝහල්වල ඒක ව්‍යාප්ත කිරීම සඳහා එම ක්‍රමවේදය පාවිච්චි කරන්නට උත්සාහ ගනිමින් සිටිනවා. මා ඔබතුමා හරහා ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ. කරුණාකරලා, මේ පරීක්ෂණාගාර සේවාව, අපි කෝටි ගණන් මුදල් වියදම් කරලා ඇති වැඩක් නැහැ. ලෙඩක් ඇතුව රෝහලට එන මනුස්සයාට, බොහොම පහසුවෙන් කරගන්න පුළුවන් පරීක්ෂණය කරගන්න රෝහලෙන් අවස්ථාවක් ලැබෙන්නේ නැත්නම්, සම්පූර්ණ සෞඛ්‍ය සේවාවම කඩා වැටුණු සෞඛ්‍ය සේවාවක් බවට පත් වෙනවා. ඒ නිසා මා ඉතාමත් යටහත්ව හා ගෞරවයෙන් ඔබතුමා හරහා වර්තමාන සෞඛ්‍ය ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. කරුණාකරලා පරීක්ෂණාගාර සේවාවන් ඇති කරන්නට මුදල් ප්‍රමාණයක් වෙන් කරන්නය කියලා. විශේෂයෙන් ග්‍රාමීය රෝහල්වලට. මම හිතනවා, ඒක කරන්න පුළුවන් නම් අපි පළාත් සභාව තුළ මේ ඉන්න මිනිස්සුන්ට ලැබෙන සෞඛ්‍ය සේවාව ඉදිරියට ගෙන යන්නට ඒක යම්කිසි අස්වැසිල්ලක්, සහායක් වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණාව හැටියට මම සඳහන් කරන්න කල්පනා කළේ, මේ ඖෂධ ප්‍රතිපත්තිය. ලංකාවේ අපි කවුරුත් දන්න දෙයක් තමයි පළාත් සභාවලට ඖෂධ ප්‍රතිපත්තියක් නැහැ. නමුත් ඒක ජාතික ප්‍රතිපත්තියක් හැටියට සැලසුම් කරන්නට ඕනෑ. ඖෂධ ලබා ගැනීමේදී, මිලදී ගැනීමේදී - පළාත් සභාවට ඖෂධ මිලදී ගැනීමේ හැකියාවක් නැහැ. ඒක රේඛීය අමාත්‍යාංශය හරහා අපි ලබාගත යුතුයි. රජයෙන් අපට

මුදල් වෙන් කරලා දෙනවා. සෞඛ්‍ය සඳහා ඒ වෙන් කරන මුදලෙන් තමයි අපි නැවත වාරයක් රේඛීය අමාත්‍යාංශයට ගිහිල්ලා අපට අවශ්‍ය ඖෂධ මිලදී ගන්නේ. එතකොට රේඛීය අමාත්‍යාංශයේ තිබෙන දූෂණයන් සහ වෙනත් අක්‍රමිකතා හේතුකොටගෙන ඒ මිල වැඩි වනකොට අපට ලැබුණු මුදල නැවත ගෙවලා ඖෂධ මිලදී ගන්නකොට ලැබුණු මුදලේ වටිනාකම අපට ලබා ගන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා. මෙන්න මේ පිළිබඳවත් වචනයක් කථා කරලා යෝජනාවක් කරන්නට මම බලාපොරොත්තු වෙනවා. අපි කවුරුත් දන්නවා, මහචාර්ය සේනක බිබිලේ. එස්.ඒ. වික්‍රමසිංහ මහත්මයා. මම හිතන්නේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා තව විනාඩි 02 කින් විතර කථාව අවසන් කරන්න වෙනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මට මිනිත්තු දෙකක් විතර වැඩිපුර දෙන්න පුළුවන් නම් -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බැහැ, බැහැ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම මේ මෝඩ කතන්දරයක් නොවෙයි කියන්නේ. ප්‍රයෝජනවත් දෙයක් කියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පැහැදිලියි. කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

සේනක බිබිලේ, වික්‍රමසිංහ මහත්තයා එකතු වෙලා ඖෂධ ප්‍රතිපත්තියක් හදන්න ගියා. මම ඒක ගැන කථා කරන්නේ නැතුව ඉතාමත් සරලව කාරණා දෙකක් නැත්නම් තුනක් කියනවා. මේ ලංකාවේ ඖෂධ මාෆියාවක් තිබෙනවා. ඖෂධ මාෆියාව කොහොමද අපි නැති කරන්නේ කියන එක ගැන අපි අපේ අවධානය යොමු කරලා යම් හෝ පියවර ගන්නට ඕනෑ. ඖෂධ මාෆියාව ක්‍රම දෙකකට නැත්නම් තුනකට ක්‍රියාත්මක වෙනවා. පළමුවැනි එක තමයි රාජ්‍ය ආයතනයේ ඖෂධ මාෆියාව. ඖෂධ ගෙන්වන අය ලියාපදිංචි කිරීමේදී 1998 වනකල් ක්‍රමවේදයක් තිබුණා. එවකට හිටපු වෛද්‍ය සැපයුම් අධ්‍යක්ෂ, මම හිතන්නේ බොහොම වංචනික ආකාරයට ඒ ක්‍රමවේදය වෙනස් කරලා වංචනික ක්‍රමයකට ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් 1998 ඉඳලා හඳුන්වලා දුන්නා. ඒ කෙසේ වෙතත් ඒ ගැන කථා කරන්නේ නැතුව මට තිබෙන සීමිත කාලය නිසා මම කියන්නට ඕනෑ, රජයෙන් ලබාගන්න බැරි ඖෂධ රෝහල්වල අධ්‍යක්ෂවරුන්ට අවසරය දීලා තිබෙනවා, Local Purchases කියලා. ඒ කියන්නේ විශේෂඥ වෛද්‍යවරු BHT එකේ ලිව්වාම ඒ ඖෂධය රෝහලේ නැත්නම් අධ්‍යක්ෂවරයාට පුළුවන් ඒවා මිලදී ගන්න. මහ විශාල ප්‍රමාණයක මුදල් මේ සඳහා වෙන් කරලා තිබෙනවා. අපි දන්නවා, සමහර විශේෂ මහත්වරු අඩු මිලට ගන්න පුළුවන් ඖෂධ තිබියදී වැඩි මිලක් තිබෙන යම් යම් ඖෂධ ඒ BHT වල ලියලා යනවා. එමගින් අපට ඉතාමත් අධික මිලකට ඖෂධ Local Purchases කරන්න, අපේ රේඛීය අමාත්‍යාංශයෙන් ලැබෙන ඖෂධ වෙනුවට ඒ මුදල් වෙන් කරන්න ඕනෑ. ඖෂධ විකුණන අය බොහෝ ආකාරවලට බලාගන්නවා. රැක ගන්නවා. ඔවුන්ට යම් යම් පහසුකම් ලබා දෙනවා. මෙන්න මේ කාරණාව පිළිබඳව බස්නාහිර පළාත් සභාවේ ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියනවා. මට තව එක කාරණාවක් කියන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කාලය අවසන් වෙනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මට තව මිනිත්තුවක් දෙන්න. ඉතාමත්ම වැඩි මිල තිබෙන ඖෂධ තමයි පෞද්ගලික අංශයේ වෛද්‍යවරු Prescribe කරන්නේ. මට එක කාරණාවක් විතරක් කියලා කථාව අවසන් කරන්න දෙන්න. මගේ මිත්‍ර වෛද්‍යවරයෙක් කොහුවල SPC එකේ ඉන්නකොට කාන්තාවක් ඇවිල්ලා එක්තරා ඖෂධයක් ඉල්ලලා තිබෙනවා. ලංකාවේ නම ගිය විශේෂඥ දොස්තර මහත්මයෙකුගේ Prescription එකක්. ඒක අරගෙන මාස දෙකකට ගන්න තිබෙනවාද කියලා ඇහුවාම (බාධා කිරීමක්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඒ Pharmacy ය කියලා තිබෙනවා, මේ එක පෙත්තක් රුපියල් 210 ක් වෙනවා කියලා. දොස්තර මහත්මයා ඒක අරගෙන බලලා කියලා තිබෙනවා, මේක 210 ගණනේ ගන්න ඕනෑ නැහැ. මේක රුපියල් 15 ගාණේ ගන්න පුළුවන්. මේ හා සමානම Effective Drug එකක් තිබෙනවා කියලා. ඒ කියලා ඒ මනුස්සයා ඒ ඖෂධය ගන්නේ නැතුව එළියට ගියාට පස්සේ, ඒ Pharmacy ය දොස්තර මහත්මයාට කියලා තිබෙනවා, ඔය කියන දොස්තර මහත්මයා හැමදාම ඔය ඖෂධය තමයි Prescribe කරලා එවන්නේ. ඒ කියන්නේ මම හිතනවා ඒ වෛද්‍යවරුන්ට Tip Back එකක් තිබෙනවා. ඒ ඖෂධ නිෂ්පාදනය කරන නැත්නම් ලංකාවට ආනයනය කරන අයගෙන් යම්කිසි විධියකින් ඒ අයගේ මෝටර් රථ බලා ගන්නවා. කාර් ටික අරගෙන දෙනවා. බැටරි ටික අරගෙන දෙනවා. පිටරට යවනවා. මෙන්න මේ නිසා මේ ඖෂධ මාෆියාවෙන් බස්නාහිර පළාතේ අහිංසක මිනිසුන්ව ආරක්ෂා කර ගන්නට ක්‍රමවේදයක් සකස් කරන්නට පියවර ගන්නය කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 02.16]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා වන වෙලාවේ වර්තමාන අපේ ගරු අමාත්‍ය රංජිත් සෝමවංශ මැතිතුමා මේ අමාත්‍යාංශය භාර අරගෙන, පළාත් සභාවේ දීර්ඝ කාලයක් නියෝජනය කරපු මහජන නියෝජිතයෙක් හැටියට තමයි ප්‍රථම අයවැය ලේඛනය එතුමා ඉදිරිපත් කරන්නේ. මේ අයවැය ලේඛනය පිළිබඳව සාකච්ඡා කිරීමේදී මම විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන අපේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන බස්නාහිර පළාතේ විශාල ප්‍රමාණයක් තිබෙනවා. විශේෂයෙන් මේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන විදේශ අරමුදල්වලින් ඒ වාගේම දේශීය අරමුදල්වලින්, සුභ පතන්නන්ගේ ආධාර මත පවත්වන මධ්‍යස්ථාන විශාල ප්‍රමාණයක්ද බස්නාහිර පළාත තුළ තිබෙනවා. අපි අමාත්‍යාංශයක් හැටියට, දෙපාර්තමේන්තුවක් හැටියට මේවායේ රැකවරණය ලබන දරුවන් වෙනුවෙන් ගෙවනු ලබන්නේ රුපියල් 20 ක වාගේ දිනක දීමනාවක්. ඒ දරුවන්ගේ යැපීම සඳහා. සියලු කාරණා සඳහා. මම හිතන්නේ, වර්තමානයේ මේ වාගේ ආයතනයක තිබෙන වියු හියදම් දිහා බැලුවාම, මේ මුදල කිසිසේත් ප්‍රමාණවත් නැතැයි කියන කාරණාව මේ වෙලාවේ මම සඳහන් කරන්න කැමැතියි. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ මුදල යම්කිසි සාධාරණ වූ මට්ටමට වැඩිවීමක් කරන්න මේ වෙලාවේ යෝජනාවක් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

රුපියල් 50 ක් කර තිබෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු ඇමැතිතුමා මේ වෙලාවේ සඳහන් කරනවා, ඒ මුදල රුපියල් 50 දක්වා වැඩි කරලා තිබෙනවා කියන කාරණාව. අපි ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම ඊළඟ කාරණාව තමයි බස්නාහිර පළාතේ ළමා නිවාසවල ඉන්න පාලිකාවන් සඳහා රජය විසින් අනුමත රජයේ ආයතනවල යම් දීමනාවක්, වැටුපක් ගෙව්වත් එක්කෝ විදේශ හෝ දේශීය ආධාර මත ස්වෙච්ඡාවෙන් ක්‍රියාත්මක වන ආයතනවල පාලිකාවන්ට කිසිදු දීමනාවක් රජය හරහා ගෙවීමක් සිද්ධ වෙන්නේ නැහැ. 2015 අයවැය යෝජනා හරහා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පෙර පාසල් පාලිකාවන්ට යම් දීමනාවක් ගෙවන්නට යෝජනා කළා වාගේ මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ වාගේ මධ්‍යස්ථානවල, නිවාසවල ඉන්න අපේ දරුවන් පැය 24 ම රැක බලා ගන්නා වූ පාලිකාවන් සඳහා පළාත් සභාවේ අපේ දෙපාර්තමේන්තුව හරහා යම් දීමනාවක් ගෙවන වැඩ පිළිවෙළකට ක්‍රියාත්මක වෙන්න කියන කාරණාව ගරු ඇමැතිතුමාගේ අවධානය පිණිස මම මේ වෙලාවේ යොමු කරනවා.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ආයුර්වේද සේවය. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව හරහා බස්නාහිර පළාතේ ආයුර්වේද රෝහල් හරහා විශාල

සේවාවක් සිද්ධ වන වකවානුවක්. විශේෂයෙන් මම නියෝජනය කරන කඳුබඩ ආයුර්වේද රෝහල, අද මහජනතාව විශාල සේවාවක් ලබා ගන්නා ස්ථානයක්. බාහිර රෝගීන් මෙන්ම, නේවාසික රෝගීන්. කඳුබඩ ආයුර්වේද රෝහලේ නේවාසික රෝගීන්ට දැන් ඉන්නට ඉඩක් නැහැ. ඒ තරමටම ආයුර්වේද සේවාවේ ප්‍රතිලාභ ජනතාව ඉතාම ඉහළින් භුක්ති විඳින වෙලාවක්. මම කනගාටු වෙනවා. ගරු ඇමැතිතුමා ඉදිරිපත් කරපු මේ පොත් පිංචේ එතරම් විශාල සේවාවක් සපයන කඳුබඩ ආයුර්වේද රෝහල පිළිබඳව වචනයක්වත් සඳහන් වෙලා නැහැ. ඒක දියුණු කරන්න කිසිදු අදහසක් මේ පොත් පිංච තුළ නොතිබීම ගැන මම කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් වසර ගණනාවක සිට අපේ ආයුර්වේද රෝහලේ වෛද්‍ය මණ්ඩලය, ඒ රෝහල් කමිටුව දීර්ඝ ලෙස අමාත්‍යාංශය හරහා දිගින් දිගටම ඉල්ලීමක් කරලා තිබුණා. ඒ රෝහලේ නේවාසික රෝගී අංශය දියුණු කරන්නට, වැඩි දියුණු කරන්නට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම් සහ ගොඩනැගිලි ඉදි කිරීම් කටයුතු සිද්ධ කරන්නය කියන කාරණාව. ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ රෝහලේ ඉඩකඩ සීමිත බැවින් ඊට ආසන්න ඉඩමක් තිබෙනවා. ඒක රජයට භාර දෙන්නත් කැමැතියි. හැබැයි, යම් ගෙවීමකට. ඒ සඳහා ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරලා විශේෂයෙන් බාහිර රෝගී අංශය ඒ ස්ථානයේ දියුණු කරන්න කටයුතු කරන්නය කියන කාරණාව මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම තමයි සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හරහා මම කනගාටු වෙනවා. මේ වෙලාවේ අපේ ඉතිහාසයේ මේ පළාත් සභා වාරයට මත්තෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හරහා අපේ රෝහල් වැඩිදියුණු කරන්නට ප්‍රජාව සම්බන්ධ වුණු වැඩ පිළිවෙළක් තිබුණා. රෝහල් කමිටු බිහි කරලා. මම කනගාටු වෙනවා වර්තමාන ඇමැතිතුමාගේ ඒ පිළිබඳව තිබෙන අකැමැත්තක්ද එහෙම නැත්නම් වර්තමාන පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය හෝ අමාත්‍යාංශ ලේකම්තුමාගේ තිබෙන අකැමැත්තක්ද මම දන්නේ නැහැ, මහජනතාව අපේ රෝහල් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරන එකට තිබෙන අකැමැත්ත නිසා වෙන්න ඇති අද වනකොටවත් රෝහල් කමිටු පිහිටුවන වැඩ පිළිවෙළකට මේ අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වෙලා නැහැ. මේ තත්ත්වය සම්බන්ධයෙන් මම අතිශයින් කනගාටු වෙනවා. මේ රෝහල්වල රෝහල් කමිටු ක්‍රියාත්මක කිරීම තුළ, මහජනතාව සම්බන්ධ වීම තුළ ප්‍රදේශයේ සුභ පතන්නන්ගේ සම්බන්ධතාවය මත රෝහල්වල තිබෙන ක්ෂණික සුළු අලුත්වැඩියා, අත්‍යවශ්‍ය කාරණා අපි බොහෝ සෙයින් සපුරාගෙන අපේ රෝහල් සේවය ශක්තිමත් කරන්න ඉතිහාසයේ සිට කටයුතු කරලා තිබෙනවා. අද වර්තමානයේ මේ දෙපාර්තමේන්තුවේ තිබෙන අක්‍රියතාවයක් කියන එක මම මේ වෙලාවේ සඳහන් කරන්න කැමැතියි. ඒ නිසා විශේෂයෙන් බියගම ග්‍රාමීය රෝහලේ කටයුතු පසුගිය කාලයේ අර්බුදයකට ලක් වෙලා තිබුණා, ප්‍රධාන වෛද්‍ය නිලධාරීවරයාගේ ස්ථාන මාරුවීමත් එක්ක. අනෙකුත් වෛද්‍යවරු ගණනාවක් ස්ථාන මාරු වෙලා ඒකේ සේවාවන් දෙන්න බැරි තත්ත්වයක් තිබුණා.

බියගම ග්‍රාමීය රෝහල කියන්නේ, බියගම නිදහස් වෙළඳ කලාපයේ අනේවාසික සේවකයින් 25,000 කට ආසන්න ප්‍රමාණයක් ඉන්න, ඒ වාගේම තවත් කර්මාන්ත පුර ගණනාවක් තිබෙන ප්‍රදේශයක්. ඒ නිසා විශාල සේවාවක් සිද්ධ වුණු රෝහලකට අපේ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව නිසි අවධානය යොමු නොකිරීම නිසා යම් අභාග්‍ය සම්පන්න තත්ත්වයකට යමින් පවතිනවා. ඒකේ ඉන්න වෛද්‍ය මණ්ඩලය විශාල ආඩුපාඩු රාශියක් මධ්‍යයේ විශාල උත්සාහයක් ගන්නවා. ඒ නිසා මේවා පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල වැඩි පියවරක් ගත යුතුයි කියන කාරණාව මම මේ වෙලාවේ මතක් කරනවා. ඒ වාගේම අද MOH වල, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල රියදුරු මහතුන් සේවය කරනවා. ආදේශක වැඩ ආවරණය කරන රියදුරු මහතුන්. අතිගරු ජනාධිපතිතුමා 2015 අයවැය ඉදිරිපත් කරමින් කිව්වා අනියම්, ආදේශක සේවකයින් ස්ථිර කරන වැඩ පිළිවෙළක් ගැන. මම මේ වෙලාවේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. අපේ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව තුළ ඉන්න, අපේ කාර්ය මණ්ඩලවල ඉන්න වැඩ ආවරණය කරන රියදුරු මහත්වරු ස්ථිර කරන වැඩ පිළිවෙළකට යන්නය කියන කාරණාව.

ඒ වාගේම එක විනාඩියක් දෙන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අද මේ සභාව ආරම්භයේ ඉඳලා - සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැදගත්ම දෙපාර්තමේන්තුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය. මේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමිය අයවැයේ අදහස් අහන්න මේ සභාව ආරම්භයේ හිටියේ නැහැ. ඇයි? මේ නිලධාරීන් සභාව හැල්ලු කරන තත්ත්වයකට පත් වෙලා තියෙන්නේ? මේක විශාල ගැටළුවක්. කිසිම නිලධාරියෙකුට මේ සභාව හැල්ලු කරන්න දෙන්න බැහැ. ඉතිහාසයේ එහෙම වෙලා නැහැ. බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඉතිහාසයේ ඉතා ඉහළින් වැජඹුනු දෙපාර්තමේන්තුවක්. ඉතිහාසයට ගියොත් වෛද්‍ය නිහාල් ජයතිලක මහතා එක කාලයක මෙහි අධ්‍යක්ෂවරයා හැටියට හිටියා. අමල් හර්ෂ මහතා, ඒ වාගේම අපේ ගම්පහ හිටපු සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා ඉන්ද්‍රසිරි මහතා, මේ අය විශිෂ්ට සේවාවක් බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අධ්‍යක්ෂවරු හැටියට මේ පළාත් සභා ඉතිහාසයේ කටයුතු කරලා තිබෙනවා. අද ඉතාම කනගාටුයි. මහජන නියෝජිතයෙක්ට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ දුරකථනයට කථා කරන්න බැහැ. උත්තරයක් හම්බ වෙන්න නැහැ. මේ වාගේ හැල්ලුවට මේ පළාත් සභාව පත් වෙන්න බැහැ. කිසිම නිලධාරියෙක්ට මේ උත්තරීතර සභාව හැල්ලු කරන්න බැහැ. මේ පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැදගත්ම දෙපාර්තමේන්තුව සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව. ඒකේ ප්‍රධානියා මෙතැන නැතුව -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම නම් හිතන්නේ නැහැ, ඒක සාධාරණ චෝදනාවක් කියලා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මේක සාධාරණ චෝදනාවක්. මේ පිළිබඳව දැඩි අවධානය යොමු කරන්න කියන කාරණාව මම මේ වෙලාවේ මතක් කරමින් මේ ඇමැතිතුමාගේ කටයුතු ඉදිරියට ගෙන යන්න අපේ සහයෝගය ලබා දෙනවා කියන කාරණාව මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ වැදගත් අමාත්‍යාංශයකට, වැදගත් විෂයයකට අදහස් ප්‍රකාශ කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ වැඩි අවධානයක් විපක්ෂයේ මන්ත්‍රීවරු සියලු දෙනාටම තිබුණා. ඒ නිසාම තමයි අපි විපක්ෂයේ සෝදිසිය කියන වැඩ සටහනෙන් ප්‍රථමයෙන්ම මීගමුව මහ රෝහල නිරීක්ෂණ සංචාරයකට ගියේ. අපි පළාත් සභා මන්ත්‍රීවරු කණ්ඩායම ගියාම මීගමුවේ ඒ මහත්මිය ඉතා ආදරයෙන් අපව පිළිගෙන අපට විශාල ලෙස පහසුකම් සියල්ලක්ම සැලසුවා. මම එතුමියට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම අමාත්‍යතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඒ පහසුකම් ටික සලසා දෙන්න කියන ඉල්ලීම කිරීම පිළිබඳව. අපට ඒ පිළිබඳව කිසිම ගැටළුවක් නැහැ. අපව හොඳින් පිළිගත්තා. අපි කියන දේවල්වලට හොඳින් ඇහුම්කන් දුන්නා. නමුත් අපට තිබෙන ගැටළුව තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ඒ මීගමුව රෝහලට වෙලා තිබෙන තත්ත්වය. මම මේ මීගමුව රෝහල ගැන පමණක් කථා කරනවා නොවෙයි. මේ මීගමුව රෝහල ගැන ඇති වෙලා තිබෙන තත්ත්වයම තමයි ගම්පහ රෝහලටත් වෙලා තිබෙන්නේ. අපේ මන්ත්‍රීතුමන්ලා ඒකට සාක්ෂි දරයි. එතුමන්ලා අපව ආදරයෙන් පිළිගත්තාට අද ජනතාවට එවැනි තත්ත්වයක් නොවෙයි උදා වෙලා තිබෙන්නේ. අද රෝහලකට ගියාම කනගාටුයි කියන්න, රෝහලේ වෛද්‍යවරුන්ට දෙන්න වෙලා තිබෙන්නේ තුණ්ඩු කෑල්ල විතරයි. තුණ්ඩු කෑල්ල දෙන්නේ. බෙහෙත් ටික නොවෙයි. අපි බලාපොරොත්තු වෙන්නේ, රෝගියෙක් ගියාම බෙහෙත් ටික අරගෙන එන යුගයක් ආරම්භ කරන්න.

ඒ විතරක් නොවෙයි. රෝගියෙක් ගියාම අද පරීක්ෂණයක් කරන්න අවස්ථාවක් නැහැ. මුත්‍රා පරීක්ෂණය කරන්නත් වෙලා තිබෙන්නේ, පෞද්ගලික ආයතනයකට ගිහිල්ලා. මෙවැනි විශාල ගැටළු ප්‍රමාණයක් තිබෙනවා. මම හිතන්නේ ඔබතුමන්ලාට ඒක ගැටළුවක් නැහැ. මොකද, මන්ත්‍රීවරුන්ට රක්ෂණයක් තිබෙනවා නේ? ගිහිල්ලා නතර වෙලා හොඳටම ඒ ටික කර ගන්න පුළුවන්. නමුත් සාමාන්‍ය ජනතාවට ඒ අවස්ථාව නැහැ. ඒකයි ඇත්ත තත්ත්වය. අද මීගමුවට ගියාම මීගමුව රෝහලේ ඇති වෙලා තිබෙන තත්ත්වය. මම මගේ ජීවිතයේ, මම හිතන්නේ නැහැ එක මන්ත්‍රීවරයෙක්වත් මේ වාගේ දෙයක් දැකලා

තිබෙනවා කියලා. වැහි පීලි තියෙන්නේ බිල්ඩිම ඇතුලේ. අපි දන්න තරමින් වැහි පීලි දාන්නේ එළියෙන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැහි පීලි තිබෙන්නේ බිල්ඩිම ඇතුළේ. රෝගියාගේ ඇඳ එහා පැත්තේ වතුර Leak වෙනවාට බේසම් තියලා. අර ගෙවල්වල තියනවා වාගේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඒක තමුන්නාන්සේලාගේ පරිපාලනයේ හොඳකම.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මෙවැනි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. මම ඉතා සතුටුයි එවැනි දෙයක් දකින්න ලැබිලා අපේ ගරු ඇමැතිතුමාට එවැනි අඩුපාඩු කියන්න හැකිවීම ගැන. විශේෂයෙන්ම මේ තත්ත්වයම තමයි ගම්පහ ඉස්පිරිතාලෙට ඇති වෙලා තිබෙන්නේ. අපි ගියා කියලා මාධ්‍යයෙන් දැක්කාම ගම්පහ ඉස්පිරිතාලේ ඉන්න සේවක සේවිකාවන්, ඒ ප්‍රදේශවාසීන් කියනවා. එන්න කෝ මන්ත්‍රීතුමා, ගම්පහට ඇවිල්ලා බලන්න කියලා. ගම්පහ වෙලා තියෙන්නේත් ඔය තත්ත්වයමයි කියන එක පැහැදිලියි. ඉතින් මම හිතන්නේ, මේකේ මෙතුමාටත් කරන්න පුළුවන් දෙයක් නැහැ. මොකද, අද මේ පළාත් සභාවේ වැදගත්ම විෂයයක් බවට පත් වෙලා තිබෙනවා සෞඛ්‍ය විෂයය. අනිවාර්යයෙන්ම. මේ සෞඛ්‍ය විෂයයට අද ප්‍රතිශතයක් හැටියට කීයද මුදල් වෙන් කරන්නේ? මේ පළාත් සභාවේ අපි කොපමණ කථා කළත් 3% යි මුදල් වෙන් කරන්නේ. 3% ක මුදල් වෙන් කිරීමක් කරලා ජනතාවට සේවයක් කරන්න පුළුවන් වන්නේ කොහොමද? මේකයි ඇත්ත. එදා කෘෂිකර්මයට 1.75 යිද කොහේද. අද සෞඛ්‍යයට දීලා තිබෙන්නේ 3% යි. ආණ්ඩුව සෞඛ්‍ය ගැන ලොකුවට කථා කරනවා. නමුත් මුදල් වෙන් කරන්නේ නැතුව මේක කරන්නේ කොහොමද? මම හිතන්නේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

09 වැනිදායින් පස්සේ පුළුවන් නේ?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

අපි කරලා පෙන්වන්නම්.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

විශේෂයෙන් අපේ ගරු ඇමැතිතුමාට හොඳ කාර්ය භාරයක් තිබෙනවා. ඒ කාර්ය භාරය ඉටු කරන්න ඒ සම්පත් ප්‍රමාණය මේ පළාත් සභාවෙන් ලැබෙයි කියන එක මම බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම තමයි අපේ හිටපු ඇමැතිතුමයි, දැන් ඉන්න ඇමැතිතුමයි මේ දෙදෙනාම කළුතර දිස්ත්‍රික්කයෙන් ඉදිරිපත් වෙලා මහජන නියෝජිතයින් හැටියට පත් වෙලා තිබෙන්නේ. නමුත් විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ කළුතර දිස්ත්‍රික්කයේ මේ අවුරුද්දේම 14 දෙනෙකුට ඒඩ්ස් හැදිලා. ලංකාදීප පත්තරේ තිබුණු දේ. ඒකෙන් මේ මාස 09 ඇතුළත තමයි 11 දෙනෙක්. මම විශේෂ අවධානයක් යොමු කරන්න කැමැතියි අපේ ඇමැතිවරුන්ට. අපේ හිටපු ඇමැතිතුමාත් ඉන්නවා. වර්තමාන ඇමැතිතුමාත් ඉන්නවා. ඒඩ්ස් රෝගය පිළිබඳව වැඩි අවධානයක් ඔබ තමුන්නාන්සේලාගේ දිස්ත්‍රික්කය නියෝජනය කරන - මම හිතන්නේ නැහැ ගරු ඇමැතිතුමාට ඒ ගැන ගැටළුවක් තියෙයි කියලා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

සමලිංගික පක්ෂ තිබෙනවා. සමලිංගික දේශපාලන ව්‍යාපාර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒවාට උත්තර දෙන්න යන්න එපා. ඔබතුමා මූලාසනයට කථා කරන්න. ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

එහෙම නම් මේ ජනතාව වෙනුවෙන් වැඩි සේවාවක් සිදු කරන්න, ජනතාව වෙනුවෙන් අපි කවුරුත් බලාපොරොත්තු වන නොමිලේ සෞඛ්‍ය සේවය ලබා දීලා - නොමිලේ සෞඛ්‍ය කිව්වාම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්නේ නොමිලේ සෞඛ්‍ය සේවාවක් ලබා දෙනවා කියලා වෛද්‍යවරුන්ගේ උපදෙස් ටික විතරක් ලැබිලා වැඩක් නැහැ. වෛද්‍යවරු හම්බ වෙන්න ගියාම බෙහෙත් ටික ලැබෙන යුගයක් ඇති කරන්න ඔබ සියලු දෙනා, විශේෂයෙන්ම ඇමැතිතුමා කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.31]

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ සමස්ත ජනතාවගේ ජීවිතයට වඩාත්ම සමීප වුණු, වඩාත්ම බද්ධ වුණු විෂයය ක්ෂේත්‍රයක් සම්බන්ධව අද අයවැය විවාදය පැවැත්වෙන මොහොතේ අදහස් එකතු කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන්, මේ අවස්ථාවට අදහස් දැක්වීමට මා සතු වගකීමක් තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. විශේෂයෙන්ම වර්තමාන අප අමාත්‍යතුමාත් සමග උපදේශක කාරක සභාවලදී සම්බන්ධ වෙමින් මේ බස්නාහිර පළාත් සභාව තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් අපගේ අදහස් අපි එතුමාට යොමු කරනවා. හුවමාරු කර ගන්නවා. හැබැයි, මාසිකව උපදේශක කාරක සභා පැවැත් වෙන්නේ නම් නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ පිළිබඳව අපේ කනගාටුවක් තිබෙනවා. මාසිකව පැවැත් වෙනවා නම් අපට නිරන්තරයෙන් මේ පිළිබඳව අමාත්‍යතුමාත් එක්ක අපට සම්බන්ධ වෙලා යහපත් කටයුතු රාශියක් පළාතේ සෞඛ්‍ය වෙනුවෙන් කරන්න හැකියාව තිබෙනවා කියන එක මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ පළාත් සභාවට ආධුනික මන්ත්‍රීවරයෙක් වශයෙන් මාගේ ප්‍රථම අයවැය විවාදයට සම්බන්ධ වන අවස්ථාවේදී මේ සියලුම අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තාවන් පිළිබඳව යම් යම් ආකාරයේ නිරීක්ෂණයක යෙදුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සෑම අමාත්‍යාංශයකම ඉතාමත්ම ලස්සන වචන මාලාවක් යොදා ගනිමින් දැක්මක් සහ මෙහෙවර ප්‍රකාශයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම දැක්කා, අයවැය විවාදය සම්බන්ධව ඉදිරිපත් කරලා තිබෙන ඒ සෑම පොතකම තිබෙනවා. නමුත් අවාසනාවකට අද අප රට තුළ ඇති වෙලා තිබෙන ගැටළුව තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ දැක්මත් එක් එක් අමාත්‍යාංශවල ඉදිරිපත් කරන මෙහෙවර ප්‍රකාශයත් අනුව එයට අදාළ ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකිව අද ඒ සියලුම ක්ෂේත්‍ර දේශපාලනීකරණය වීම තමයි අද තිබෙන බරපතළම ගැටළුව වෙලා තිබෙන්නේ. ඒ නිසාම තමයි කිසිදු අමාත්‍යාංශයක ඒ අමාත්‍යාංශය බලාපොරොත්තු වන මූලික ඉලක්කයන් කරා යාමට නොහැකිව ඒ අමාත්‍යාංශවල බරපතළ අර්බුද සහ ගැටළු මතු වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ දවසක් උදා විය යුතුයි මේ අමාත්‍යාංශවලට ජාතික ප්‍රතිපත්තියක්, ජාතික වැඩ සටහනක් ව්‍යවස්ථාපිතව සාදලා ඒක කිසිවෙකුට එක් එක් අමාත්‍යවරයාට හැකි අයුරින්, එක් එක් අමාත්‍යවරයාගේ අවශ්‍යතාවය අනුව වෙනස් කළ නොහැකි ව්‍යවස්ථාපිත ජාතික වැඩ සටහනක්, ජාතික ප්‍රතිපත්තියක් මේ අමාත්‍යාංශයවලට එක් විය යුතුයි කියන එක මම පෞද්ගලිකව විශ්වාස කරනවා. එහෙම නැත්නම් වෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වසරින් වසර සිදු වන අමාත්‍යාංශ සංශෝධනවලදී ඒ අමාත්‍යාංශ භාරව පැමිණෙන අමාත්‍යවරයා තමන් දන්න විධියට, තමන්ට දැනෙන විධියට, තමන් කැමැති විධියට ඒ අමාත්‍යාංශයේ මූලික වැඩ සටහන්, මූලික ප්‍රතිපත්තීන්, ඉදිරි දැක්ම, දිගු කාලීන සැලැස්ම වෙනස් කිරීමයි.

ඒ නිසා මම හිතන්නේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේත් පසුගිය කාලය පුරාවට ඔය බරපතළ අර්බුදය තිබුණා. මේ වනවිට මම හිතන්නේ, සෞඛ්‍ය අමාත්‍යතුමාට මුහුණ දෙන්න සිදු වන බරපතළ ගැටළුව තමයි අද සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ තිබෙන වෘත්තීය සමිති ක්‍රියා මාර්ග. මේ වෘත්තීය සමිති ක්‍රියා මාර්ගත් එක්ක මේ වනවිට සෞඛ්‍ය අමාත්‍යතුමා හරහා බරපතළ අභියෝගයක් තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයෙන් අපේ රටේ ජනතාව බලාපොරොත්තු වන ඒ යහ ප්‍රතිලාභය මේ රෝගීයාට, ඒ ප්‍රතිලාභියාට ලැබෙනවාද කියන එක. ඒ අභියෝගය විසඳා ගැනීමට අද ගරු ඇමැතිවරයාට සුවිශේෂී වගකීමක් සහ අභියෝගයක් තිබෙනවා කියන එක මම විශ්වසා කරනවා. අද ප්‍රධාන වශයෙන් පළාත් සභා රෝහල්වල අපි දකිනවා විශේෂයෙන් කණිෂ්ට කාර්ය මණ්ඩලය ඉතාමත්ම දේශපාලනීකරණය වෙලා. වෘත්තීය සමිති දැඩි ක්‍රියා මාර්ග ගනිමින් ඒ රෝහලට පැමිණෙන රෝගියාව, සේවාලාභියාව ඉතාමත් අපහසුතාවයට පත් කරනවා. සමහර ආයතනවල ඒ රෝහල්වල පරිපාලන කටයුතු සිද්ධ වෙන්නේ, ඒ රෝහල්වල ස්ථානභාර වෛද්‍යවරයාගේ අවශ්‍යතාවය අනුව නොවෙයි. සමහර විට කණිෂ්ට රෝහල් සේවකයන්ගේ තිබෙන දේශපාලන අවශ්‍යතාවලට. අපි දන්නවා, වසර හතරක් යනකොට, එහෙම නැත්නම් වසර පහක් යනකොට මේ සේවකයාට ස්ථාන මාරු ලබා දිය යුතු වුණත්, රජයේ එවැනි ක්‍රියාවක් තිබුණත් අද බොහෝ රෝහල්වල වසර 10, 15 එකම රෝහලේ සේවය කරන කණිෂ්ට කාර්ය

මණ්ඩලයක් ඉන්නවා. අපි දකිනවා, අද පිළියන්දල රෝහලේ ඒක තිබෙනවා. වැතර රෝහලේ එහෙම තිබෙනවා. හෝමාගම රෝහලේ එහෙම තිබෙනවා. ඒ නිසාම එක තැන පල් වුණු, එක තැන කාලය ගෙවන දේශපාලනය සමග සම්බන්ධ වුණු ඒ ක්‍රියාකාරීන් විසින් රෝහලේ සමස්ත පරිපාලනයට දැඩි බාධා ඇති කරන අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ නිසා ඒවා පිළිබඳව තීන්දු තීරණ ගන්න ඒ පිළිබඳව නිවැරැදිව ක්‍රියාත්මක වෙන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා විශ්වාස කරනවා අප අමාත්‍යවරයාට විශේෂ වගකීමක් තිබෙනවා.

ඒත් එක්කම පසුගිය වසර කිහිපය පුරාවටම විපක්ෂයේ ඉන්න අපි කථා කරන ප්‍රධානතම මාතෘකාව තමයි රෝහල්වල තිබෙන ඖෂධ හිඟය. ඒක අපි සෑම වේදිකාවකම කථා කරනවා. අපට දැන් කථා කරලාත් ඇති වෙලා. මම හිතන්නේ පාලක පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට ඒක අහගෙන ඉඳලාත් ඇති වෙලා. නමුත් ඒකට විසඳුමක් ලැබිලා නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරනකොට සෑම මන්ත්‍රීවරයෙක්ම පුන පුනා කියපු කථාව තමයි නිදහස් සෞඛ්‍ය වචනයට සීමා වුණු දෙයක්. රෝගියාට රෝහලට ඇවිල්ලා ඒ බෙහෙත් ටික, තමන්ට අවශ්‍ය ඖෂධ ටික ඒ රෝහලෙන් ලබා ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා කියන එක. එහෙම නම් මොකක්ද කළ යුත්තේ? ඒ සඳහා සුවිශේෂී ඉලක්කයක් ඇති වැඩ පිළිවෙළක් - අපි දන්නවා, පිළියන්දල රෝහලේ අප සම්බන්ධ වන නිසා, මම වසර කිහිපයක් රෝහල් සංවර්ධන කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරපු නිසා දැඩි ඖෂධ හිඟයක් පිළියන්දල රෝහලේ තිබෙනවා. එහෙම නම් වාර්ෂිකව රෝහලට ලබා දෙන ඖෂධ ප්‍රමාණය අඩු කරනවා නම්, මම ඉල්ලා සිටිනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබ තුමුන්නාසේලාට හැකියාවක් තිබෙන්න ඕනෑ මේ රටේ ඇති වන රෝගීන් ප්‍රමාණය අඩු කරවන්න. රෝහලට ලබා දෙන ඖෂධ ප්‍රමාණය අඩු කරනවා නම් මෙහෙන් ඇති වන රෝගීන් ප්‍රමාණය අඩු කරන්න හැකියාව තිබෙන්න ඕනෑ. එහෙම දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. අද එන්න එන්නම රෝහලකට යොමු වන ප්‍රමාණය, බාහිර සායනවල යොමු වන ප්‍රමාණය දිනපතා අද වැඩිවන තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා මේ තත්ත්වයන් පිළිබඳව අපි අවබෝධ කරගෙන දේශපාලන වශයෙන් අපි මොන මතිමතාන්තර දැරුවත් දේශපාලන අධිකාරිය වශයෙන් අපේ වගකීමක් තිබෙනවා, මේ රටේ ජනතාවට සෞඛ්‍ය සම්පන්න අනාගතයක් බිහි කරන්නට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්නට. එසේ නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සම්බන්ධව ගරු අමාත්‍යතුමාගේ විශේෂ අවධානය ඔබතුමා හරහා යොමු කරමින් තවත් එක් පුංචි කරුණක් පමණක් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

පරිවාස හා ළමා රක්ෂක සේවා අමාත්‍යාංශය යටතේ මේ ප්‍රදේශයේ පවතින අනාථ දරුවන් වෙනුවෙන් රුපියල් 20 ක් ලබා දෙනවා කියලා කියැවුණා. ඒක රුපියල් 50 දක්වා වැඩි කරලා තිබෙනවා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විධායක ජනාධිපතිතුමාට එක දවසකට මිලියන් 25 කට අධික ප්‍රමාණයක් වෙන් කෙරෙන අයවැයක් තුළදී අනාථ දරුවෙකුට එක දවසකට ලැබෙන්නේ රුපියල් 50 ක් කියන එකත් සිහිපත් කරමින්, ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමා, ඔබතුමාට විනාඩි 17 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 02.42]

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් අද බස්නාහිර පළාත් සභාවේ මගේ යටතේ තිබෙන අමාත්‍යාංශය, මගේම අමාත්‍යාංශයක් විතරක් නොවෙයි. මගේ මතයක් තිබෙනවා විශේෂයෙන් පළාත් සභාවේ ජ්‍යෙෂ්ටතම මන්ත්‍රීවරයෙක් හැටියට මේ අමාත්‍යාංශය පක්ෂ විපක්ෂ අප සියලු දෙනාගේම වගකීම් යටතේ තිබෙන මේ බස්නාහිර පළාතේ

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

ජනතාවට අයිති අමාත්‍යාංශයක් කියලා. මම ඒ මතයේ ඉඳලා තමයි ක්‍රියාත්මක වෙන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා අපේ උපදේශක කාරක සභාවේදීත් මම ඒ නියෝජනය ඒ ආකාරයෙන්ම ආරක්ෂා කරනවා. ඉදිරියටත් ඒ නියෝජනය ආරක්ෂා කරනවා. මම දන්නවා, රොඩ්නි ප්‍රේසර් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ සෞඛ්‍ය අමාත්‍යාංශයයි, අධ්‍යාපන අමාත්‍යාංශයයි වැඩියෙන් විවේචනයට භාජනය වන අමාත්‍යාංශ දෙකක්. කොහොමත් වැඩිපුර සාධාරණ විවේචන තමන්ගේ අමාත්‍යාංශයට ලැබෙනවා නම්, ඒවා ඉවසා දරාගෙන ඒ විවේචන අඩු වන විධියට ඒ අමාත්‍යාංශවල තත්ත්වය හොඳ තත්ත්වයකට නංවාලීමට කටයුතු කිරීම සහ ඒ සඳහා නායකත්වය දීම තමයි අමාත්‍යවරයාගේ වගකීම කියලා මම විශ්වාස කරන්නේ. ඒ නිසාවෙන් අද දවසේ ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා රාශියක් අදහස් ප්‍රකාශ කළා. විවිධ යෝජනා ඉදිරිපත් කළා. විවිධ අදහස් ඉදිරිපත් කළා. අගය කිරීම් කළා. මේ සියලු දේවල් මම ඉතාම හොඳින් අවධානයට ලක් කළා විතරක් නොවෙයි. දෙසැම්බර් මාසයෙන් පසුව එළැඹෙන 2015 වර්ෂයේ අද පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කරපු ගරු මන්ත්‍රීතුමන්ලාගේ විශේෂ හමුවක් -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එහා පැත්තේ පොඩි සාජ්ජයක්

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා බලන්න. පොඩි කරදරයක් වාගේ මට පේන්නේ. කාන්තා හිංසනයක් වාගේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හිරුණිකා අවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම මේ සභාවේ කලිනුත් කිව්වා විනයක් ඕනෑ කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හිරුණිකා ආවා. ඒකයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම මූලාසනයේ ඉන්න කාලේත් මම ඒක කළා. මාත් එක්ක තරහාත් වුණා. මම ඒ වුණාට ඒ විනය කළා. සභාවක විනයක් අවශ්‍යයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා සභා ගර්භයෙන් පිටත වන දේවල් පිළිබඳව මට -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

වෙලාව පිළිබඳව සැලකිලිමත් වෙන්න. මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ විශේෂ සාකච්ඡාවට භාජනය වුණු කාරණාවක් තමයි ග්‍රාමීය රෝහල්වල සංවර්ධන කටයුතු මීට වඩා හොඳින් ඉෂ්ට කරන්න ඕනෑ. විශේෂයෙන් අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේම රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා, හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා මට මේක වැඩියෙන් අවධානය කළා. ඒ නිසාවෙන් මම මතක් කරන්න ඕනෑ, අපේ සෞඛ්‍ය සේවාව ගමට ගෙනියන්න. දැන් ජනතාවගේ ආකල්ප වැරදි විධියට තමයි ක්‍රියාත්මක වෙන්නේ. වෙනදා ගමේ රෝහලෙන් ප්‍රතිකාර ගත්තු රෝගියා අද නගරයට එන්න, පෞද්ගලික රෝහලකට නැඹුරු වෙන්න තිබෙන ඉඩකඩ වැඩියි. ඒ නිසා විශේෂයෙන් මගේ වකවානුව තුළ ග්‍රාමීය රෝහල් සංවර්ධනය කරන්න වැඩි බරක් තිබෙනවා කියලා බොහොම අවංකව ප්‍රකාශ කරන්න ඕනෑ. ගමටත් දැන් බෝ නොවන රෝග කාරක සීඝ්‍රයෙන් පැතිර යමින් තිබෙනවා. ඉස්සර එහෙම තිබුණේ නැහැ. දැන් ගමේ පුංචි දරුවාටත් සමහර විට දියවැඩියාව තියෙන්න පුළුවන්. එහෙම නැත්නම් තරුණයෙකුට කොලෙස්ටරෝල් කියන කාරණාව තිබෙන්න පුළුවන්. අධික රුධිර පීඩනය. ආඝාතය. මේ වාගේ විවිධ රෝග තිබෙනවා. ඒ නිසා මේ පුංචි රෝහලටත් මේ අත්‍යවශ්‍ය පහසුකම් දෙන්න, ETU හදිසි ප්‍රතිකාර ඒකක රාශියක් ක්‍රියාත්මක කරන්න මුදල් ප්‍රතිපාදන අපි දැනටමත් වෙන් කරලා අවසන්. අපේ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීතුමන්ලා එය දන්නවා. ඉතාම ඉක්මණින් එම වැඩ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම මූලික රෝහල් කිහිපයක් අපි ඇති කරන්න කටයුතු කරනවා. විශේෂයෙන්ම මීරිගම මූලික රෝහල, කලින් තිබුණාට වඩා අලුතෙන් අපි ආරම්භ කරලා තිබෙනවා. සියලු පහසුකම් සංවිධානගත කරන්න බලාපොරොත්තු වෙනවා. මිනුවන්ගොඩ මූලික රෝහලට අපි දැනට 90% ක් විතර පහසුකම් සම්පාදනය කරන්න කටයුතු කරලා තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා සෞඛ්‍ය ඇමැතිවරයා හැටියට ඉන්න කාලයේ එතුමාගෙන් විශේෂ සහයෝගයක් ලැබුණා. එතුමා සෞඛ්‍ය ඇමැතිවරයා හැටියට ඉන්න කාලයේ තමයි මම - නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා මෙතැන නැහැ. පිඹුර රෝහල මූලික රෝහලක් කරන්න කටයුතු කළේ. තවත් ඒ තත්ත්වය එහාට ගෙනි යන්න ඕනෑ. ගමේ මේ සේවාව බලාපොරොත්තු වන රෝගියාගේ ප්‍රසාදයට අපි පාත්‍ර වෙන්න ඕනෑ. ඒ නිසාවෙන් අපි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, රෝහල්වල පරිපාලනමය කටයුතු පිළිබඳව අඩුපාඩුකම් මට මතක් කළා. මම මේ සැරේ විශේෂ යෝජනාවක් ඉදිරිපත් කළා. මම පිළිගන්නවා. අපි පත් කරන සේවකයන් - මම ආවට පස්සේ නම් සේවකයන් එක්කෙනෙක්වත් පත් කළේ නැහැ. මම එන්නට කලින් පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධික ප්‍රමාණයක සේවක අතිරික්තයක් තිබෙනවා. මගෙන් පස්සේ මම එහෙම අතිරික්තයක් ඇති කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. පරිපාලනමය දුර්වලතාවයක් හට ගැනෙනවා. හැබැයි, ඒ සියලුම සේවකයින්ට දැනුම, ආකල්ප සහ තමන්ගේ වගකීම දැනුවත් කරන්න විශේෂ ව්‍යාපෘතියක් සකස් කළා. ඔවුන් දැනුවත් කරන්න. ඒ වාගේම පුහුණු මධ්‍යස්ථානයක් හදන්න බලාපොරොත්තු වෙනවා. මොකද, ඒක අවශ්‍යයි. අද මේ පත්වීම් ලිපියක් ගහලා රෝහලකට ගියාම ඔහුට තිබෙන දැනුම සහ සමාජයීය ආකල්පවල තිබෙන විෂමතාවයන් නිසා තමයි රෝහල් තුළ මේ විවිධ ප්‍රශ්න මතු වෙන්නේ. ඒ නිසා රාජකාරිය දේව කාරියක් සේ සලකන්නට වෙනවා. ඒ වගකීම උසුලන්න තමයි එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ඒ නිසා මීගමුව රෝහල ගැනත් මම මතක් කරන්න ඕනෑ. ඉතාම අවංකව මේ නැඟෙන චෝදනාව අපි පිළිගන්නවා. මොකද, මේ සඳහා කරුණු ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමනි, මේ මීගමුව රෝහල අපි හදපු දෙයක් නොවෙයි. මීගමුව රෝහල 2002 ගොඩනැඟුණේ කොරියන් රජයෙන් ලැබුණු ආධාර මත. කියැන් නැම් කම්පැණියෙන්. ලංකාවේ මුදල් නොවෙයි. ගම්පහත් එහෙමයි. ඉතින් මේ තට්ටු හතක ගොඩනැගිල්ලක් ඉරි තලලා තිබෙනවා. මම ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ පවත්වන්න තීන්දු කළා. දැනට අපි මොරටුව විශ්ව විද්‍යාලයෙන් සහ ඒ වාගේම අපේ බලශක්ති අධිකාරියෙන් වාර්තාවක් කැඳවලා තිබෙනවා. ඒ සඳහා ප්‍රතිපාදන පවා වෙන් කරලා, ඉතාම කඩිනමින් මේ රෝහලේ ඉදිරි කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහත්මයා එක්ක පවා කථා කළා. එතුමාත් බලාපොරොත්තුවෙන් ඉන්නවා. මම විශ්වාස කරනවා, මේක මගේ වගකීමක්. ඉතින් අනුන්ගේ ඔක්කෝම දේවල් දැන් වර්තමානයේ සෞඛ්‍ය ඇමැතිතුමාට තමයි පැටවෙන්නේ. මට කියනවා ඇහුණා. සමහර ඒවා කළේ නැහැ. ලස්සන නම් තිබුණා. ඒ නම් මට වැඩක් නැහැ. මගේ කාලයේ මම නිතරම බලාපොරොත්තු වෙන්නේ තනියෙන් වැඩ කරන්න නොවෙයි. හැමෝම එක්කම කථා කරලා වැඩ කරන්න. ඒ නිසාවෙන් මගේ කාලයේ මේ වගකීම මම උසුලාගෙන සිටිනවා. මේ වගකීම ඉෂ්ට කරන්න ඔබේ සහාය බලාපොරොත්තු වෙන බව බොහොම අවංකව මතක් කරනවා. එහෙම කරන්න තමයි වෙන්නේ.

ඒ වාගේම මීගොඩ ආර්යුවේද රෝහල සම්බන්ධවත් යම්කිසි චෝදනාවක් තිබුණා. ඒ පත්තරේ ප්‍රවෘත්ති නිවැරැදි කරනවා නම් හොඳයි. ඒක මේ මාස ගණනකට කලින් වුණු දෙයක්. ඩෙංගු මර්දන සම්බන්ධයෙන් පරීක්ෂණයක් කෙරෙද්දී. ඉතාම හොඳ තත්ත්වයකට මීගොඩ ආර්යුවේද රෝහල අපි පවත්වාගෙන යනවා. මට මතක් කරන්න ඕනෑ, ලංකාවේ බස්නාහිර පළාතේ ආයුර්වේද නිෂ්පාදනාගාරයක් නැහැ. දකුණු පළාතේ තිබෙනවා. සබරගමු පළාතේ තිබෙනවා. ඒ නිසාවෙන් මම තීන්දුවක් අර ගත්තා. ඒකට මූලික සැලසුම් සකස් කරලා තිබෙනවා, මීගොඩ ආර්යුවේද රෝහල් භූමිය ආශ්‍රිතව ඖෂධ නිෂ්පාදනාගාරයක් 2015 දී ආරම්භ කරන්න. ගරු සභානායකතුමා ඒ අදහස මට මතක් කරලා දුන්නා. ඒ වාගේම විශේෂයෙන් අපි මතක් කරන්න ඕනෑ, අලුතින් වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක කරගෙන යනවා.

ගරු සභාපතිතුමනි, ඩෙංගු ගැනත් පොඩ්ඩක් කියන්න ඕනෑ. මොකද, අපට විශාල චෝදනාවක් තිබුණා - ලාල් කාන්ත ගරු මන්ත්‍රීතුමා දැක්කත් සතුටුයි. මේ දවස්

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

ටිකේම පේන්න තිටියේ නැහැ. දැක්කාම නිකන් කාන්තියක් ඇති වුණා වගේ නේද? එතුමායි මායි දෙන්නාම ඉත්තෑපාන. මෙහෙම හිටියාට. එතුමා ඉගෙන ගත්ත පාසල මම මහින්ද චින්තනය යටතේ තාක්ෂණ මහින්දෝදය විද්‍යාගාර සහිත හොඳ පාසලක් බවට පත් කරලා තිබෙනවා. එතුමා ඉගෙන ගත්ත පාසල. මම වගකීම් දරලා ඉෂ්ට කරනවා. පක්ෂ භේද වෙනමයි. වැඩ වෙනමයි.

ඩෙංගු සම්බන්ධව විශේෂ ස්තුතියක් අතිගරු ජනාධිපතිතුමාට කරන්න ඕනෑ. ජනාධිපතිතුමා අපව කැඳවලා ජනාධිපති කාර්යසාධක බලකායක් හදලා අපට ලොකු වගකීම් සම්භාරයක් භාර දුන්නා. පළාත් සභා සෞඛ්‍ය ඇමැතිවරයා හැටියට මම තනියෙන් නොවෙයි. විශේෂයෙන් මධ්‍යම රජයේ අමාත්‍යාංශ යටතේ, ඒ වාගේම වසංගත රෝග වෛද්‍ය විශේෂඥවරු යටතේ, ඒ වාගේම විශේෂයෙන් ත්‍රිවිධ හමුදාව, පොලීසිය, ඒ වාගේම පළාත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, අපේ වෛද්‍යවරු, අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන්ලා, ශ්‍රී ලංකා පොලිසිය, ස්වෙච්ඡා සංවිධාන, අපේ රෝහල්වල වෛද්‍ය අධිකාරිවරු, අමාත්‍යාංශ නිලධාරීන් මේ සියලු දෙනාත් එක්ක විශාල කැපවීමක් කරලා තමයි අපි ඩෙංගු සම්බන්ධව අද යම්කිසි අස්වැසිල්ලක් ලබන්නේ. අපට චෝදනා හරියට තිබෙනවා. දැන් ඩෙංගු රෝගීන් මේ වාගේ වැහි දවස්වලින් පස්සේ ඇති වෙන්න පුළුවන්. හැබැයි, රෝගය වැළඳෙනවා වාගේම ඒ රෝගියාව ආරක්ෂා කිරීමේ කටයුතු අපි වෙනදාට වැඩිය හොඳට කරලා තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ මෑත වකවානුවේ රෝගය වැළඳුනු එකම රෝගියෙක්වත් - ටික දෙනෙකුට වැළඳුනා. මිය ගියේ නැහැ. මීගමුව රෝහලේ විශේෂ ඩෙංගු මර්දන ඒකකයක් හදලා තිබෙනවා. ඒ රෝහලට ඇතුළත් වුණු කිසිම රෝගියෙක් මිය ගියේ නැහැ. එසේ නොවේවා කියලා ප්‍රාර්ථනාවකුත් මගේ පුද්ගලිකව තිබෙනවා.

ඒ වාගේම මතක් කරන්න ඕනෑ. අද E රෝහල් ව්‍යාපෘතිය. මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. E රෝහල් ව්‍යාපෘතිය සම්බන්ධව අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විශේෂ ස්තුතියකුත් කළා. අපේ ලේකම්තුමා Rodrigo මහත්මයා විශේෂයෙන් මේ බව අපට හොඳට ප්‍රත්‍යක්ෂ කරලා දුන්නා. එතුමා පරිගණක ක්ෂේත්‍රය සම්බන්ධව ප්‍රවීනයෙක්. අපි E රෝහල් ව්‍යාපෘතිය පානදුර, අවිස්සාවෙල්ල, දොම්පේ රෝහල්වලට ඇතුළත් කරලා තිබෙනවා. දැන් රෝහලට යන රෝගියා අර පිළිගැනීමේ කවුන්ටරයට ගියාම රෝගියාගේ නම පරිගණකගත කරලා රෝගියාගේ ඒ ලැබෙන විස්තර පත්‍රිකාව හරහා රෝගියාව බාහිර රෝගී අංශයේ ප්‍රතිකාර පැත්තට යොමු කරලා එතැන වෛද්‍යවරු රෝගියාව නිසි අංශයට යොමු කරනවා. ඉතින් මේ ව්‍යාපෘතිය අපි දැන් වැඩි දියුණු කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් මූලික රෝහල් සියල්ලේම මේ රෝගී සත්කාරක සේවාවන්, පරිපාලන සේවාවන්, ප්‍රතිකාර මේ සියලු දේවල් පරිගණකගත කරලා මේ තත්ත්වය වැඩි දියුණු කරන්න යනවා. වේලාව අඩු වේලාවක මේවා ගැන කථා කරන්න විධියක් නැහැ. මේ E රෝහල් ව්‍යාපෘතිය ඉතාමත් හොඳ තත්ත්වයකට අපි ගෙනි යන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම මතක් කරන්න ඕනෑ, සෞඛ්‍ය තත්ත්ව වාර්තාවන්. මට චෝදනාවක් නැඟුණා, වැඩ පිළිවෙළක් කරගෙන ආවාය. එක් එක් රාජ්‍ය සේවයේ අයගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කරන වැඩ පිළිවෙළක්. හැබැයි, ඉතින් හදිසියකදී දිනයක් දාගෙන ගිහිල්ලා සෞඛ්‍ය වැඩ පිළිවෙළක් කියලා ඉන්ජෙක්ෂන් කටුවකින් ඇණලා ඒකේ රුධිර සාම්පලයක් ගත්ත පමණින්ම ඒ රෝගියාගේ සෞඛ්‍ය වාර්තාවක් ගන්න පුළුවන්කමක් නැහැ. මම ඉතාම නිවැරැදි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒක තමයි සෞඛ්‍ය තත්ත්ව වාර්තාව. මම අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ අයවැයේදීත් එතුමා මෙය ඉදිරිපත් කළා. අපි ප්‍රතිපාදනත් වෙන් කළා. මෙහි මූලික කටයුතු දැනට අවසන්. කළුතර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතුමාට විශේෂ ස්තුතියක් කරනවා. එතුමා හොරණ සහ අගලවත්ත මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න සූදානම් කරලා තිබෙනවා. හැම පවුලකම, පවුල් පිටින් අම්මා, තාත්තා, දුව, පුතා, ආච්චි, සීයා කුටුම්බයක් හැටියට අරගෙන විධිමත් පරීක්ෂණයකට භාජනය කරලා සෞඛ්‍ය තත්ත්ව වාර්තාවක් අපි දෙනවා. එයාගේ වයස, උස, බර, රුධිර සාම්පල්, අරගෙන තිබෙන ප්‍රතිකාර, කරලා තිබෙන ඔපරේෂන් මේ සියලු දේවල් ඇතුළත් වෙනවා. ඒ නිසාවෙන් හදිසියේ අසනීප වුණාම මේ ෆයිල් එක අරගෙන ත්‍රීවිල් එකේ නඟින්න පුළුවන්. මොකද, රෝහලට ගියාම DMO මහත්මයා මේක බලනවා. බැලුවාම මේ රෝගියාගේ පෙර තත්ත්වය ඔක්කෝම පැහැදිලි වෙනවා. මේ තත්ත්වය වැඩි දියුණු කරනවා පරිගණක මට්ටම දක්වා. ඒ කියන්නේ, අපේ E රෝහල්

ව්‍යාපෘතිය දියුණු වෙනකොට විදේශීය වශයෙන් තිබෙන - මට මතකයි අපේ කාවින්ද ජයවර්ධන ගරු මන්ත්‍රීතුමා මතක් කළා. ජාත්‍යන්තර වශයෙන් දියුණු රටවල් E-Health කාඩ් එකක් බවට පරිවර්තනය කරන්න තමයි මම මූලික පියවරක් හැටියට මෙය ගෙනි යන්නේ.

ඒ එක්කම මතක් කරන්න ඕනෑ. දරුවන් සම්බන්ධයෙන් විශේෂ වැඩ පිළිවෙළවල් රාශියක් ලංකාවේ කරන්න වෙනවා. අපි පිළිගන්නවා, මත්ද්‍රව්‍ය රකුසා දරුවන් ළඟට එනවා. ඒ නිසා දැනටත් සුව සිසු ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි. ඩෙංගු සම්බන්ධයෙන් විතරක් නොවෙයි. බෝ නොවන රෝග කාරක සම්බන්ධව - විශේෂයෙන් මත්ද්‍රව්‍ය සම්බන්ධව. මත්ද්‍රව්‍ය රකුසා දරුවන් ගිල ගන්න එනවා. ඒ වාගේම අද යෞවනත්වයේ දරුවන්ට තිබෙන ගැටලු. මානසික පීඩාවන්. දරුවන් හදිස්සියේ එල්ලිලා මැරෙන තැන් තිබෙනවා. සියදිවි හානි කරගන්න තැන් තිබෙනවා. මේ ප්‍රශ්න යෞවන දරුවන් එක්ක පාසලේදී කථා කරන්න ඕනෑ. මේ වාගේ වේලාවක කියන්න පුළුවන්කමක් නැති වුණත්, ඒ සඳහා විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම විශේෂයෙන් ගර්භනී මාතාවන් සම්බන්ධව කාවින්ද ජයවර්ධන ගරු මන්ත්‍රීතුමා මට මතක් කළා. ඒ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමනි, මාතෘ අභිමානී වැඩ සටහන දැනටමත් ක්‍රියාත්මකයි. අපි ගමේ මව්වරුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළට නංවන්න, සිසිර ජයකොඩි අපේ ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා වාගේ ළදරු මරණ අනුපාතය පහළට ගෙනියන්න - ළදරු මරණ අනුපාතය අවම කිරීම සම්බන්ධව අද ආසියානු කලාපයේ අපි අද ඉතා හොඳ තැනක ඉන්නවා.

ඒ වාගේම බාහිර රෝගී අංශවලට අපි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඒකට අපි කියන්නේ රැඳී සිටීමේ ස්ථාන හදලා දෙන්න. OPD Hut. මේ සැරේට හයක් හදනවා. මේක අපි අත්හදා බලනවා. ගරු සභාපතිතුමනි, ඒ කියන්නේ වයසක අම්මලා තාත්තලා, රෝගීන් පෝලිමේ ඉන්නවා. එතකොට දවල් වෙනකොට බණිනවා. ප්‍රතිකාර ගන්න විධියක් නැහැ. ඒ නිසා වයසක අම්මලා තාත්තලාට රැඳී සිටීමේ OPD Hut එකක් හදලා දුන්නාම ඒකේ ඉන්න පුළුවන්. ඒකේ අපි වතුර ටිකක් බොන්න පහසුකම් දෙනවා. රූපවාහිනියක් සවි කරනවා. පත්තර ටිකක් දෙනවා. හොඳ පුටු ටිකක් දාලා වාඩි වෙන්න තියනවා. කවුන්ටරෙන් අංකය කියනකොට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කන්න දෙනවද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඊළඟ පියවරේදී කන බොන දේවලුත් අපි දෙන්න බලමු. අපට කවුන්ටරයෙන් නොම්බරය කියන කොට, නොම්බර තිහ, තිස් එක, තිස් දෙක කියන කොට මෙතැන ඉන්න වයසක අම්මා ගියාම ඇති. එතකන් නොම්බරේ අරගෙන සතුටු සාමිචියේ වාඩි වෙලා ඉන්න පුළුවන්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

තවම පෝලිම් නැති වුණේ නැහැ නේ. පෝලිම් තවම තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ වාගේම මතක් කරන්න ඕනෑ, අපි විශේෂ දෙයක් කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු සභානායකතුමා මට ස්තුති කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට දැණුනු දෙයක් තමයි, අපට ආචාර්ය ජයසුන්දර මහත්මයා චෝදනාවකුත් කළා. මේ මුළු රටම හදලා තිබෙනවා. පාරවල් හදලා තිබෙනවා. නගර හදලා තිබෙනවා. මොනතරම් සංවර්ධනයක්ද කරලා තිබෙන්නේ. හැබැයි, ඔයගොල්ලෝ කාන්තාවන්ට සලකන්න දන්නේ නැහැයි කියලා චෝදනාවක් කළා. මම ඒක හදවතට අරගෙන මම තීන්දුවක් ගත්තා, නිමල් පීරිස් ගරු මන්ත්‍රීතුමනි. සෑම නගරයකම බස් නැවතුම් පොළවල්වල කාන්තා විවේක කාමර හදන්න. අපි හොරණින් ආරම්භ කරනවා. හැබැයි, සමාවෙන්න ඕනෑ.

[සභාවේ ඝෝෂා]

මට විනාඩියක් ඉඩ දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ නිසා මතක තියාගන්න . අපි එය පිරිමි අයට නොවෙයි. මේ දුරගමන් සේවාවල ගිහිල්ලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමා අවසාන ටික මේ පැත්ත බලාගෙන කියන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දුර ගමන් සේවාවල බස් නැවතුම් පොළේ බැස්සාම, ලාල් කාන්ත ගරු මන්ත්‍රීතුමනි, කාන්තාවන්ට සැලකීමක් නැහැ. මොකද, ශරීර කෘත්‍ය අවශ්‍යයි. බබාට කිරි දෙන්න අවශ්‍යයි. බබාලා හම්බ වෙන්න ඉන්න අම්මලා අසරණ වෙනවා. රෝගී අම්මලා ඉන්නවා. මම ඒ නිසා විශේෂයෙන් කාන්තා විවේක කාමර හදන්න, ඒ කාමරය ඇතුළේ පහසුකම් දෙන්න, ශරීර කටයුතු කරගන්න, පුටු ටිකක් දාලා, ෆෑන් එකක් දාලා පාලනය කරන්න වැඩ පිළිවෙළක් හදනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඕවා නොවෙයි, බෙහෙත් තමයි ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා කථාව අවසන් කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම අද මීට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මගේ අමාත්‍යාංශයට විවිධ විධියේ අදහස්, යෝජනා ඉදිරිපත් කළා. ආයුර්වේදය පැත්තෙන් ඉදිරිපත් කළා. ආයුර්වේදය දියුණු කරන්න බලාපොරොත්තු වෙනවා. ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමනි, කඳුබොඩ ආයුර්වේදය සඳහා විශේෂ සැලකිල්ලක් කරන්න බලාපොරොත්තු වෙනවා. අපේ රොඩ්නි ප්‍රේසර් ගරු මන්ත්‍රීතුමා හොඳ අදහස් ටිකක් ඉදිරිපත් කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමා මූලාසනයේ අසුන් ගත්ත මන්ත්‍රීවරයෙක්. ඔබතුමා රීති දන්නවා. පොඩ්ඩක් ඔබතුමා වේලාව බලන්න.

[සභාවේ ඝෝෂා]

කථාව අවසන් කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ නිසාවෙන් ගරු මහ ඇමැතිතුමා ඇතුළු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා කරුණාකරලා වාඩි වෙන්න. කථාව අවසන් කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සියලුම නිලධාරීන්ට ස්තුති කරලා මම නිහඬ වෙනවා.

***ඊට අනුකූලව අ.භා. 02.59 ට, අංක 105, 116, 117 හා 118 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***
*Accordingly discussion on the Expenditure Head Nos 105,116,117 and 118 was concluded at 02.59 p.m..*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස, ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂ අංක 105, 116, 117 හා 118 සම්බන්ධ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ඊට අනුකූලව,***

***ශීර්ෂ අංක 105 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 51 යි, විපක්ෂව 38 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 105 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 51 for,38 against and 00 decliners.*

***ශීර්ෂ අංක 116 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 51 යි, විපක්ෂව 38 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 116 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 51 for,38 against and 00 decliners.*

***ශීර්ෂ අංක 117 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 51 යි, විපක්ෂව 38 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 117 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 51 for,38 against and 00 decliners.*

***ශීර්ෂ අංක 118 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 51 යි, විපක්ෂව 38 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 118 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 51 for,38 against and 00 decliners.*

## 2015 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය
## THE APPROPRIATION STATUTE RELATING TO THE FINANCIAL STATEMENT - 2015

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය"* යන යෝජනාව යළිත් මා ඉදිරිපත් කරනවා.

***ඊට අනුකූලව ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදය ආරම්භ කිරීමට මම විපක්ෂයට ආරාධනා කරනවා. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

***[නැඟී සිටියේය. ]***
*[Stood.]*

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කරුණාකර විනාඩියක් වාඩි වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය දෙවැනිදා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයට එක්වන මොහොතේදී මගේ අයවැය කථාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම් ප්‍රදීප් විජේරත්නසේකර මහතා විසින් මීනුවන්ගොඩ අධ්‍යාපන කලාපයට යවන ලද ලිපියක් මම සභාගත කළා. එතකොට මේ ලිපිය සම්බන්ධයෙන් ඊයේ දවස තුළ, මම ඒ මොහොතේදී මේ සභාව තුළ සිටියේ නැහැ.

[ගරු මහින්ද ජයසිංහ]

ගරු ප්‍රධාන අමාත්‍යතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරමින් මෙය මගේ නිර්මාණයක් ලෙස - එතුමා මෙය මතු කළාද කියන එක පිළිබඳව මට හරිම අදහසක් නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, අද පුවත්පත්වල වාර්තා කරලා තිබෙනවා. විශේෂයෙන්ම අද රිවිර පත්තරේ 14 වැනි පිටුවේ මේ සිද්ධිය සම්බන්ධයෙන් වාර්තා කරලා තිබෙනවා. ඒ වාගේම ලංකාදීප පත්තරේත් වාර්තා කරලා තිබෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පතේ සාකච්ඡාවට භාජනය වන වේලාවේදී වරප්‍රසාද ප්‍රශ්න සම්ප්‍රදායේ ගන්නේ නැහැ. ඒ ගැන ඔබතුමා අවධානය යොමු කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, එතුමා කලින් අවස්ථාව ඉල්ලුවා. ගරු මන්ත්‍රීතුමා, එහෙම නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කොහේද තිබෙන්නේ? මේ රීති මාලාවේ කොහේද තිබෙන්නේ කියලා කියන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දන්නවා වැඩියි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මෙහි සම්ප්‍රදායක් තිබෙනවා නේ. සම්ප්‍රදාය එතුමාට කියලා දෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ රීති පොත අරගෙන කියන්න කොහේද තිබෙන්නේ කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාපතිතුමා විනාඩි පහක් බලාගෙන සිටියේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම කෙටියෙන් ඉවර කරනවා. මේ ඕනෑ නැති ප්‍රශ්න. ඕනෑ නැති වැඩමයි කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. ඔබතුමා ඉක්මණට කථා කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, අද පුවත්පත්වල මේ සම්බන්ධයෙන් වාර්තා කරලා තිබෙනවා. ලංකාදීපයේ වාර්තා කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මට ලොකු ගැටලුවක් නැහැ. ඩයනා උදයංගනී කියන මහත්මිය තමයි වාර්තා කරලා තිබෙන්නේ. ඒ වාගේම රිවිර පුවත්පතේ වාර්තා කරලා තිබෙන මේ පුවත්පත් නිවේදනයේ වගකීමක් නැහැ.

*"බස්නාහිර පළාත් ජවිපෙ මන්ත්‍රී සභාගත කළ ව්‍යාජ ලිපිය ගැන පරීක්ෂණ කර වාර්තාවක් දෙන්න."*

එහෙම තමයි තිබෙන්නේ. මේ පුවත්පත් වාර්තාවට අනුව මා විසින් ව්‍යාජ ලිපියක් සභාගත කළා කියන එකක් තමයි මෙහි සඳහන් වෙන්නේ. මා විසින් ව්‍යාජ ලිපියක් සභාගත කළා කියලා. ඉතාම පැහැදිලිව මා සතුව තිබෙනවා. මම හිතන්නේ ගරු මහ ඇමැතිතුමාත් මේ සම්බන්ධයෙන් දන්නවා. මේ තිබෙන්නේ මම සභාගත කළ ලිපිය. එතකොට මේ ලිපිය මීනුවන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයට ලැබිලා තිබෙන්නේ 2014 නොවැම්බර් මාසයේ 10 වැනිදා. එතකොට මේ ලිපියේ සීල් එක තිබෙනවා, කලාප අධ්‍යාපන කාර්යාලය, මීනුවන්ගොඩ. 2014 නොවැම්බර් මාසයේ 10. සාමාන්‍ය පාලන අංශයේ සීල් එක තිබෙනවා. ඊළඟට මීනුවන්ගොඩ කලාපයේ සියලුම විදුහල්පතීන් වෙත. කරුණාකර පහත උපදෙස් පරිදි කටයුතු කරන්න කියලා එකළොස් වැනි මාසයේ 14 වැනිදා බී. කුමාරසිංහ, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපට තව විනාඩි 45 යි තිබෙන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විනාඩියෙන් ඉවර කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සභාගත කරන්න කෝ. අපි සොයන්නම්.

**ගරු සිසිර ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්න කෙටි වෙන්න ඕනෑ. අපේ වේලාවෙන් දෙන්නේ නැහැ. විපක්ෂයෙන් වේලාව වෙන් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බී. කුමාරසිංහ, නියෝජ්‍ය කලාප -

**ගරු සිසිර ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

වේලාව මදි නම් වේලාව විපක්ෂයෙන් අඩු කරන්න ඕනෑ. අපෙන් අඩු කරන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේක මගේ බරපතළ ප්‍රශ්නයක්. මගේ පක්ෂයෙත් ප්‍රශ්නයක් මේක.

[සභාවේ ඝෝෂා]

වෙලාව කන්නේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වෙලාව කන්නේ ඔබතුමන්ලා නේ. කරුණාකර මගේ ප්‍රශ්නය කියන්න මට ඉඩ දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කරන්න දෙන්න කෝ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, විනාඩියෙන් ඉවර කරනවා. මෙතුමන්ලා බාධා කරනවා නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔව්. කෙටියෙන් කියනවා. කෙටියෙන් අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කියන දේ දැන් මට පැහැදිලියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පැහැදිලි නොකර මගේ වරප්‍රසාද කඩවීම මට කියන්න බැහැ. මේ බී. කුමාරසිංහ නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, මිනුවන්ගොඩ. එතුමා තමයි මේ Minute එක ගහලා තිබෙන්නේ. Minute එක ගහලා මේක ඉස්සරහාට යවලා තිබෙනවා. එතකොට ඒ ලිපිය තමයි මම සභාගත කළේ. එතකොට මේක මා විසින් සකස් කළ ව්‍යාජ ලිපියක් නොවෙයි. ජනතා විමුක්ති පෙරමුණේ අපි එහෙම දෙකේ පන්තියේ වැඩ කරන, එහෙම තුච්ඡ වැඩ කරන, එහෙම පහත් වැඩ කරන මිනිස්සු නොවෙයි. ඒක හොඳට මතක තියාගන්න. හරිද? ජනතා විමුක්ති පෙරමුණේ අපි (බාධා කිරීමක්) එහෙම මිනිස්සු නොවෙයි. ඒ නිසා අපට හොර ලියුම් හදලා සභාගත කරන්න උවමනාවක් නැහැ. ඒ ලිපිය කලාප කාර්යාලයෙන් - මේක මම හොරට හදලා ඉදිරිපත් කළා නොවෙයි. මම ඔබතුමාගෙන් ඉල්ලනවා. වහාම මේ පුවත්පත් නිවේදන - (බාධා කිරීමක්) එය මා විසින් සකස් කරන ලද ව්‍යාජ ලේඛනයක් ලෙස ඊයේ ප්‍රකාශය තුළ අඩංගු වෙලා තිබෙනවා නම් කරුණාකර එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියන ඉල්ලීම මම ඉතාමත්ම ඕනෑකමින් යුතුව කරන්න කැමැතියි.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දැන් කාගේ වේලාවද කපන්නේ?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම කිසිම අවස්ථාවක එතුමා විසින් නිර්මාණය කළා කියලා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තියෙනවා නම් කියලා මම කිව්වා නේ. හරි. ප්‍රශ්නයක් නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. නැහැ. මගේ වැඩේ ඉවර නැහැ. අහගෙන ඉන්න. ගරු සභාපතිතුමනි, මම කිසිම අවස්ථාවක -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මොන වරප්‍රසාද කඩවෙලාද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එතුමා කියපු කථාව මම - 36(1)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕක ඉතින් පොඩි ළමයින් වාගේ අහන්න ඕනෑ නැහැ නේ? හැමෝම දන්වා නේ?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම මෙය නිවැරැදි කිරීමක් කරන්න ඕනෑ. මොකද, (බාධා කිරීමක්) මම මෙය එතුමා නිර්මාණය කළා කියලා කිසිම අවස්ථාවක කිව්වේ නැහැ. ගරු සභාපතිතුමනි, එතුමා එහෙම කියන්න හේතුව මම දන්නේ නැහැ. එතුමා නිර්මාණය කළා දෝ කියන සැකය දැන් මා තුළ තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ කාරණාව සම්බන්ධව මම හිතන්නේ, ඒ පුවත්පතේ වැරැද්දක් නැහැ. මෙතුමා කියපු විධියට ඒක ව්‍යාජ ලිපියක් කියන එක තමයි කියලා තිබුණේ. මම පැහැදිලිවම කියනවා, ඕක ව්‍යාජ ලිපියක් කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කවුද ඒ ලිපියට අත්සන් කරලා තිබෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මෙතුමාත් ඒක දන්නවා. මමත් දන්නවා. මෙකට අපි පරීක්ෂණයක් ඉල්ලුවේ මේ ව්‍යාජ ලිපිය ගැන -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ව්‍යාජද නැද්ද කියන එක පරීක්ෂණය කළාට පසුව නේ ඒක තහවුරු වෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. මම වගකීමෙන් මෙතැන කියනවා. ඔබතුමාට ඕක වගකීමෙන් කියන්න බැහැ. ඔබතුමා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම මේකේ වගකීමක් ගන්නේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේක පැහැදිලිවම කලාපයට ගිහිල්ලා තිබුණෙත් ෆොටෝ කොපියක්. Original එක ගෙනැල්ලා මම මෙතුමාටත් පෙන්නලා ඒක සභාගත කරන්න කටයුතු කළා. ගරු සභාපතිතුමනි, Original එක නොවෙයි. ඒකත් අත්සන් කරලා තිබුණේ කොපියක. එතකොට ඒක කලාපයෙන් යොමු කිරීමක තමයි මෙතුමා ගත්තා කියලයි කියන්නේ. අපි දන්නේ නැහැ, කොහොමද ගත්තේ කියලා. එතුමා කියන දේ මම පිළිගන්නවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම කිසිම අවස්ථාවක කිව්වේ නැහැ මෙතුමා මේක කළාය කියලා. හැබැයි, එතුමා කිව්වා එහෙම කිව්වා කියලා. ඒ නිසා මට සැකයක් ඇති වුණා. ඔබතුමන්ලා කරෝලා මෙහෙම වුණා දෝ කියන එක හිතුණා. මම ජීවිතේටවත් හිතන්නේ නැහැ, ඔබතුමා කළාය කියලා. මම හිතන්නේ නැහැ. පැහැදිලිව කියන්න එපැයි. මම එහෙම හිතන්නේ නැහැ. හැබැයි, සැකයක් ආවා කියන එක විතරයි කිව්වේ. ඒක නිසා ගරු සභාපතිතුමනි, පැහැදිලිවම ඒක ව්‍යාජ ලිපියක්. ඒ ගැන පරීක්ෂණයක් අවශ්‍යයි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු මහ ඇමැතිතුමා, ඒ අහපු පත්තරේ මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රශ්නය අහපු වේලාවේ පැහැදිලිවම මම ලේකම්තුමාට උපදෙස් දුන්නා. මේ ගැන කඩිනම් පරීක්ෂණයක් කරලා වාර්තාව සභාවට ඉදිරිපත් කරන්නය කියලා. ඒ අනුව ඔබතුමාගේත් ඒ වරප්‍රසාද ප්‍රශ්නයට අපි පරීක්ෂණයක් පවත්වලා පැහැදිලි වාර්තාවක් ඉදිරිපත් කරන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පුවත්පත් නිවේදනය?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක නිවැරදි කරන්නම්. මම විපක්ෂයට ආරාධනා කරනවා, අනේ සමාවෙන්න ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාගේ කාලයට ප්‍රශ්නයක් ආවා. එක එක ප්‍රශ්න ආවාම මට කරන්න දෙයක් නැහැ. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 03.17]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පත සම්මත කිරීමට අදාළ විවාදයට එක්වීමට ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. මම කැමැතියි, කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න. පසුගිය දින කිහිපය තුළ 2015 සඳහා වන අයවැය සාකච්ඡාව දින හතරක් පැවැත් වුවා. ඒ සම්බන්ධයෙන් මතු වූ කාරණා කීපයක් පිළිබඳව මා කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ ජීවත් වන ජනතාව වෙනුවෙන් ඔවුන්ගේ අභිලාෂයන් ඉටු කිරීමට වැදගත් වන යෝජනා හා අදහස් අපගේ දෘෂ්ටි කෝණයෙන් අපි පසුගිය දින කිහිපය තුළ ඉදිරිපත් කළා, ගරු සභාපතිතුමනි. ආණ්ඩු පක්ෂයේ වගකීම වෙන්නේ, මේ අදහස් උපයෝගී කරගෙන ජනතාවට සපයන සේවය වඩාත් ඵලදායි ලෙස ඉටු කිරීමයි කියලා මා විශ්වාස කරනවා. ඒ වාගේම අපි දන්නවා, පළාත් සභා ක්‍රමය අපට හරියට ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් අපි ඇත්දැකීමෙන් දන්නවා, ජනතාවට විශාල සේවයක් කරන්න පුළුවන් කියලා. බලතල නැහැයි කියලා අපි ඉන්නවාට වඩා අපි සතුව තිබෙන බලතල උපයෝගී කරගෙන ජනතාවට සේවය කරන්න පුළුවන් නම් ඒක තමයි අපගේ ජයග්‍රහණය.

ගරු සභාපතිතුමනි, අපි දන්නවා පළාත් සභා ක්‍රමයට අවුරුදු 26 ක් වෙනවා. මේ ගෙවී ගිය කාලය තුළ ලැබූ අත්දැකීම් හා ඒ වගේම පළපුරුද්ද අපට උපයෝගී කරගන්න පුළුවන් නම්, අපට පුළුවන් වෙනස් දෙයක්, අලුත් දෙයක් පළාතේ ජීවත්වන ජනතාව වෙනුවෙන් කරන්න. ඇත්ත වශයෙන්ම අපි බලන්න ඕනෑ, අපට තිබෙන ඉඩකඩ උපයෝගී කරගෙන අපි එවැනි සේවයක් ජනතාවට කරනවාද කියලා. අපි දන්නවා, අවුරුදු 26 ක කාලය තුළ අපි මේ පළාත් සභාවෙන් විෂයය නිශ්චිත ප්‍රඥප්ති සම්මත කරගෙන තිබෙන්නේ 67 ක් විතරයි. අපට කොයිතරම් දේවල් කරන්න තිබුණාද? අපි ජීවත් වන මේ පළාත් සභා ප්‍රදේශයේ ඕනෑ තරම් කෘෂි නිෂ්පාදන තිබෙනවා. නමුත් අපි ඒ සම්බන්ධයෙන් වැදගත්කමක් දීලා නැහැයි කියලා හිතනවා. අපි දන්නවා, මේ පළාතේ ඕනෑ තරම් පළතුරු තිබෙනවා. බුලත් වැනි නිෂ්පාදන තිබෙනවා. අපට අඩුම ගණනේ ඒ සඳහා වන අධිකාරි පිහිටුවලා ජනතාවට ප්‍රතිලාභ ලැබෙන වැඩ පිළිවෙළක් සකස් කරන්න තිබුණා. ඒ සඳහා වන ප්‍රඥප්ති සම්මත කරගන්න තිබුණා.

ඒ වාගේම පළාතට අවශ්‍ය නිෂ්පාදන පළාත තුළම කරගන්න. විශේෂයෙන් අපි දන්නවා, මේ පළාතේ රජයේ කර්මාන්ත ශාලා වැනි කර්මාන්ත ශාලා ආරම්භ කරලා ජනතාවටත්, ඒ වාගේම අනික් පළාත් අතර අන්තර් පළාත් සම්බන්ධතා ඇති වන විධියට සේවයක් සිදු කරන්න අපට ඕනෑ තරම් අවස්ථාව තිබුණා. අපි ආපසු හැරිලා බලන්න ඕනෑ, අපි ඒ අවස්ථාවලින් ප්‍රයෝජන අරගත්තාද කියලා. ඒ වාගේම අපි යළිත් සිහිපත් කරන්න ඕනෑ. අපේ පළාතේ තිබෙන ලොකුම ප්‍රශ්නය. අපි නිෂ්පාදන ආර්ථිකයකට ගැළපෙන විධියට ප්‍රාග්ධනය වැය කරලා නැහැ. නිෂ්පාදන ආර්ථිකයකට යන්න අපි කටයුතු කරන්න ඕනෑ. දැන්වත් අපි අපේ අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන් අපි පළාතේ උපාධිධාරීන් පාවිච්චි කරන්නේ මොකටද? පළාතේ උපාධිධාරීන්ව අපි කාර්යාලවලට හිර කරලා තිබෙනවා. පළාතේ තරුණ උපාධිධාරීන් නිෂ්පාදන ආර්ථිකයකට ගැළපෙන කර්මාන්ත හෝ වෙනත් සේවාවන්

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

සඳහා යොමු කරන්නේ නම්, ඔවුන්ගේ ශක්තිය ඒ තරුණ කාලයේ අපට ප්‍රයෝජනයට ගන්න පුළුවන් නම් අපට විශාල ජයග්‍රහණ ප්‍රමාණයක් අත් කරගන්න තිබුණා. ගරු සභාපතිතුමනි, අපි දන්නවා පළාත් සභා ක්‍රමය මෙරට දේශපාලන බිමේ ස්ථාවර අංගයක් බවට මේ වන විට පත් වෙලා තිබෙනවා. නමුත් මේ දෙවන තලයේ මේ ආණ්ඩුකරණය සැබෑ ලෙස ක්‍රියාත්මක විය යුත්තේ කොහොමද කියන එක ගැන යළි යළිත් අපට සිතා බලන්න වෙනවා. නමුත් අපි කරන්නේ කෙසේ විය යුතුද යන්න පිළිබඳව තර්ක කරමින් සිටීම පමණයි.

අපි දන්නවා, එදා බලය බෙදා හැරීමට විරුද්ධ වූ අය, ඒ වාගේම අද බලය බෙදා හැරීමට විරුද්ධව සිටින අයත් මේ පළාත් සභාව නියෝජනය කරනවා. ඇතැමුන් පළාත් සභාවේ ඇමැති තනතුරු පවා දරන බව අපි දන්නවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ නෛතික දේශපාලනික හා මූල්‍යමය ප්‍රශ්න අපට තිබෙනවා. විශාල අභියෝග ප්‍රමාණයක් හමුවේ තමයි මේ පළාත් සභාව ඉදිරියට යන්නේ. ඒ වාගේම මුදල් ලැබීමේ අවිනිශ්චිතතාවයක් තිබෙනවා. ඉතින් අපි කළ යුත්තේ, මේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගනිමින් ඉදිරියට යාමයි. අපි දන්නවා, මහ ආණ්ඩුවේ අයවැය ඉදිරිපත් කරනකොට මොනවාද ඒකේ තිබුණේ? ඡන්ද පොරොන්දු විතරයි. එහෙම ඡන්ද පොරොන්දු විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කරපු ආණ්ඩුවේ අයවැයත් එක්ක අපි බලාපොරොත්තු වෙනවා, මේ පළාත් සභාවේ කටයුතුවලටත් ආණ්ඩුවෙන් සල්ලි ලැබෙයි කියලා. ගරු සභාපතිතුමනි, එහෙම වෙලා තිබෙන්නේ අපි මුදල් උපයන ක්‍රියාමාර්ග මේ පළාත් සභාව හරහා පසුගිය අවුරුදු 26 ක් පුරාම නිවැරදි මාර්ගවලට එළැඹුණු නැති නිසයි.

ඒ නිසා ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මට කථා කරන්න තවත් වැදගත් කාරණයක් තිබෙනවා. අපි දන්නවා, මේ පළාත් සභා හරහාත්, අමාත්‍යාංශ හරහාත් විශාල වශයෙන් වංචා, දූෂණ සිද්ධ වෙනවා. අපි දැන් ඉන්න ඇමැතිවරුන්ට කියලා වැඩක් නැහැ. පසුගිය පළාත් සභාව දිහා හැරිලා බැලුවොත් දැන් අපට විශාල වශයෙන් වංචා, දූෂණ පිළිබඳව චෝදනා ලැබෙනවා. අපි මතක් කරන්න කැමැතියි. මේ පළාත් සභාවේවත් ගරු ඇමැතිවරුන්ට මේ පළාත් සභාව හරහා සිදුවන ජනතාවගේ සම්පත් සූරා කන, ඒ වාගේම වංචාවට, දූෂණයට ඉඩක් තබන්න එපාය කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මා කියන්න කැමැතියි. ගරු ප්‍රධාන අමාත්‍යවරයා සහ ඇමැතිවරුන්ට ඔවුන්ගේ ඒ අදාළ වැය ශීර්ෂ සම්මත කර ගත්තත්, අපි දන්නවා, සමහර මන්ත්‍රීවරු හෘද සාක්ෂියට එකඟව නොවෙයි මෙයට ඡන්දය දුන්නේ. කෙසේ වෙතත් අපි හොඳ වැඩවලට සහාය දෙනවා. ජනතාවාදී වැඩ පිළිවෙළට සහාය දෙනවා. ජනතාවට ප්‍රතිලාභ ලැබෙන වැඩ පිළිවෙළට සහාය දෙනවා. ජනතාවට කිසියම් වූ බලපෑමක් සිද්ධ වෙනවා නම්, අපි නිරන්තරයෙන් ඒවාට විරුද්ධ වෙනවා. කෙසේ වෙතත්, මේ අයවැයෙන් වෙන් කරපු මුදල් ජනතාවට ප්‍රතිලාභ ලැබෙන විධියට වැය කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. ඊට අවශ්‍ය ශක්තිය සියලු දෙනාටම ලැබේවා කියලා ප්‍රාර්ථනය කරනවා. ස්තුතියි.

[අ.භා. 03.24]

**ගරු සිසිර ජයකොඩි - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
**Hon. Sisira Jayakody - Chief Government Whip**

ගරු සභාපතිතුමනි, පුරා දින හතරක් අපි සියලු දෙනා ඉතාම කැපවීමෙන් යුතුව අවසන් කරන විවාදයක අවසාන තීරණාත්මක වේලාවක සිටින්නේ. එක පැත්තකින් මැතිවරණ උණුසුමක්. අනික් පැත්තෙන් තමන්ගේ ප්‍රතිපාදනවල වැඩ අවසන් කිරීමේ උත්සාහය. ඒ සියල්ල මැද්දේ මේ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විවාදය සාර්ථක කරගන්න සහාය ලබා දීම පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාටම අපගේ ආදරය, ප්‍රසාදය පිරිනමනවා. ඒ වාගේම අපි දන්නවා, කිසිම අභියෝගයකින් තොරව බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශය දිනවන්න අපට හැකියාව ලැබුණා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශ වැය ශීර්ෂයේදී සුවිශාල වැඩි ඡන්ද 24 කින් ජයග්‍රහණය කළා වාගේ මේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විසර්ජන ප්‍රඥප්තියත් එවැනිම වැඩි ඡන්ද ප්‍රමාණයකින්, අද හදපු ගණන් හිලව් බොරු කරලා මහා විශාල ජයග්‍රහණයක් ලබන්න අපේ බස්නාහිර පළාත් සභාවට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ නිසා එළැඹෙන ජනාධිපතිවරණයේදී අතිගරු ජනාධිපතිතුමාට ඒ සුවිශේෂ ජයග්‍රහණය අපේ රටේ නියත වශයෙන් අත්කර දෙනවා කියන මතක් කිරීම කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව යමින් ඇති කරපු ඒ ප්‍රතිපත්තිය මූලික කරගෙන තමයි අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ බස්නාහිර පළාතේ මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා එක ප්‍රතිපත්තියක් සහ එක වැඩ

පිළිවෙළක් අනුව යමින් තමයි මේ මූලා ප්‍රකාශය ඉදිරිපත් කළේ. ඒ හැර ආඩි හත් දෙනාගේ කැඳ හැලිය වාගේ ප්‍රතිපත්තියක් නැති, දර්ශනයක් නැති, මතයක් නැති අසංවිධානාත්මක ව්‍යූහයන් තුළ ගොඩනැඟෙන සංවිධාන ව්‍යූහවලින් ජනතාවට කිසිම ප්‍රතිචාරයක්, කිසිම ප්‍රතිලාභයක් නොලැබෙන බව මතක් කරනවා.

ඔබතුමන්ලා මතක් කළ නිසා මම ඉතා ඕනෑකමින් ඉතිහාසය මතක් කර දෙනවා. 1989 වර්ෂය. 1988, 1989 වර්ෂවල - 88 අවුරුද්දේදී අපේ රටේ ඉතිහාසයේ තීරණාත්මක ජනාධිපතිවරණයක් තිබුණා. මේක සියලුදෙනා දැනගන්න ඕනෑ. රහසක් නොවෙයි. ප්‍රේමදාස ජනාධිපතිතුමාත්, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් අතර කරට කර තරගය තිබුණේ. අපි හිටියේ ප්‍රගතිශීලී දේශප්‍රේමී පිළේ. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය දිනවන්න කියන පිළේ. එදා සමහර බලවේග ප්‍රේමදාස ජනාධිපතිතුමාත් එක්ක ගියා. එදා ඡන්දය දෙන්න එපැයි කියලා ඒ ප්‍රේමදාස ජනාධිපතිවරයාව ජයග්‍රහණය කරවන්න එදා උත්සාහ කළේ කවුද කියලා අපි දන්නවා. මම ජනතා විමුක්ති පෙරමුණට චෝදනා කරන්නේ නැහැ. එදා ගත්ත වැරැදි දේශපාලන තීන්දුව ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ තරුණයන් දස දහස් ගණනක් විනාශ වෙන්න හේතු වුණා. ඒ නිසා හැමවිටම අපි ප්‍රගතිශීලී දේශප්‍රේමී පිළ අමතක කරලා අධිරාජ්‍යවාදී බටහිර ගැති රාජ්‍ය නොවන සංවිධානවල ව්‍යූහයන් එක්ක එකට එකතු වෙලා මේ රට -

**ගරු මොහොමඩ් මුජිබූර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කේ.පී. කොහෙද ඉන්නේ?

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ඒකේ මොකක්ද තමුන්නාන්සේලාගේ දේශපාලන ප්‍රතිපත්තිය කියන කාරණය මතක් කරන්න අවස්ථාව කරගනිමින් -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ඝෝෂාව වැඩියි.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ඒ නිසා අපි මතක් කර සිටිනවා. මට වෙලාව නැති බව දන්නවා. ආණ්ඩු ක්‍රමයේ කවර ප්‍රතිසංස්කරණ ගැන කථා කළත් ඒකීය රටක් තුළ මේ රටත් ආරක්ෂා කරගෙන ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ යන මේ ඉදිරි ගමනට අපි සියලු දෙනා එකතු වෙමුයි කියන මතක් කිරීම කරමින්, දේශපාලන වශයෙන් අසාධාරණකම්වලට වැඩියෙන්ම ලක් වුණු මනුස්සයා මම. පාර්ලිමේන්තුව නියෝජනය කළ යුතු තැනැත්තෙක් මම. ඒ සියල්ල අහිමි වෙලා තිබෙද්දී ක්‍රෝධය, වෛරය, ද්වේශය මත දේශපාලනය කරලා වැඩක් නැහැ. රට ගැන, රටට ආදරය කරන දේශපාලනයක් කරලා ගෙදර යන එක සැපයි. නම්බුයි. ඒ නිසා ඒ දේශපාලන මතය නැවතත් කියමින්, මේ සභාවේ දුෂ්කර කාලපරිච්ඡේදය තුළ ආණ්ඩු පක්ෂ කණ්ඩායම අපට ලබා දුන්නු සහාය පිළිබඳව ඔබතුමාටත්, ඒ වාගේම සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, අනිකුත් සියලු නිලධාරීන්ටත් අපේ ප්‍රසාදය, ප්‍රශංසාව පිරිනමමින් මගේ කෙටි කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 03.28]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, පසුගිය ගත වුණු අවුරුදු 26 ක කාලය තුළම අපට පළාත් සභාව පිළිබඳව විවේචනයක් තිබුණා. අපි කිව්වා, පළාත් සභා මේ රට බෙදන යාන්ත්‍රණයට සම්බන්ධ කරගන්න පුළුවන් කියලා. ඒ වාගේම මේ පළාත් සභා සුදු අලියෙක් කියලා. පළාත් සභා රටේ පරිපාලනයේ මහා අවුලක්, වියවුලක් නිර්මාණය කරනවා කියලා. ඒ සියල්ල අද සත්‍ය වෙලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාවට, අපේ රටේ වැඩිම ආදායම් උපදවන පළාත් සභාවට, ජාතික අයවැයෙන් වැඩිම පංගුවක් නියෝජනය වන පළාත් සභාවටවත් තමන්ගේ ආදායමෙන් තමන්ගේ පුනරාවර්තන වියදම් පියවා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමනි, ජනතා විමුක්ති පෙරමුණ පළාත් සභාව පිළිබඳව කියපු අනාවැකි හරි වාගේම මේ මැතිවරණයේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ගෙදර යවන්න ගත්ත තීන්දුවත් හරි. ඒකට අපි වැඩ කරනවා කියන සහතිකය අපි දෙනවා. ඒ නිසා ඕගොල්ලන්ගේ අන්තිම -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හීන දකිනවාද?

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, දැන් මෙතැන නීති විරෝධී සුදු ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාරයක් යනවා. සුදු ඔට්ටු අල්ලනවා. ලක්ෂ ගණන් ගෙනැල්ලා. ගරු මහ ඇමැතිතුමා බොරුද? මේ බස්නාහිර පළාත් සභාවේ අයවැය විවාදය යනකොට රටේ ලොකු ආන්දෝලනයක් තිබුණා, මේ පළාත් සභාවේ ලොකු පෙරළියක් වෙයි කියලා. දැන් කොහොමත් දේශපාලනයේ ලොකු පෙරළියක් වෙමින් තිබෙන වේලාවේ සමහර පළාත් සභා සීතල කියලා කල් දාලා තිබෙනවා. නැගෙනහිර පළාත් සභාවේ -

[සභාවේ ඝෝෂා]

දැන් මේ පළාත් සභාව ඡන්දයට ඉස්සර වෙලා තියන්න නියමිත වෙලා තිබුණා. තියන්නේ නැහැ. ජනවාරි 08 වැනිදාට ඉස්සෙල්ලා නියම විධියට පළාත් සභාව තිබිය යුතුයි. තියන්නේ නැහැ. ඇයි? (බාධා කිරීම්) පළාත් සභාව පටන් ගන්නකොට ආණ්ඩු පක්ෂයේ හිටපු පාර්ශවයක් වන හෙළ උරුමය කැඩිලා වෙන් වෙලා ගියා. පළාත් සභාවේ අයවැය යනකොට සම සමාජ පක්ෂයේ කීර්ති කාරියවසම් මන්ත්‍රීවරයා පොදු අපේක්ෂකයාට උදව් කරන්න නිර්භීත තීන්දුවක් අරගෙන ආවා. අයවැය ඉවරවෙන කොට අයවැයට අත ඉස්සුවත් මුස්ලිම් කොංග්‍රස් එකත් තමන්ගේ තීන්දු අරගෙන ප්‍රකාශයට පත් කරයි. මේක කොහොම වෙතත්, ජනවාරි 09 වැනිදා වෙනකොට දේශපාලන පෙරළියක් -

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, ඔය වැඩිපුර කෑ ගහන අය තමයි මේ වෙනකොටත් ගිහිල්ලා සාකච්ඡා කරලා තිබෙන්නේ. පෙරෙයිදා ගිහිල්ලා සාකච්ඡා කරලා ඇමැතිකම මොකක්ද කියලා කථා කරගෙන තමයි ආවේ. එහෙම කට්ටිය තමයි මේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි ආණ්ඩුවට කියන්නේ, කළබල වෙන්න එපා. ලොකු දේශපාලන පෙරළියකට පෙර නිමිති පහළ වෙලා තිබෙනවා. 94 ත් පළාත් සභාවලින් තමයි මෙය පටන් ගත්තේ. ඒ නිසා මේ පළාත් සභා ඇතුළේ වෙන සුළු සුළු වෙනස්කම් තමයි රටේ දේශපාලන පෙරළියේ පෙර නිමිති බවට පත් වෙලා තිබෙන්නේ. දැන් ඌව පළාත් සභාව සීතලයි කියලා කල් දැම්මා. මෙහෙටත්, (බාධා කිරීම්) ආණ්ඩු පක්ෂයට දැන් දැනිලා තිබෙන්නේ. අපි ඒ නිසා කියන්නේ, ඔබතුමන්ලා මේක -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හිත හදාගන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

හිත හදාගන්න දෙයක් නැහැ. මේක තමුන්නාන්සේලා හිත හදාගෙන සම්මත කරගන්න. හැබැයි, ඊළඟට අලුත් පළාත් සභාවකට එකතු වෙන්න වෙන්නේ අලුත් ජනාධිපතිවරයෙක් යටතේ කියන එක කියමින් නිහඬ වෙනවා.

[අ.භා. 03.31]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, විසර්ජන ප්‍රඥප්තිය යටතේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මේ විසර්ජන ප්‍රඥප්තිය තමයි මේ අයවැය ප්‍රකාශයේ වැදගත්ම ලියවිල්ල, අපි සම්මත කරන. පළාත් සභාව වැය කිරීමට අපේක්ෂා කරන සියලු මුදල් පළාත් සභාව විසින් උපයා ගන්නා මුදල්වලින් හෝ රජයෙන් ලැබෙන ප්‍රදානවලින්, එහෙම නැත්නම් වෙනත් ප්‍රදානවලින් ලැබෙන දේවල්වලින් පියවා ගැනීම සඳහා නීතිමය බලය දෙන ලියවිල්ල තමයි විසර්ජන ප්‍රඥප්තිය. ඒ නිසා මේ ප්‍රඥප්තිය සම්මත කරන්නේ නැතිව පළාත් සභාවකට තමන්ගේ අවුරුද්දේ වියදම් පියවාගෙන පළාතේ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කරන්න බැහැයි කියන කාරණය තමයි අපට මතක් කරන්න තිබෙන්නේ. ඒ නිසා මේක තමයි වැදගත්ම ලියවිල්ල. ගරු සභාපතිතුමනි, නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අවුරුදු 26 ක් තිස්සේ මේ ලියවිල්ල සම්මත කරගෙන බස්නාහිර පළාත් සභාව පළාතේ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කරලා තිබුණත් තවමත් උතුරු පළාත් සභාවට අවුරුද්දක කාලසීමාවක් ගෙවිලා නැහැ.

මේ අවුරුද්දක කාල සීමාවේ උතුරු පළාත් සභාව ඉදිරිපත් කරපු අයවැයෙන් විසර්ජන ප්‍රඥප්තිය සම්මත කරලා තිබුණත් ඔවුන්ට වෙන් වෙලා තිබෙන සියලු මුදල් පාවිච්චි කරලා ඒ ප්‍රදේශයේ ජනතාවගේ සංවර්ධනය නොකිරීම නිසා මේ බල ව්‍යූහය මේ රට ඇතුළේ ස්ථාපිත කිරීම තුළින් රටේ ජන වර්ග අතර සාමය ස්ථාපිත කරන්නට ගත්ත උත්සාහය තවමත් යථාර්ථයක්ද කියන කාරණය ඔප්පු කරගන්න බැරිව ඉන්නවා. ඒ නිසා උතුරු පළාත් සභාව මේ කාරණය නිවැරැදිව ක්‍රියාත්මක කරන තුරු අපට මේ පළාත් සභා ක්‍රමය ජනවාර්ගික සාමයට ගලප්ප ගන්නේ කොහොමද කියන කාරණය විග්‍රහ කරගන්න බැරිව යනවා.

නමුත් ගරු සභාපතිතුමනි, ඔබතුමාට කියන්නට ඕනෑ. පළාත් සභා ව්‍යූහයන්වලට පුළුවන් වෙලා තිබෙනවා, ජාතික දේශපාලනයට බලපෑම් කරන්න. ඒකට හොඳම උදාහරණය තමයි 1993 අවුරුද්ද. 1993 අවුරුද්දේ එවකට තිබුණු දාහත් අවුරුදු එක්සත් ජාතික පක්ෂ දූෂිත පාලනය පන්නන්න පුළුවන්කම ලැබුණේ, දකුණු පළාත් සභාවේ ගත්ත පියවරයන් නිසා. එදා ෆ්‍රැන්සිස්කු මන්ත්‍රීවරයා උස්සාගෙන ගිහිල්ලා පළාත් සභාව බේරගන්න ගත්ත උත්සාහයේදී එදා ජනතාවට පුළුවන්කම ලැබුණා, තමන්ගේ බලයෙන් පළාත් සභාවේ බලය තියාගෙන ඒ ලබාගත්ත බලය අද වනතුරු ඉස්සරහාට ගෙනි යන්න. ඒ නිසාම වෙන්න ඇති එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ විපක්ෂය උත්සාහ කෙරුවේ පළාත් සභා හොල්ලවලා, රටේ පාලන බලය නැවත වෙනස් කිරීමකට ආරම්භය සනිටුහන් කරනවා කියලා. නමුත් අපි කියන්න ඕනෑ. එක පළාත් සභාවක්වත් හොල්ලන්න බැරි වුණා. මේ පළාත් සභාව පෙරළනවා කියලා, මේ පළාත් සභාවේ බලය වෙනස් කරනවා කියලා කිව්වේ. හැබැයි, හැම වැය ශීර්ෂයක්ම සම්මත වුණේ වැඩි ඡන්ද 20 කට වැඩි ඡන්ද සංඛ්‍යාවකින්. හැම වැය ශීර්ෂයක්ම සම්මත වුණේ එහෙම. අඩුම තරමින් විපක්ෂයට තමන්ගේ මන්ත්‍රී කණ්ඩායම මෙතැනට ගෙන්න ගන්න බැරි වුණා. කථා කරන්න කථිකයෝ විපක්ෂයට නැති වුණා. ඒ නිසා මා විශ්වාස කරනවා. විසර්ජන ප්‍රඥප්තිය සම්මත කරන මේ වේලාවේ ගරු විපක්ෂ නායකතුමයි, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමයි තමන්ගේ තනතුරුවලින් ඉල්ලා අස් වෙන්න ඕනෑ. තමන්ගේ විපක්ෂය ගෙන්න ගන්න බැරි වුණා. රටේ දේශපාලන උණුසුමක් මතු වෙලා තිබෙන වේලාවේ ආණ්ඩුවක් ගන්න කෙළ පෙරාගෙන බලාගෙන ඉන්න වේලාවේ, එළු බිජ්ජ වැටෙනකන් වාගේ බලාගෙන ඉන්නවා, ආණ්ඩුව තමන්ගේ දෝතට වැටෙයි කියලා. ඒකට වෙන මිනිස්සු සොයනවා. වෙන බිල්ලවල් සොයනවා. වෙන අපේක්ෂකයෝ සොයනවා. ඡන්ද ලකුණු සොයනවා. තමන්ගේ පක්ෂය පාවිච්චි කරගන්න බැහැ. තමන්ගේ ඡන්ද ලකුණු පාවිච්චි කරගන්න බැහැ. තමන්ගේ පක්ෂයෙන් අපේක්ෂකයෙක් දාගන්න බැහැ. මේ එකක්වත් කරගන්න බැරිව අනුන්ගේ පහනෙන් එළිය බලන්න බලාගෙන ඉන්නවා. හැබැයි, අදත් ඒක යථාර්ථයක් වුණේ නැහැ. මේ පළාත් සභාව ඇතුළේත් ඒක කරගන්න බැරි වුණා. ඒ නිසා පළාත් සභා ව්‍යූහය පාවිච්චි කරන්න බලාපොරොත්තු වෙනවා නම්, තමන්ගේ දේශපාලන පෙරළිය සඳහා. අපි කියනවා, කුමන්ත්‍රණ කර කර ඉන්නේ නැතිව මහ පොළවේ ගිහිල්ලා වැඩ කරන්න කියලා.

ගරු සභාපතිතුමනි, පෙරේදා දවසේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ පොදු විපක්ෂය මාධ්‍ය සාකච්ඡා නවයක් තිබ්බා. අපි පෙරේදා දවසේ එක මාධ්‍ය සාකච්ඡාවක් තිබ්බේ නැහැ. හැබැයි, මහ පොළවේ හැම තැනකම, හැම ගමකම අපේ මිනිස්සු වැඩ කෙරුවා. කටවුට් ගැහුවා. පෝස්ටර් ගැහුවා. රැස්වීම් තිබ්බා. ඒ නිසා මහන්සි වෙලා වැඩ කරලා මිසක, මිනිස්සු තුළ විශ්වාසය දිනාගෙන මිසක මේ ආණ්ඩුව පෙරළන්න බැහැයි කියන කාරණය මතක් කරමින්, විසර්ජන ප්‍රඥප්තිය සම්මත කළ යුතුයි කියන කාරණය කියමින් නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විසර්ජන ප්‍රඥප්තිය සම්බන්ධයෙන් යම්කිසි ආකාරයකින් මන්ත්‍රීවරු දැනුවත් කිරීමක් කිරීම සම්බන්ධයෙන් මම ඔබතුමාට බොහොමත්ම ස්තූතිවන්ත වෙනවා. මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 03.35]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන බොහොම ස්තූතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමය මේ රටට ආවේ විශේෂයෙන්ම ජනවාර්ගික අර්බුදයට විසඳුමක් හැටියට. මේ රටේ බලය විමධ්‍යගත කරලා, මේ රටේ තිබුණු යුද්ධයට දේශපාලන විසඳුමක් හැටියට තමයි එදා පළාත් සභා ක්‍රමය මේ රටට හඳුන්වලා දුන්නේ. මේ පළාත් සභා ක්‍රමය

[ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්]

හඳුන්වලා දීමත් එක්කම ඒ අසූ ගණන්වල මේ පළාත් සභා ක්‍රමයට විරුද්ධව විශාල බලවේග එදා සිටියා. මම හිතනවා, සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත්, එදා ඒ පළාත් සභා ක්‍රමය මේ රටට ඕනෑ නැහැයි කියලා එදා තරුණයින්ව උසිගන්වපු, තරුණයින්ව එදා දංගෙඩියට ගෙන්වපු ඒ මහජන එක්සත් පෙරමුණේ නායකයොත් එක්ක තමයි එදා එතුමාත් සිටියේ. අද අපිට සන්තෝෂයි. එතුමා පළාත් සභාවට ඇවිල්ලා තිබෙනවා. අද එතුමා ප්‍රතිපත්ති ගැන කථා කරනවා. එතුමා පළාත් සභාවට විරුද්ධයි. එතුමා බලය බෙදීමට විරුද්ධයි. එහෙම කථා කරන දේශපාලන පක්ෂයක් නියෝජනය කරන ඔබතුමා මේ සභාවට ඇවිල්ලා ආණ්ඩු පක්ෂයේ සංවිධායකකමත් අරගෙන තිබෙනවා. එහෙමනම් ඔබතුමා පළාත් සභාවට විරුද්ධ නම් මේ (බාධා කිරීමක්)

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ජනතා විමුක්ති පෙරමුණත් ගැන කියන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජනතා විමුක්ති පෙරමුණ ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. ඔබතුමා ගැන. ඔබතුමා තමයි දැන් විරුද්ධව කථා කළේ. ඔබතුමා කිව්වා, අපට ප්‍රතිපත්ති නැහැ. අපි ප්‍රතිපත්තිවලට විරුද්ධව වැඩ කරන්නේ කියලා චෝදනා කළේ ඔබතුමා. ඒ නිසා ඔබතුමා පළාත් සභාවට විරුද්ධව එදා 88, 89 මේ රටේ තරුණයන්ව උසිගන්වලා, බස් ගිනි තියලා, බෝ ගහ යට රැස්වීම් තියලා ඒකට නායකත්වය දීපු මහජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් අද ඔබතුමා පළාත් සභාවට ඇවිල්ලා තිබෙනවා. සන්තෝෂයි. ප්‍රතිපත්තියක් නැත්තේ ඔබතුමාටයි. ඔබතුමා පළාත් සභාවට විරුද්ධ නම් එළියේ ඉන්න ඕනෑ. තනතුරු දරන්න එපා. එහෙමනම් ඔබතුමා එළියේ ඉන්න ඕනෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමය ගෙනාවේ ජනවාර්ගික අර්බුදයට විසඳුමක් හැටියට. නමුත් අද වන විට මේ පළාත් සභා ක්‍රමයේ යම් කොටසක් ආණ්ඩුව පවරාගෙන තිබෙනවා. විශේෂයෙන්ම දිවි නැඟුම පනත හරහා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා ඔය හැමදාම කියන ටික නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට තිබුණු බලතල රාශියක්, විෂයයන් රාශියක් මධ්‍යම ආණ්ඩුව පවරා ගත්තා. ඊළඟට නාගරික සංවර්ධන පනතක් ගෙනැල්ලා පළාත් සභාවට නාගරික සංවර්ධනය සඳහා තිබුණු විෂයයන් ගණනාවක්ම මධ්‍යම ආණ්ඩුව පවරා ගත්තා. ගරු සභාපතිතුමනි, ආණ්ඩුව එක වේලාවකට කථා කරනවා, ජනාධිපතිතුමා එක වේලාවකට කියනවා, අපි 13 වැනි සංශෝධනයෙන් එහාට ගිය විසඳුමකට යනවා කියලා. 13 + එක ගැන කථා කළා අපට මතකයි. නමුත් මේ පළාත් සභාවට තිබුණු බලතල ටිකෙන් ටික ටිකෙන් ටික කප්පාදු කරලා, අද මේ පළාත් සභාව ඇමැතිවරුන්ගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතනයක් බවට මේ ආණ්ඩුව පත් කරලා තිබෙනවා. අපි මන්ත්‍රීවරු හැටියට, තමුන්නාන්සේ මහ ඇමැතිතුමා හැටියට සම්මේලන ගණනාවක් තිබ්බා. ඒ මහ ඇමැති සම්මේලනවලදී තමුන්නාන්සේලාට තීන්දුවක් ගන්න බැරි වුණා. ඉඩම් බලතල ටික, පොලිස් බලතල ටික, මේ පළාත් සභාවේ අපට 13 වැනි සංශෝධනය යටතේ දීලා තිබෙන බලතල ටිකවත් ප්‍රඥප්තියක් ගෙනැල්ලා පවරා ගන්නවත් ඔබතුමන්ලා ඉක්මන් වුණේ නැහැ. ඒ කියන්නේ මේක නාමික බැසිල් රාජපක්ෂලාගේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපට එපා. අපි ඉල්ලන්නෙත් නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒ ගොල්ලෝ කියන දේවල් කරන සභාවක් බවට අද පත් වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. අද වන විට මේ පළාත් සභාවේ මෙහි සමහර දේශපාලඥයින් මේ එන ජනාධිපතිවරණය මුල් කරගෙන, මේකේ නිලධාරීන්ට තර්ජනය කරලා පළාත් සභාවේ තිබෙන සම්පත් ජනාධිපති මැතිරණයට යොදන්න අද ක්‍රියා කරගෙන යනවා. අපි මේක තරයේ හෙළා දකිනවා. මම ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. අර මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා, විසර්ජන ප්‍රඥප්තියට සාකච්ඡා කරන්නේ මොනවාද කියලා.

**ගරු මොහොමඩ් මුජීබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මේ පළාත් සභාවේ විෂයයන් ගැන මම කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ නිසා ඔබතුමා ඒ ගැන කථා කරන්න. එතකොට කථාව අර්ථවත් වෙනවා.

**ගරු මොහොමඩ් මුජීබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

එතුමාත් දේශපාලන කථාවක් කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා මුලින් පැහැදිලි කළා.

**ගරු මොහොමඩ් මුජීබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා මමත් පළාත් සභාවේ විෂයයන් ගැන කථා කරන්නේ. ගරු සභාපතිතුමනි, ඒ නිසා අද මේ පළාත් සභාව ජනාධිපති මැතිවරණය ඉලක්ක කරගෙන මේකේ සම්පත්, මේකේ නිලධාරීන්ව භය කරලා, ඔවුන්ට තර්ජනය කරනවා. අපි කියනවා, ඒ සම්පත් පාවිච්චි කරන්න දෙන්න එපා. ඒ වාගේම අපි නිලධාරීන්ට කියනවා, තමුන්නාන්සේලා නීතිය අනුව වැඩ කරන්න. ලබන නව වැනිදාට මේ බස්නාහිර පළාත් සභාවේ සියලුම

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ කාර්යාලය විවෘත කරන තැනට මම ගියා. මෙතැන හිටපු කිහිප දෙනෙක් ඒ කාර්යාලයේ සිටියා. මම නම් කියන්නේ නැහැ. නව වැනිදා වෙනකොට අපට බලාගන්න පුළුවන්. අපි මේ රටේ මෛත්‍රී පාලනයක් ඇති කරනවාත් එක්කම බස්නාහිර පළාත් සභාවේත් වෙනසක් වෙනවායි කියන එක මතක තියා ගන්න කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.42]

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මා විසින් ඉදිරිපත් කරන ලද 2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය සම්බන්ධව විසර්ජන ප්‍රඥප්තිය ඉදිරිපත් කරන මේ අවස්ථාවේදී ගරු අමාත්‍ය මණ්ඩලයට, ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට, විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට, ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමිය ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන්ට මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පළමුවෙන්ම පුද කරන්න ඕනෑ. මොකද, ඒ අයගේ දායකත්වය නැත්නම් මේ අයවැය ඉදිරිපත් කිරීම පහසු කාර්යයක් නොවේ. කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි, මේ සභාවේ 2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය සාකච්ඡා කරපු අවස්ථාවේ මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වුණ අදහස්, යෝජන හා විවේචන කෙරෙහි මගේ විශේෂ අවධානය යොමු කරලා එක් එක් විෂයයන් යටතේ ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳව අදාළ උපදේශක කාරක සභාවේදී සාකච්ඡාවට ගන්න අපි බලාපොරොත්තු වෙනවයි කියන කාරණාව මතක් කරන්න ඕනෑ. අපට පැවරී ඇති බලතල සීමාව තුළ ක්‍රියාත්මක කළ හැකි ඵලදායි යෝජනා ඒ තුළ ඉදිරියේදී ක්‍රියාත්මක කරන්නත් බලාපොරොත්තු වෙන බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, සමස්ත අයවැයෙන් වැඩි මුදල් ප්‍රමාණයක් මගේ අමාත්‍යාංශයට වෙන් කරගෙන ඇති බව විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් අදහස් කළා. ඒක පුන පුනා කිව්වා. මන්ත්‍රීවරු කරුණු ඉදිරිපත් කළත් මේ සභාවේ සිටි මන්ත්‍රී සංඛ්‍යාව අනුව සමහර අය ඒවාට ඇහුම්කන් දුන්නේ නැහැ. නොදැන පුන පුනා කිව්වා. ඒ නිසා මම විශ්වාස කරනවා, විසර්ජන ප්‍රඥප්තිය සාකච්ඡා කරන මේ අවස්ථාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය තිබෙන නිසා මේ කාරණාව පැහැදිලි කරන්න ඕනෑය කියලා. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව අපට පැවරුණු විෂයයන් තිබෙනවා. එම විෂයයන්වල අපට පවතින වගකීම් අනුව මුදල් වෙන් කළ යුතු වෙනවා. එසේ නැති වුණොත් අමාත්‍යාංශ අනුව මුදල් වෙන් කිරීමක් කරන්න බැහැ. අමාත්‍යාංශ පහට සමානව මුදල් වෙන් කිරීමේ හැකියාවකුත් නැහැ. එසේ කිරීමේ අවශ්‍යතාවයකුත් නැහැ. පළාත් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයෙන් 71.86% ක් පමණ සිටින්නේ, මගේ අමාත්‍යාංශය යටතේ. ඒ අයට වැටුප් ගෙවන්න පමණක් රුපියල් මිලියන දාහත් දහස් හයසිය අසූ දෙකක්

[ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා]

වැය වෙනවා. එය සමස්ත අයවැයෙන් 36.45% ක් වෙනවා. පළාත් පාලන ආයතනවලට වැටුප් හා මුද්දර ආදායම ආපසු ගෙවීමට රුපියල් මිලියන එකළොස් දහස් විස්සක් මගේ අමාත්‍යාංශය යටතේ වෙන් වී තිබෙනවා. ඒවා අපට පැවරුණු විෂයයන්. මෙම මුදල වෙනත් අමාත්‍යාංශයක් යටතේ වෙන් කරන්න බැහැ. මේවා ගැන අධ්‍යයනය නොකර නිෂ්ඵලව කථා කිරීම සුදුසු නැති බව අපි තේරුම්ගත යුතුයි. ගරු සභාපතිතුමනි, පළාත් සභා නවක මන්ත්‍රීවරුන් මේවා පුන පුනා කිව්වාම අපට ඒක පිළිගන්න පුළුවන්. මොකද, ඒ අයට ඒ පිළිබඳව අවබෝධයක් නොමැති නිසා. නමුත් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු මේක පුන පුනා කියද්දී මම කල්පනා කළේ, මේ අය මේ ගැන අධ්‍යයනය නොකර මේ පළාත් සභාවේ අයවැයට සම්බන්ධ වුණායි කියන කාරණ යයි. ඒ නිසා අපි බලාපොරොත්තු වුණු දේ විපක්ෂයක් හැටියට ඒ අයගෙන් බලාපොරොත්තු වුණු දේ අපට ලැබුණේ නැහැයි කියන එක මේ අවස්ථාවේදී කියන්න ඕනෑ ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, ප්‍රාග්ධන වියදම් දැරීමේදී අපේ අමාත්‍යාංශවලට සැලැස්මක් නැහැයි කියා විපක්ෂයේ එක් මන්ත්‍රීවරයෙක් පැවසුවා. අපේ සෑම අමාත්‍යාංශයකටම, දෙපාර්තමේන්තුවකටම පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් තිබෙනවා. එහි ප්‍රමුඛ පරාස සහ ඉලක්ක හඳුනාගෙන තිබෙනවා. එම ඉලක්ක ළඟා කර ගැනීමට තමයි අපි මුදල් වෙන් කරන්නේ. මෙම ප්‍රමුඛ පරාස සහ ඉලක්ක මොනවාද කියා සෑම අමාත්‍යාංශයකින්ම විමසා තොරතුරු ලබාගන්න පුළුවන්. අවස්ථා ගණනාවකදී මේවා පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් කර තිබෙනවා. ගරු සභාපතිතුමනි, තවත් කියනවා නම් අපේ ගරු මන්ත්‍රීවරුන්ට මේ පිළිබඳව පැහැදිලි නැත්නම් ඒ අයට තම තමන්ගේ උපදේශක කාරක සභාවේදීත්, පස් අවුරුදු සැලැස්ම පිළිබඳව ඒ අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් උපදෙස් ලබාගෙන කටයුතු කරන්න කියන ඉල්ලීම මේ අවස්ථාවේදී මම තමුන්නාන්සේලාගෙන් කරනවා.

ප්‍රාග්ධන වියදම් ප්‍රමාණවත් නොවන බවත්, ඒ නිසා සංවර්ධනයක් නැහැයි කියා විපක්ෂය ගරු මන්ත්‍රීවරු පවසනවා. සංවර්ධනය මනින්නේ ප්‍රාග්ධන වියදමෙන් පමණක් නොවෙයි. පුනරාවර්ථන වියදම් තුළින්ද ඕනෑ තරම් සංවර්ධනයට දරණ වියදම් තිබෙනවා. ගරු පුහුණුව. මාර්ග නඩත්තු. රෝහල් සහ පාසල් නඩත්තු. මෙම සියල්ල සංවර්ධන කාර්යයන්. ඒ විතරක් නොවෙයි. ගුරුවරුන්ට ගෙවන වැටුප් පවා සංවර්ධන වියදමක් සේ සලකන්න පුළුවන්. අනික් අතට අතීතයේ පටන් අපේ රට සුභසාධන රාජ්‍යයක්. නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය, නිදහස් මාර්ග වැනි සුභසාධන කාර්යයන් රාශියක් අපේ රටේ පවතිනවා. මේවා වෙනුවෙන්ද විශාල මුදලක් වැය කරනවා. මෙම සියල්ල සංවර්ධන කාර්යයන්. ගොඩනැඟිලි ඉදි කිරීම් වැනි දෙයක් පමණක් සංවර්ධන කාර්යයක් සේ සැලකිය යුතු නැහැ.

මට මතකයි, ගරු මන්ත්‍රීවරයෙක් එතුමාගේ කථාවේදීත් - අපේ අවට රටවල්වල ජනගහනය අනුව වෛද්‍යවරු කොපමණ ඉන්වාද? හෙදියන් කොපමණ ඉන්නවාද කියලා ඒ ගොල්ලෝ ගණනය කළේ සිංගප්පූරුව, මැලේසියාව වාගේ රටවල් හදාගෙන. ඒ රටවල්වල නිදහස් සෞඛ්‍ය සේවාව නැහැ. ඒවායේ මුදල් අය කරලා කරන සේවාවක් තිබෙන්නේ. ඒ නිසා ඒ අයට කරන්න පුළුවන්. හැබැයි, අපි මුදල් අය කරන්න ගත්තොත් අපි දන්නවා, ජනතා විමුක්ති පෙරමුණ අනික් විපක්ෂය ඕකට ලොකු හඬක් නගලා ඕක නවත්වන්න හදනවා. ගරු සභාපතිතුමනි, මේ රටේ වෙලා තිබෙන්නේ ඒකයි. ඒ නිසා අපේ රට සංසන්දනය කළේ, මුදල් අය කරලා කටයුතු කරන රටවල් එක්කයි.

ගරු සභාපතිතුමනි, 2015 වර්ෂයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අප විසින් සම්මත කරගත යුතු වෙනවා. ලබන වර්ෂය තුළ පුනරාවර්ථන වියදම් ප්‍රාග්ධන වියදම් සහ ණය අත්තිකාරම් ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට මෙම විසර්ජන ප්‍රඥප්තියෙන් බලාපොරොත්තු වෙනවා. රුපියල් හාරදහස් අටසිය පනස් එක්කෝටි තිස් ලක්ෂ අසූ හාර දහසක මුදලක් සහ අත්තිකාරම් කටයුතු සඳහා රුපියල් දෙසිය තිස් හය කෝටි අනූ තුන් ලක්ෂ දෙදහසක මුදලක් වැය කිරීමටද මෙමඟින් බලය ඉල්ලනවා.

ගරු සභාපතිතුමනි, අද මේ පළාත් සභා අයවැයේත් විසර්ජන ප්‍රඥප්තිය සාකච්ඡා කරන අවස්ථාවේදීත් හැම මන්ත්‍රීවරයෙකුගේම අවධානය යොමු වුණේ, ඉදිරි මැතිවරණය පිළිබඳව. ගොඩ දෙනෙක් අයවැය ගැන කථා කරනවාට වඩා දේශපාලන සාකච්ඡාවල තමයි නියැලුනේ. අපි දැක්කා, 93 ෆ්‍රැන්සිස්කු කරණයෙන් දකුණු පළාත් සභාවේ ඇති වුණු දේ. එදා එක්සත් ජාතික පක්ෂය ෆ්‍රැන්සිස්කු කරණය කරලා, එතුමාව හංගන් ඉඳලා

නොයෙකුත් බලපෑම් කරලා ජයග්‍රහණය කරන්න බැලුවා. ඒකේ ප්‍රතිඵලය අපි දැක්කා. පළාත් සභා මැතිවරණ තියද්දී සියලුම පළාත් සභා අපට ජයග්‍රහණය කරන්න පුළුවන්කම ලැබුණා. (බාධා කිරීමක්) පළාත් සභාව ගැන මම මේ කියන්නේ. ඒ වාගේම මේ අයවැයට ඉස්සෙල්ලා අපි රූපවාහිනීවල දැක්කා, අපේ නොයෙකුත් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු අට වැනිදාට ඉස්සෙල්ලා අයවැයේදී මේ පළාත් සභාවේදී බලය පෙරළනවා කියලා කිව්වා. අපි ඒක බලාපොරොත්තුවෙන් සිටියා, එහෙම කරයිද කියලා. හැබැයි, අද නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා, කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා ගැන කථා කරලා කිව්වා. එතුමා ඉදිරි මැතිවරණයේදී මෛත්‍රී පාලනයට සහයෝගය ලබා දෙන්න - මම ඒක පිළිගන්නවා. ඒ පිළිබඳව එතුමා ප්‍රකාශයකුත් කළා. හැබැයි, එතුමාගේ ඡන්දය මේ අයවැයේදී තමුන්නාන්සේලාට ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. හැබැයි, අපේ අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමාගේ ඡන්දය අපට ලබා ගන්න පුළුවන්කම ලැබුණා. ඒවා බලෙන් ලබාගත්ත දේවල් නොවෙයි.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

පගාව දීලා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දැන් ගරු සභාපතිතුමනි, අපෙන් ගිය මන්ත්‍රීවරු ඔය පැත්තට ගියේ සල්ලි දීලද?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ** නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔව්. ඔව්.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ආ. ඒක හොඳයි. පිළිගන්වා නම්, මම ඒක පිළිගන්නවා. ගරු සභාපතිතුමනි, අපේ විරුද්ධ පක්ෂයේ නායකතුමා කියනවා, අපෙන් ගිය මන්ත්‍රීවරුත් ගියේ සල්ලිවලටලු. ඔබතුමා පිළිගන්නවා නම් ඒක හරී.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ** නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

සල්ලි නැතිව මෙලෝ දෙයක් -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මෛත්‍රීපාල අපේ මන්ත්‍රීතුමා ඇතුළු පොදු විපක්ෂයේ අපේක්ෂකයා සල්ලිවලට ගියා කියලා අපේ විරුද්ධ පක්ෂයේ නායකතුමා කියනවා නම් මීට වැඩිය කථා කරන්නේ මොකක්ද ගරු සභාපතිතුමනි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ** නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

බොරු කියන්න එපා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේ දැන් කිව්වා නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ** නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ. නැහැ. මම කිව්වේ -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, අද පොදු අපේක්ෂකයාට මුදල් වියදම් කරන්නේ බටහිර රටවල්. අද ඒ අයගේ කොන්ත්‍රාත් එක අරගෙන කරන්නේ මේ අය. අද අපි දන්නවා

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ජනාධිපති පාවිච්චි කරන්නේ අපේ සල්ලි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ජනාධිපති වියදම් කරන්නේ කාගේ සල්ලිද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කලබල වෙන්න එපා. ඔබතුමන්ලා ආයිත් කියනවා නම් පිළිගන්න ලැහැස්තියි. හැබැයි, මේවා අපිත් දන්න දේවල් කියන්න ඕනැ. ඒ නිසා (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මම කාටවත් බාධා කළේ නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අර්ජුන ගියෙත් සල්ලිවලටද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම දන්නේ නැහැ. අර්ජුන අයියා පක්ෂයේ හිටියේ නැහැ නේ? අර්ජුන කවදාවත් සල්ලි ගන්න කෙනෙක් නොවෙයි. එයා සල්ලි කවදාවත් අතගාපු කෙනෙක් නොවෙයි. ඒ නිසා (බාධා කිරීම්) මගේ පෞද්ගලික ජීවිතේ මම දන්නවා කොහොමද කියලා. ඒ නිසා මම වගකීමෙන් කියනවා අර්ජුන රණතුංග ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටියේ මීට අවුරුදු ගණනකට ඉස්සෙල්ලා. දැන් ඉන්නේ ජනතා විමුක්ති පෙරමුණත් එක්ක. නැහැ නේ? ඒත් නැහැ නේ? ඉන්නවාද? නැහැ නේද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එයා තමයි දන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කවුරුත් දන්නේ නැහැ එතුමා ඉන්න පක්ෂයවත්. කොහොම වුණත් ඒක තමයි ගරු සභාපතිතුමනි වෙලා තිබෙන්නේ. හතළිස් තුන්දෙනෙක් අත්සන් කළාම පක්ෂ තිබෙන්නේ පහයි. එතකොට ඉතිරි හතළිහම පුද්ගලයෝ. මේ පුද්ගලයන් පක්ෂ මාරු කළාට ගම් මට්ටමේ ඡන්දවලට බලපාන්නේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි ජනවාරි 06 වැනිදා තිබුණු පළාත් සභාව - අපි යෝජනා කළේ නැහැ. අපි අදහසක් ඉදිරිපත් කළා. එදා නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාත් අත උස්සලා එකඟතාවය දුන්නා. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් වගකීමෙන් අහනවා. එදා ඔබතුමා මේ සාකච්ඡාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකමතිකව.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒකමතිකව සභා සම්මත වුණා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

එහෙම වුණේ -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

බොරු කියන්න එපා. කෙරුවොත් කරන්නේ බොරුවක්. ජනතා විමුක්ති පෙරමුණ යමක් කිව්වාම ඒක පිළිගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඒකමතිකව සභාවේ සම්මත වුණා.

[සභාවේ ඝෝෂා]

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි,

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

හය වැනිදා පුළුවන් නම් තියන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එදා මෙතුමා ආවේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමා අභියෝගයක් කරනවා නම් හය වැනිදා අපි තියන්න ලැහැස්තියි. ඔට්ටුව මොකක්ද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

හය වැනිදා තියමු.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මෙතුමා කියනවා හය වැනිදා තියන්න මෙතුමා සහයෝගය දෙනවා කියලා. අපි ඒක ස්ථිර කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

හරි. ස්ථිර කරනවා නම් ඔබතුමන්ලා මේ පළාත් සභාව හය වැනිදාට පෙරළනවාද?

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අනිවාර්යයෙන්. අපි ලබන ජනවාරියේ මේ පළාත් සභාවේ බලය ගන්නවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ලබන ආත්මේ.

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

විපක්ෂයේ අපි ඔක්කෝම එකතු වෙලා බලය ගන්නවා. ඔබතුමා පුළුවන් නම් -

[සභාවේ ඝෝෂා]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

දාහතරයි, පහළවයි ඡන්දය දෙන්නේ. ලැජ්ජා හිතෙනවා.

[සභාවේ ඝෝෂා]

විපක්ෂයේ ඡන්දය දෙන්න එන්නේ දාහතරයි, පහළවයි. කවුරුවත් එන්නේ නැහැ. එකමුතුවක් නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අභියෝගය භාර ගන්නවා නම් හය වැනිදා වෙන කොට මේ පළාත් සභාව පෙරළනවා කියලා. අපි ලැහැස්තියි හය වැනිදා මේ සභාව තියන්න. හැබැයි, අභියෝගය ඔබතුමන්ලා හය වැනිදා මේ පළාත් සභාව පෙරලුවොත් -

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඔට්ටුව මේකයි. අපි ඇමැතිවරු වෙනවා. ඔබතුමන්ලා මන්ත්‍රීවරු වෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ යෝජනාව මොකක්ද? මට ඇහුණේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, හය වැනිදා පළාත් සභාව පෙරළනවයි කියලා එතුමන්ලා කියනවා නම් අපි තියන්න ලැහැස්තියි. එහෙම වෙනස් වුණොත් මම මේ ප්‍රධාන අමාත්‍ය ධූරයෙන් පවා අයින් වෙනවා. එතුමන්ලා මන්ත්‍රී ධූරයෙන් අයින් වෙන්න ඕනෑ.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අපි නේ ඒක කරන්නේ. ඒක ඔබතුමා නොවෙයි, අපි කරන්නේ. ඔබතුමාට අයින් වෙන්න වෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම මීට වැඩිය කථා කරන්නේ නැහැ. මේ අය මේ හීනේ අයවැයට ඉස්සෙල්ලත් දැක්කා. මම දැක්කා, හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඉතාමත්ම දුර්වල සංවිධායකවරයෙක්. එතුමාට පුළුවන්කමක් ලැබුණේ නැහැ, තමන්ගේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු ටික ඡන්දයට සම්පූර්ණයෙන් ගෙන්වන්න. අපේ සම්පූර්ණ මන්ත්‍රී කණ්ඩායම ඉන්නවා. කෝරමයක්වත් සිටියේ නැහැ, ගරු සභාපතිතුමනි. ඒ නිසා අපි ඔබතුමා මාර්ගයෙන් විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා. විශේෂයෙන් තමන්ට පැවරිලා තිබෙන රාජකාරියේ ගෞරවය රැකෙන පරිදි මේ සභාවේ කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***අ.භා. 03.58 ට 2015 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ විවාදය අවසන් විය.***

*At 03.58 p.m. the debate on the Appropriation Statute related to Annual Financial Statement of 2015 was concluded.*

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මට පැහැදිලි නැහැ, අපට ඊළඟ සභාව හය වැනිදා තිබෙනවාද කියන එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එදා ප්‍රකාශ කළා නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු ප්‍රධාන අමාත්‍යතුමා තිබෙනවා කියලා කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. එතුමා කිව්වේ නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

එතුමා කිව්වා, හය වැනිදා තිබෙනවා කියලා. අපි විපක්ෂය හැටියට ඉල්ලීමක් කරනවා. මේ ජනවාරි හය වැනිදා මේ පළාත් සභාව (බාධා කිරීම්) ඇයි හය?

[සභාවේ ඝෝෂා]

නාම යෝජනා භාර දුන්නාට පස්සේ -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

තමුන්නාන්සේලා කියන ඕනෑම අභියෝගයකට අපි ලැහැස්තියි.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

කිසිම ගැටලුවක් නැහැ. අපි හැමෝම ඒකමතිකව බලාපොරොත්තු වෙනවා, හය වැනිදාට -

[සභාවේ ඝෝෂා]

අපට සීතලත් නැහැ. එකම දේ තිබෙන්නේ වැස්ස විතරයි.

[සභාවේ ඝෝෂා]

මෙතුමා කියනවා නම් හය වැනිදා තියන්න කියලා හය වැනිදා තියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මම වගකීමෙන් කියනවා. ඔබතුමා නිවැරදිව තීරණය කරන්න.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, ඔබතුමා හය නැතිව තීරණය ගන්න. අපි නව වැනිදායින් පස්සේ අපි ඔබතුමාව ඔය පුටුවේ තියනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අපේ අභියෝගය භාර ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, අපේ සභාව අභියෝගයට ලක් කළා, හය වැනිදාට තියන්න කියලා. ඉතින් අපි කියනවා, සභාව පිළිබඳව

ගැටලුවක් නැහැ. මම පෞද්ගලිකව අතිගරු ජනාධිපතිතුමා අට වැනිදා ජයග්‍රහණය කරනවා කියන එක පැහැදිලිව කියනවා. මගේ ඇමැතිකම -

[සභාවේ ඝෝෂා]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මේ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා වරප්‍රසාදය -

ගරු ශ්‍රීනාත් පෙරේරා
Hon. Srinath Perera

මොකක්ද වරප්‍රසාදය?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා අසුන්වලට යන්න. තමුන්ගේ නියමිත අසුන්වලට යන්න. වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමන්ලා තැන් තැන්වල ඉන්නවා. මේක ඉතාම වැදගත් අවස්ථාවක්.

[සභාවේ ඝෝෂා]

**ගරු අශෝක දයාරත්න**
Ashoka Dayarathne

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ඉඳලා මම ඉවත් වෙලා ප්‍රජාතන්ත්‍රවාදී - අපට ආරංචියි ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ජනාධිපතිතුමාට සහයෝගය දක්වන්න එනවා කියලා. එතුමාගේ නායකත්වයට ලොකු ගැටලුවක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ලාභයි. ලාභයි. කෝටි පහයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් වේලාව හරි. විහිලු තහළු ඉවරයි. කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. ඉතාම වැදගත් අවස්ථාවක්. දවස් හතරක් විවාදයට සම්බන්ධ වෙලා, අයවැය විවාදය අවසන් වන මොහොත. විසර්ජන ප්‍රඥප්තිය කියන්නේ ඉතාමත් වැදගත් දෙයක්. විසර්ජන ප්‍රඥප්තිය සම්මත කරන අවස්ථාවේ ගරු මන්ත්‍රීතුමන්ලා මට උදව් කරන්න. ඒ සම්බන්ධව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ඊට අනුකූලව,***

***ප්‍රශ්නය විමසන ලදුව, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 55 යි, විරුද්ධව 41 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*Question put and, the Committee of the Whole Council divided under Rule 61(3) as 55 for, 41 against and 00 decliners.*

# රීති අංක 30 යටතේ යෝජනාව
## MOTION UNDER RULE NO : 30

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු සභාපතිතුමනි, *"දැන් පූර්ණ කාරක සභාවේ කාලය දීර්ඝ කළ යුතු යැයි"* මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙම අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභාවක් බවට පත් වෙනවා.

***ඊට අනුකූලව අ.භා. 04.01 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 04.01 p.m. the Provincial Council resolved itself into a committee of the whole Council.*

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, මෙය අපි අවසන් කරලා ඉමුද?

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂයන් පිළිවෙළින් 106, 119, 120, 121 යන ශීර්ෂයන් යටතේ විවාදය 2014.12.03 වන දින ප.ව. 03.00 ට ආරම්භ කොට ප.ව. 05.00 දක්වා පැවැත් වුණු අතර එකී වැය ශීර්ෂයන් (බාධා කිරීමක්) පිළිබඳ විවාදය එදින අවසන් නොවූ අතර එදින තාවකාලික අත්සිටවූ විවාදය 2014.12.04 දින එනම් අද දිනයේ පෙ.ව. 09.00 ට ආරම්භ කොට පෙ.ව. 11.00 දක්වා පැවැත්විණ. ඒ අනුව එකී අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් යටතේ විවාදය පුරා විනාඩි 84 කට ආසන්න කාලයක් පුරා පැවැති අතර ගරු මන්ත්‍රීවරුන් අට දෙනෙකු එකී විවාදය සඳහා සම්බන්ධ විය. විවාදය අවසානයේ බෙදීමක් ඉල්ලූ බැවින් ශීර්ෂ අංක 106, 119, 120 හා 121 යන වැය ශීර්ෂයන් වැඩි ඡන්ද 27 කින් සභා සම්මත වූ බව සභාවට දන්වන අතර,

ඉන් අනතුරුව ආරම්භ කරන ලද්දේ ශීර්ෂ අංක 105, 106, 117 සහ 118 වැය ශීර්ෂයන් වන සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා, සහා කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂයන්. අද දින පෙ.ව. 11.00 ට ආරම්භ වූ එකී විවාදය ප.ව. 03.00 දක්වා පැවැත්විණ. එකී අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් පුරා විනාඩි 149 ක් පැවැති අතර ගරු මන්ත්‍රීවරු 14 දෙනෙකු එකී විවාදය සඳහා දායකත්වය සපයන ලදී. විවාදය අවසානයේ බෙදීමක් ඉල්ලූ බැවින්, ශීර්ෂ අංක 105, 106, 117 හා118 වැය ශීර්ෂයන් වැඩි ඡන්ද 13 කින් සභා සම්මත වූ බව මෙම සභාවට දැනුම් දෙනවා.

අද දින ප.ව. 03.00 ට ආරම්භ වූ 2015 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡාව ප.ව. 04.00 ට අවසන් වුණා. එම 2015 මූල්‍ය ප්‍රකාශයේ විසර්ජන පනත් කෙටුම්පතට අවසානයේදී බෙදීමක් ඉල්ලූ බැවින් ඡන්ද විමසීමකට ලක් වුණා. එම විසර්ජන පනත් කෙටුම්පතට පක්ෂව මන්ත්‍රීවරු 55 ක් සහ විපක්ෂව ගරු මන්ත්‍රීවරු 41 දෙනෙක් ඡන්දය පාවිච්චි කිරීමෙන් අනතුරුව වැඩි ඡන්ද 14 කින් එම විසර්ජන පනත් කෙටුම්පත සභා සම්මත වූ බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

අපේ සම්ප්‍රදායක් තිබෙනවා, අයවැය විවාදය අවසන් වුවායින් පස්සේ මගේ ස්තුතියක් කිරීම. ඒ නිසා මෙම අවස්ථාවේදී මගේ ස්තුතිය ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා. මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලා මට සහාය ලබා දෙයි කියන එක. 2015 අයවැය විවාදය පැවැත් වුණු අවස්ථාවේදී විශේෂයෙන් අපි ගරු ආණ්ඩුකාරතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ආණ්ඩුකාර ලේකම්තුමා ඇතුළු ආණ්ඩුකාර ලේකම් කාර්යාලයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම ගරු ඇමැතිවරුන්ට, ගරු විපක්ෂ නායකතුමාට, ගරු නියෝජ්‍ය සභාපතිතුමා, ගරු සභා නායකතුමා, ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, විශේෂයෙන්ම මට අතිමහත් සහයෝගයක් ලබා දුන්නු මගේ නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමාට මම විශේෂයෙන් මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මූලාසනය දරමින් මට සහාය දැක් වූ අපේ හිතවත් ජොෂ්ඨ මන්ත්‍රී හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේම සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමාටත් මගේ ස්තුතිය මේ වේලාවේදී ප්‍රකාශ කර සිටිනවා.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී දින හතරක කාලයක් තිස්සේ මට නොයෙක් ආකාරයෙන් සහාය දක්වපු ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලුම මන්ත්‍රීතුමන්ලාට මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කර සිටිනවා. ඒ වාගේම නිලධාරීන් වශයෙන් ප්‍රධාන ලේකම් ජයන්ති විජේතුංග මැතිනිය, ඒ වාගේම කාර්ය මණ්ඩලය, ආණ්ඩුකාර ලේකම්තුමා ඇතුළු එම කාර්ය මණ්ඩලය, සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු එම කාර්ය මණ්ඩලය, විශේෂයෙන්ම මේ අයවැය විවාදය කාලය තුළ අපට විශාල ශක්තියක් ලබා දුන්නු සහා ලේකම් කාර්යාලයේ හේමන්ත සමරකෝන් මැතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට, පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු ගොඩාක් සහභාගි වෙලා ඉන්නවා. ඒ සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ට මගේ ස්තුතිය, ගෞරවය සහ ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කර සිටිනවා.

ඒ වාගේම සේවා ලබා දීමෙන් ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන්, අමාත්‍යාංශ ආරක්ෂක අංශයේ MSD නිලධාරීන්, තලංගම පොලීසියේ පොලිස් ස්ථානාධිපතිතුමා ඇතුළු සියලු කාර්ය මණ්ඩලයට, බන්ධනාගාර නිලධාරීන්ට, බෝම්බ නිශ්ක්‍රීය අංශයේ සියලුම නිලධාරීන්ට, බස්නාහිර පළාත් වෙස්කෝ ආයතනයේ ආරක්ෂක අංශයට, කඩුවෙල මහ නගර සභාවේ නගරාධිපති ගරු ජී.එච්. බුද්ධදාස මැතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට, පවිත්‍රතා හා සේවා කටයුතු සැපයූ සියලුම සේවා ආයතනයන්ට, ආහාරපාන සංග්‍රහ සැපයූ ආයතනයන්ට, විශේෂයෙන්ම දින හතරක කාලයක් තිස්සේ අපිත් එක්ක ඉතාම සුහදව, ලෙංගතුව කටයුතු කරපු සියලුම මා හිතවත් විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය මිත්‍රවරුන්ට මගේ විශේෂ ස්තුතිය පුද කර සිටිනවා, අපට ලබා දීපු සහයෝගයට. ඒ වාගේම භාෂණ පරිවර්තන කටයුතු සැපයූ, අපට නොපෙණුනත් භාෂණ පරිවර්තන නිලධාරීන් විශාල සේවයක් කළා. මම මේ අවස්ථාවේදී ඒ සියලු දෙනාට මගේ ස්තුතිය පුද කර සිටිනවා. ඒ වාගේම නොයෙකුත් අංශවලින් දැක් වූ සහයෝගයට ඒ සියලු දෙනාටම මගේ ගෞරවනීය, ප්‍රණාමය සහ ස්තුතිය පුද කර සිටිනවා.

ඒ වාගේම විශේෂයෙන්ම 2014 වසරට සභා රැස්වීම් පැවැත්වෙන්නේ නැහැ. ඒ නිසා 2015 වසර ඔබ සැමට සුභ නව වසරක් වේවා. ලබන්නා වූ නත්තල සුභ නත්තලක් වේවා කියා ප්‍රාර්ථනය කරමින්, අපි හැමෝටම නිදහසේ ජීවත් වෙන්න පුළුවන් සාමය පිරි -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ තෙවැනි වාරයත් එක්ක අපි එනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

අපි මෛත්‍රී කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 04.10 ට, 2015 ජනවාරි මස 20 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 04.10 p.m till 09.30 a.m, on 20.01.2015*